# 2025

# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT



**දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව**
**உள்நாட்டு இறைவரித் திணைக்களம் - இலங்கை**
**INLAND REVENUE DEPARTMENT - SRI LANKA**

මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

# වාර්ෂික

## කාර්ය සාධන වාර්තාව

# 2 0 2 5

**වැය ශීර්ෂ අංකය 246**
(2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන
රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 2.4 වගන්තිය ප්‍රකාරව)

---

**ආර්. පී. එච්. ප්‍රනාන්දු**
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්

# පටුන


| 01 පරිච්ඡේදය | 11 |
|---|---|
| ආයතනික පැතිකඩ | 11 |
| 1.1 හැඳින්වීම | 13 |
| 1.1.1 දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | 13 |
| 1.1.2 දැක්ම හා මෙහෙවර ප්‍රකාශය | 14 |
| 1.1.3 ප්‍රධාන අරමුණු හා ඉලක්ක | 14 |
| 1.2 සංවිධාන ව්‍යුහය | 15 |
| 1.3 කළමනාකරණ කණ්ඩායම | 16 |

| 02 පරිච්ඡේදය | 17 |
|---|---|
| ප්‍රගතිය සහ ඉදිරි දැක්ම | 17 |
| I කොටස | 19 |
| බදු ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම | 19 |
| 2.1 හැඳින්වීම | 19 |
| 2.2 බදු නීති සංශෝධනය කිරීම සඳහා 2025 වර්ෂයේදී පනවනු ලැබූ නීති | 19 |
| 2.2.1 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සඳහා සිදු කරනු ලැබූ සංශෝධන | 19 |
| 2.2.2 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සඳහා සිදු කළ සංශෝධන | 21 |
| 2.2.3 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සඳහා සිදුකළ සංශෝධන | 22 |
| 2.2.4 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීමේ සහ සූදු බදු පනත සඳහා සිදු කළ සංශෝධන | 22 |
| 2.2.5 වසර තුළ නිකුත් කරන ලද ගැසට් නිවේදන | 22 |
| 2.3 අනුමත පුණ්‍ය ආයතන | 24 |
| 2.4 ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් (DTAAs) | 24 |
| II කොටස | 26 |
| ආදායම් කාර්ය සාධනය | 26 |
| 2.5 ආදායම් රැස් කිරීම | 26 |
| 2.5.1 සමාලෝචනය | 26 |
| 2.5.2 රැස් කරනු ලැබූ සමස්ත ආදායම | 26 |
| 2.5.3 2025 වර්ෂයෙහි සහ 2024 වර්ෂයෙහි ආදායම් සංසන්දනය | 36 |
| 2.6 අනෙකුත් සුවිශේෂ ජයග්‍රහණ | 37 |
| 2.6.1 ආදායම් රැස් කිරීම ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ | 37 |
| 2.7 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභියෝග සහ අනාගත ඉලක්ක | 41 |
| 2.7.1 අභියෝග | 41 |
| 2.7.2 අනාගත ඉලක්ක | 42 |
| III කොටස | 44 |
| අනුකූලතාව සහ බලාත්මක කිරීම | 44 |
| 2.8 හැඳින්වීම | 44 |
| 2.9 බදු ගෙවන්නන්, බදු සම්බන්ධ වෘත්තිකයන් සහ මහජනතාව සඳහා පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් | 44 |
| 2.10 වාර්තා ගොනු කිරීමේ අනුකූලතාව | 45 |
| 2.10.1 2024/2025 තක්සේරු වර්ෂය සඳහා සංස්ථාපිත ආදායම් බදු වාර්තා ගොනු කිරීම | 45 |
| 2.10.2 2024/2025 තක්සේරු වර්ෂය සඳහා තනි පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා ගොනු කිරීම | 58 |

2.10.3 2024/2025 තක්සේරු වර්ෂය සඳහා අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) සහ අත්තිකාරම් ආදායම් බදු (AIT) වාර්තා ගොනු කිරීම 47
2.10.4 2025 වර්ෂයේදී එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීමේ අනුකූලතාව 48
2.10.5 2025 වර්ෂයේදී සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) වාර්තා ගොනු කිරීමේ අනුකූලතාව 51
2.11 බලාත්මක කිරීම 53
2.11.1 විගණන 53
2.11.2 විමර්ශන 54
2.11.3 බදු අභියාචනා කොමිෂන් සභාව (TAC) හමුවේ විභාග වන බදු අභියාචනා 54
2.11.4 අධිකරණ කටයුතු 55
2.11.5 බදු ගෙවීම මගහැරීම අවම කිරීම සඳහා ගත් පියවර 55

**IV කොටස** **56**
**ආයතනික කාර්ය සාධනය** **56**
2.12 හැඳින්වීම 56
2.12.1 සංචාරක වැට් බදු ආපසු ගෙවීමේ ක්‍රමවේදය (TVRS) යළි ක්‍රියාත්මක කිරීම 56
2.12.2 අපනයන ආශ්‍රිත බදු මුදල් ආපසු ගෙවීම සඳහා "අපනයන ආපසු ගෙවීමේ සැකසුම් අංශය" ස්ථාපිත කිරීම 57
2.12.3 2025 වර්ෂයෙහි බදු අනුකූලතාවය සහ ආදායම් පරිපාලනය සම්බන්ධයෙන් අවදානම් කළමණාකරණය කිරීමේ අංශයෙහි කාර්යභාරය 57
2.12.4 දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර කටයුතු ඒකකයක් (Internal Affairs Unit – IAU) ස්ථාපිත කිරීම 58
2.12.5 ඉහළ වත්කම් සහිත පුද්ගලයින් පිළිබඳ අංශයෙහි 2025 වර්ෂයේ කාර්ය සාධනය 58
2.12.6 ධාරිතා වර්ධනය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය තුළින් බදු අපරාධ විමර්ශනය සවිබලගැන්වීම 59
2.12.7 රාජ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කරමින් බදු ගෙවන්නන් සඳහා නව සේවා මධ්‍යස්ථාන ආරම්භ කිරීම 59
2.12.8 ජාතික බදු සතිය 2025 -"බදු ශක්ති" තුළින් ජාතිය සවිබල ගැන්වීම 60
2.12.9 ශ්‍රී ලංකාවේ මූල්‍ය අධීක්ෂණය සවිබල ගැන්වීම: මිල පැවරුම් වැඩසටහන 60
2.12.10 උසස් මිලකරණ ගිවිසුම් සඳහා විධිමත් රාමුව සහ මාර්ගෝපදේශ 61

**03 පරිච්ඡේදය** **63**

**වසරේ මූල්‍ය කාර්ය සාධනය** **63**
3.1 මූල්‍ය කාර්ය සාධනය 65
3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 67
3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 68
3.4 මූල්‍ය ප්‍රකාශන සටහන් 70
3.5 ආදායම් රැස් කිරීමේ කාර්ය සාධනය 112
3.6 වෙන්කිරීම් ප්‍රයෝජනයට ගැනීමේ කාර්ය සාධනය 113
3.7 මු.රෙ. 208 ප්‍රකාරව අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවේ වැය සඳහා වන වෙන්කිරීම් ප්‍රදාන 113
3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 114
3.9 විගණකාධිපති වාර්තාව 114

**04 පරිච්ඡේදය** **115**

**කාර්ය සාධන දර්ශක** **115**
4.1 හැඳින්වීම 117
4.2 මූලික කාර්ය සාධන දර්ශක (KPIs) 117
4.2.1 ආදායම් රැස් කිරීම 117
4.2.2 දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම 117
4.2.3 බදු ගොනු විවෘත කිරීම 117

| 05 පරිච්ඡේදය | 119 |
|---|---|
| **තිරසර සංවර්ධන අරමුණු** | **119** |
| 5.1 හැඳින්වීම | 121 |
| 5.2 තිරසර සංවර්ධන අභිමතාර්ථ පදනම් කර ගත් දේශීය ආදායම් දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම් | 121 |

| 06 පරිච්ඡේදය | 125 |
|---|---|
| **මානව සම්පත් පැතිකඩ** | **125** |
| 6.1 විශ්ලේෂණය | 127 |
| 6.2 කාර්ය මණ්ඩල කළමනාකරණය | 127 |
| 6.2.1 මුළු සේවක සංඛ්‍යාව | 127 |
| 6.2.2 පරිපාලන අභියෝග | 129 |
| 6.2.3 පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගත් පියවර | 129 |
| 6.2.4 2025 වර්ෂය තුළ උසස්වීම් | 130 |
| 6.2.5 2025 වර්ෂය තුළ විශ්‍රාම ගැනීම් | 130 |
| 6.2.6 වයස් කාණ්ඩය අනුව කාර්ය මණ්ඩල වර්ගීකරණය | 131 |
| 6.2.7 2025 වර්ෂය අවසානය වන විට කාර්ය මණ්ඩලයේ සේවා කාලය අනුව ව්‍යාප්තිය | 133 |
| 6.2.8 2025 වර්ෂය අවසානය වන විට ස්ත්‍රී පුරුෂ භාවය අනුව කාර්ය මණ්ඩලයෙහි ව්‍යාප්තිය | 133 |
| 6.3 මානව සම්පත් සංවර්ධන වැඩසටහන් | 134 |
| 6.3.1 2025 වර්ෂය තුළ පවත්වනු ලැබූ දේශීය හා විදේශීය මානව සම්පත් සංවර්ධන වැඩසටහන් | 135 |
| 6.3.2 2025 වර්ෂය තුළ දේශීය ආදායම් සේවා නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු පන්ති, අනෙකුත් සම්මන්ත්‍රණ, වැඩමුළු, දැනුවත් කිරීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන් සහ විභාග | 135 |
| 6.3.3 2025 වර්ෂයේදී රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සඳහා පවත්වන ලද පුහුණු පාඨමාලා | 136 |
| 6.3.4 දේශීය ආදායම් සේවාවට අයත් නොවන නිලධාරීන් සඳහා 2025 වර්ෂයේදී පවත්වන ලද අනෙකුත් සම්මන්ත්‍රණ, වැඩමුළු, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු වැඩසටහන් | 136 |

| 07 පරිච්ඡේදය | 137 |
|---|---|
| **අනුකූලතා වාර්තාව** | **137** |

## වගු ලේඛනය


| | | | | |
|---|---|---|---|---|
| 2.1 | වගුව | : | 2025 අප්‍රේල් 01 දින සිට බලාත්මක තනි පුද්ගල ආදායම් බදු අනුපාත | 20 |
| 2.2 | වගුව | : | 2025 වර්ෂයේදී පුණ්‍ය ආයතන සඳහා ලබා දී ඇති අනුමැතියන් | 24 |
| 2.3 | වගුව | : | 2016 සිට 2025 දක්වා ආදායම් ඇස්තමේන්තුවලට සාපේක්ෂව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ආදායම් කාර්ය සාධනය | 26 |
| 2.4 | වගුව | : | රජයේ සමස්ත ආදායමට හා රජයේ බදු ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි දායකත්වය සහ බදු හා දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය | 28 |
| 2.5 | වගුව | : | බදු වර්ගය අනුව මුළු බදු ආදායම - 2025 | 29 |
| 2.6 | වගුව | : | බදු ආදායම පළාත් සභා වෙත පැවරීම - 2025 | 30 |
| 2.7 | වගුව | : | සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු ආදායම | 31 |
| 2.8 | වගුව | : | 2024/2025 තක්සේරු වර්ෂය සඳහා අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) යටතේ බදු විශ්ලේෂණය සහ ආදායම් මට්ටම | 32 |
| 2.9 | වගුව | : | අත්තිකාරම් ආදායම් බද්ද (AIT) යටතේ රැස් කරන ලද බදු ආදායම - 2025 | 32 |
| 2.10 | වගුව | : | එකතු කළ අගය මත බද්ද (VAT) යටතේ රැස් කරන ලද බදු ආදායම සහ ආපසු ගෙවීම | 32 |
| 2.11 | වගුව | : | දළ දේශීය නිෂ්පාදිතය සඳහා වැට් බදු දායකත්වය - අංශ අනුව විශ්ලේෂණය | 32 |
| 2.12 | වගුව | : | සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම - අංශ අනුව විශ්ලේෂණය | 35 |
| 2.13 | වගුව | : | ඍජු බදු සහ වක්‍ර බදු අනුපාතය | 36 |
| 2.14 | වගුව | : | 2024 වර්ෂයෙහි සහ 2025 වර්ෂයෙහි ආදායම් සංසන්දනය | 36 |
| 2.15 | වගුව | : | ඉදිරිපත් කරන ලැබූ/ විසඳනු ලැබූ අභියාචනා සහ පරිපාලන සමාලෝචන සඳහා ඉල්ලීම් පිළිබඳ විශ්ලේෂණය | 37 |
| 2.16 | වගුව | : | බදු වර්ග සඳහා ලියාපදිංචි වී ඇති සංඛ්‍යාව | 38 |
| 2.17 | වගුව | : | 2025.12.31 දිනට අයවිය යුතු බදු පිළිබඳ විශ්ලේෂණය | 39 |
| 2.18 | වගුව | : | ආදායම රැස්කිරීම, මුළු වියදම සහ ආදායම් රැස් කිරීමේ පිරිවැය | 40 |
| 2.19 | වගුව | : | දැනුම්වත් කිරීමේ වැඩසටහන්වල සාරාංශය | 45 |
| 2.20 | වගුව | : | 2024/2025 තක්සේරු වර්ෂය සඳහා සංස්ථාපිත ආදායම් බදු වාර්තා ඉලෙක්ට්‍රොනිකව ගොනුකිරීම | 46 |
| 2.21 | වගුව | : | 2024/2025 තක්සේරු වර්ෂය සඳහා තනි පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා ගොනු කිරීම | 47 |
| 2.22 | වගුව | : | 2025 වර්ෂයේ දී අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ අත්තිකාරම් ආදායම් බදු වාර්තා ගොනු කිරීම | 48 |
| 2.23 | වගුව | : | 2025 වර්ෂයේ දී විශාල බදුගෙවන්නන් (LTOs) විසින් නියමිත වෙලාවට එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීම | 49 |
| 2.24 | වගුව | : | විශාල බදු ගෙවන්නන්ගේ අංශයට අදාළ නොවන වෙනත් ලියාපදිංචි බදු ගෙවන්නන් (Non-LTOs) විසින් 2025 වර්ෂයේ දී එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීම | 49 |
| 2.25 | වගුව | : | සියලුම ලියාපදිංචි බදු ගෙවන්නන් විසින් 2025 වර්ෂයේ දී එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීම | 50 |
| 2.26 | වගුව | : | 2025 වර්ෂයේ දී විශාල බදු ගෙවන්නන් (LTOs) විසින් නියමිත දිනයේදී සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) වාර්තා ගොනු කිරීම | 51 |
| 2.27 | වගුව | : | 2025 වර්ෂයේ දී අනෙකුත් ලියාපදිංචි බදු ගෙවන්නන් (Non-LTOs) විසින් සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) වාර්තා ගොනු කිරීම | 52 |
| 2.28 | වගුව | : | 2025 වර්ෂයේ දී සියලුම ලියාපදිංචි බදු ගෙවන්නන් විසින් සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) වාර්තා ගොනු කිරීම | 52 |
| 2.29 | වගුව | : | විගණන පිළිබඳ විස්තර | 53 |
| 2.30 | වගුව | : | සංස්ථාපිත සහ වෙනත් අංශ මගින් රැස් කරන ලද අතිරේක බදු වර්ගීකරණය | 54 |

| | | | | |
|---|---|---|---|---|
| 2.31 | වගුව | : | විමර්ශන පිළිබඳ විස්තර | 54 |
| 2.32 | වගුව | : | පැහැර හරින ලද බදු රැස් කර ගැනීම සඳහා බදු අභියාචනා කොමිෂන් සභාවේ (TAC) ගොනු කර ඇති අභියාචනා | 54 |
| 2.33 | වගුව | : | ගෙවීම් පැහැර හැර ඇති බදු එකතු කිරීම සඳහා ගොනු කර ඇති නඩු | 55 |
| 4.1 | වගුව | : | 2025 වසර සඳහා නිශ්චිතව දක්වනු ලැබූ කාර්ය සාධන දර්ශක | 118 |
| 5.1 | වගුව | : | තිරසර සංවර්ධන අභිමතාර්ථ පදනම් කර ගත් දේශීය ආදායම් දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම් | 121 |
| 6.1 | වගුව | : | 2025 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩලය | 128 |
| 6.2 | වගුව | : | 2025 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු සාරාංශය | 129 |
| 6.3 | වගුව | : | 2025 වර්ෂය තුළ විශ්‍රාම ගැනීම් | 131 |
| 6.4 | වගුව | : | 2025 වර්ෂය තුළ විශ්‍රාමයාම් සංඛ්‍යාව | 131 |
| 6.5 | වගුව | : | වයස් කාණ්ඩය අනුව කාර්ය මණ්ඩල වර්ගීකරණය | 132 |
| 6.6 | වගුව | : | 2025 වර්ෂය අවසානය වන විට කාර්ය මණ්ඩලයේ සේවා කාලයෙහි ව්‍යාප්තිය | 133 |
| 6.7 | වගුව | : | 2025 වර්ෂය අවසානය වන විට ස්ත්‍රී පුරුෂ භාවය අනුව කාර්ය මණ්ඩලයෙහි ව්‍යාප්තිය | 134 |
| 6.8 | වගුව | : | දේශීය මානව සම්පත් සංවර්ධන වැඩසටහන් | 135 |
| 6.9 | වගුව | : | 2025 වර්ෂයේදී රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සඳහා පවත්වන ලද පුහුණු පාඨමාලා | 136 |

## සටහන් ලේඛනය


| | | | | |
|---|---|---|---|---|
| 2.1 | සටහන | : | 2016 සිට 2025 දක්වා ආදායම් ඇස්තමේන්තුවලට සාපේක්ෂව දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ආදායම් කාර්ය සාධනය | 27 |
| 2.2 | සටහන | : | රජයේ ආදායමට සහ රජයේ බදු ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි දායකත්වය | 28 |
| 2.3 | සටහන | : | සමස්ත ආදායම් රැස්කිරීම - 2025 | 29 |
| 2.4 | සටහන | : | 2025 සහ 2024 වර්ෂ තුළ රැස්කළ සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු මුදල් අනුපාතය | 31 |
| 2.5 | සටහන | : | අංශ අනුව එකතු කළ අගය මත බද්ද (VAT) යටතේ රැස් කරන ලද බදු ආදායම | 33 |
| 2.6 | සටහන | : | දළ දේශීය නිෂ්පාදිතය සඳහා වැට් බදු දායකත්වය - අංශ අනුව විශ්ලේෂණය | 34 |
| 2.7 | සටහන | : | සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම - අංශ අනුව විශ්ලේෂණය | 35 |
| 2.8 | සටහන | : | 2025 වර්ෂයෙහි සහ 2024 වර්ෂයෙහි ආදායම් සංසන්දනය | 37 |
| 6.1 | සටහන | : | වයස් කාණ්ඩය අනුව දේශීය ආදායම් සේවයේ සේවකයින් පිළිබඳ විශ්ලේෂණය | 132 |
| 6.2 | සටහන | : | වයස් කාණ්ඩය අනුව වෙනත් සේවාවන්ට අයත් සේවකයින් පිළිබඳ විශ්ලේෂණය | 132 |
| 6.3 | සටහන | : | සේවා කාලය අනුව දේශීය ආදායම් සේවයේ සේවකයින්ගේ ව්‍යාප්තිය | 133 |
| 6.4 | සටහන | : | ස්ත්‍රී පුරුෂ භාවය අනුව කාර්ය මණ්ඩලයෙහි ව්‍යාප්තිය | 134 |


## ඇමුණුම් ලේඛනය


| | | | | |
|---|---|---|---|---|
| ඇමුණුම | 01 | : | වර්ෂය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද බදු | 145 |
| ඇමුණුම | 02 | : | අවලංගු කර හෝ අහෝසි කර ඇති නමුත් 2025 වර්ෂයේදී ආදායම් රැස් කිරීම සිදු කරන ලද බදු | 147 |
| ඇමුණුම | 03 | : | 2025 දෙසැම්බර් 31 දිනට අනුමත පුණ්‍යායතන | 149 |
| ඇමුණුම | 04 | : | 2025 දෙසැම්බර් 31 දිනට ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම් | 152 |
| ඇමුණුම | 05 | : | පෙර වසර සමඟ ආදායම සංසන්දනය කිරීම | 154 |
| ඇමුණුම | 06 | : | 2025 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බදු පිළිබඳ විශ්ලේෂණය | 155 |
| ඇමුණුම | 07 | : | ප්‍රවර්ධන හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර | 156 |
| ඇමුණුම | 08 | : | විගණකාධිපති වාර්තාව | 162 |
| ඇමුණුම | 09 | : | 2025 වර්ෂය තුළ උසස්වීම් | 201 |
| ඇමුණුම | 10 | : | දේශීය ආදායම් සේවයේ විශ්‍රාම ගත් නිලධාරීන් | 203 |
| ඇමුණුම | 11 | : | 2025 වර්ෂයේ දී පවත්වන ලද විදේශීය මානව සම්පත් සංවර්ධන වැඩසටහන් | 204 |
| ඇමුණුම | 12 | : | සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් 2025 වර්ෂයේ දී පවත්වන ලද පුහුණු වැඩසටහන් | 217 |

## කෙටි යෙදුම්

| | |
|---|---|
| අ.ආ.බ. | අත්තිකාරම් ආදායම් බද්ද |
| අ.පු.ආ.බ. | අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද |
| අ.බ. | අධිභාර බද්ද |
| ආ.බ. | ආදායම් බද්ද |
| උ.වි.ගෙ. | උපයන විට ගෙවීම් බද්ද |
| එ.අ.බ. | එකතු කළ අගය මත බද්ද |
| ජා.ආ.බ. | ජාතික ආරක්ෂක බද්ද |
| ජා.ගො.බ. | ජාතිය ගොඩනැගීමේ බද්ද |
| ති.සං.අ. | තිරසර සංවර්ධන අභිමතාර්ථ |
| දු.දේ.නි. | දළ දේශීය නිෂ්පාදිතය |
| දේ.ආ.දෙ. | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව |
| මු.රෙ. | මුදල් රෙගුලාසි |
| ර.ගැ.බ. | රඳවා ගැනීමේ බද්ද |
| ස.ආ.දා.බ. | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද |



# 01

පරිච්ඡේදය

# ආයතනික පැතිකඩ

# 01 පරිච්ඡේදය

## ආයතනික පැතිකඩ

### 1.1 හැඳින්වීම

#### 1.1.1 දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මෙරට බදු පරිපාලනය සහ ආදායම් රැස් කිරීම සම්බන්ධයෙන් වගකීම දරන ප්‍රධාන රාජ්‍ය ආයතනය වේ. කාර්යක්ෂම සහ සාධාරණ බදුකරණ ක්‍රමයක් තහවුරු කිරීම තුළින් රාජ්‍ය සේවාවන්, යටිතල පහසුකම් සංවර්ධනය හා ජාතික ආර්ථික වර්ධනය සඳහා අරමුදල් සපයමින් මෙම දෙපාර්තමේන්තුව විසින් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 1932 වර්ෂයේ දී පිහිටුවනු ලැබූ අතර බූදල් බද්ද සහ මුද්දර බද්ද ඒකාබද්ධ කිරීමෙන් අනතුරුව එය "ආදායම් බදු, බූදල් බදු සහ මුද්දර බදු දෙපාර්තමේන්තුව" වශයෙන් නම් කරන ලදී. පසුව මෙම දෙපාර්තමේන්තුවෙහි විස්තෘත කාර්යභාරය විදහා දක්වමින් 1958 වසරේ දී එය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වශයෙන් නම් කරන ලදී. 1974 වසරේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ සිදුකරනු ලැබූ මූලික ප්‍රතිව්‍යුහගතකරණයන් තුළින් දේශීය ආදායම් සේවය වෘත්තිය බදු පරිපාලනය පිළිබඳ සංවෘත සේවාවක් ලෙස ස්ථාපනය කරන ලද අතර එතැන් පටන් මේ දක්වා බදු රැස් කිරීමේ ක්‍රියාදාමය නවීකරණය කිරීම සහ බදු ගෙවන්නා වෙත සපයනු ලබන සේවාවන් වැඩි දියුණු කිරීම උදෙසා මෙම දෙපාර්තමේන්තුව තුළ ප්‍රතිසංස්කරණ ගණනාවක් සිදුකොට ඇත.

රජයේ මූල්‍ය අරමුණු සපුරාලීම සඳහා පුළුල් පරාසයක බදු පරිපාලනය කිරීම සහ එකතු කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වගකීමකි. එකී බදු පහත දැක්වේ.

- සංස්ථාපිත ආදායම් බද්ද (CIT)
- පුද්ගල ආදායම් බද්ද (IIT)
- හවුල් ව්‍යාපාර ආදායම් බද්ද (PIT)
- එකතු කළ අගය මත බද්ද (VAT)
- ඔට්ටු සහ සූදු බද්ද (BGL)
- මුද්දර බද්ද (SD)
- ප්‍රාග්ධන ලාභ බද්ද (CGT)
- කොටස් ගනුදෙනු බද්ද (STL)
- විගමන බද්ද (MT)
- ප්‍රේෂණ ගාස්තුව (RF)
- අධිභාර බද්ද (ST)
- ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද (TVD)
- සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL)

මීට අමතරව, ආදායම් එකතු කිරීම සහ අනුකූලතාවය පවත්වාගැනීම පහසු කරගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් අත්තිකාරම් ආදායම් බද්ද (AIT) සහ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) යන බදු ක්‍රම ද ක්‍රියාත්මක කරනු ලැබේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගේ මූලිකත්වයෙන් යුත් ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමකින් සමන්විත වන අතර, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරුන් නව දෙනෙකු, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන් විසි දෙදෙනෙකු සහ කොමසාරිස්වරුන් අනූ දෙනෙකුගෙන් සමන්විත වේ. දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කාර්යයන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරුන්, නියෝජ්‍ය කොමසාරිස්වරුන් සහ සහකාර කොමසාරිස්වරුන්ගෙන් සැදුම්ලත් කාර්ය මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

වඩාත් ඵලදායී සේවාවක් සපයනු ලැබීම සහතික කිරීම සඳහා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට විවිධ රජයේ සේවාවන්හි නිලධාරීන්ගේ සහාය ද ලැබේ. පහත සඳහන් සේවාවන් ඊට ඇතුළත් වේ.

- ශ්‍රී ලංකා පරිපාලන සේවය
- ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය
- ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය
- රජයේ භාෂා පරිවර්තක සේවය
- ශ්‍රී ලංකා පුස්තකාලයාධිපති සේවය
- සංවර්ධන නිලධාරී සේවය
- කළමනාකරණ සේවා නිලධාරී සේවය
- කාර්යාල සේවක සේවය
- ඒකාබද්ධ රියදුරු සේවය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා ඇති අතර ප්‍රාදේශීය මට්ටමින් සේවා සැපයීම සඳහා දිවයින පුරා නගර කාර්යාල සහ ප්‍රාදේශීය කාර්යාල ක්‍රියාත්මක වේ. ආදායම් රැස්කිරීම ඉහළ නංවාලීමට සහ ආර්ථික වර්ධනයට ඇප කැපවී සිටින දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාවේ මූල්‍ය ස්ථාවරත්වය සහ සංවර්ධනය සම්බන්ධයෙන් සුවිශේෂී පාර්ශ්වකරුවෙකු වේ.

### 1.1.2 දැක්ම හා මෙහෙවර ප්‍රකාශය




### 1.1.3 ප්‍රධාන අරමුණු හා ඉලක්ක

- රජයේ ආදායම් ඉලක්ක සපුරා ගැනීම
- ස්වේච්ඡා බදු ගෙවන්නන්ගේ අනුකූලතාව සහ ස්වයං තක්සේරුව සඳහා පහසුකම් සැලසීම
- මෙහෙයුම් නොකරන මූලස්ථානයක් විසින් අධීක්ෂණය කරනු ලබන ආංශිකකරණය මත පදනම් වූ කාර්යක්ෂම හා ඵලදායී සංවිධානයක් ගොඩනැගීම
- දෙපාර්තමේන්තුවෙහි විශ්වසනීයබව, ඵලදායීතාව සහ අනුවර්තනය වීමේ හැකියාව ඉහළ නංවාගැනීම සහ කාර්ය මණ්ඩලයේ නිපුණතා හා වෘත්තීය දක්ෂතා වැඩිදියුණු කිරීම
- විධිමත් ව්‍යාපාර ක්‍රියාවලි, තාක්ෂණය සහ දත්ත උපයෝගී කර ගනිමින් බදු ගෙවන්නන් වෙත ලබා දෙන සේවාවන් වැඩිදියුණු කිරීම
- සමීප සහයෝගීතාවයෙන් කටයුතු කර පාර්ශ්වකරුවන් සමග විශ්වසනීය සබඳතා ගොඩනගා ගැනීම

## 1.2 සංවිධාන ව්‍යුහය




* මෙම අංශය 2025.04.20 දින සිට අහෝසි කර ඇත .

** මෙම අංශය 2025.04.10 දින සිට අහෝසි කර ඇත .

## 1.3 කළමනාකරණ කණ්ඩායම

| 2025 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන නිලධාරීන් | |
|---|---|
| ආර්. පී. එච්. ප්‍රනාන්දු මිය | දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |

| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරු | |
|---|---|
| එස්. පී. රණසිංහ මිය | බදු පරිපාලන - ඉහළ සංස්ථාපිත කාර්යාලය |
| ජේ. ඩී. රණසිංහ මිය | බදු පරිපාලන - නගර කාර්යාල හා ප්‍රාදේශීය කාර්යාල |
| ආචාර්ය එන්. ටී. ඒ. දිසානායක මිය | පාරිභෝගික සේවා හා ප්‍රවර්ධන |
| ඩී. එම්. එන්. එස්. බී. දිසානායක මයා | බදු පරිපාලන - මධ්‍ය සංස්ථාපිත කාර්යාලය |
| වී. කේ. ඒ. තුසිතාංජලී මිය | බදු පරිපාලන - විශාල බදු ගෙවන්නන්ගේ කාර්යාලය |
| ඩබ්ලිව්. එම්. ආර්. බණ්ඩාර මයා | මානව ප්‍රාග්ධන සහ වත්කම් පරිපාලන |
| ජේ. එම්. එස්. එස්. රත්නවර්ධන මයා | බදු ප්‍රතිපත්ති, ජාත්‍යන්තර බදු කටයුතු හා නීති |
| කේ. ජී. පී. කේ. ධර්මවර්ධන මයා | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පරිපාලන සහ බදු මෙහෙයුම් සහාය |
| එන්. එම්. ඒ. කේ. බී. නාපාන මයා | බදු ආවේක්ෂණ හා ප්‍රභව බදු පරිපාලන |

| ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරු | |
|---|---|
| ඩී. එල්. සමරවික්‍රම මිය | ඉහළ සංස්ථාපිත අංශ අභියාචනා, හිඟ බදු අය කිරීම් සහ ආපසු ගෙවීම් |
| එච්. එස්. එස්. කුමාර මයා | විශාල බදු අංශ - මූල්‍ය සහ ඉහළ වටිනාකම් සහිත පුද්ගල |
| වී. ජී. ආර්. කුමාර මයා | මානව සම්පත් සංවර්ධන සහ කළමනාකරණ |
| එම්. කේ. පී. ජේ. එස්. එස්. පෙරේරා මයා | ඉහළ සංස්ථාපිත අංශ මූල්‍ය, නිෂ්පාදන හා සේවා |
| ටී. එම්. එස්. එම්. තෙන්නකෝන් මිය | බදු ආවේක්ෂණ හා ප්‍රභව බදු පරිපාලන 01 |
| එස්. ඩී. සී. මල්කාන්ති මිය | වංචා වැළැක්වීමේ හා අභ්‍යන්තර විමර්ශන |
| එම්. එල්. ජේ. ජී. චන්ද්‍රසිරි මයා | උපායමාර්ගික මෙහෙයුම් හා අනුකූලතා සහාය |
| එම්. ඒ. ප්‍රියංක මයා | ඉහළ සංස්ථාපිත අංශ සේවා සහ තොග හා සිල්ලර |
| එස්. ජාසිංහ මිය | මධ්‍ය පරිමාණ සංස්ථාපිත අංශ - මූල්‍ය, නිෂ්පාදන, සේවා සහ තොග හා සිල්ලර |
| එච්. එච්. ටී. ප්‍රියන්ති මිය | විශාල බදු අංශ සේවා, තොග හා සිල්ලර |
| එච්. එස්. ජේ. රණසිංහ මයා | පාරිභෝගික සේවා සහ ප්‍රවර්ධන |
| ඩී. එම්. එන්. ඩී. දසනායක මිය | ලියාපදිංචි කිරීම හා යාවත්කාලීන කිරීම |
| ජේ. ඩී. දිමන්ත මයා | ප්‍රාදේශීය කාර්යාල |
| ඊ. කේ. පී. බී. ඒකනායක මයා | ප්‍රසම්පාදන හා වත්කම් කළමනාකරණ |
| එස්. ඕ. ඒ. සී. ආර්. නිවුන්හැල්ල මිය | නගර කාර්යාල, VIP සහ RTP |
| ඒ. එම්. නජීල් මයා | ලේකම් අංශය හා නීති |
| ඩබ්. ඩී. ඒ. ඒ. වලිමිණි මයා | විශාල බදු අංශ - අභියාචනා, හිඟ බදු අය කරගැනීම, ආපසු ගෙවීම් |
| ජේ. එන්. රාජපක්ෂ මෙනෙවිය | අන්තර් ආයතන සම්බන්ධතා |
| ඒ. කේ. ලොකුබාලසූරිය මයා | බදු ආවේක්ෂණ හා ප්‍රභව බදු පරිපාලන 02 |
| එම්. ඒ. වී. ජයසිරි මයා | විශාල බදු අංශ - උපායමාර්ගික මෙහෙයුම් සහ අපනයන ආපසු ගෙවීම් |
| ඒ. එල්. ඩී. සංජීව මයා | මධ්‍ය පරිමාණ සංස්ථාපිත අංශ අභියාචනා, හිඟ බදු අය කරගැනීම සහ ආපසු ගෙවීම් |
| එස්. අයි. අසන්ති මිය | විශාල බදු අංශ - නිෂ්පාදන |

| ප්‍රධාන මූල්‍ය නිලධාරී (වැ.බ.) | |
|---|---|
| ඩබ්. එන්. ආර්. සී. කුමාරි මිය | මූල්‍ය අංශය |



# 02

පරිච්ඡේදය

## ප්‍රගතිය සහ ඉදිරි දැක්ම

# 02 පරිච්ඡේදය

## I කොටස - බදු ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම

### 2.1 හැඳින්වීම

බදු ප්‍රතිපත්ති ඵලදායී ලෙස ක්‍රියාවට නැංවීම, ශ්‍රී ලංකාවේ මූල්‍ය රාමුවෙහි ඉතා වැදගත් අංගයකි. බදු ප්‍රතිපත්ති, රටෙහි ආදායම් බළ මුළු ගැන්වීම සහ ආර්ථික සංවර්ධනය කෙරෙහි සෘජු බලපෑමක් ඇති කරනු ලබයි. බදු අනුකූලතාවය සහ සාධාරණත්වය පවත්වා ගනිමින් ප්‍රශස්ත ලෙස ආදායම් රැස් කිරීම සඳහා රජයේ බදු ප්‍රතිපත්ති, සවිමත් පරිපාලන ක්‍රියාමාර්ග බවට පත්කරගනු ලබන බවට සහතික වෙමින් 2025 වර්ෂයේ දී, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් රජයේ බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ වගකීම භාරගෙන ඇත. සාධාරණ හා කාර්යක්ෂම බදු ක්‍රමයක් පවත්වාගෙන යෑම සඳහා රජයේ කැපවීම පිළිබිඹු කරමින්, වසර තුළ හඳුන්වා දුන් මූලික බදු ප්‍රතිසංස්කරණ සහ ප්‍රතිපත්ති සංශෝධන ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ගත් විධිමත් ක්‍රියාමාර්ග මෙම පරිච්ඡේදය තුළින් විස්තර කෙරේ.

නව්‍යකරණය වූ බදු පරිපාලන ක්‍රියාවලීන් හඳුන්වාදීම, බදු අනුකූලතාවය පිළිබඳ රාමු සවිමත් කරගැනීම සහ බදු ගෙවන්නන් සඳහා සලසනු ලබන සේවාවන් වැඩිදියුණු කිරීම ඇතුළුව බදු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමට සහාය වන යාන්ත්‍රණයන් වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් 2025 වර්ෂය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි අවධානය යොමු විය. ඒ අනුව, නැගී එන ආර්ථික අභියෝගවලට මුහුණ දෙමින් මූල්‍ය ඒකාබද්ධතාවය පවත්වාගැනීම සහ ආර්ථික ඔරොත්තු දීමේ හැකියාව ඇති කරගැනීම වැනි පුළුල් අභිමතාර්ථ රැසක් සාධනය කරගැනීම උදෙසා බදු පදනම පුළුල් කිරීම, බදු පැහැර හැරීම වළක්වා ගැනීම සහ බදු පද්ධතියෙහි විනිවිදභාවය වැඩි දියුණු කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබූ අතර තිරසාර සංවර්ධනය සහ මූල්‍ය වගකීම පිළිබඳ රජයේ පුළුල් න්‍යාය පත්‍රය සඳහා එමගින් සුවිශේෂි සහායක් හිමි විය.

එමෙන්ම, මෙරට විවිධ ආර්ථික ස්තර වෙත බදු පද්ධතියෙහි ප්‍රතිචාරත්මක බව සහතික කරමින් බදු ගෙවන්නන්, රාජ්‍ය ආයතන සහ සංවර්ධනයෙහි හවුල්කරුවන් ඇතුළු පාර්ශ්වයන්ගේ සහයෝගීතාවයෙන් යුතුව බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ද, 2025 වර්ෂයේදී සිදු විය. එම සාමූහික ප්‍රයත්න තුළින්, ශ්‍රී ලංකාවේ සාර්ව ආර්ථික ස්ථාවරත්වය සහ ජාතික සංවර්ධන ප්‍රමුඛතා සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් සැලකිය යුතු දායකත්වයක් අඛණ්ඩව ලබා දී තිබේ.
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ බදු නීති සඳහා 2025 වර්ෂය තුළ දී හඳුන්වා දුන් සංශෝධන එහි සංක්ෂිප්ත තොරතුරු ද ඇතුළත් ව මෙම පරිච්ඡේදය තුළින් විමසා බලනු ලබයි.

### 2.2 බදු නීති සංශෝධනය කිරීම සඳහා 2025 වර්ෂයේදී පනවනු ලැබූ නීති

පහත සඳහන් සංශෝධන පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබූ අතර දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් වසර තුළ ක්‍රියාත්මක කරන ලදී.

- 2025 අංක 2 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත
- 2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත
- 2025 අංක 24 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත
- 2025 අංක 25 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු ( සංශෝධන) පනත

#### 2.2.1 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සඳහා සිදු කරනු ලැබූ සංශෝධන

ආදායම් බද්දට අදාළ බදු ප්‍රතිපත්ති වෙනස්කම් කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා, 2025 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සංශෝධන පනතක් සම්මත කරන ලදී.

#### 2.2.1.1 2025 අංක 2 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

2025 මාර්තු 20 වන දින ගරු කථානායකතුමා විසින් සහතිකය සටහන් කොට ඇති 2025 අංක 2 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත මගින් ඉදිරිපත් කරනු ලැබූ ප්‍රතිපත්ති වෙනස්කම් පහත දැක්වේ:

- **පුද්ගලික සහනය (Personal Relief)**

2025/2026 වර්ෂයේ සිට ආරම්භ වන ඕනෑම තක්සේරු වර්ෂයක් සඳහා ශ්‍රී ලංකාවේ වාසික පුද්ගලයෙකුගේ හෝ ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන නිර්වාසික පුද්ගලයෙකුගේ බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේදී අඩු කළ හැකි පුද්ගලික සහනය රු. 1,200,000 සිට රු. 1,800,000 දක්වා වැඩි කර ඇත.

- **2025 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන පරිදි ආදායම් බදු අනුපාත සංශෝධනය කිරීම**

2025 අප්‍රේල් 01 වන දින සිට, තක්සේරු වර්ෂයක් සඳහා වාසික හෝ නිර්වාසික පුද්ගලයෙකුගේ බදු අය කළ හැකි ආදායම පහත පරිදි ගණනය කෙරේ.

**2.1 වගුව : 2025 අප්‍රේල් 01 දින සිට බලාත්මක තනි පුද්ගල ආදායම් බදු අනුපාත**

| බදු අයකළ හැකි ආදයම | ගෙවිය යුතු බද්ද |
|---|---|
| රු 1,000,000 නොඉක්මවන | රු. 0ට අතිරික්ත මුදලින් 6% |
| රු 1,000,000 ඉක්මවන නමුත් රු 1,500,000 නොඉක්මවන | රු. 60,000ක් වූ මුදලක් සහ රු. 1,000,000ට අතිරික්ත මුදලින් 18% |
| රු 1,500,000 ඉක්මවන නමුත් රු 2,000,000 නොඉක්මවන | රු. 150,000ක මුදලක් සහ රු. 1,500,000ට අතිරික්ත මුදලින් 24% |
| රු 2,000,000 ඉක්මවන නමුත් රු 2,500,000 නොඉක්මවන | රු. 270,000ක මුදලක් සහ රු. 2,000,000ට අතිරික්ත මුදලින් 30% |
| රු 2,500,000 ඉක්මවන | රු. 420,000ක මුදලක් සහ රු. 2,500,000ට අතිරික්ත මුදලින් 36% |

*මූලාශ්‍රය: 2025 අංක 2 දරන දේශීය ආදයම් (සංශෝධන) පනත*

2025 අප්‍රේල් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, සේවා අපනයන සහ විදේශ මූලාශ්‍ර ආදායම් මත ආදායම් බදු නිදහස් කිරීම් ඉවත් කරනු ලැබූ අතර, 2025 අප්‍රේල් 01 දින සිට ආරම්භ වන සෑම තක්සේරු වර්ෂයක් සඳහා ම 15% උපරිම ප්‍රතිශතයකට යටත් ව ඒ සඳහා බදු අයකරනු ලැබේ.

- ශ්‍රී ලංකාවෙන් පිටත දී ප්‍රයෝජනයට ගැනීම පිණිස ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී යම් තැනැත්තෙකු වෙත සපයනු ලබන සේවා සඳහා වන ගෙවීම, විදේශීය ව්‍යවහාර මුදලින් ලැබෙන අවස්ථාවක දී සහ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවකදී, ඒ සේවා සැපයීමෙන් ලැබුණු හෝ උපයන ලද ලැබීම් සහ ලාභ

- යම් විදේශීය මූලාශ්‍රයකින් ලැබෙන හෝ උපයනු ලබන ලැබීම් සහ ලාභ විදේශ ව්‍යවහාර මුදලින් ලැබෙන හෝ උපයනු ලබන අවස්ථාවකදී සහ බැංකුවක් හරහා ශ්‍රී ලංකාවට ප්‍රේෂණය කරනු ලබන අවස්ථාවකදී ඒ විදේශීය මූලාශ්‍රයෙන් ලැබුණු හෝ උපයන ලද ලැබීම් සහ ලාභ

2025 අප්‍රේල් 01 දින සිට පහත සඳහන් ලැබීම් සහ ලහ සඳහා 45% අනුපාතයකින් බදු අයකරනු ලැබේ.

- ඔට්ටු ඇල්ලීමෙන් සහ සූදු ක්‍රීඩා පැවැත්වීමෙන් ලැබෙන ලැබීම් සහ ලාභ
- යම් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයක් අපනයනය කිරීමෙන් හැර, යම් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයක් නිෂ්පාදනය කොට විකිණීමෙන් හෝ ආනයනය කොට විකිණීමෙන් ලැබෙන ලැබීම් සහ ලාභ

- **පොලී සහ වට්ටම් සඳහා අත්තිකාරම් ආදායම් බදු**

2025 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි පොලිය හෝ වට්ටම් මත අයකරනු ලබන අත්තිකාරම් ආදායම් බද්ද 10%ක අනුපාතයකින් මූලාශ්‍රයේදී අඩු කිරීමකට යටත් වන අතර, 5%ක අත්තිකාරම් ආදායම් බදු අනුපාතය 2025 මාර්තු 31 දක්වා අදාළ වේ.

- **ආදායම් බදු ආපසු ගෙවීමේ ක්‍රියා පටිපාටියෙහි වෙනස්කම්**

2025/2026 තක්සේරු වර්ෂයේ සිට ආරම්භ වන කිසියම් තක්සේරු වර්ෂයක් සඳහා වාසික පුද්ගලයෙකු විසින් බදු වාර්තාවක් ඉදිරිපත් කොට රු. 180,000 දක්වා බදු මුදල් ආපසු ගෙවීමක් ඉල්ලා සිටින්නේ නම්, බදු විගණනයකට පෙර, එම හිමිකම් පෑමෙන් මාස තුනක කාලයක් ඇතුළත කොමසාරිස් ජනරාල්වරයා විසින් අදාළ ආපසු ගෙවීම සිදු කළ යුතුය.

බදු විගණනයකට පෙර, කාර්තුමය ආපසු ගෙවීමේ හිමිකම් පෑම රු. 45,000 නොඉක්මවන්නේ නම්, ජුනි 30, සැප්තැම්බර් 30, දෙසැම්බර් 31 සහ මාර්තු 31 යන දිනවලින් අවසන් වන කාර්තු අවසානයේ දී එම කාර්තු සඳහා බදු මුදල් ආපසු ගෙවීම් ලබා ගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන් (දේශීය ආදායම් පනතෙහි 195 වන වගන්තියේ අර්ථ දක්වා ඇති පරිදි) හිමිකම් ලබයි.

2024/2025 තක්සේරු වර්ෂයේ සිට, බදු වාර්තාවක්

ගොනු කළ යුතු අදාළ තක්සේරු වර්ෂයේ අවසාන දින සිට මාස 30ක කාලයක් ඇතුළත බදු ගෙවන්නා විසින් බදු මුදල් ආපසු ගෙවීමේ හිමිකම් පෑම් ඉදිරිපත් කළ යුතුය.

### 2.2.2 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සඳහා සිදු කළ සංශෝධන

එකතු කළ අගය මත බදු පනතට අදාළ සංශෝධන කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා 2025 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සංශෝධන පනතක් සම්මත කර ගන්නා ලදී.

### 2.2.2.1 2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

2025 අප්‍රේල් 11 වන දින ගරු කථානායකවරයා විසින් සහතික කරන ලැබූ 2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මගින් පහත සඳහන් සංශෝධන දක්වා ඇත.

- **නිර්වාසික තැනැත්තෙකු විසින් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා සපයනු ලබන සේවා සඳහා එකතු කළ අගය මත බදු පැනවීම**

2026 අප්‍රේල් 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි නිර්වාසික පුද්ගලයෙකු විසින් ශ්‍රී ලංකාව තුළ සිටින පුද්ගලයෙකු සඳහා ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා සපයනු ලබන ඩිජිටල් සේවාවන් සඳහා එකතු කළ අගය මත බදු අදාළ වේ. 2025 සැප්තැම්බර් 03 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, මෙම ඩිජිටල් සේවාවන් සඳහා වැට් බද්ද ක්‍රියාත්මක කිරීම 2026 අප්‍රේල් 01 දක්වා කල් දැමීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. පසුව, එය ක්‍රියාත්මක කිරීම 2026 ජූලි 01 දක්වා නැවතත් කල් දමන ලදී.

- **සරල කරන ලද එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමය (SVAT) අවලංගු කිරීම සහ අවදානම් මත පදනම් වූ ආපසු ගෙවීමේ ක්‍රමය හඳුන්වා දීම**

2025 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි සරල කරන ලද අගය එකතු කළ අගය මත බදු යෝජනා ක්‍රමය අවලංගු කරනු ලැබූ අතර ඒ වෙනුවට අවදානම් මත පදනම් වූ ආපසු ගෙවීමේ ක්‍රමය හඳුන්වා දෙනු ලැබීය. මෙහිදී, සුදුසුකම් ලබන අපනයනකරුවෙකුගේ හෝ බදු අය කළ හැකි කාල සීමාව තුළ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති හෝ විශේෂ ව්‍යාපෘති සඳහා කරනු ලබන සැපයුම්වල වටිනාකම එම බදු අය කළ හැකි කාල සීමාවේ මුළු සැපයුම්වල වටිනාකමෙන් 50% ඉක්මවන තැනැත්තෙකුගේ හෝ එකතු කළ අගය මත බදු පනතේ 22 (7) වගන්තිය යටතේ අනුමත කරන ලද ව්‍යාපෘති සඳහා ලියාපදිංචි තැනැත්තෙකුගේ අතිරික්ත යෙදවුම් බද්ද අගය කළ අගය මත බදු වාර්තාව නිසි පරිදි භාර දීමට යටත්ව, එම වාර්තාව භාර දීමට නියමිත දින සිට දින 45ක් ඉක්ම යාමට පෙර ආපසු ගෙවනු ලැබේ.

- **ශූන්‍ය අනුප්‍රමාණගත සැපයුම් (Zero Rated Supplies)**

එ.අ.බ. පනතේ (සංශෝධිත පරිදි) 7 වැනි වගන්තියේ විධිවිධානය ප්‍රකාරව ශූන්‍ය අනුප්‍රමාණගත භාණ්ඩ හෝ සේවා සැපයුම්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී ශ්‍රී ලංකාවේ බැංකුවක් හරහා විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලැබිය යුතුය යන කොන්දේසියට යටත් වේ. කෙසේ වෙතත්, නිශ්චිතව මාස හයක කාලයක් තුළ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවක් හරහා විදේශ මුදලින් ගෙවීම් නොලැබුණහොත්, එවැනි සැපයුම්වලට ආරෝපණය කළ හැකි යෙදවුම් බදු ප්‍රමාණය අඩු කිරීමට ඉඩ නොදෙන අනුරූප විධිවිධාන අදාළ වන්නේ 2025 අප්‍රේල් 10 වැනිදා දක්වා පමණි.

ඉහත සඳහන් කළ පරිදි ශූන්‍ය අනුප්‍රමාණගත භාණ්ඩ හෝ සේවා සැපයුම් සඳහා වන ගෙවීම් අදාළ මාස හයක කාල සීමාව තුළ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවක් හරහා විදේශ මුදල් වශයෙන් නොලැබුණි නම්, එම සැපයුම්වලට අදාළ යෙදවුම් බද්ද අඩු කිරීමට අවසර ලබා නොදීම සඳහා වූ විධිවිධානය 2025 අප්‍රේල් 10 වන දින දක්වා පමණක් බල පැවැත්විණි.

- **වාණිජමය ආනයනකරුවන්/ අපනයනකරුවන් එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචිය අනිවාර්ය කිරීම**

වාණිජමය අරමුණු සඳහා භාණ්ඩ ආනයනය කරන හෝ අපනයනය කරන සියලුම තැනැත්තන්, පිරිවැටුම් සීමාවන් හෝ බදු නිදහස් කිරීම් නොසලකා, එකතු කළ අගය මත බදු පනත යටතේ ලියාපදිංචි වීම අවශ්‍ය වේ.

- **සැපයුමේ වටිනාකම ශූන්‍ය ලෙස සලකනු ලබන සැපයුම්**

2024 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් සැපයුම්වල සැපයුම් වටිනාකම එකතු කළ අගය මත බදු පනතේ කාර්ය සඳහා ශූන්‍ය වටිනාකමක් ලෙස සලකනු ලැබේ.

- සේවායෝජකයකු විසින් නොමිලයේ හෝ සහනදායී මිලට ඔහුගේ සේවා නියුක්තිකයන්ට ආහාර හෝ පදිංචි ස්ථානය සහ කාර්යාලය අතර මෝටර් කෝච් රථයක් මගින් ප්‍රවාහන පහසුකම් සපයා ඇති අවස්ථාවක එම සැපයුම්වල වටිනාකම

- ශ්‍රී ලංකාවෙන් පිටත ප්‍රතිරක්ෂණකරුවකුගෙන් බැංකුවක් හරහා යම් දේශීය රක්ෂණ සමාගමක් වෙත විදේශ ව්‍යවහාර මුදලින් ලැබෙන යම් ප්‍රතිරක්ෂණ කොමිස් මුදලක් හෝ යම් වන්දි මුදලක්

- ආණ්ඩුවේ හෝ එහි පළාත් සභාවක යම් භාවිත නොකළ තැපැල් හා ආදායම් මුද්දරවල මුහුණත වටිනාකම

- **එකතු කළ අගය මත බදු වාර්තා ඉලෙක්ට්‍රොනිකව ගොනු කිරීම අනිවාර්ය කිරීම**

2025 ජූලි 01 වන දින සිට එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි සියලුම තැනැත්තන් ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කළ යුතුය. ලිඛිතව වාර්තාවක් භාර දීමට ඉල්ලීමක් කරන තැනැත්තෙකුට, කොමසාරිස් ජනරාල්වරයා විසින් යෝග්‍ය යැයි සලකනු ලබන විශේෂ අවස්ථාගත කරුණුවලදී පමණක් අවසර දෙනු ලැබේ.

- **"සකස් නොකළ කෘෂිකාර්මික නිෂ්පාදන" සඳහා පහත සඳහන් අර්ථ නිරූපණය හඳුන්වා දීම**

"භූමියේ හෝ හරිතාගාරයක වගා කරන ලද ශාකවලින් ලබාගත් ඕනෑම නිෂ්පාදනයක් අදහස් වන අතර, එම නිෂ්පාදන පිරිසිදු කිරීම, ප්‍රමාණකරණය කිරීම, තේරීම, වර්ග කිරීම, ශ්‍රේණිගත කිරීම, කැපීම හෝ සිසිල් කිරීම යන මූලික සැකසුම් පියවර මගින් විකිණීම සඳහා සකස් කරනු ලබන නිෂ්පාදන ද ඊට ඇතුළත් වේ".

බිත්තර සැපයීම සඳහා ලබාදී තිබූ නිදහස් කිරීම 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනතේ ප්‍රතිපාදන අනුව ඉවත් කරන ලද අතර 2024 ජනවාරි 01 දින සිට බිත්තර සැපයීම 18% අනුපාතය යටතේ බද්දට යටත් වේ. ඉහත නව අර්ථ නිරූපණය හා බිත්තර සැපයීම බද්දට යටත්වීම අතර කිසිදු සම්බන්ධයක් නොමැත.

- **නව නිදහස් කිරීම් (2025 අප්‍රේල් 11 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි)**

විදුලිබලය උත්පාදනය කිරීම පිණිස ලංකා විදුලිබල මණ්ඩලය වෙත සපයනු ලැබීම සඳහා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් රසායනික නැප්තා සැපයීම සහ ආනයනය කිරීම;

දේශීය වශයෙන් නිෂ්පාදිත නැවුම් කිරිවලින් නිෂ්පාදනය කරනු ලබන දියර කිරි සහ යෝගට් සැපයීම, මෙම නිදහස් කිරීම සඳහා සුදුසුකම් ලැබීම පිණිස දියර කිරිවල හෝ යෝගට්වල යටත් පිරිසෙයින් 50%ක් දේශීය වශයෙන් නිෂ්පාදිත නැවුම් කිරි අඩංගු විය යුතුය.

- **නිදහස් කිරීම් ඉවත් කිරීම (2025 අප්‍රේල් 11 සිට ක්‍රියාත්මක වන පරිදි)**

රේගු කාර්යයන් සඳහා නිශ්චිතව සඳහන් කරන ලද සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ හඳුනාගෙන ඇති ගුවන්යානා එන්ජින් හෝ ගුවන්යානා අමතර කොටස් ආනයනය කිරීම සඳහා ලබා දී තිබූ නිදහස් කිරීම ඉවත් කරන ලදී.

**2.2.3 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සඳහා සිදුකළ සංශෝධන**

සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට අදාළ සංශෝධන කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා 2025 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සංශෝධන පනතක් සම්මත කර ගන්නා ලදී.

**2.2.3.1 2025 අංක 24 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත**

2025 දෙසැම්බර් 17 වන දින ගරු කථානායකවරයා විසින් සහතික කරන ලැබූ 2025 අංක 24 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත මගින් පහත සඳහන් සංශෝධන දක්වා ඇත.

- ශ්‍රී ලංකාව තුළ මූල්‍ය සේවා සපයනු ලබන ව්‍යාපාරයක් කරගෙන යන ඕනෑම තැනැත්තෙකු විසින් සපයනු ලබන, 20.5% ක එකතු කළ අගය මත බද්දට යටත් වන මූල්‍ය සේවාවන්, 2025 දෙසැම්බර් 17 වන දින සිට බලපැවැත්වෙන පරිදි සමාජ ආරක්ෂණ දායකත්ව බද්දෙන් (SSCL) නිදහස් කර ඇත.

- **නිදහස් කිරීම් පිළිබඳ සීමා**
  විදුලිබල උත්පාදනය සඳහා යන්ත්‍රෝපකරණ සහ උපකරණ ආනයනය හෝ දේශීයව මිලදී ගැනීම

  ලංකා විදුලිබල මණ්ඩලය හෝ ලංකා විදුලිබල මණ්ඩලය වෙත විදුලිය සපයනු ලබන ආයතන විසින් විදුලිබල උත්පාදනය සඳහා දේශීයව මිලදී ගන්නා ලද හෝ ආනයනය කරන ලද යන්ත්‍රෝපකරණ හෝ උපකරණ (අනුමත රේගු සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක යටතේ වර්ගීකරණය කර මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද) සඳහා මීට පෙර අදාළ වූ නිදහස් කිරීම 2025 පෙබරවාරි 18 වන දින සිට

ක්‍රියාත්මක වන පරිදි අත්හිටුවන ලදී. ඒ අනුව, 2025 පෙබරවාරි 18 වන දින හෝ ඊට පසු සිදු කරන ලද සියලුම සැපයුම් සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බදු අදාළ වේ.

- **පැහැදිලි කරනු ලැබූ නිදහස් කිරීම්**
  පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් සිල්ලර සහ තොග වෙළඳාම :
  2025 ජූලි 01 වන දිනට පෙර, පිරවුම්හල් තුළ පමණක් අලෙවි කරන පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් සඳහා පමණක් නිදහස් කිරීම් අදාළ වූ අතර, 2025 ජූලි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, මෙම නිදහස් කිරීම පෙට්‍රල්, ඩීසල් හෝ භූමිතෙල් අලෙවිය සඳහා පොදුවේ අදාළ වන පරිදි පුළුල් කරන ලදී.

  භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය:
  2025 දෙසැම්බර් 17 වන දිනට පෙර, භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය සඳහා නිදහස් කිරීම අදාළ විය. 2025 දෙසැම්බර් 17 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, බහාලුම් පර්යන්ත ක්‍රියාකරුවන් විසින් අන්තර්ජාතික ප්‍රවාහනයට අදාළව සපයනු ලබන සේවාවන් සමග භාණ්ඩ හා මගීන් ප්‍රවාහනය ඇතුළත් කිරීම සඳහා නිදහස් කිරීම තවදුරටත් පුළුල් කරන ලදී.

**2.2.4 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීමේ සහ සූදු බදු පනත සඳහා සිදු කළ සංශෝධන**

1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීමේ සහ සූදු බද්දට අදාළ බදු ප්‍රතිපත්ති වෙනස්කම් කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා, 2025 වර්ෂයේදී පාර්ලිමේන්තුව විසින් සංශෝධන පනතක් සම්මත කරන ලදී.

**2.2.4.1 2025 අංක 25 දරන ඔට්ටු ඇල්ලීමේ සහ සූදු බදු (සංශෝධන) පනත**

2025 දෙසැම්බර් 17 වන දින ගරු කථානායකතුමා විසින් සහතික කරන ලද 2025 අංක 25 දරන ඔට්ටු ඇල්ලීමේ සහ සූදු බදු (සංශෝධන) පනත මගින් ගෙන එන ලද බදු ප්‍රතිපත්ති වෙනස්කම් පහත පරිදි වේ:

- **කැසිනෝ ඇතුළුවීමේ බද්ද ඇමරිකානු ඩොලර් 50 සිට ඇමරිකානු ඩොලර් 100 දක්වා වැඩි කර ඇත.**
  ශ්‍රී ලංකාවේ සූදු ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලබන සෑම තැනැත්තෙකු විසින්ම, 2026 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, එවැනි සූදු ව්‍යාපාර ස්ථානයකට ඇතුළු වන ශ්‍රී ලාංකික පුරවැසියෙකුගෙන් එක්සත් ජනපද ඩොලර් සියයක් හෝ එයට සමාන පරිවර්තනය කළ හැකි වෙනත් විදේශ ව්‍යවහාර මුදලකින් හෝ ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදලින් කැසිනෝ ඇතුළුවීමේ බද්ද (CEL) අය කරනු ලැබිය යුතුය.

- **සෑම ඔට්ටු ඇල්ලීමේ සහ සූදු ව්‍යාපාරයක් සඳහා දළ එකතුව මත බද්ද 15% සිට 18% දක්වා වැඩි කර ඇත.**
  2026 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, බුකීකරුවෙකුගේ ව්‍යාපාරයකින් හෝ සූදු ව්‍යාපාරයකින් ලැබෙන දළ එකතුව මසකට රුපියල් මිලියනය ඉක්මවන්නේ නම්, එවැනි ව්‍යාපාරයකින් ලබන දළ එකතුව මත බදු අනුප්‍රමාණය සියයට දහඅට (18%) දක්වා වැඩි කර ඇත.

**2.2.5 වසර තුළ නිකුත් කරන ලද ගැසට් නිවේදන**

2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත සහ 2002 අංක 14 දරන අගය එකතු කළ බදු පනත යටතේ පහත සඳහන් ගැසට් නිවේදන වසර තුළ නිකුත් කරන ලදී.

**2.2.5.1 2025 මාර්තු 27 දිනැති අංක 2429/39 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය**

2025 අප්‍රේල් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි, කල්බදු හෝ කුලී ගිවිසුමේ (කුලී මිලදී ගැනීමේ ගිවිසුමක් හැර) අඩංගු මුළු කාලය සඳහාම ගෙවිය යුතු ඕනෑම වාරිකයක් ඇතුළුව, සමස්ත කල්බදු හෝ කුලී මුදලේ සෑම රු. 1,000 ක් හෝ එහි කොටසක් සඳහා මුද්දර ගාස්තුව රු. 10 සිට රු. 20 දක්වා වැඩි කරනු ලැබේ.

කුලී මිලදී ගැනීමේ ගිවිසුම් සඳහා 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත යටතේ අය කරන ලද මුද්දර ගාස්තුව නොවෙනස්ව පවතී.

**2.2.5.2 2025 ජූලි 01 දිනැති අංක 2443/30 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය**

මෙම අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් 2025 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකාවේ පුද්ගලයෙකුට ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා නිර්වාසික පුද්ගලයෙකු විසින් සේවා සැපයීමේදී එකතු කළ අගය මත බද්ද ගණනය කර ගෙවිය යුතු ආකාරය සහ ඊට අදාළ කරුණු නිශ්චිතව දැක්වීම සඳහා නියෝගයක් ප්‍රකාශයට පත් කරන ලදී. 2025 සැප්තැම්බර් 03 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී, නිර්වාසික සේවා සපයන්නන් විසින් ඉලෙක්ට්‍රොනික වේදිකාවක් හරහා සේවා සැපයීමේදී එකතු කළ අගය මත බද්ද ක්‍රියාත්මක කිරීමේ දිනය 2026 අප්‍රේල් 01 දක්වා කල් දැමීමට අනුමැතිය ලබා දී ඇත. පසුව, එය ක්‍රියාත්මක කිරීම 2026 ජූලි 01 දක්වා නැවතත් කල් දමන ලදී.

**2.2.5.3 2025 සැප්තැම්බර් 29 දිනැති අංක 2456/02 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය**

මෙම අතිවිශේෂ ගැසට් නිවේදනය මගින්, 2025 ඔක්තෝබර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි අවදානම මත පදනම් වූ ආපසු ගෙවීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා කොන්දේසි සහ අවශ්‍යතා නිශ්චිතව දක්වමින් නියෝගයක් ප්‍රකාශයට පත් කරනු ලැබිණි.

#### 2.2.5.4 2025 නොවැම්බර් 17 දිනැති අංක 2463/05 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය

2026 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි, එකතු කළ අගය මත බද්ද සම්බන්ධයෙන් සෑම ලියාපදිංචි තැනැත්තෙකු විසින්ම නිකුත් කළ යුතු බදු ඉන්වොයිසියේ ආකෘතිය සහ පිරිවිතර නිශ්චිතව දැක්වෙන නියෝගයක් මෙම අතිවිශේෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලදී.

පසුව, එකතු කළ අගය මත බදු ලියාපදිංචි කර ඇති බොහෝ තැනැත්තන් විසින් කරන ලද ඉල්ලීම් සලකා බලා, ඉහත සඳහන් ගැසට් නිවේදනය ක්‍රියාත්මක වන දිනය කල් දැමූ බවත්, ඒ අනුව එහි සංශෝධිත බලාත්මක දිනය 2026 අප්‍රේල් 01 වන බවත් සියලුම ලියාපදිංචි තැනැත්තන්ට දැනුම් දෙන ලදී.

## 2.3 අනුමත පුණ්‍ය ආයතන

අනුමත පුණ්‍ය ආයතනයක් යනු පුණ්‍ය කටයුතු සඳහා පමණක් ස්ථාපිත කර ඇති හෝ එවැනි අරමුණු ඉටු කර ගැනීම සඳහා පමණක් ක්‍රියාත්මක වන භාරයක්, සංස්ථාවක් හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයකි. එවැනි ආයතනයක් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ පස්වන උපලේඛනයේ 1(අ) වගන්තියට අනුකූලව අනුමත පුණ්‍යායතනයක් ලෙස අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද දැන්වීමක් හරහා මුදල් අමාත්‍යවරයා විසින් විධිමත් ලෙස ප්‍රකාශයට පත් කළ යුතුය. මෙම විධිවිධානයට අනුව, පුද්ගලයෙකු හෝ ආයතනයක් විසින් අනුමත පුණ්‍යායතනයක් සඳහා ලබා දෙන ඕනෑම මුදල් පරිත්‍යාගයක් අඩු කළ හැකි ගෙවීමක් ලෙස සලකනු ලබන අතර පරිත්‍යාගශීලියාගේ තක්සේරු කළ හැකි ආදායමෙන් අඩු කළ හැකි ගෙවීමක් ලෙස සැලකීම සඳහා හිමිකම් පෑමට සුදුසුකම් ලබයි.

2.2 වගුවේ දක්වා ඇති පුණ්‍ය ආයතන, 2025 වර්ෂයේදී මුදල් අමාත්‍යවරයා විසින් අනුමත කර ඇත.

**2.2 වගුව: 2025 වර්ෂයේදී පුණ්‍ය ආයතන සඳහා ලබා දී ඇති අනුමැතියන්**

| පුණ්‍ය ආයතනය | ගැසට් නිවේදනයෙහි අංකය | ගැසට් නිවේදනයෙහි දිනය |
|---|---|---|
| බිංගිරිය සමාජ සේවා සංගමයට අයත් ජේ.එල්. සිරිසේන අනුස්මරණ වැඩිහිටි නිවාසය | 2443/22 | 2025.07.01 |
| ඉන්දිරා පිළිකා භාරය | 2449/52 | 2025.08.15 |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

2025 දෙසැම්බර් 31 දිනට අනුමත පුණ්‍ය ආයතනවල සම්පූර්ණ ලැයිස්තුවක් ඇමුණුම 03හි දක්වා ඇත.

## 2.4 ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් (DTAAs)

ශීඝ්‍ර ලෙස ගෝලීයකරණය වූ ආර්ථික පරිසරයක් තුළ, ජාත්‍යන්තර වෙළඳාම, අන්තර් දේශසීමා ආයෝජනය සහ පුද්ගල සංචලතාව යන සාධක ගෝලීය ආර්ථික ක්‍රියාකාරකම්වල අනිවාර්ය අංග බවට පත්ව ඇත. කෙසේ වෙතත්, මෙම ඉහළ අන්තර් සම්බන්ධතාවයන් හේතුවෙන් ද්විත්ව බදුකරණය පිළිබඳ ගැටලුව ඉස්මතු වී ඇති අතර, එහිදී එකම ආදායම එක් බල සීමාවකට වඩා බදුකරණයට යටත් වේ. බදු බැඳීම් එකිනෙක හරහා ගමන්කරනු ලබන එවැනි අවස්ථාවන් මගින් ජාත්‍යන්තර ආර්ථික සහයෝගීතාවයට සැලකිය යුතු බාධා ඇතිවන අතර දේශසීමා හරහා ගනුදෙනු කිරීමේ පිරිවැය ඉහළ නංවමින් විදේශ ආයෝජන අධෛර්යමත් කරයි.

මෙම අභියෝගයට පිළියමක් වශයෙන් රටවල් ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම් අනුගමනය කරමින් පුළුල් නීතිමය රාමු ස්ථාපිතකොට ඇත.

ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුමක් යනු බදු ගෙවන්නන් එකම ආදායම මත වාසිකත්වය ඇති රටේදී සහ ආදායම් ප්‍රභව ස්ථානය ඇති රටේදී යන දෙකෙහිදීම බදු අය කිරීම වැළැක්වීම සඳහා නිර්මාණය කර ඇති ද්විපාර්ශ්වික හෝ බහුපාර්ශ්වික ගිවිසුමකි. එක් එක් රාජ්‍යයේ අදාළ බදු අයිතිවාසිකම් නිර්වචනය කිරීම තුළින්, පොදුවේ නිදහස් කිරීම්, ණය හෝ අඩු කළ බදු අනුපාත හරහා මෙම ගිවිසුම් තුළින් බදු සහන සඳහා ක්‍රමවේදයන් ඉදිරිපත් කරනු

ලබයි. සාමාන්‍යයෙන් ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුමක මූලික අරමුණ වන්නේ මූල්‍ය බාධක ඉවත් කිරීම, බදු සම්බන්ධයෙන් සාධාරණ ලෙස සැලකීම සහතික කිරීම සහ බදු පැහැර හැරීම සහ වළක්වා ගැනීම තුළින් දේශසීමා ආර්ථික කටයුතු සඳහා පහසුකම් සැලසීමයි.

ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් මගින් දැක්වෙන නිශ්චිත මූල්‍ය ඇඟවුම්වලට අමතරව, එමගින් බදු කටයුතුවලදී නීතිමය නිශ්චිතභාවය සහ පුරෝකථනය කිරීමේ හැකියාව වර්ධනය කිරීම තුළින් ජාත්‍යන්තර වෙළෙඳ හා ආයෝජන ප්‍රවාහයන් වැඩි දියුණු කිරීමේදී බොහෝ වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. රැකියා ආදායම, ලාභාංශ, පොලී, රාජ්‍ය භාග මුදල් සහ ප්‍රාග්ධන ලාභ ඇතුළු විවිධ ආදායම් කාණ්ඩවල බදුකරණය සඳහා පැහැදිලි නීති නිර්වචනය කිරීම තුළින් ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුම් මගින් ගෝලීය මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය සහ කාර්යක්ෂමතාවය සඳහා සැලකිය යුතු දායකත්වයක් හිමි වේ. සෑම ද්විත්ව බදුකරණය වැළැක්වීමේ ගිවිසුමක් තුළින් ම ගෝලීය  මූල්‍ය පද්ධතියෙහි ආදායම් ප්‍රවාහයන් මත බදු අයිතිවාසිකම් සඳහා හිමි  අවකාශය පාලනය කරනු ලබන නිශ්චිත විධිවිධාන නියම කරනු ලබන ජාත්‍යන්තර බදුකරණයේ විනිවිදභාවය, අනුකූලතාව සහ සාධාරණත්වය එමඟින් ප්‍රවර්ධනය කරයි.

2025 දෙසැම්බර් 31 වන විට ශ්‍රී ලංකාව රටවල් 46ක් සමඟ ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්වලට සහ බහුපාර්ශ්වික ගිවිසුමකට (SAARC) එළඹ ඇත. ශ්‍රී ලංකාව එළඹ ඇති ද්විත්ව බදු ගිවිසුම් පිළිබඳ සම්පූර්ණ විස්තර ඇමුණුම 04හි දක්වා ඇත.

# 02 පරිච්ඡේදය

## II කොටස - ආදායම් කාර්ය සාදනය

### 2.5 ආදායම් රැස් කිරීම

#### 2.5.1 සමාලෝචනය

බදු පරිපාලනය තුළ පරිවර්තනීය ප්‍රතිසංස්කරණ රැසක් සාර්ථකව ක්‍රියාවට නංවනු ලැබූ 2025 වර්ෂය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා තීරණාත්මක මූල්‍ය වර්ෂයක් විය. ඒ අනුව, ස්ථාවර සාර්ව ආර්ථික වාතාවරණයක් තුළ ක්‍රියාත්මක වෙමින්, වාර්ෂික ආදායම් ඉලක්කය අභිබවා ගිය බදු ආදායමක් රැස් කරගන්නට දෙපාර්තමේන්තුව සමත් විය. බදු පදනම පුළුල් කිරීම සහ ස්වේච්ඡා අනුකූලතාවය ඇති කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් අනුගමනය කරනු ලැබූ උපායමාර්ගික වෙනස්කම්වල ඵලදායීබව මෙම කාර්ය සාධනය මගින් මනාව පිළිබිඹු වන අතර දේශීය සම්පත් බළ මුළු ගැන්වීම සඳහා වඩාත් ශක්තිමත් පදනමක් නිර්මාණය කරමින් මෙම මූල්‍ය වර්ෂය තුළදී බදු පදනම සැලකිය යුතු ලෙස ප්‍රසාරණය වී ඇති බව සඳහන් කළ හැකිය. ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියෙහි (RAMIS) ප්‍රශස්ත භාවිතය සහ අන්තර් ආයතන සහයෝගීතාව ඉහළ නංවාලීම තුළින් මෙහෙයවනු ලබන දෙපාර්තමේන්තුව, මෙම වර්ෂය තුළදී ස්වකීය මූල්‍ය පැවරුම සාර්ථකව ඉටු කිරීමට පමණක් නොව, ජාතික ආර්ථික ස්ථාවරත්වයේ ප්‍රමුඛතම පාර්ශ්වයක් ලෙස ලෙස තම ස්ථානය වඩාත් තහවුරු කරගන්නට සමත් වී තිබේ.

#### 2.5.2 රැස් කරනු ලැබූ සමස්ත ආදායම

පුරෝකථනය කළ ආදායම සහ සැබෑ ආදායම් රැස් කිරීමේ කාර්යක්ෂමතාව යන දෙඅංශයෙහිම කැපීපෙනෙන අභිවෘද්ධියක් 2025 මූල්‍ය වර්ෂය තුළ සටහන් විය. ඒ අනුව, වර්ෂය තුළ දෙපාර්තමේන්තුව රුපියල් බිලියන 3,093.45ක ආදායම් ඉලක්කයක් අත්පත් කරගෙන ඇති අතර එය පෙර වසරේ ඇස්තමේන්තුගත ආදායම වූ රුපියල් බිලියන 2,740.44ට වඩා 12.88%ක වර්ධනයකි. 2025 මූල්‍ය වර්ෂය සඳහා නියම කරනු ලැබූ ආදායම් ඉලක්කය රුපියල් බිලියන 128.10කින් ඉක්මවා යමින් රුපියල් බිලියන 3,221.55ක සැබෑ ආදායමක් රැස් කිරීමට දෙපාර්තමේන්තුව සමත් විය. මෙමගින් ආසන්න වශයෙන් 104.14%ක වර්ධන අනුපාතයක් පිළිබිඹු කරනු ලබන අතර, එය අපේක්ෂිත ආදායම් ඉලක්කයට වඩා 4.39%ක ප්‍රතිශතයක පහළ යෑමක් පෙන්නුම් කළ 2024 මූල්‍ය වර්ෂයට (සැබෑ ආදායම රු. බිලියන 2,620.07) වඩා සැලකිය යුතු තත්ත්වයකි. මෙම වර්ධනීය ගමන් මග තුළින් දෙපාර්තමේන්තුවෙහි පරිපාලන ධාරිතා වර්ධනය, නවීකරණය කරන ලද බදු එකතු කිරීමේ උපාය මාර්ග, දේශීය සම්පත් සාර්ථකව බළ මුළු ගැන්වීම තුළින් නිර්මාණය කරනු ලැබූ හිතකර සාර්ව ආර්ථික පරිසරය මනාව පිළිබිඹු වේ.

පසුගිය දශකය තුළ ආදායම් ඇස්තමේන්තුවලට අනුව දෙපාර්තමේන්තුවෙහි ආදායම් කාර්ය සාධනයේ විකාශනය නිරූපණය කරනු ලබන විශ්ලේෂණය 2.3 වගුව සහ 2.1 සටහන මගින් දක්වා ඇත.

**2.3 වගුව: 2016 සිට 2025 දක්වා ආදායම් ඇස්තමේන්තුවලට සාපේක්ෂව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ආදායම් කාර්ය සාධනය**

| වර්ෂය | ඇස්තමේන්තු කළ ආදායම (රු. මිලියන) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රැස්කළ ආදායම (රු. මිලියන) | රැස්කළ ආදායම ඇස්තමේන්තු කළ ආදායමේ ප්‍රතිශතයක් (%) ලෙස |
|---|---|---|---|
| 2025 | 3,093,448 | 3,221,546 | 104.14% |
| 2024 | 2,740,443 | 2,620,067 | 95.61% |
| 2023 | 1,761,984 | 1,842,315 | 104.56% |
| 2022 | 1,131,012 | 1,058,080 | 93.55% |
| 2021 | 612,615 | 632,831 | 103.30% |
| 2020 | 575,403 | 523,934 | 91.06% |
| 2019 | 1,038,129 | 1,025,319 | 98.77% |

| | | | |
|---|---|---|---|
| 2018 | 1,028,265 | 900,348 | 87.56% |
| 2017 | 837,855 | 836,518 | 99.84% |
| 2016 | 573,115 | 641,547 | 111.94% |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**2.1 සටහන: 2016 සිට 2025 දක්වා ආදායම් ඇස්තමේන්තුවලට සාපේක්ෂව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ආදායම් කාර්ය සාධනය**




*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**2.5.2.1 රජයේ සමස්ත ආදායම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි දායකත්වය**

2025 මූල්‍ය වර්ෂය තුළ ජාතික මූල්‍ය ක්ෂේත්‍රය තුළ පරිවර්තනීය වර්ධනයන් දක්නට ලැබුණු අතර, සමස්ත රජයේ ආදායම 35.19%ක වර්ධන වේගයක් පෙන්නුම් කරමින් රුපියල් ට්‍රිලියන 4.03 සිට රුපියල් ට්‍රිලියන 5.45 දක්වා ඉහළ ගියේය. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ආදායම් රැස්කිරීම 22.96% ක ප්‍රතිශතයකින් ඉහළ ගොස් රුපියල් ට්‍රිලියන 3.22ක සමස්ත බදු ආදයමක් එක්රැස් වූ අතර රජයේ සමස්ත ආදායම සඳහා 59.12% ක් වූ කැපී පෙනෙන දායකත්වයක් ලබා දෙමින්, රාජ්‍ය ආර්ථිකය තුළ තම සුවිශේෂී කාර්යභාරය නැවත වතාවක් තහවුරු කරගන්නට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමත් විය.

උපායමාර්ගික මෙහෙයුම් වැඩිදියුණුකිරීම සහ ඵලදායී බදු ප්‍රතිපත්ති ප්‍රතිසංස්කරණ තුළින් ළඟා කරගනු ලැබූ මෙම කාර්ය සාධනය තුළින් ජාතියේ මූල්‍ය ස්ථාවරත්වයට හේතුවන හිතකර ආර්ථික වාතාවරණය සහ ආදායම් බළ මුළු ගැන්වීමේ කාර්යක්ෂමතාව ඉහළ යැම දක්වනු ලබයි.

**2.5.2.2 රජයේ බදු ආදායම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි දායකත්වය**

ශ්‍රී ලංකාවේ ජාතික බදු ක්‍රමයේ කේන්ද්‍රීය ආයතනය ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තම අනන්‍යතාවය වඩාත් තහවුරු කරමින් 2025 මූල්‍ය වර්ෂයේදී, රාජ්‍ය මූල්‍ය ඒකාබද්ධතාවය පවත්වාගැනීම සඳහා වූ රජයේ ප්‍රයත්නයන් සඳහා කැපී පෙනෙන දායකත්වයක් ලබා දී ඇත. 2025 වර්ෂයේදී, රජයේ මුළු බදු ආදායමෙහි ශක්තිමත් ප්‍රසාරණයක් දක්වමින් 2024 වර්ෂයේදී වාර්තා වූ රුපියල් ට්‍රිලියන 3.70 සිට රුපියල් ට්‍රිලියන 5.05ක දක්වා ඉහළ යැමක් 2025 වර්ෂය තුළ සටහන් වූ අතර එය ආසන්න වශයෙන් 36.30%ක වර්ධනයකි.

ඉහත පසුබිම තුළ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරමින් 2025 වර්ෂයෙහි රාජ්‍ය ආදායම සඳහා රුපියල් බිලියන 3,221.55ක දායකත්වයක් ලබා දී ඇත. එය වසර තුළ රැස්කරගනු ලැබූ මුළු බදු ආදායමෙන් 63.80%ක් වූ අතර මෙරට ජාතික මූල්‍ය ස්ථාවරත්වය හිතකර මට්ටමක පවත්වාගැනීම සඳහා දෙපාර්තමේන්තුවෙහි තීරණාත්මක බලපෑම එමගින් අවධාරණය කරනු ලබයි. එමෙන්ම දෙපාර්තමේන්තුව විසින් වාර්තා කොට ඇති ආදායම් වර්ධන වේගය 22.96% ක් ලෙස සටහන් වූ අතර, නවීකරණය කරන ලද මෙහෙයුම් උපාය මාර්ගවල කාර්යක්ෂමතාව සහ පරිපාලන කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් දැක්වූ අඛණ්ඩ කැපවීම මෙම තිරසාර කාර්ය සාධනය තුළින් ඉස්මතු කරයි. ඉදිරියේදී ද දිගුකාලීන ආර්ථික ස්ථාවරත්වය සහ තිරසාර ආදායම් උත්පාදනය සහතික කිරීම සඳහා

වඩාත් පැහැදිලි බදු එකතු කිරීමේ යාන්ත්‍රණයන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, මෙම ධනාත්මක පරිසරය මත ගොඩනැගීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව කැපවී සිටී.

### 2.5.2.3 දළ දේශීය නිෂ්පාදිතය (GDP) සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි දායකත්වය

2025 වර්ෂය තුළ දී, ජාතික ආර්ථිකය ධනාත්මක ගමන් පථයක් තුළ ඉදිරියට යෑම පෙන්නුම් කළ අතර, පවත්නා වෙළෙඳපොළ මිල ගණන් යටතේ දළ දේශීය නිෂ්පාදිතය (GDP) රුපියල් ට්‍රිලියන 32.75 දක්වා 8.82%කින් වර්ධනය විය. මෙම හිතකර සාර්ව ආර්ථික පරිසරය තුළ, රටෙහි සමස්ත බදු ආදායමෙන් රුපියල් ට්‍රිලියන 3.22ක් රැස් කරමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලැබීය. පසුගිය මූල්‍ය වර්ෂය සඳහා 8.71%ක් ලෙස සටහන් වූ දළ දේශීය නිෂ්පාදිතයට බදු අනුපාතය 2025 වර්ෂයේදී දී 9.84% දක්වා ඉහළ යෑම තුළින් මෙම හිතකර කාර්ය සාධනය මනාව පැහැදිලි වේ.

සංකීර්ණ ආර්ථික ප්‍රවණතා රැසක් අබිබවා යමින් ආදායම් එකතු කිරීමේ වාර්ෂික වර්ධනය 22.96%ක් බවට පත් කරගැනීම දෙපාර්තමේන්තුවේ පරිපාලන කාර්යක්ෂමතා වර්ධනය පිළිබඳ සාක්ෂියකි. ඒ අනුව, ජාතික දළ දේශීය නිෂ්පාදිතය සඳහා තම දායකත්වය විශ්වසනීය ලෙස ඉහළ නංවාලනු ලබන දේශීය ආදායම් දෙපාර්තමේන්තුව රජයේ මූල්‍ය ඒකාබද්ධතාව පිළිබඳ අරමුණු සහ රටෙහි දිගුකාලීන ජාතික සංවර්ධනය සඳහා සහාය වීම සඳහා අවශ්‍ය සම්පත් ලබා ගැනීම සහතික කරමින් ඒකාබද්ධ අරමුදලෙහි අත්‍යවශ්‍ය පාර්ශ්වයක් ලෙස අඛණ්ඩව ක්‍රියා කරයි.

**2.4 වගුව: රජයේ සමස්ත ආදායමට හා රජයේ බදු ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි දායකත්වය සහ බදු හා දළ දේශීය නිෂ්පාදිතය අතර අනුපාතය**

| වර්ෂය | රජයේ සමස්ත ආදායම (රු. මි.) | රජයේ සමස්ත බදු ආදායම (රු. මි.) | පවත්නා වෙළෙඳපොළ මිල අනුව ද.දේ.නි. (රු. මි.) | දේ.ආ.දෙ. රැස් කළ ආදායම (රු. මි.) | රජයේ සමස්ත ආදායමට දේ.ආ.දෙ. රැස් කළ ආදායම දක්වන ප්‍රතිශතය | රජයේ බදු ආදායමට දේ.ආ.දෙ. රැස් කළ ආදායම දක්වන ප්‍රතිශතය | රජයේ බදු ආදායම, ශ්‍රී ලංකාවේ ද.දේ.නි.ට දක්වන අනුපාතය ප්‍රතිශතයක් ලෙස | දේ.ආ.දෙ. රැස් කළ ආදායම, ලංකාවේ ද.දේ.නි.ට දක්වන අනුපාතය ප්‍රතිශතයක් |
|---|---|---|---|---|---|---|---|---|
| 2025 | 5,449,402 | 5,049,192 | 32,750,844 | 3,221,546 | 59.12% | 63.80% | 15.42% | 9.84% |
| 2024 | 4,030,838 | 3,704,577 | 30,095,825 | 2,620,067 | 65.00% | 70.73% | 12.31% | 8.71% |
| 2023 | 3,048,822 | 2,720,563 | 27,539,080 | 1,842,315 | 60.43% | 67.72% | 9.88% | 6.69% |
| 2022 | 1,979,184 | 1,751,132 | 24,063,162 | 1,058,080 | 53.46% | 60.42% | 7.28% | 4.40% |
| 2021 | 1,457,071 | 1,298,019 | 17,612,370 | 632,831 | 43.43% | 48.75% | 7.37% | 3.59% |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව*

**2.2 සටහන: රජයේ ආදායමට සහ රජයේ බදු ආදායමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි දායකත්වය**




*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

2.5 වගුව: බදු වර්ගය අනුව මුළු බදු ආදායම - 2025

| බදු වර්ගය | ශුද්ධ ආදායම් ඇස්තමේන්තුව (රු.) | ශුද්ධ ආදායම් එකතුව (රු.) | බදු ආදායම් එකතුව ඇස්තමේන්තුවෙහි ප්‍රතිශතයක් ලෙස | බදු ආදායම් එකතුව මුළු ආදායමෙහි ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| ආදායම් බද්ද | 1,115,600,000,000 | 1,131,326,088,242 | 101% | 35.12% |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 4,400,000,000 | 8,020,679,561 | 182% | 0.25% |
| එකතු කළ අගය මත බද්ද | 1,670,000,000,000 | 1,746,874,446,361 | 105% | 54.22% |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | - | 528,741,479 | - | 0.02% |
| ආර්ථික සේවා ගාස්තුව | - | 24,826,579 | - | 0.001% |
| ණය ආපසු ගෙවීමේ බද්ද | - | 19,670,278 | - | 0.001% |
| ඔට්ටු හා සූදු බද්ද | 9,500,000,000 | 10,241,921,832 | 108% | 0.32% |
| කොටස් ගනුදෙනු බද්ද | 6,400,000,000 | 7,455,358,291 | 116% | 0.23% |
| විගමන බද්ද | 48,000,000 | 67,044,767 | 140% | 0.002% |
| මුද්දර බද්ද | - | 22,452,959,854 | - | 0.70% |
| පිරිවැටුම් බද්ද | - | 10,472,428 | - | 0.0003% |
| ජාතික ආරක්ෂක බද්ද | - | 672,328 | - | 0.00002% |
| ප්‍රේෂණ ගාස්තු | 460,000 | 1,890,973 | 411% | 0.0001% |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | - | 1,489,775 | - | 0.00005% |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 287,000,000,000 | 294,519,506,705 | 103% | 9.14% |
| කැසිනෝ බලපත්‍ර ගාස්තු | 500,000,000 | - | - | - |
| **මුළු ආදායම් එකතුව** | **3,093,448,460,000** | **3,221,545,769,453** | **104%** | **100.00%** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

2.3 සටහන: සමස්ත ආදායම් රැස්කිරීම - 2025




* ප්‍රාග්ධන ලාභ බද්ද, ඔට්ටු සහ සූදු බද්ද, කොටස් ගනුදෙනු බද්ද, විගමන බද්ද, කැසිනෝ බලපත්‍ර ගාස්තුව, ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම් මත බද්ද, ණය ආපසු ගෙවීමේ බද්ද, මුද්දර ගාස්තු, ආර්ථික සේවා ගාස්තුව, ජාතිය ගොඩනැගීමේ බද්ද, පිරිවැටුම් බද්ද, ප්‍රේෂණ ගාස්තුව සහ ජාතික ආරක්ෂක බද්ද අනෙකුත් බදු අතරට ඇතුළත් වේ.

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

#### 2.5.2.4 මුද්දර බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම පළාත් සභා වෙත පැවරීම

2011 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත සහ 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනත ප්‍රකාරව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් එකතු කරන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද සහ මුද්දර ගාස්තු පහත පරිදි පළාත් සභා වෙත පැවරිය යුතුය.

ජාතිය ගොඩනැගිමේ බද්ද

මුළු එකතුවෙන් 33.33%

මුද්දර බද්ද

මුළු එකතුවෙන් 100%

මුළු ආදායම් එකතු කිරීම සහ පළාත් සභා වෙත පවරන ලද අදාළ බදු ප්‍රමාණය 2.6 වගුව මඟින් දැක්වේ.

**2.6 වගුව: බදු ආදායම පළාත් සභා වෙත පැවරීම - 2025**

| බදු වර්ගය | වර්ෂය තුළ මුළු ආදායම (රු.) | වර්ෂය තුළ පළාත් සභා වෙත පවරන ලද මුළු මුදල (රු.)* | ප්‍රතිශතය |
|---|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 528,741,479 | 40,625,305 | 33.33% |
| මුද්දර බද්ද | 22,452,959,854 | 22,296,202,502 | 99.30% |

* වර්ෂය තුළ පළාත් සභා වෙත සත්‍ය වශයෙන්ම ප්‍රේෂණය කරන ලද මුදල දක්වා ඇත.

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

#### 2.5.2.5 ආදායම් බදු එකතු කිරීම

වැඩිදියුණු කළ පරිපාලනය සහ ඵලදායී ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිළිබිඹු කරමින් 2025 වර්ෂය තුළ ආදායම් බදු එකතු කිරීමේදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කොට ඇත. වර්ෂය සඳහා ආදායම් ඉලක්කය රුපියල් බිලියන 1,115.60ක් වූ අතර එය පෙර වසරේ ඇස්තමේන්තුගත රුපියල් බිලියන 1,075.00ට වඩා සැලකිය යුතු වැඩිවීමකි.

රැස් කරන ලද සැබෑ ආදායම රුපියල් බිලියන 1,131.33ක් වූ අතර එය ආදයම් ඉලක්කය රුපියල් බිලියන 15.73කින් හෙවත් 1.41%ක ඉක්මවා යෑමක් විය. ආදායම් ඇස්තමේන්තුවට සාපේක්ෂව කාර්ය සාධනයෙහි මධ්‍යස්ථ ඉක්මවීමක් වුවද, මෙය පසුගිය වර්ෂයට සාපේක්ෂව ප්‍රශස්ත වර්ධනයකි. 2024 වර්ෂයේදී රැස් කරන ලද සැබෑ ආදායම වූ රුපියල් බිලියන 1,024.10ට සාපේක්ෂව, ආදායම රුපියල් බිලියන 107.23කින් වැඩි වී ඇති අතර එය 10.47%ක වර්ධන වේගයක් සටහන් කොට ඇත.

සමස්තයක් වශයෙන්, මෙම කාර්ය සාධනය තුළින් බදු රැස් කිරීමේ කාර්යක්ෂමතාව සහ ඵලදායීතාව පිළිබඳ සැලකිය යුතු අභිවෘද්ධියක් දිස්වේ. ඒ අනුව, ඉහළ ආදායම් ඉලක්කයක් සපුරා ගැනීම මෙන්ම එම ඉලක්කය සුළු ප්‍රමාණයකින් ඉක්මවා යාමට ද හැකිවීම තුළින් වත්මන් බදු ප්‍රතිපත්ති සහ බලාත්මක කිරීමේ පියවරයන්හි ශක්තිමත් බව සහ ආදායම් බළ මුළු ගැන්වීමේ උපාය මාර්ගවලට අනුවර්තනය වීමටත් සහ උපාය මාර්ග වඩා සවිබල ගැන්වීමටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සතු හැකියාව පෙන්නුම් කරනු ලබයි.

**සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු යටතේ රැස් කරන ලද මුදල**

2024 වර්ෂයේදී  දී සංස්ථාපිත ආදායම් බදු ආදායම රුපියල් බිලියන 669.64ක් වූ අතර එය පෙර වසරේ වාර්තා වූ රුපියල් බිලියන 582.28ට සාපේක්ෂව සැලකිය යුතු යුතු වර්ධනයකි. මෙය රුපියල් බිලියන 87.36ක වැඩිවීමක් වන අතර 15%ක වර්ධන වේගයක් පිළිබිඹු කරයි. එමෙන්ම, 2024 වර්ෂයේදී රුපියල් බිලියන 441.81ක් වූ සංස්ථාපිත නොවන ආදායම් බදු ආදායම 2025 වර්ෂයේදී රුපියල් බිලියන 461.68 දක්වා ඉහළ ගියේය. රුපියල් බිලියන 19.87ක මෙම වර්ධනය 4.5% ක ප්‍රතිශතමය වර්ධනයකි.

2024 සහ 2025 වර්ෂ සඳහා සංස්ථාපිත බදු ආදායම සහ සංස්ථාපිත නොවන බදු ආදායම් සංයුතිය 2.7 වගුව මගින් සංසන්දනාත්මකව දක්වා ඇත.

2.7 වගුව: සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු ආදායම

| අංශය | 2025 | | 2024 | |
|---|---|---|---|---|
| | රැස් කරන ලද බදු ආදායම (රු.) | % | රැස් කරන ලද බදු ආදායම (රු.) | % |
| සංස්ථාපිත* | 669,644,503,984 | 59% | 582,284,485,027 | 57% |
| සංස්ථාපිත නොවන** | 461,681,584,258 | 41% | 441,813,946,708 | 43% |
| **මුළු එකතුව** | **1,131,326,088,242** | **100%** | **1,024,098,431,735** | **100%** |

* සංස්ථාපිත ආදායම් බද්ද (CIT), ලාභාංශ බද්ද සහ ප්‍රේෂණ බද්ද ඇතුළත් වේ.

* 2025 දී රුපියල් මිලියන 19ක සහ 2024 දී රුපියල් මිලියන 33ක ලාභාංශ බද්ද ඇතුළත් වේ.

* 2025 දී රුපියල් මිලියන 1,416ක සහ 2024 දී රුපියල් මිලියන 3,075ක ප්‍රේෂණ බද්ද ඇතුළත් වේ

** තනි පුද්ගල ආදායම් බද්ද (IIT), හවුල් ව්‍යාපාර ආදායම් බද්ද (PIT), අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) සහ අත්තිකාරම් ආදායම් බද්ද (AIT)/ රඳවා ගැනීමේ බද්ද (WHT) ඇතුළත් වේ.

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**2.4 සටහන: 2025 සහ 2024 වර්ෂ තුළ රැස්කළ සංස්ථාපිත සහ සංස්ථාපිත නොවන ආදායම් බදු මුදල් අනුපාතය**




*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) යටතේ රැස් කරන ලද බදු ආදායම**

වසර සඳහා ඇස්තමේන්තුගත අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) ආදායම රුපියල් බිලියන 198.0 ක් වූ අතර එය පෙර වසරේ ඇස්තමේන්තුගත රුපියල් බිලියන 160.0ට වඩා වැඩි වීමකි. 2024 දී රුපියල් බිලියන 197.57ක් වූ මෙම බදු යෝජනා ක්‍රමය යටතේ, රැකියා ආදායම් මට්ටම අනුව 2025 වර්ෂයේදී රැස් කරන ලද සැබෑ ආදායම රුපියල් බිලියන 201.12ක් විය. මෙය 2024 වසරට සාපේක්ෂව 1.8%ට වර්ධන වේගයක් සටහන් කළ රුපියල් බිලියන 3.55ක වැඩිවීමකි. එපමණක් නොව, මෙම බද්ද යටතේ රැස් කළ සැබෑ ආදායම ඇස්තමේන්තුගත ආදායම රුපියල් බිලියන 3.12කින් ඉක්මවා ඇති අතර එය ප්‍රක්ෂේපිත අගයට වඩා 1.58%ක අතිරික්තයක් පිළිබිඹු කරයි.

2024/2025 තක්සේරු වර්ෂය සඳහා අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) සහ රැකියා ආදායම් මට්ටම යටතේ බදු විශ්ලේෂණය 2.8 වගුවේ දැක්වේ.

**2.8 වගුව : 2024/2025 තක්සේරු වර්ෂය සඳහා අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) යටතේ බදු විශ්ලේෂණය සහ ආදායම් මට්ටම**

| ආදායම් පරාසය (රු.) | සේවා නියුක්තිකයින් සංඛ්‍යාව | සමස්ත දළ පාරිශ්‍රමිකය (රු.) | APIT යටතේ බදු මුදල (රු.) |
|---|---|---|---|
| බද්ද අඩු නොකළ | 1,924,903 | 1,015,764,044,145 | - |
| 1,200,000ට අඩු - බදු අඩු කළ | 143,998 | 105,342,143,454 | 2,073,256,555 |
| 1,200,001-1,700,000 | 187,290 | 260,065,846,072 | 3,835,215,319 |
| 1,700,001-2,200,000 | 85,518 | 163,896,494,174 | 6,014,518,170 |
| 2,200,001-2,700,000 | 52,662 | 127,499,500,718 | 7,869,203,954 |
| 2,700,001-3,200,000 | 40,515 | 119,088,834,168 | 10,288,396,876 |
| 3,200,001-3,700,000 | 29,039 | 99,750,191,717 | 11,353,305,958 |
| Above 3,700,000 | 83,397 | 615,585,441,789 | 150,471,742,557 |
| **එකතුව** | **2,547,322** | **2,506,992,496,236** | **191,905,639,388** |

*මෙම තොරතුරු 2024/2025 තක්සේරු වර්ෂය සඳහා සේවායෝජකයින් විසින් සපයන ලද සම්පූර්ණ කරන ලද වාර්තා මත පදනම් වේ.*

**රඳවාගැනීමේ බද්ද (WHT)/ අත්තිකාරම් ආදායම් බද්ද (AIT) යටතේ රැස්කරන ලද බදු ආදායම**

වසර සඳහා අත්තිකාරම් ආදායම් බද්දෙන් (AIT) ඇස්තමේන්තුගත ආදායම රුපියල් බිලියන 175.0ක් වූ අතර එය පෙර වසරේ ඇස්තමේන්තුගත රුපියල් බිලියන 160.0ට වඩා බිලියන 15.0ක වැඩිවීමකි. අත්තිකාරම් ආදායම් බද්ද යටතේ 2024 වසර සඳහා රැස් කරන ලද සත්‍ය ආදායම රුපියල් බිලියන 163.79ක් වූ අතර 2025 වර්ෂයේදී එය රුපියල් බිලියන 175.79කි. රුපියල් බිලියන 12.00ක වර්ධනයක් වූ එහි වාර්ෂික වර්ධනය 7.33%කි.

ඒ අනුව, සැබෑ බදු ආදායම, ඇස්තමේන්තුගත මුදල රුපියල් බිලියන 0.79කින් ඉක්මවා ගොස් ඇති අතර, එය ප්‍රක්ෂේපිත අගයට වඩා 0.45%ක අතිරික්තයකි. 2025 සඳහා අත්තිකාරම් ආදායම් බදු ආදායම පිළිබඳ වැඩිදුර විස්තර 2.9 වගුවේ දක්වා ඇත.

**2.9 වගුව: අත්තිකාරම් ආදායම් බද්ද (AIT) යටතේ රැස් කරන ලද බදු ආදායම - 2025**

| රඳවා ගැනීමේ බදු වර්ගය | ආදායම් ඇස්තමේන්තුව (රු. මි.) | රැස් කරන ලද ආදායම (රු. මි.) | රැස් කරන ලද ආදායම ඇස්තමේන්තුවෙහි ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| පොලිය මත | 69,000.00 | 71,620.50 | 103.80% |
| නිශ්චිත ගාස්තු සහ වෙනත් | 106,000.00 | 104,171.97 | 98.28% |
| **එකතුව** | **175,000.00** | **175,792.47** | **100.45%** |

*මූලාශ්‍රය : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**2.5.2.6 එකතු කළ අගය මත බද්ද (VAT) යටතේ රැස් කරන ලද බදු ආදායම**

2025 වර්ෂය සඳහා වැට් බදු ආදායම් ඉලක්කය රුපියල් බිලියන 1,670.00ක් වූ අතර එය පෙර වසරේ ඇස්තමේන්තුගත රුපියල් බිලියන 1,400.00ට වඩා සැලකිය යුතු වැඩිවීමකි. බදු මුදල් ආපසු ගෙවීමෙන් පසු (refunds) සැබෑ ශුද්ධ වැට් බදු ආදායම රුපියල් බිලියන 1,746.87ක් වූ අතර එය ආදායම් ඉලක්කය රුපියල් බිලියන 76.87කින් හෙවත් 4.60%කින් ඉක්මවා යෑමක් විය.

පෙර වසරේ වැට් බදු යටතේ ඉපැයූ රුපියල් බිලියන 1,309.68ක් වූ බදු ආදායම, 2025 වර්ෂයේදී රුපියල් බිලියන 437.19කින් වර්ධනයක් වී ඇත. 33.38%ක ප්‍රතිශතයක් වූ මෙම වර්ධනය සඳහා වාහන ආනයනය සඳහා වූ සීමාවන් ඉවත් කිරීම මෙන්ම වැට් බදු එකතු කිරීමේ යාන්ත්‍රණයන්හි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම බොහෝ දුරට හේතු විය.

### 2.10 වගුව: එකතු කළ අගය මත බද්ද (VAT) යටතේ රැස් කරන ලද බදු ආදායම සහ ආපසු ගෙවීම

| අංශය | 2025 | | | 2024 | | |
|---|---|---|---|---|---|---|
| | දළ ආදායම (රු.) | ආපසු ගෙවීම් (රු.) | ශුද්ධ ආදායම ආදායම (රු.) | දළ ආදායම (රු.) | ආපසු ගෙවීම් (රු.) | දළ ආදායම (රු.) |
| නිෂ්පාදන | 290,696,211,515 | 10,746,002,481 | 279,950,209,034 | 239,625,905,763 | 693,829,661 | 238,932,076,102 |
| ආනයන හැර අනෙකුත් නිෂ්පාදන නොවන | 575,534,432,337 | 13,773 | 575,534,418,563 | 473,254,867,240 | - | 473,254,867,240 |
| මූල්‍ය නොවන සේවාවන් | 377,287,202,964 | 13,773 | 377,287,189,190 | 352,861,218,004 | - | 352,861,218,004 |
| මූල්‍ය සේවාවන් | 198,247,229,373 | - | 198,247,229,373 | 120,393,649,236 | - | 120,393,649,236 |
| ආනයන | 892,470,356,575 | 1,080,537,811 | 891,389,818,764 | 597,735,489,795 | 242,606,391 | 597,492,883,404 |
| **එකතුව** | **1,758,701,000,427** | **11,826,554,065** | **1,746,874,446,361** | **1,310,616,262,799** | **936,436,052** | **1,309,679,826,747** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 2.5 සටහන: අංශ අනුව එකතු කළ අගය මත බද්ද (VAT) යටතේ රැස් කරන ලද බදු ආදායම




*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

වසර තුළ මුළු වැට් බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් 5.33%ක් විය. අංශ වශයෙන් ගත් කල, නිෂ්පාදන අංශය තුළින් උපයනු ලැබූ වැට් බදු ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.85%ක් වූ අතර නිෂ්පාදන නොවන අංශයෙහි (ආනයන හැර) දායකත්වය 1.76%ක් විය. සමස්ත වැට් බදු ආදායමෙහි විශාලතම කොටස ආනයන අංශය තුළින් ජනනය වූ අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 2.72%ක් විය. 2.11 වගුව මඟින් අංශ අනුව ශුද්ධ වැට් බදු එකතු කිරීම සහ දළ දේශීය නිෂ්පාදිතය සඳහා එහි දායකත්වය දක්වා ඇති අතර, වැට් බදු ආදායමෙහි සංයුතිය පිළිබඳ මෙම ප්‍රවණතාවන් 2.6 සටහනෙහි වැඩිදුරටත් දක්වා ඇත.

**2.11 වගුව : දළ දේශීය නිෂ්පාදිතය සඳහා වැට් බදු දායකත්වය - අංශ අනුව විශ්ලේෂණය**

| අංශය | 2025 | | 2024 | | දළ දේශීය නිෂ්පාදිතය සඳහා වැට් බදු දායකත්වයෙහි ප්‍රතිශතය | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | දළ ආදායම (රු.) | % | ශුද්ධ ආදායම (රු.) | % | 2025 | 2024 | 2023 | 2022 | 2021 |
| නිෂ්පාදන අංශය | 279,950,209,034 | 16.03% | 238,932,076,102 | 18.24% | 0.85% | 0.79% | 0.65% | 0.47% | 0.23% |
| ආනයන හැර අනෙකුත් නිෂ්පාදන නොවන අංශය | 575,534,418,563 | 32.95% | 473,254,867,240 | 36.14% | 1.76% | 1.57% | 1.05% | 0.75% | 0.83% |
| ආනයන මත | 891,389,818,764 | 51.03% | 597,492,883,404 | 45.62% | 2.72% | 1.99% | 0.82% | 0.71% | 0.70% |
| **එකතුව** | **1,746,874,446,361** | **100%** | **1,309,679,826,747** | **100%** | **5.33%** | **4.35%** | **2.52%** | **1.92%** | **1.75%** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහ බැංකුව*

**2.6 සටහන: දළ දේශීය නිෂ්පාදිතය සඳහා වැට් බදු දායකත්වය - අංශ අනුව විශ්ලේෂණය**




*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 2.5.2.7 සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) යටතේ රැස් කරන ලද බදු ආදායම

2025 වර්ෂය සඳහා, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා ඇස්තමේන්තුගත ආදායම් ඉලක්කය රුපියල් බිලියන 287.00ක් වූ අතර එය පෙර වසරේ ඇස්තමේන්තුගත රුපියල් බිලියන 250.00ට වඩා ඉහළ අගයකි. එවැනි ඉහළ ආදායම් ඉලක්කයක් යටතේ, 2025 වර්ෂයේදී ආපසු ගෙවීම්වලින් පසු සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද යටතේ රැස් කරගනු ලැබූ ආදායම රුපියල් බිලියන 294.52ක් වූ අතර එය ඇස්තමේන්තුව රුපියල් බිලියන 7.52කින් ඉක්මවා ගොස් 2.62%ක අතිරික්තයක් වාර්තා කොට ඇත. පෙර වර්ෂයේදී සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) යටතේ රැස්කළ සැබෑ ආදායම වූ රුපියල් බිලියන 250.87ට සාපේක්ෂව, මෙය රුපියල් බිලියන 43.65ක කැපී පෙනෙන වර්ධනයක් වන අතර එය පසුගිය වසරට සාපේක්ෂව 17.40%ක වර්ධනයකි.

මෙම ධනාත්මක කාර්ය සාධනය තුළින් සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) පිළිබඳ පරිපාලනයේ කාර්යක්ෂමතාව සහ රජයේ ආදායමට මෙම බදු දායකත්වයෙහි වැදගත්කම ඉස්මතු වේ. කාර්යක්ෂම බදු එකතු කිරීම තුළින් මූල්‍ය රාමුව ශක්තිමත් කිරීම සහ එමගින් සමාජ සුභසාධන සහ සමාජ ආරක්ෂණ වැඩසටහන්වල තිරසාරභාවයට සහාය වීම සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ද එමගින් මනාව පිළිබිඹු වේ.

**2.12 වගුව: සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම - අංශ අනුව විශ්ලේෂණය**

| අංශය | 2025 | | 2024 | |
|---|---|---|---|---|
| | බදු ආදායම (රු.) | % | බදු ආදායම (රු.) | % |
| නිෂ්පාදන අංශය | 78,373,722,276 | 26.61% | 64,971,136,298 | 25.90% |
| සේවා අංශය | 143,532,078,905 | 48.73% | 121,505,412,941 | 48.43% |
| ආනයන මත | 72,613,705,524 | 24.66% | 64,392,173,901 | 25.67% |
| **එකතුව** | **294,519,506,705** | **100%** | **250,868,723,139** | **100%** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**2.7 සටහන: සමාජ ආරක්ෂණ දායකත්ව බදු ආදායම - අංශ අනුව විශ්ලේෂණය**




*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**2.5.2.8 වක්‍ර බදු සහ සෘජු බදු**

වෙනත් බොහෝ රටවල මෙන්ම ශ්‍රී ලංකාවේ ද බදු ප්‍රධාන කාණ්ඩ දෙකකට වර්ග කර ඇත. එනම් සෘජු බදු සහ වක්‍ර බදු වශයෙනි. සෘජු බදු පුද්ගලයන්ගේ සහ ආයතනවල ආදායම හෝ ධනය මත සෘජුවම පනවනු ලබන අතර ආදායම හෝ ධනය ඉහළ යන විට බදු අනුපාතය වැඩි වේ. ආදායම් බද්ද, ධන බද්ද සහ ප්‍රාග්ධන ලාභ බද්ද සෘජු බදු සඳහා පොදු උදාහරණ වේ.

ආදායම හෝ ධනය මත නොව භාණ්ඩ හා සේවා මත වක්‍ර බදු අය කෙරේ. බොහෝ විට පරිභෝජන බදු ලෙස හඳුන්වනු ලබන මෙම වක්‍ර බදු ශ්‍රී ලංකාවේ රජයේ ආදායමෙන් සැලකිය යුතු කොටසක් වන අතර, එකතු කළ අගය මත බද්ද (VAT) , සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL), සුරාබදු සහ රේගු බදු ඊට ඇතුළත් වේ.

ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතිය තුළ සෘජු සහ වක්‍ර බදු යන දෙකම වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. ඵලදායී හා සාධාරණ බදු ව්‍යුහයක් සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම බදු ව්‍යුහයන් දෙක අතර මනා තුලනයක් පවත්වා ගත යුතු වේ. බදු අනුකූලතාව වැඩි දියුණු කිරීම, බදු පැහැර හැරීම අවම කිරීම මෙන්ම අඩු ආදායම්ලාභී කණ්ඩායම් මත අධික බර පැටවීම වැළැක්වීමේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම තිරසාර ආර්ථික වර්ධනයක් ඇති කිරීම සහ සාධාරණත්වය සහතික කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ. ආර්ථික කාර්යක්ෂමතාව, සාධාරණත්වය සහ ආදායම් ස්ථාවරත්වය වැඩි දියුණු කිරීම අරමුණ කරගත් ප්‍රශස්ත බදු ක්‍රමයක් තුළ සෘජු සහ වක්‍ර බදු යන දෙවර්ගයම අදාළ පරිදි ක්‍රියාත්මක විය යුතුය.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද මුළු ආදායම සඳහා සෘජු බදු සහ වක්‍ර බදු

කාණ්ඩවල සාපේක්ෂ දායකත්වය පිළිබඳ සංක්ෂිප්ත තොරතුරු 2.13 වගුවේ දක්වා ඇත.

**2.13 වගුව : ඍජු බදු සහ වක්‍ර බදු අනුපාතය**

| වර්ෂය | ඍජු බදු සහ වක්‍ර බදු අනුපාතය |
|---|---|
| 2025 | 36:64 |
| 2024 | 40:60 |
| 2023 | 50:50 |
| 2022 | 53:47 |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 2.5.3 2025 වර්ෂයෙහි සහ 2024 වර්ෂයෙහි ආදායම් සංසන්දනය

2025 වර්ෂයේ ආදායම් සහ 2024 වර්ෂයේ ආදායම් සංසන්දනයක් 2.14 වගුව සහ 2.8 සටහනෙහි දැක්වේ. පසුගිය වර්ෂ 04ක අඛණ්ඩ කාල පරිච්ඡේදය සඳහා රැස් කරන ලද මුළු ආදායම ඇමුණුම 05හි දැක්වේ.

**2.14 වගුව : 2024 වර්ෂයෙහි සහ 2025 වර්ෂයෙහි ආදායම් සංසන්දනය**

| බදු වර්ගය | 2025 වර්ෂයෙහි ආදායම (රු.) | 2024 වර්ෂයෙහි ආදායම (රු.) | වාර්ෂික ලක්ෂ්‍යමය වැඩිවීම/ අඩුවීම ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|
| ආදායම් බද්ද | 1,131,326,088,242 | 1,024,098,431,735 | 10.47% |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 8,020,679,561 | 1,853,674,690 | 332.69% |
| එකතු කළ අගය මත බද්ද | 1,746,874,446,361 | 1,309,679,826,747 | 33.38% |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 294,519,506,705 | 250,868,723,139 | 17.40% |
| ඔට්ටු සහ සූදු බද්ද | 10,241,921,832 | 9,814,824,181 | 4.35% |
| කොටස් ගනුදෙනු බද්ද | 7,455,358,291 | 3,130,914,014 | 138.12% |
| විගමන බද්ද | 67,044,767 | 33,981,314 | 97.30% |
| කැසිනෝ බලපත්‍ර ගාස්තු | - | 5,100,000,000 | -100.00% |
| වෙනත් බදු* | 23,040,723,694 | 15,486,843,048 | 48.78% |
| **මුළු බදු ආදයම** | **3,221,545,769,453** | **2,620,067,218,868** | **22.96%** |

* ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම් මත බද්ද, මුද්දර බද්ද, ආර්ථික සේවා ගාස්තු, ජාතිය ගොඩනැගීමේ බද්ද, පිරිවැටුම් බද්ද, ප්‍රේෂණ ගාස්තු සහ ජාතික ආරක්ෂක බද්ද වෙනත් බදුවලට ඇතුළත් වේ.

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**2.8 සටහන: 2025 වර්ෂයෙහි සහ 2024 වර්ෂයෙහි ආදායම් සංසන්දනය**




*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 2.6 අනෙකුත් සුවිශේෂ ජයග්‍රහණ

### 2.6.1 ආදායම් රැස් කිරීම ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක කර ඇති වැඩපිළිවෙළ

#### 2.6.1.1 බදු අභියාචනා විසඳීම සහ පරිපාලන සමාලෝචන සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීම (RARs)

වසර තුළ, නිකුත් කරන ලද තක්සේරු කිරීම් සම්බන්ධයෙන් ලැබුණු බදු අභියාචනා 1,632ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් විසඳා ඇති අතර, අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විශ්ලේෂණය පහත වගුවේ දක්වා ඇත.

**2.15 වගුව : ඉදිරිපත් කරන ලැබූ/ විසඳනු ලැබූ අභියාචනා සහ පරිපාලන සමාලෝචන සඳහා ඉල්ලීම් පිළිබඳ විශ්ලේෂණය**

| විස්තරය | ආබ | එඅබ | සආදාබ | රගැබ/ අආබ | උවිගෙ/ අපුආබ | අබ | ජාගොබ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 2025.01.01 දිනට ශේෂය* | 298 | 1,300 | 24 | 1 | 3 | 30 | 2 | 1,658 |
| වර්ෂය තුළ ලියාපදිංචි කිරීම් (APL 2 ප්‍රකාරව) | 414 | 1,277 | 163 | 3 | 4 | 26 | - | 1,887 |
| නිරවුල් කිරීම් | 428 | 1,136 | 19 | 1 | 5 | 41 | 2 | 1,632 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| කොමසාරිස් ජනරාල්-වරයාගේ කරුණු විමසීම සඳහා ඉදිරිපත් කිරීම් | 4 | 429 | 14 | 1 | - | - | - | 448 |
| ප්‍රතික්ෂේප කිරීම්/ ආපසු යැවීම්/ මාරුකිරීම් | 6 | 3 | - | - | 1 | 2 | - | 12 |
| 2025.12.31 දිනට ශේෂය | 274 | 1,009 | 154 | 2 | 1 | 13 | - | 1,453 |

* 2025.01.01 දිනට නිවැරදි අගය වාර්තා කරන ලදී.

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**2.6.1.2 ලියාපදිංචි බදුගෙවන්නන්ගේ වැඩිවීම**

පසුගිය වසරට සාපේක්ෂව 2025 මූල්‍ය වර්ෂය සඳහා බදු පදනම සැලකිය යුතු ලෙස වර්ධනය වී ඇත. වසර අවසාන වන විට විවිධ බදු යටතේ සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇති තැනැත්තන් සංඛ්‍යාව පහත දැක්වේ.

**2.16 වගුව: බදු වර්ග සඳහා ලියාපදිංචි වී ඇති සංඛ්‍යාව**

| | 2024.12.31 දිනට | | 2025.12.31 දිනට | |
|---|---|---|---|---|
| **ආදායම් බද්ද** | | | | |
| **සංස්ථාපිත** | | | | |
| වාසික සමාගම් /නිර්වාසික සමාගම් | 100,409 | | 125,432 | |
| **සංස්ථාපිත නොවන** | | | | |
| තනි පුද්ගල | 976,498 | | 1,159,505 | |
| හවුල් ව්‍යාපාර | 16,227 | | 17,659 | |
| **මුළු ආදායම් බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | **1,093,134** | | **1,302,596** |
| **වෙනත් බදු ගෙවන්නන්** | | | | |
| එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 21,227 | | 33,187 | |
| මූල්‍ය සේවාවන් මත එකතු කළ අගය මත බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 315 | | 347 | |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි වූ තැනැත්තන් | 12,097 | | 16,206 | |
| ඔට්ටු හා සූදු බද්ද සඳහා ලියාපදිංචි තැනැත්තන් | 1,248 | | 1,248 | |
| ප්‍රාග්ධන ලාභ බද්ද සඳහා ලියාපදිංචි තැනැත්තන් | 7,892 | | 10,181 | |
| **වෙනත් බදු ගෙවන්නන්ගේ එකතුව** | | **42,779** | | **61,169** |
| උ.වි.ගෙ./ අ.පු.ආ.බ. යෝජනා ක්‍රම යටතේ ලියාපදිංචි වූ සේවායෝජකයන් | 44,904 | | 46,571 | |
| පොලිය මත රඳවා ගැනීමේ බද්ද/ අ.ආ.බ.සඳහා ලියා-පදිංචි වී ඇති රඳවා ගැනීමේ බදු/ අත්තිකාරම් ආදායම් බදු අනුයෝජිතයන් | 1,592 | | 1,922 | |
| නිශ්චිත ගාස්තු මත රඳවා ගැනීමේ බද්ද/ අත්තිකාරම් ආදායම් බදු | 45,712 | | 45,775 | |
| මුද්දර බද්ද | 11,420 | | 11,978 | |
| | | 103,628 | | 106,246 |
| **ලියාපදිංචි කරනු ලැබූ මුළු බදු ගෙවන්නන් සංඛ්‍යාව** | | **1,239,541** | | **1,470,011** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

2025 වර්ෂ අවසානය වන විට, පුද්ගල ආදායම් බද්ද (IIT) යටතේ ලියාපදිංචි වූ බදු ගෙවන්නන්ගෙන් 68% ක් පිරිමි පුද්ගලයන් ද , 32%ක් කාන්තාවන් ද විය.

**2.6.1.3 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ තක්සේරු අනුව අයවිය යුතු බදු මුදල**

සලකා බලනු ලබන වර්ෂය තුළ, අභියාචනයන් සඳහා ඉදිරිපත් කර ඇති ඇති බදු තක්සේරු විවාදයට ලක් වූ බදු යටතේ වර්ගීකරණය කර ඇත. විනිශ්චය සභා හෝ අධිකරණ විසින් අවසන් තීරණ නිකුත් කරන තෙක් එවැනි තක්සේරු යටතේ බදු අයකිරීම සඳහා සුදුසුකම් නොලැබීම ඊට හේතු වේ. මෙම අභියාචනා විභාග කිරීමෙන් පසු තක්සේරු කරන ලද බදු බැඳියාව තහවුරු කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම සිදුවේ. එමෙන්ම, අය කළ හැකි බදු යනු අභියාචනයක් ඉදිරිපත් කර නොමැති නිසා හෝ අභියාචනා ක්‍රියාවලිය අවසන් කර ඇති නිසා අවසාන තක්සේරුව බවට නිශ්චය කළ තක්සේරු කිරීම් වන අතර ඒවාට අදාළව ද මේ වනවිට හිඟ බදු පැවතිය හැකි වුවද, එම බදු මුදල් දෙපාර්තමේන්තුව වෙත අයවිය යුතු බවට බලාත්මකව පවතී.

2025 වර්ෂය ආරම්භයේ හා අවසානයේදී අයවිය යුතු බදු පිළිබඳ සාරාංශය 2.17 වගුවෙහි දැක්වේ.

**2.17 වගුව: 2025.12.31 දිනට අයවිය යුතු බදු පිළිබඳ විශ්ලේෂණය**

| විස්තරය | බද්ද (රු. මි.) | දණ්ඩන (රු. මි.) | පොලිය (රු. මි.) | එකතුව (රු. මි.) |
|---|---|---|---|---|
| **2025.01.01 දිනට** | | | | |
| දළ මුදල් ප්‍රමාණය | 672,433.87 | 388,559.18 | 89,010.98 | 1,150,004.03 |
| විවාදයට ලක්වූ මුදල (අත්හිටවූ මුදල) | 575,998.97 | 317,132.54 | 81,175.69 | 974,307.20 |
| එකතු කළ යුතු මුදල | 96,434.90 | 71,426.64 | 7,835.29 | 175,696.83 |
| **2025.12.31 දිනට** | | | | |
| දළ මුදල් ප්‍රමාණය | 1,395,290.06 | 435,835.95 | 333,271.01 | 2,164,397.02 |
| විවාදයට ලක්වූ මුදල (අත්හිටවූ මුදල) | 1,069,660.70 | 331,691.45 | 277,715.67 | 1,679,067.82 |
| එකතු කළ යුතු මුදල | 325,629.36 | 104,144.50 | 55,555.34 | 485,329.20 |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

2025 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බදු පිළිබඳ විස්තරාත්මක විග්‍රහයක් ඇමුණුම 06හි දක්වා ඇත.

**2.6.1.4 ඵලදායීතා අනුපාතය**

බදු ආදායම් රැස් කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් දරනු ලැබූ මුළු වියදමට අනුපාතිකව එකතු කරන ලද මුළු බදු ආදායමේ අනුපාතය ලෙස අර්ථ දක්වා ඇති ඵලදායිතා අනුපාතය, දෙපාර්තමේන්තුව, එහි වියදම්වලට සාපේක්ෂව කෙතරම් කාර්යක්ෂමව ආදායමක් එකතු කරන්නේද යන්න පිළිබඳ ප්‍රධාන මිනුමක් ලෙස ක්‍රියා කරයි. 2023, 2024 සහ 2025 වර්ෂයන් සඳහා ඵලදායීතා අනුපාතය පිළිබඳ සංක්ෂිප්ත කාර්ය සාධනය පහත දක්වා ඇත:

**2023:** මුළු බදු ආදායම රුපියල් මිලියන 1,842,315.12ක් වූ අතර, මුළු වියදම රුපියල් මිලියන 7,539.50ක් විය. ඒ අනුව ඵලදායිතා අනුපාතය 244.36ක් විය.

**2024:** බදු ආදායම රුපියල් මිලියන 2,620,067.22 දක්වා ඉහළ ගොස් ඇති අතර, වියදම ද රුපියල් මිලියන 8,018.95 දක්වා ඉහළ ගියේය. ඵලදායිතා අනුපාතය 326.73 දක්වා ඉහළ ගොස් ඇත.

**2025:** බදු ආදායම රුපියල් මිලියන 3,221,545.77 දක්වා තවදුරටත් වර්ධනය වූ අතර, වියදම රුපියල් මිලියන 8,986.55ක් විය. ඒ අනුව, කාර්යක්ෂමතාවයෙහි අඛණ්ඩ වර්ධනයක් පිළිබිඹු කරමින් ඵලදායිතා අනුපාතය 358.49 දක්වා ළඟා විය.

**පසුගිය වසර තුන සඳහා ඵලදායිතා අනුපාත විශ්ලේෂණය:**

2023 වර්ෂයේදී, ඵලදායිතා අනුපාතය ආසන්න වශයෙන් 244.36ක් වූ අතර, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් වියදම් කරන සෑම රුපියල් මිලියනයක් සඳහා ම රුපියල් මිලියන 244.36ක පමණ බදු ආදායමක් එකතු කර ඇති බව එයින් අදහස් වේ. මෙය අය කරන ලද රුපියල් 100කට රුපියල් 0.41 (ශත 41) ක අය කිරීමේ පිරිවැයකට අනුරූප වේ.

2024 වර්ෂයේදී, ඵලදායිතා අනුපාතය 326.73ක් පමණ දක්වා වැඩි වූ අතර, එයින් පෙන්නුම් කළේ සෑම රුපියල් මිලියනයක වියදමකටම රුපියල් මිලියන 326.73ක් එකතු කර ඇති බවයි. එහි ප්‍රතිඵලයක් ලෙස, එකතු කිරීමේ පිරිවැය එකතු කරන ලද රුපියල් 100කට රුපියල් 0.31 (ශත 31) දක්වා අඩු විය.

2025 වර්ෂය වන විට, ඵලදායිතා අනුපාතය ආසන්න වශයෙන් 358.49ක ඉහළම මට්ටමට ළඟා වූ අතර, බදු ආදායම් රැස් කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් වියදම් කරනු ලබන සෑම රුපියල් මිලියනයකටම රුපියල් මිලියන 358.49ක බදු අදායමක් එක් රැස් කරනු ලබන බව එයින් අදහස් විය. බදු අය කිරීමේ පිරිවැය තවදුරටත් රුපියල් 100කට රුපියල් 0.28 (ශත 28) දක්වා අඩු වූ අතර, මෙහෙයුම් කාර්යක්ෂමතාවයේ කැපී පෙනෙන අභිවෘද්ධියක් පිළිබිඹු කරමින්, රැස්කළ බදු ආදායම, ආදායම් රැස්කිරීමේ පිරිවැය සැලකිය යුතු ලෙස ඉක්මවා ගියේය.

සමස්තයක් වශයෙන්, 2023 සිට 2025 දක්වා ඵලදායිතා අනුපාත තුළින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි කාර්යක්ෂමතාවයේ පැහැදිලි සහ ස්ථාවර වර්ධනයක් පෙන්නුම් කරන අතර, ඒ අතරින් 2025 මූල්‍ය වර්ෂය වඩාත් සුවිශේෂී විය.

**2.18 වගුව: ආදායම රැස්කිරීම, මුළු වියදම සහ ආදායම් රැස් කිරීමේ පිරිවැය**

(රු. මි.)

| විස්තරය | 2023 | 2024 | 2025 |
|---|---|---|---|
| රැස් කරනු ලැබූ බදු ආදායම | | | |
| ආදායම් බද්ද | 908,417.65 | 1,024,098.43 | 1,131,326.09 |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 2,679.20 | 1,853.67 | 8,020.68 |
| එකතු කළ අගය මත බද්ද | 694,460.23 | 1,309,679.83 | 1,746,874.45 |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව්කිරීම් මත බද්ද | 11.78 | 1.39 | 1.49 |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 31.37 | 52.18 | 19.67 |
| ඔට්ටු හා සූදු බද්ද | 6,921.82 | 9,814.82 | 10,241.92 |
| කොටස් ගනුදෙනු බද්ද | 2,477.74 | 3,130.91 | 7,455.36 |
| විගමන බද්ද | 14.35 | 33.98 | 67.04 |
| මුද්දර බද්ද | 10,009.41 | 14,976.10 | 22,452.96 |
| ආර්ථික සේවා ගාස්තු | 246.68 | 245.07 | 24.83 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 359.35 | 201.30 | 528.74 |
| භාණ්ඩ හා සේවා බද්ද | 0.24 | 0 | - |
| පිරිවැටුම් බද්ද | 3.89 | 9.02 | 10.47 |
| ජාතික ආරක්ෂක බද්ද | 0.88 | 1.16 | 0.67 |
| ප්‍රේෂණ ගාස්තු | - | 0.62 | 1.89 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 216,180.55 | 250,868.72 | 294,519.51 |
| කැසිනෝ බලපත්‍ර ගාස්තු | 500.00 | 5,100.00 | - |
| **මුළු බදු ආදායම** | **1,842,315.12** | **2,620,067.22** | **3,221,545.77** |
| වියදම | | | |
| පුනරාවර්තන වියදම් | | | |
| පඩිනඩි | 2,999.20 | 3,305.28 | 3,812.17 |
| ප්‍රවාහන | 4.16 | 5.21 | 8.68 |
| සැපයුම් සහ උපකරණ | 237.48 | 278.75 | 274.53 |
| නඩත්තු සහ අලුත්වැඩියා | 338.27 | 263.83 | 202.42 |
| කොන්ත්‍රාත් සේවා | 816.28 | 1,017.96 | 1,217.92 |
| මාරු කිරීම් | 31.80 | 29.53 | 29.07 |

| | | | |
|---|---|---|---|
| ප්‍රාග්ධන වියදම් | | | |
| ප්‍රතිසංස්කරණ සහ වැඩිදියුණු කිරීම් | 17.17 | 17.27 | 21.34 |
| අත්පත්කර ගැනීම් | 18.21 | 153.00 | 60.06 |
| ධාරිතා ගොඩනැංවීම | 8.80 | 11.97 | 10.37 |
| ආයෝජන (RAMIS ව්‍යාපෘතිය) | 3,068.11 | 2,936.15 | 3,349.99 |
| **මුළු වියදම්** | **7,539.50** | **8,018.95** | **8,986.55** |
| **රු. 100ක් රැස් කිරීම සඳහා පිරිවැය** | **0.41** | **0.31** | **0.28** |
| රු. 100ක් රැස් කිරීම සඳහා පිරිවැය (ආනයන මත එකතු කළ අගය සඳහා බද්ද, ජාතිය ගොඩනැගීමේ බද්ද, ආර්ථික සේවා ගාස්තු, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද හා භාණ්ඩ හා සේවා බද්ද හැර) | **0.48** | **0.41** | **0.40** |
| **ඵලදායීතා අනුපාතය** | **244.36** | **326.73** | **358.49** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 2.7 දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභියෝග සහ අනාගත ඉලක්ක

විශාල අවිධිමත් ආර්ථිකය, වක්‍ර බදු මත අධික ලෙස රඳා පැවතීම, මානව සම්පත් සහ යටිතල පහසුකම්වල හිඟය සහ බදු සහ ඩිජිටල් සාක්ෂරතාවය පිළිබඳව මහජන දැනුම්වත්භාවය අවම වීම ඇතුළු මූලික අභියෝග කිහිපයකට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මුහුණ දෙයි. මෙම ගැටලු විසඳීම සඳහා, බදු පදනම පුළුල් කිරීම, සෘජු බදු ආදායම වැඩි කිරීම, ඩිජිටල් පද්ධති සහ අවදානම් පාදක විගණනය තුළින් බදු ගෙවන්නන්ගේ අනුකූලතාව වර්ධනය කිරීම සහ කඩදාසි රහිත බදු පරිපාලනය සඳහා විද්‍යුත් සේවා භාවිතය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි දෙපාර්තමේන්තුව අවධානය යොමු කරයි. නවීකරණය, බදු ගෙවන්නන්ගේ දැනුම්වත්භාවය ඉහළ නැංවීම සහ බදු බලාත්මක කිරීම තුළින්, දිගුකාලීන ආර්ථික වර්ධනය සහ මූල්‍ය ස්ථාවරත්වය සඳහා සහාය වන වඩාත් කාර්යක්ෂම, විනිවිද පෙනෙන සහ තිරසාර බදු ක්‍රමයක් ගොඩනැගීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

### 2.7.1 අභියෝග

#### 2.7.1.1 අවිධිමත් ආර්ථිකය

ශ්‍රී ලංකාවේ බදු පදනම පුළුල් කිරීම සඳහා පුළුල්ව පැතිරුණු අවිධිමත් ආර්ථිකය ප්‍රධාන අභියෝගයක් වී ඇත. 2025 වර්ෂයේදී දී රුපියල් ට්‍රිලියන 3.2ක් වූ මුළු ආදායම තුළ එ.අ.බ. වැනි වක්‍ර බදු ප්‍රමුඛ වූ අතර, වර්තමාන බදු ආදායම්වලින් 54%කට ආසන්න ප්‍රමාණයක් සඳහා එ.අ.බ. දායක වේ. මෙම නිල බදු ජාලයෙන් පිටත ක්‍රියාත්මක වන අවිධිමත් ශ්‍රම බලකාය සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලින් බදු අය කරගැනීම දුෂ්කර වීම මෙම තත්ත්වයට එක් හේතුවකි. මෙම ගැටලුවට පිළියමක් ලෙස, දෙපාර්තමේන්තුව ගෙයින් ගෙට ලියාපදිංචිය *(door-to-door registration)* සඳහා ජංගම තාක්ෂණය භාවිතා කරමින් ක්ෂේත්‍ර නිරීක්ෂණ වැඩසටහනක් දියත් කොට ඇත.

#### 2.7.1.2 සෘජු බදුවලට සාපේක්ෂව වක්‍ර බදු අනුපාතය

ඓතිහාසිකව, ශ්‍රී ලංකාවේ බදු ප්‍රතිපත්තිය වක්‍ර බදුකරණය කෙරෙහි දැඩි ලෙස නැඹුරු වී ඇත. මෑත කාලීනව, විශේෂයෙන් වැට් බදු අනුපාත ඉහළ නැංවීම සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ක්‍රියාත්මක කිරීම හරහා පරිභෝජනය පදනම් කරගත් බදු මත අඛණ්ඩව රඳා පැවතීම දක්නට ලැබුණි. මෙම ක්‍රමවේදයන් තුළින් බදු ආදායම තුළ කඩිනම් ස්ථාවරත්වයක් නිර්මාණය කළ ද, පෙර වර්ෂයේ 28:72ක් ව පැවති සෘජු බදුවලට සාපේක්ෂව වක්‍ර බදු වල ජාතික අනුපාතය මෙම වසරේ 23:77 දක්වා වෙනස් වීමට හේතුවී තිබේ.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි බදු රැස් කිරීමේ රාමුව තුළ, මෙම අනුපාතය දැනට 36:64 වේ. මෙය ජාතික සාමාන්‍යයට වඩා ඉහළ අගයක් වුවද, ප්‍රතිපත්තිමය වෙනසක් ඇති කිරීමේ තීරණාත්මක අවශ්‍යතාවය එයින් අවධාරණය කරනු ලබයි. හිතකර 60:40 අනුපාතයක් සඳහා වූ රජයේ ඉලක්කය සපුරා ගැනීම සඳහා, දෙපාර්තමේන්තුව ආදායම් පාදක ආදායම් මාර්ග වෙත යොමුවීම වෙනුවෙන් ක්‍රියාත්මක වේ.

### 2.7.1.3 මෙහෙයුම් සීමාවන්: මානව ප්‍රාග්ධනය සහ යටිතල පහසුකම්

2025 දෙසැම්බර් 31 වන විට, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සැලකිය යුතු මට්ටමක සම්පත් සීමාවීමකට මුහුණ පා සිටී. මානව ප්‍රාග්ධනයෙහි හිඟය මින් ප්‍රධාන වන අතර, විවිධ මට්ටම්වල කාර්ය මණ්ඩල පුරප්පාඩු 415ක් පමණ පවතින අතර, එය 14%ක පුරප්පාඩු අනුපාතයකට සමාන වේ. මෙම හිඟය බදු පරිපාලනය සහ අත්‍යවශ්‍ය සහායක සේවා සැපයීමේදී දැඩි පීඩනයක් ඇති කරනු ලබන අතර ප්‍රමාණවත් භෞතික යටිතල පහසුකම් නොමැතිකම, විශේෂයෙන් ප්‍රධාන කාර්යාලයේ බිම් අවකාශයේ සීමිත බව සහ යල් පැන ගිය පහසුකම් හේතුවෙන් මෙහෙයුම් කාර්යක්ෂමතාවයට බාධා ඇති වේ. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එහි ආදායම් ඉලක්ක සපුරා ගැනීමට සහ බදු ගෙවන්නන් නවීකරණය වූ සේවාවක් සැපයීම සඳහා, පුරප්පාඩු කඩිනමින් පිරවීම සහ යටිතල පහසුකම් පුළුල් කිරීම ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා ප්‍රමුඛතා ලෙස පවතී.

### 2.7.1.4 සමාජ-තාක්ෂණික බාධාවන්: සාක්ෂරතාව සහ ඩිජිටල් පරිවර්තනය

මුළුමනින්ම ඩිජිටල්කරණය කරන ලද, කඩදාසි රහිත බදු පරිපාලනයක් සාක්ෂාත් කර ගැනීම සඳහා පවතින මූලික අභියෝගයක් වන්නේ පොදු ජනතාව තුළ බදු ආශ්‍රිත දැනුම්වත්භාවය සහ පරිගණක සාක්ෂරතාවය අවම වීමයි. RAMIS පද්ධතිය සහ මාර්ගගත ගොනු කිරීමේ පද්ධති හරහා දෙපාර්තමේන්තුව සිය ඩිජිටල් අවතීර්ණවීම පුළුල් ලෙස ක්‍රියාත්මක කර ඇතත්, සංකීර්ණ බදු බැඳීම් පිළිබඳ මහජනතාවගේ සීමිත අවබෝධය සහ ඩිජිටල් මෙවලම් පිළිබඳ ප්‍රවීණතාවයක් නොමැතිකම හේතුවෙන් එවැනි නවීන ක්‍රමවේද වෙත අනුවර්තනය වීම තරමක් ප්‍රමාද වේ. මෙම තත්වය ස්වයං තක්සේරු කිරීම්වලදී ඉහළ දෝෂ අනුපාත සහ භෞතික ලියකියවිලි සහ ප්‍රති මට්ටමේ සහාය මත නිරන්තර විශ්වාසයක් ඇති කරයි.

මෙම තත්ත්වය පාලනය කිරීම සඳහා, තාක්ෂණික යටිතල පහසුකම් පමණක් ප්‍රමාණවත් නොවන බව දෙපාර්තමේන්තුව හඳුනා ගනී; ඒ සඳහා බදු ගෙවන්නන්ගේ දැනුම්වත්කිරීම සඳහා උපාය මාර්ගික වැඩපිළිවෙළක් ද ක්‍රියාත්මක කළ යුතුය. එමෙන්ම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය මත පරිපාලනමය බර අඩු කිරීම සහ කඩදාසි රහිත පරිසරයකට මාරුවීම ඇතුළත් බව සහතික කිරීම සඳහා ඩිජිටල් පරතරය පියවීම අත්‍යවශ්‍ය වේ. ඉදිරියේදී, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තම පරිගණක පද්ධතියෙහි පරිශීලක අතුරුමුහුණත් සරල කිරීම සහ බදු ගෙවන්නන් සවිබල ගැන්වීම සඳහා වැඩිදියුණු කළ ප්‍රජා සම්බන්ධතා වැඩසටහන් ක්‍රියාත්මක කොට එතුළින් බදු අනුකූලතාවය බාධාවකින් තොරව ඩිජිටල් අත්දැකීමක් බවට පරිවර්තනය කිරීමට අපේක්ෂා කරයි.

### 2.7.2 අනාගත ඉලක්ක

කාර්යක්ෂමතාව සහ පාරිසරික තිරසාරභාවය වැඩි දියුණු කරනු ලබන උපායමාර්ගික අරමුණු කෙරෙහි ගෝලීය වශයෙන් බදු පරිපාලකයන් වැඩි අවධානයක් යොමු කරනු ලබයි. ඒ අනුව, බදු පදනම පුළුල් කිරීම, අනුකූලතාව ශක්තිමත් කිරීම සහ කඩදාසි රහිත මෙහෙයුම් කරා විතැන් වීම පහසු කිරීම සඳහා ඉලෙක්ට්‍රොනික සේවා භාවිතය දිරිමත් කිරීම දෙපාර්තමේන්තුවේ මූලික ප්‍රමුඛතාවලට ඇතුළත් වේ. මෙම ගෝලීය ප්‍රවණතාවන්ට අනුකූලව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉදිරි දැක්මක් සහිත උපායමාර්ගික අරමුණු කිහිපයක් නිර්වචනය කර ඇත.

#### 2.7.2.1 බදු පදනම පුළුල් කිරීම

රාජ්‍ය මූල්‍ය තිරසාරභාවය ශක්තිමත් කිරීම සහ දිගුකාලීන ආර්ථික වර්ධනයට සහාය වීම සඳහා බදු පදනම පුළුල් කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාවයක් වේ. පෙර බදු නොගෙවූ තැනැත්තන් බදු ක්‍රමයට ගෙන ඒම ඊට ඇතුළත් වන අතර එමඟින් සීමා සහිත බදු ගෙවන්නන් කණ්ඩායමක් මත යැපීම අවම කොට අතරම සමස්ත ආදායම ඉහළ නංවාලීමට හැකියාව ලැබේ.

මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බදු අනුකූලතාව වැඩිදියුණු කිරීම, පරිපාලන පද්ධති නවීකරණය කිරීම සහ ස්වේච්ඡා අනුකූලතාව දිරිමත් කිරීම සඳහා බදු ගෙවන්නන්ගේ දැනුම්වත්භාවය ප්‍රවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. රජයේ ආදායම ඉහළ නැංවීම සඳහා පමණක් නොව, බදු රාමුව තුළ සාධාරණත්වය සහ සමානත්වය ප්‍රවර්ධනය කිරීම සඳහා ද බදු පදනම පුළුල් කිරීම අත්‍යවශ්‍ය වේ.

#### 2.7.2.2 බදු අනුකූලතාව වැඩි දියුණු කිරීම

බදු පද්ධතියේ සමස්ත කාර්යක්ෂමතාව සහ ඵලදායීතාවය ශක්තිමත් කිරීම සඳහා බදු අනුකූලතාව වැඩිදියුණු කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි මූලික උපායමාර්ගික අරමුණු අතරට ඇතුළත් වේ. ඉහළ අනුකූලතා මට්ටමක් සහතික කිරීම තුළින් බදු බැඳියාවට යටත් සියලුම බදු ගෙවන්නන්ට ඔවුන්ගේ නීතිමය බැඳීම් සපුරාලීම අවශ්‍ය වන අතර බදු බර සාධාරණ ලෙස බෙදා හැරීමට සහ රජයේ ආදායම වැඩි කිරීමට එය හේතු වේ.

මෙම ඉලක්කයට සහාය වීම සඳහා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් උසස් ඩිජිටල් තාක්ෂණයන් අනුගමනය කිරීම, පරිපාලන ක්‍රියා පටිපාටි සරල කිරීම සහ ස්වේච්ඡා අනුකූලතාව දිරිමත් කිරීම සඳහා බදු ගෙවන්නන්ගේ දැනුම්වත්භාවය

වැඩිදියුණු කිරීමේ වැඩසටහන් සහ ප්‍රජා සම්බන්ධතා වැඩසටහන් පුළුල් කිරීම සඳහා ප්‍රමුඛත්වය ලබා දෙයි. ඒ සමගම, අනුකූල නොවීම අධෛර්යමත් කිරීම සඳහා අවදානම් පාදක විගණන ඇතුළු වැඩිදියුණු කළ බලාත්මක කිරීමේ යාන්ත්‍රණ ක්‍රියාත්මක කරනු ලැබේ.

වගවීම ප්‍රවර්ධනය කිරීම, මූල්‍ය ස්ථාවරත්වය පවත්වා ගැනීම සහ රටේ දිගුකාලීන සමාජ-ආර්ථික සංවර්ධනයට සහාය වීම සඳහා බදු අනුකූලතාව ශක්තිමත් කිරීම අත්‍යවශ්‍ය පියවරකි.

### 2.7.2.3 කඩදාසි රහිත බදු පරිපාලනයක් සඳහා විද්‍යුත් සේවා භාවිතය උපරිම කිරීම

කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, පිරිවැය අවම කිරීම සහ පාරිසරික තිරසාරභාවය සඳහා සහාය වීම සඳහා පූර්ණ ඩිජිටල්, කඩදාසි රහිත බදු පරිපාලනයකට මාරුවීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන දිගුකාලීන අරමුණකි. මෙම ඉලක්කය ඩිජිටල් පාලනයේ ගෝලීය ප්‍රවණතා සමග සමපාත වන අතර බදු සේවාවන්හි විනිවිදභාවය, ප්‍රවේශ්‍යතාව සහ සමස්ත ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම එමගින් අරමුණු කරනු ලබයි.

බදු ගොනු කිරීම, ගෙවීම් සහ සන්නිවේදනය සඳහා ඉලෙක්ට්‍රොනික වේදිකා භාවිතය දිරිමත් කිරීමෙන්, ක්‍රියාවලීන් විධිමත් කිරීම, දෝෂ අවම කිරීම සහ බදු ගෙවන්නන්ට වඩාත් පහසු අත්දැකීමක් ලබා දීම දෙපාර්තමේන්තුවෙහි අරමුණයි. එමෙන්ම, මෙම ඩිජිටල් මෙහෙයුම් තුළින් පරිපාලන පිරිවැය අවම කර ගත හැකි වන අතර බදු ගනුදෙනු වේගවත්ව, වඩාත් ආරක්ෂිතව හැසිරවීමට හැකියාව ලබා දෙනු ඇත.

බදු ක්‍රමය නවීකරණය කිරීම, කාර්යක්ෂම සහ පුරවැසි කේන්ද්‍රීය රාජ්‍ය පරිපාලනයක් ගොඩනැගීම සඳහා විද්‍යුත් සේවාවන්ට අනුවර්තනය වීම අත්‍යවශ්‍ය වේ. මෙම අනාගත ඉලක්ක සපුරා ගැනීම සඳහා නීති සම්පාදන ප්‍රතිසංස්කරණ, තාක්ෂණික අභිවර්ධනය, ක්‍රියාකාරී මහජන සහභාගීත්වය සහ ඵලදායී බලාත්මක කිරීමේ පියවරයන් ඒකාබද්ධ කරගනු ලැබූ ප්‍රවේශයක් අනුගමනය කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ සඳහා උපායමාර්ගික ප්‍රමුඛත්වය ලබාදීම තුළින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තම මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම, අනුකූලතාව වැඩි දියුණු කිරීම සහ ආර්ථික ස්ථාවරත්වය සහ තිරසාර වර්ධනයට සහාය වීමට අදාළ කාර්යභාරය වඩා හොඳින් සවිබල ගන්වාගැනීමට හැකියාව ලැබේ.

# 02 පරිච්ඡේදය

## III කොටස - අනුකූලතාව සහ බලාත්මක කිරීම

### 2.8 හැඳින්වීම

බදුකරණ පද්ධති, ස්වේච්ඡා අනුකූලතාව සහ දැඩි බලාත්මක කිරීම අතර සියුම් සමතුලිතතාවයක් මත රඳා පවතියි. අනුකූලවීම මඟින් බදු ගෙවන්නන් ඔවුන්ගේ නෛතික යුතුකම් ඉටු කිරීමට, නිවැරදි වාර්තා සැපයීමට සහ නියමිත වෙලාවට බදු ගෙවීමට ඇති කැපවීම නිරූපණය කරන අතර, නීතිය ක්‍රියාත්මක කිරීම මඟින් එම නීතිවලින් බැහැර වන අවස්ථා හඳුනාගෙන ඒවාට දඬුවම් පැමිණවීම සඳහා අවශ්‍ය ආරක්ෂක පියවරක් ලෙස ක්‍රියා කරයි. මෙම කැපී පෙනෙන සාධක එක්ව හුදු ආදායම රැස් කිරීමේ කාර්යය ඉක්මවා ගොස් රාජ්‍යයේ මූල්‍ය විශ්වසනීයත්වය (fiscal integrity) ආරක්ෂා කරන අතරම සියලුම පුරවැසියන් සඳහා සමාන අවස්ථා සහිත පරිසරයක් සහතික කරයි. රාජ්‍ය සේවා සඳහා පවතින ඉල්ලුම වර්ධනය වීමත් සමඟ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වඩාත් නවීන බහු-විධ උපාය මාර්ගයක් කරා යොමු වී ඇත.

මෙම පරිච්ඡේදය මගින් ජාතික ආදායම සුරක්ෂිත කිරීම සඳහා ක්‍රියාවට නංවන ලද බදු අනුකූලතාවයේ ප්‍රධාන සන්ධිස්ථාන සහ බදු බලාත්මක කිරීමේ දැඩි ක්‍රියාමාර්ග කෙරෙහි අවධානය යොමු කරමින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2025 වර්ෂයේ උපායමාර්ගික මුලපිරීම් විශ්ලේෂණය කරයි.

### 2.9 බදු ගෙවන්නන්, බදු සම්බන්ධ වෘත්තිකයන් සහ මහජනතාව සඳහා පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන්

2025 වසර පුරාම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පුළුල් බදු සාක්ෂරතා ක්‍රියාවලියක් තුළින් පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයට ප්‍රමුඛතාව ලබා දෙන ලදී. බදු ගෙවන්නන්, වෘත්තිකයන් සහ සාමාන්‍ය ජනතාව ඉලක්ක කරගනිමින් නිර්මාණය කර ඇති මෙම සැසි නීති සම්පාදනය හා සම්බන්ධ යාවත්කාලීන කිරීම් සඳහා මඟපෙන්වමින් ඊ-සේවාව හරහා බදු වාර්තා ගොනු කිරීමේ වේදිකාව වැඩිදියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කළේය. සජීවී මාර්ගගත සම්මන්ත්‍රණ (webinars) සමඟ සජීවී වැඩමුළු (in-person workshops) ඒකාබද්ධ කරන ලද දෙමුහුන් තොරතුරු සම්ප්‍රේෂණ ආකෘතියක් අනුගමනය කිරීමෙන් දෙපාර්තමේන්තුව උපරිම ප්‍රවේශය සහතික කළ අතර පසුව ස්ථිර මහජන ප්‍රවේශය සඳහා නිල ඩිජිටල් මාර්ගයන්හි සියලුම සැසි සංරක්ෂණය කරන ලදී. සමාජ මාධ්‍ය සහ නිල වෙබ් අඩවිය හරහා ප්‍රචාරය කරන ලද මෙම දැනුම්වත් කිරීමේ වැඩසටහන් ඔස්සේ අවධානය යොමු කරන ලද ප්‍රධාන මාතෘකා පහත පරිදි වේ.

1. ආදායම් බදු වාර්තා මාර්ගගතව පුරවනු ලබන ආකාරය (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
2. මාර්ගගත බදු ද්වාරයෙහි කාර්යයන් (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
3. 2425 තක්සේරු වර්ෂය සඳහා රඳවා ගැනීමේ බද්ද/ අත්තිකාරම් ආදායම් බදු ප්‍රකාශය පුරවනු ලබන ආකාරය
4. අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) 2024/2025
5. පොලිය මත 10%ක රඳවා ගැනීමේ බද්දෙන් සහනයක් ලබා ගන්නා අකාරය (සිංහල සහ ඉංග්‍රීසි)
6. 2025 අංක 2 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
7. සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) වලින් ඔබ්බට අවදානම් පාදක ආපසු ගෙවීමේ විශිෂ්ටත්වය කරා ගමන් කිරීම (1 වන සැසිය)
8. සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) වලින් ඔබ්බට අවදානම් පාදක ආපසු ගෙවීමේ විශිෂ්ටත්වය කරා ගමන් කිරීම (2 වන සැසිය)
9. 2425 තක්සේරු වර්ෂය සඳහා තනි පුද්ගල ආදායම් බදු වාර්තාව
10. 2425 තක්සේරු වර්ෂය සඳහා තනි පුද්ගල ආදායම් බදු වාර්තාව - සරල කරන ලද ක්‍රමය (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
11. SVAT අවලංගු කිරීම සමඟ ඇතිවූ වෙනස්කම්
12. බදු වාර්තා ස්වයං නිකුතුව (සිංහල සහ ඉංග්‍රීසි)
13. පෞද්ගලික හඳුනාගැනීමේ අංකය (PIN) යනු කුමක්ද?
14. ඊ-සේවා වෙත පිවිසෙන ආකාරය
15. ආදායම් බදු වාර්තාව මාර්ගගතව ඉදිරිපත් කිරීම
16. බදු ගෙවන්නා දැනුම්වත් කිරීම (YouTube මඟින් කෙරෙන කෙටි දැනුම්දීම්) (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
17. ආදායම් බදු වාර්තා ඉදිරිපත් කිරීමට ඇත්තේ

තව දින 10ක් බව දැනුවත්කිරීම (YouTube මගින් කෙරෙන කෙටි දැනුම්දීම්) (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)

18. 2025 නොවැම්බර් 30ට පෙර ඔබගේ ආදායම් බදු වාර්තා භාර දෙන්න (YouTube මගින් කෙරෙන කෙටි දැනුම්දීම්) (සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි)
19. බදු ගෙවන්නන්ගේ තොරතුරු යාවත්කාලීන කිරීම සඳහා උපදෙස්

ඉහත සඳහන් දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා ඉලක්කගත කණ්ඩායම් අතරට බදු ගෙවන්නන්, විගණන ආයතන, බදු උපදේශකයින්, සේවායෝජකයින් සහ සේවකයින්, රජයේ ගණකාධිකාරීවරුන් සහ බදුකරණයට අදාළ කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශ්වකරුවන් ඇතුළත් විය.

බදු සම්බන්ධයෙන් මහජනතාවගේ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් සිදු කළ මෙම කාර්යයන් තුළින් වසර තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සහභාගිවන්නන් 47,597 දෙනෙකු දැනුවත් කරන ලදී.

2025 දී පවත්වන ලද දැනුම්වත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර ඇමුණුම 07හි දක්වා ඇති අතර එහි සාරාංශයක් 2.19 වගුවෙහි දක්වා ඇත.

**2.19 වගුව: දැනුම්වත් කිරීමේ වැඩසටහන්වල සාරාංශය**

| වැඩසටහන් සංඛ්‍යාව | භෞතිකව සහභාගීවූවන් සංඛ්‍යාව |
|---|---|
| 143 | 47,597 |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 2.10 වාර්තා ගොනු කිරීමේ අනුකූලතාව

2025 මූල්‍ය වර්ෂය පුරාම මෙම දෙපාර්තමේන්තුව අදාළ නීති සහ රෙගුලාසි මගින් නිශ්චිතව දක්වා ඇති ව්‍යවස්ථාපිත ගොනු කිරීමේ කාලරාමුවලට පූර්ණ වශයෙන් අනුකූල වෙමින් කටයුතු කරන ලදී. මෙම විස්තීර්ණ අනුකූලතා රාමුව තුළ වාර්ෂික ආදායම් බදු වාර්තා, මාසික සහ කාර්තුමය එකතු කළ අගය මත බදු (VAT) වාර්තා , කාර්තුමය සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) වාර්තා සහ වාර්ෂික අත්තිකාරම් ආදායම් බද්ද (AIT) සහ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) යන බදුවලට අදාළ බදු ප්‍රකාශන ඇතුළත්ව කලින් කලට අදාළ සහ වාර්ෂික බැඳීම් කළමනාකරණය කිරීම ඇතුළත් විය. බදු වර්ගය අනුව ප්‍රධාන අනුකූලතා මිනුම් පහත පරිදි සාරාංශ කළ හැකිය.

### 2.10.1 2024/2025 තක්සේරු වර්ෂය සඳහා සංස්ථාපිත ආදායම් බදු වාර්තා ගොනු කිරීම

2024/2025 තක්සේරු වර්ෂය තුළ සංස්ථාපිත ආදායම් බදු (CIT) වාර්තා ගොනු කිරීමේ දී විශාල බදු ගෙවන්නන් සහ වෙනත් සංස්ථාපිත බදු ගෙවන්නන් අතර සැලකිය යුතු වෙනසක් පෙන්නුම් කළේය. සමස්තයක් වශයෙන් බදු වාර්තාවලින් 35% ක් නියමිත දිනට ගොනු කර ඇති අතර නියමිත දින සිට මාසයක් ඇතුළත 38%ක් භාර දී ඇත.

මුළු ආදායම් බදු ආදායමෙන් බහුතරයකට දායකත්වය සපයන විශාල බදු ගෙවන්නන් විසින් ඉහළ අනුකූලතාවයක් පෙන්නුම් කරන ලදී. ඔවුන්ගෙන් 94%ක් බදු වාර්තා නියමිත වේලාවට ගොනු කරන ලද අතර 95%ක් නියමිත දින සිට මාසයක් ඇතුළත ගොනු කරන ලදී. ඊට සාපේක්ෂව අනෙකුත් සංස්ථාපිත බදු ගෙවන්නන් පසුපසින් සිටි අතර නියමිත දිනට සපුරා ඇත්තේ 35%ක් පමණක් වන අතර ඊළඟ මාසය තුළ ගොනු කර ඇත්තේ 37%කි.

මෙමගින් පූර්ව වර්ෂයට වඩා ප්‍රගතියක් පෙන්නුම් කරයි. සියලුම සංස්ථාපිත බදු වාර්තාවලින් 29% ක් නියමිත දිනට ගොනු කර ඇති අතර මාසයක් ඇතුළත 35%ක් ගොනු කර තිබේ. දළ වශයෙන් 6% ක ප්‍රතිශතයක සමස්ත වැඩිවීම නියමිත කාලයට ගොනු කිරීමේ ධනාත්මක ප්‍රවණතාවක් පිළිබිඹු කරන අතර විශාල බදු ගෙවන්නන් නිරන්තරයෙන් ඉහළ අනුකූලතා මට්ටම් පවත්වා ගනු ලැබේ.

2.20 වගුව මගින් 2024/2025 තක්සේරු වර්ෂය සඳහා සංස්ථාපිත ආදායම් බදු වාර්තා ගොනු කිරීම් සහ අනුකූලතා අනුපාත පිළිබඳ සවිස්තරාත්මක බෙදීයාම දැක්වෙන අතර නියමිත දිනට සහ නියමිත දින සිට මාසයක් ඇතුළත ගොනු කිරීම් යන දෙකම පෙන්නුම් කරයි. ක්‍රමවත් සැකසුම් සහ වාර්තාකරණය සහතික කරමින් සියලුම බදු වාර්තා අනිවාර්ය විද්‍යුත් ගොනු කිරීමේ පද්ධතිය හරහා ඉලෙක්ට්‍රොනිකව ගොනු කරන ලදී.

**2.20 වගුව: 2024/2025 තක්සේරු වර්ෂය සඳහා සංස්ථාපිත ආදායම් බදු වාර්තා ඉලෙක්ට්‍රොනිකව ගොනුකිරීම**

| බදු වර්ගය | නියමිත දිනට ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට අනුකූලතාව % ලෙස | නියමිත දින සිට මසක් ඇතුළත අනුකූලතාව % ලෙස |
|---|---|---|---|---|---|
| ඉහළ සංස්ථාපිත බදු ගෙවන්නන් (LTOs) | 585 | 593 | 622 | 94% | 95% |
| වෙනත් සංස්ථාපිත බදු ගෙවන්නන් | 39,335 | 41,903 | 112,399 | 35% | 37% |
| **මුළු සංඛ්‍යාව** | **39,920** | **42,496** | **113,021** | **35%** | **38%** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 2.10.2 2024/2025 තක්සේරු වර්ෂය සඳහා තනි පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා ගොනු කිරීම

2024/2025 තක්සේරු වර්ෂයේ දී තනි පුද්ගල ආදායම් බදු (IIT) සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු (PIT) වාර්තා ගොනු කිරීම පූර්ව වර්ෂයට සාපේක්ෂව කැපීපෙනෙන වර්ධනයක් පෙන්නුම් කරයි. තනි පුද්ගල ආදායම් බදු වාර්තා නියමිත දිනට හෝ ඊට පෙර 25%ක් ගොනු කර ඇති අතර නියමිත දින සිට මාසයක් ඇතුළත 27%ක් භාර දී තිබේ. එය 2023/2024 තක්සේරු වර්ෂයෙහි පිළිවෙළින් 14% සහ 20% සිට ඉහළ ගොස් ඇත. මෙය බදු ගෙවන්නන්ගේ අනුකූලතාවයේ සහ නියමිත කාලයට භාර දීමේ කැපී පෙනෙන ඉහළ යාමක් පිළිබිඹු කරයි.

හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා භාරදීම ඊටත් වඩා ශක්තිමත් ලෙස ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කළ අතර නියමිත දිනට 40%ක් සහ මාසයක් ඇතුළත 43%ක් ගොනු කර ඇති අතර එය පූර්ව වර්ෂයේ 24% සහ 35%ක් විය. දත්තවලින් පෙනී යන්නේ වැඩි දැනුම්වත්භාවයක් සහ අනුකූලතාවයේ පහසුව අදහස් කරමින් බදු ගෙවන්නන් නියමිත දින හා සම්බන්ධ නියමයන් දැඩි ලෙස පිළිපදින බවයි.

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් 2023/2024 තක්සේරු වර්ෂයේ සිට සරල කරන ලද බදු වර්තා හඳුන්වාදීම මෙම බදු වැඩිදියුණුවීම් සඳහා දායක වී ඇති බව පෙනේ. මෙම සරල කරන ලද ක්‍රියාවලිය ප්‍රාථමික සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම පමණක් ඇති තැනැත්තන්, බැංකුවක් හෝ මූල්‍ය ආයතනයක් විසින් අත්තිකාරම් ආදායම් බදු අඩු කිරීමෙන් පසුව ලැබෙන පොලී ආදායම පමණක් ඇති පුද්ගලයින්, ප්‍රාථමික සේවා නියුක්තියෙන් ලැබෙන ආදායම සහ පොලී ආදායම යන දෙක පමණක් ඇති පුද්ගලයින් සහ ශුන්‍ය වාර්තාවක් ගොනු කරනු ලබන පුද්ගලයින් වැනි ඍජු ආදායම් පැතිකඩ සහිත තැනැත්තන් ඉලක්ක කරගෙන සකස් කර තිබේ.

2.21 වගුව මඟින් 2024/2025 තක්සේරු වර්ෂය සඳහා තනි පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා ගොනු කිරීම බෙදී යන අකාරය සවිස්තරාත්මකව දක්වන අතර නියමිත දිනට සහ ඉන් පසු මාසයක් ඇතුළත බදු වාර්තා භාරදීම් දක්වයි. සියලුම බදු වාර්තා සඳහා ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම අනිවාර්ය වුවද පද්ධතිය සමඟ නිශ්චිත අභියෝගවලට මුහුණ දෙන පුද්ගලයින් සඳහා විධිවිධාන පවතින අතර එහි දී විශේෂිත දුෂ්කරතාවලට මුහුණපානු ලබන තනි පුද්ගලයින්ට, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ පූර්ව ලිඛිත අනුමැතිය ලබා ගැනීමට යටත්ව අතින් ලියා සම්පූර්ණ කරන ලද ආදායම් බදු වාර්තාවක් භාර දීමට අවසර දෙන ලදී. සමස්තයක් වශයෙන් ආදායම් බදු අනුකූලතාවයේ ධනාත්මක ප්‍රවණතාවක් දක්වන අතර තනි පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා ගොනු කිරීමේ අනුපාත දෙකම වසරින් වසර සැලකිය යුතු ප්‍රගතියක් පෙන්නුම් කරයි.

2.21 වගුව : 2024/2025 තක්සේරු වර්ෂය සඳහා තනි පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු වාර්තා ගොනු කිරීම

| බදු වර්ගය | නියමිත දිනට ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට අනුකූලතාව % ලෙස | නියමිත දින සිට මසක් ඇතුළත අනුකූලතාව % ලෙස |
|---|---|---|---|---|---|
| තනි පුද්ගල ආදායම් බදු - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 279,785 | 305,905 | **1,123,477** | 25% | 27% |
| තනි පුද්ගල ආදායම් බදු - දෘඩ පිටපත් භාර දීම | 304 | 335 | | 0.03% | 0.03% |
| **තනි පුද්ගල ආදායම් බදු - සමස්ත ගොනු කිරීම්** | **280,089** | **306,240** | | **25%** | **27%** |
| හවුල් ව්‍යාපාර ආදායම් බදු - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 6,834 | 7,477 | **17,219** | 40% | 43% |
| හවුල් ව්‍යාපාර ආදායම් බදු - දෘඩ පිටපත් භාර දීම | 2 | 3 | | 0.01% | 0.02% |
| **හවුල් ව්‍යාපාර අදායම් බදු - සමස්ත ගොනු කිරීම්** | **6,836** | **7,480** | | **40%** | **43%** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

2025 නොවැම්බර් අග භාගයේදී ශ්‍රී ලංකාවේ බොහෝ ප්‍රදේශවලට බලපෑ දිට්වා සුළි කුණාටුවෙහි දැඩි බලපෑම හේතු කොට ගෙන සංස්ථාපිත ආදායම් බදු, තනි පුද්ගල ආදායම් බදු සහ හවුල් ව්‍යාපාර ආදායම් බදු සඳහා වාර්තා භාර දීම සඳහා 2025 දෙසැම්බර් 31 වනදා දක්වා සහන කාලයක් ලබා දෙන ලදී.

**2.10.3 2024/2025 තක්සේරු වර්ෂය සඳහා අත්තිකාරම් පුද්ගල ආදායම් බදු (APIT) සහ අත්තිකාරම් ආදායම් බදු (AIT) වාර්තා ගොනු කිරීම**

2024/2025 තක්සේරු වර්ෂය තුළ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද (APIT) සඳහා අනුකූලතා පසුබිම මධ්‍යස්ථ ඉහළ යාමක් පෙන්නුම් කළ අතර සමස්ත ගොනු කිරීමේ අනුපාතය 16% දක්වා ළඟා වූ අතර එය පූර්ව තක්සේරු වර්ෂයේ වාර්තා වූ 12%ට වඩා සුළු වශයෙන් ඉහළ යාමකි. කෙසේ වෙතත් මෙම වර්ධනය බදු ගෙවන්නන්ගේ කාණ්ඩ අතර පවතින සැලකිය යුතු විෂමතාවයක් පෙන්නුම් කරයි. විශාල බදු ගෙවන්නන්ගේ කාණ්ඩය තුළ සේවායෝජකයින් විසින් 65%ක බදු වාර්තා ගොනු කිරීමේ අනුපාතයක් සමඟ ශක්තිමත් අනුකූලතාවයක් පෙන්නුම් කරන ලදී. ඊට මුළුමනින් ම වෙනස්ව විශාල බදු ගෙවන්නන් නොවන කොටස 15%ක් ලෙස සැලකිය යුතු මට්ටමකින් පසුපසින් සිටි අතර මෙම අගය මෙම කාණ්ඩයේ බදු ගෙවන්නන්ගේ ඉහළ ප්‍රමාණය හේතුවෙන් සමස්ත සාමාන්‍යය සමීපව පිළිබිඹු කරන අගයකි.

අත්තිකාරම් ආදායම් බදු (AIT) වාර්තා ගොනු කිරීමේදී ද එවැනිම ප්‍රවණතාවක් දක්නට ලැබුණි. සියලුම ලියාපදිංචි බදු ගෙවන්නන් සඳහා සමස්ත කාලයට නියමිත ගොනු කිරීමේ අනුපාතය 11% ක් වූ අතර එය පෙර වසරේ 7%ක අනුපාතයට වඩා 4%ක වැඩිවීමක් දක්වයි. මෙම කාණ්ඩය ද ඉහළ කාර්ය සාධන පරතරයක් ඉස්මතු කළේය. විශාල බදු ගෙවන්නන්ගේ අංශය 71%ක ඉහළ අනුකූලතා අනුපාතයක් අත්කර ගත් අතර, විශාල බදු ගෙවන්නන් නොවන අංශය 10%ක බෙහෙවින් අඩු අනුපාතයක් පෙන්නුම් කරන ලදී. මෙම දත්ත මඟින් පද්ධතිමය වැඩිදියුණු කිරීම් ගොනු කිරීම්වල සාමාන්‍ය වැඩිවීමක් ඇති වී පවතින බව දැක්වුවද ,පරිපාලන හා අනුකූලතා අභියෝගවලින් වැඩි ප්‍රමාණයක් විශාල නොවන බදු ගෙවන්නන්ගේ පදනම තුළ සංකේන්ද්‍රණය වී පවතියි.

2024/2025 තක්සේරු වර්ෂය සඳහා අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ අත්තිකාරම් ආදායම් බදු වාර්තා ගොනු කිරීම, ගොනු කිරීමේ සංඛ්‍යාලේඛන සහ අනුකූලතා අනුපාත අංශ අනුව බෙදී යාම 2.22 වගුවෙහි දැක්වේ.

2.22 වගුව : 2024/2025 තක්සේරු වර්ෂයේ දී අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ අත්තිකාරම් ආදායම් බදු වාර්තා ගොනු කිරීම

| රඳවා ගැනීමේ බදු වර්ගය | නියමිත දිනට ගොනු කරන ලද වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට අනුකූලතාව ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| අ.පු.ආ.බ. - විශාල බදු ගෙවන්නන් - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 397 | | 65% |
| අ.පු.ආ.බ. - විශාල බදු ගෙවන්නන් - දෘඩ පිටපත් භාර දීම | 0 | **609** | 0% |
| **අ.පු.ආ.බ. - විශාල බදු ගෙවන්නන් - සමස්ත ගොනු කිරීම්** | **397** | | **65%** |
| අ.පු.ආ.බ. - වෙනත් බදු ගෙවන්නන් - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 6,505 | | 15% |
| අ.පු.ආ.බ. - වෙනත් බදු ගෙවන්නන් - දෘඩ පිටපත් භාර දීම | 5 | **42,774** | 0.01% |
| **අ.පු.ආ.බ. - වෙනත් බදු ගෙවන්නන් - සමස්ත ගොනු කිරීම්** | **6,510** | | **15%** |
| අ.පු.ආ.බ.- සියලුම බදු ගෙවන්නන් - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 6,902 | | 16% |
| අ.පු.ආ.බ. - සියලුම බදු ගෙවන්නන් - දෘඩ පිටපත් භාර දීම | 5 | **43,383** | 0.01% |
| **අ.පු.ආ.බ.- සියලුම බදු ගෙවන්නන් - සමස්ත ගොනු කිරීම්** | **6,907** | | **16%** |
| අ.ආ.බ. - විශාල බදු ගෙවන්නන් - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 431 | | 71% |
| අ.ආ.බ. - විශාල බදු ගෙවන්නන් - දෘඩ පිටපත් භාර දීම | 0 | **607** | 0% |
| **අ.ආ.බ. - විශාල බදු ගෙවන්නන් - සමස්ත ගොනු කිරීම්** | **431** | | **71%** |
| අ.ආ.බ. - වෙනත් බදු ගෙවන්නන් - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 4,554 | | 10% |
| අ.ආ.බ. - වෙනත් බදු ගෙවන්නන් - දෘඩ පිටපත් භාර දීම | 3 | **46,931** | 0.01% |
| **අ.ආ.බ. - වෙනත් බදු ගෙවන්නන් - සමස්ත ගොනු කිරීම්** | **4,557** | | **10%** |
| අ.ආ.බ.- සියලුම බදු ගෙවන්නන් - ඉලෙක්ට්‍රොනික ගොනු කිරීම් | 4,985 | | 11% |
| අ.ආ.බ. - සියලුම බදු ගෙවන්නන් - දෘඩ පිටපත් භාර දීම | 3 | **46,998** | 0.01% |
| **අ.ආ.බ.- සියලුම බදු ගෙවන්නන් - සමස්ත ගොනු කිරීම්** | **4,988** | | **11%** |

*මූලාශ්‍රයඃ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 2.10.4 2025 වර්ෂයේදී එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීමේ අනුකූලතාවය

විශාල බදු ගෙවන්නන් කාණ්ඩය තුළ එකතු කළ අගය මත බද්ද සඳහා අනුකූලතා දත්ත ධනාත්මක ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. 2025 වර්ෂය සඳහා නියමිත දිනට ආරම්භක අනුකූලතා අනුපාතය 83% දක්වා ළඟා වූ අතර එය 2024 දී වාර්තා වූ 81% සිට 2%ක වැඩිවීමක් පිළිබිඹු කරයි. තවද, නියමිත දින සිට මාසයක් ඇතුළත ගොනු කරන ලද බදු වාර්තා සමාන වර්ධනයක් පෙන්නුම් කළේය. 2025 දී මෙම අගය පෙර වසරේ 89% සමඟ සංසන්දනය කිරීමේදී 92% දක්වා ඉහළ ගියේය.

2025 වසර තුළ විශාල බදු ගෙවන්නන් අංශය සඳහා එකතු කළ අගය මත බදු අනුකූලතා අනුපාතය 2.23 වගුවේ විස්තර කර ඇති අතර නියමිත දිනට සහ නියමිත දින සිට මාසයක් ඇතුළත සම්පූර්ණ කරන ලද ගොනුකිරීම් වර්ගීකරණය කර ඇත.

**2.23 වගුව : 2025 වර්ෂයේ දී විශාල බදුගෙවන්නන් (LTOs) විසින් නියමිත වෙලාවට එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීම**

| මාසය | නියමිත දිනට ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට ගොනු කිරීමේ අනුකූලතාව % ලෙස | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කිරීමේ අනුකූලතාව % ලෙස |
|---|---|---|---|---|---|
| ජනවාරි | 482 | 523 | 576 | 84% | 91% |
| පෙබරවාරි | 148 | 166 | 190 | 78% | 87% |
| මාර්තු | 143 | 159 | 190 | 75% | 84% |
| අප්‍රේල් | 459 | 509 | 577 | 80% | 88% |
| මැයි | 153 | 175 | 191 | 80% | 92% |
| ජූනි | 148 | 173 | 191 | 77% | 91% |
| ජූලි | 511 | 547 | 579 | 88% | 94% |
| අගෝස්තු | 160 | 179 | 191 | 84% | 94% |
| සැප්තැම්බර් | 162 | 182 | 191 | 85% | 95% |
| ඔක්තෝබර් | 502 | 556 | 580 | 87% | 96% |
| නොවැම්බර් | 105 | 125 | 139 | 76% | 90% |
| දෙසැම්බර් | 119 | 129 | 139 | 86% | 93% |
| **එකතුව** | **3,092** | **3,423** | **3,734** | **83%** | **92%** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

විශාල බදු ගෙවන්නන්ගේ (LTO) අංශයේ දක්නට ලැබෙන ඉහළ අනුකූලතාවයට හාත්පසින්ම වෙනස්ව, Non-LTO (විශාල බදු ගෙවන්නන් නොවන අංශයේ) කොටස තුළ සිටින එකතු කළ අගය මත බදු (VAT) ලියාපදිංචි තැනැත්තන් සැලකිය යුතු ලෙස අඩු ගොනු කිරීමේ අනුපාත පෙන්නුම් කරන ලදී. 2025 වර්ෂය සඳහා, නියමිත දිනට සාමාන්‍ය අනුකූලතා අනුපාතය 42%ක් වූ අතර, එය අවසාන දිනයේ සිට මාසයක් ඇතුළත 55% දක්වා වැඩිවිය.

2024 සහ 2025 වර්ෂවල දත්ත බොහෝ දුරට සමානව පැවතුන බැවින්, කාල පරිච්ඡේද දෙක අතර අනුකූලතා හැසිරීම්වල සැලකිය යුතු වෙනසක් නොවීය.

නියමිත දිනට සහ නියමිත දින සිට මාසයක් ඇතුළත සම්පූර්ණ කරන ලද ගොනුකිරීම් වර්ගීකරණය කරමින්, 2025 වසර තුළ විශාල බදු ගෙවන්නන් නොවන අංශය (non-LTO) සඳහා එකතු කළ අගය මත බදු අනුකූලතා අනුපාත 2.24 වගුවෙන් විස්තර කෙරේ.

**2.24 වගුව : විශාල බදු ගෙවන්නන්ගේ අංශයට අදාළ නොවන වෙනත් ලියාපදිංචි බදු ගෙවන්නන් (Non-LTOs) විසින් 2025 වර්ෂයේ දී එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීම**

| මාසය | නියමිත දිනට ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට ගොනු කිරීමේ අනුකූලතාව % ලෙස | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කිරීමේ අනුකූලතාව % ලෙස |
|---|---|---|---|---|---|
| ජනවාරි | 8,863 | 11,442 | 20,651 | 43% | 55% |
| පෙබරවාරි | 884 | 1,160 | 1,915 | 46% | 61% |
| මාර්තු | 855 | 1,167 | 1,919 | 45% | 61% |

| | | | | | |
|---|---|---|---|---|---|
| අප්‍රේල් | 8,500 | 11,619 | 21,460 | 40% | 54% |
| මැයි | 882 | 1,216 | 1,949 | 45% | 62% |
| ජූනි | 907 | 1,252 | 1,963 | 46% | 64% |
| ජූලි | 10,346 | 13,187 | 23,487 | 44% | 56% |
| අගෝස්තු | 910 | 1,243 | 2,001 | 45% | 62% |
| සැප්තැම්බර් | 951 | 1,307 | 2,003 | 47% | 65% |
| ඔක්තෝබර් | 11,506 | 14,436 | 28,690 | 40% | 50% |
| නොවැම්බර් | 605 | 904 | 1,327 | 46% | 68% |
| දෙසැම්බර් | 741 | 1,071 | 1,328 | 56% | 81% |
| **එකතුව** | **45,950** | **60,004** | **108,693** | **42%** | **55%** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

2025 වර්ෂය සඳහා විශාල බදු ගෙවන්නන්ගේ අංශය සහ විශාල බදු ගෙවන්නන් නොවන අංශය යන දෙකම ඇතුළත් වන සමස්ත එකතු කළ අගය මත බදු ලියාපදිංචි බදු ගෙවන්නන් සලකා බැලීමේදී, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් බදු වාර්තා 112,427ක් අපේක්ෂා කරන ලදී. මෙයින්, නියමිත දිනට බදු වාර්තා 49,042ක් පමණක් ගොනු කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස සාමාන්‍ය අනුකූලතා අනුපාතය 44%ක් විය. ඉදිරිපත් කරන ලද මුළු වාර්තා 63,427ක් ද සමඟින් නියමිත දින සිට මාසයක් තුළ අනුකූලතාව 56% දක්වා වැඩි විය.

2024 වර්ෂයේ බදු ගෙවන්නන්ගේ පදනම, 2025 වර්ෂයට සාපේක්ෂව අඩු නමුත්, හැසිරීම් රටා බොහෝ දුරට සමාන විය. 44%ක අනුකූලතා අනුපාතයක් පවත්වා ගෙන යමින්, අපේක්ෂිත වාර්තා 86,326න් 37,582ක් නියමිත දිනට ගොනු කර තිබේ. එය 57%ක තරමක් ඉහළ අනුකූලතා අනුපාතයක් පෙන්නුම් කරමින්, නියමිත දින සිට මාසයක් ඇතුළත, ඉදිරිපත් කිරීම් 49,384 දක්වා ඉහළ නැග තිබේ. මෙම සංඛ්‍යාලේඛනවලින් හෙළි වන්නේ 2025 දී අපේක්ෂිත වාර්තාවල මුළු ප්‍රමාණය 26,101කින් සැලකිය යුතු ලෙස වර්ධනය වන අතරතුර එනම් බදු ගෙවන්නන්ගේ පදනමේ වැඩිවීම සැලකිය යුතු ලෙස සිදු වුවත් වර්ෂ දෙකෙහිම අනුකූලතා අනුපාත එකම අගයක පවතින බවයි.

ව්‍යවස්ථාපිත නියමිත දිනට කරන ලද ගොනු කිරීම් සහ නියමිත දින සිට මාසයක් ඇතුළත ඉදිරිපත් කරන ලද ගොනු කිරීම් අතර වෙනස හඳුනා ගනිමින්, 2.25 වගුව මඟින් 2025 වර්ෂය සඳහා මුළු ලියාපදිංචි බදු ගෙවන්නන්ගේ පදනම සඳහා වැට් බදු අනුකූලතා අනුපාත පිළිබඳ පුළුල් දළ විශ්ලේෂණයක් සපයයි.

**2.25 වගුව : සියලුම ලියාපදිංචි බදු ගෙවන්නන් විසින් 2025 වර්ෂයේ දී එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කිරීම**

| මාසය | නියමිත දිනට ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට ගොනු කිරීමේ අනුකූලතාව % ලෙස | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කිරීමේ අනුකූලතාව % ලෙස |
|---|---|---|---|---|---|
| ජනවාරි | 9,345 | 11,965 | 21,227 | 44% | 56% |
| පෙබරවාරි | 1,032 | 1,326 | 2,105 | 49% | 63% |
| මාර්තු | 998 | 1,326 | 2,109 | 47% | 63% |
| අප්‍රේල් | 8,959 | 12,128 | 22,037 | 41% | 55% |
| මැයි | 1,035 | 1,391 | 2,140 | 48% | 65% |
| ජූනි | 1,055 | 1,425 | 2,154 | 49% | 66% |
| ජූලි | 10,857 | 13,734 | 24,066 | 45% | 57% |
| අගෝස්තු | 1,070 | 1,422 | 2,192 | 49% | 65% |

| | | | | | |
|---|---|---|---|---|---|
| සැප්තැම්බර් | 1,113 | 1,489 | 2,194 | 51% | 68% |
| ඔක්තෝබර් | 12,008 | 14,992 | 29,270 | 41% | 51% |
| නොවැම්බර් | 710 | 1,029 | 1,466 | 48% | 70% |
| දෙසැම්බර් | 860 | 1,200 | 1,467 | 59% | 82% |
| **එකතුව** | **49,042** | **63,427** | **112,427** | **44%** | **56%** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 2.10.5 2025 වර්ෂයේදී සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) ගොනුකිරීම

විශාල බදු ගෙවන්නන්ගේ කොටස තුළ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා වන අනුකූලතා දත්ත, ගොනු කිරීමේ විනයෙහි ස්ථාවර ඉහළ යාමේ ප්‍රවණතාවක් පෙන්නුම් කරයි. පෙර වසරේ වාර්තා වූ 76%ට වඩා 2%ක වර්ධනයක් පිළිබිඹු කරමින් 2025 වර්ෂය සඳහා, නියමිත දිනට ගොනු කිරීමේ අනුකූලතාවය 78% දක්වා ළඟා විය.

තවද, නියමිත දින සිට මාසයක් ඇතුළත අනුකූලතාවය සැලකිය යුතු වර්ධනයක් පෙන්නුම් කරන ලදී. නියමිත දින සිට එක් මසක් අවසානයේදී, 2024 දී 89%ක් වූ අනුකූලතා අනුපාතය 2025 දී 92% දක්වා ඉහළ ගියේය.

2.26 වගුව මගින්, විශේෂයෙන් නියමිත දිනට අනුකූල වීම සහ නියමිත දින සිට මාසයක් ඇතුළත අනුකූල වීම පෙන්නුම් කරමින්, 2025 දී විශාල බදු ගෙවන්නන්ගේ සමාජ ආරක්ෂණ දායකත්ව බදු ගොනුකිරීම සඳහා අනුකූලතා අනුපාත ඉදිරිපත් කරයි.

**2.26 වගුව : 2025 වර්ෂයේ දී විශාල බදු ගෙවන්නන් (LTOs) විසින් නියමිත දිනයේදී සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) වාර්තා ගොනු කිරීම**

| මාසය | නියමිත දිනට ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට ගොනු කිරීමේ අනුකූලතාව % ලෙස | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කිරීමේ අනුකූලතාව % ලෙස |
|---|---|---|---|---|---|
| ජනවාරි | 418 | 465 | 513 | 81% | 91% |
| අප්‍රේල් | 385 | 466 | 515 | 75% | 90% |
| ජූලි | 400 | 480 | 514 | 78% | 93% |
| ඔක්තෝබර් | 402 | 478 | 518 | 78% | 92% |
| **එකතුව** | **1,605** | **1,889** | **2,060** | **78%** | **92%** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

නියම කරන ලද නියමිත දිනට පෙර සමාජ ආරක්ෂණ දායකත්ව බදු ගොනුකිරීම්වලින් 29%ක් පමණක් ගොනු කිරීම සමගින්, 2025 වර්ෂයේදී, විශාල බදු ගෙවන්නන් නොවන අංශයේ බදු ගෙවන්නන් සැලකිය යුතු මට්ටමේ අඩු අනුකූලතා අනුපාතයක් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, ප්‍රමාද වී ගොනු කිරීම කෙරෙහි ප්‍රබල ප්‍රවණතාවක් පෙන්නුම් කරමින්, මෙම අගය නියමිත දින සිට මාසයක් ඇතුළත 56% දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබේ. මෙම කාර්ය සාධනය, 31%ක් නියමිත වේලාවට ගොනු කරන ලද 2024 ට සාපේක්ෂව සුළු අඩුවීමක් පෙන්නුම් කරයි. 2024 දී 54% පැවති නියමිත දින සිට මාසයක් ඇතුළත අනුකූලතාවය 2025 දී 56% දක්වා වැඩි විය.

නියමිත දිනට සහ ඉන් මාසයක් ඇතුළත අනුකූලතාව ඉස්මතු කරමින් 2025 දී විශාල බදු ගෙවන්නන් නොවන අංශයේ තැනැත්තන් සඳහා සමාජ ආරක්ෂණ දායකත්ව බදු වාර්තා ගොනු කිරීමේ අනුකූලතා අනුපාත පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් වගුව 2.27 මගින් සපයනු ලැබේ.

**2.27 වගුව : 2025 වර්ෂයේ දී අනෙකුත් ලියාපදිංචි බදු ගෙවන්නන් (Non-LTOs) විසින් සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) වාර්තා ගොනු කිරීම**

| මාසය | නියමිත දිනට ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට ගොනු කිරීමේ අනුකූලතාව % ලෙස | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කිරීමේ අනුකූලතාව % ලෙස |
|---|---|---|---|---|---|
| ජනවාරි | 3,813 | 6,996 | 12,301 | 31% | 57% |
| අප්‍රේල් | 3,390 | 6,866 | 12,874 | 26% | 53% |
| ජූලි | 4,232 | 7,853 | 13,995 | 30% | 56% |
| ඔක්තෝබර් | 4,491 | 8,541 | 14,922 | 30% | 57% |
| **එකතුව** | **15,926** | **30,256** | **54,092** | **29%** | **56%** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

2025 දී, විශාල බදු ගෙවන්නන් සහ අනෙකුත් තැනැත්තන් ඇතුළුව සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද (SSCL) සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන්ගේ බදු පදනමේ සැලකිය යුතු ප්‍රසාරණයක් පෙන්නුම් කළ අතර, අපේක්ෂිත බදු වාර්තා ප්‍රමාණය 56,152 දක්වා ඉහළ ගියේය. මෙවන් වර්ධනයක් තිබියදීත්, නියමිත දිනට ඉදිරිපත් කර ඇත්තේ බදු වාර්තා 17,531ක් (31%) පමණක් බැවින්, නියමිත දිනට අනුකූලතාව අඩු මට්ටමක පැවතුනි. මෙය, අපේක්ෂිත බදු වාර්තා වලින් 33%ක් (38,664න් 12,789ක්) නියමිත වේලාවට ගොනු කරන ලද 2024ට සාපේක්ෂව සුළු අඩුවීමක් පෙන්නුම් කරන ලදී. කෙසේ වෙතත්, වසර දෙක තුළදීම නියමිත දිනට පසු මාසයක් තුළ ගොනු කිරීමේ තීව්‍ර වැඩිවීමක් පෙන්නුම් කළේය. 2024 දී එකම කාල වකවානුව තුළ වාර්තා වූ 56% (බදු වාර්තා 21,542) ට වඩා සුළු වැඩිවීමක් වූ, අනුකූලතා අනුපාතය 57% දක්වා ගෙන එමින්, 2025 වර්ෂය ආරම්භ වී මසක් ගතවනවිට විට, ඉදිරිපත් කරන ලද වාර්තා සංඛ්‍යාව 32,145 දක්වා ළඟාවිය.

ව්‍යවස්ථාපිත නියමිත දිනට කරන ලද ගොනු කිරීම් සහ නියමිත දින සිට මාසයක් ඇතුළත ඉදිරිපත් කරන ලද ගොනු කිරීම් අතර වෙනස හඳුනා ගනිමින්, 2025 වර්ෂය සඳහා සමස්ත ස.ආ.දා.බ. ලියාපදිංචි බදු ගෙවන්නන්ගේ පදනම සඳහා 2025 ස.ආ.දා.බ. අනුකූලතා අනුපාත 2.28 වගුවේ විස්තර කර ඇත.

**2.28 වගුව : 2025 වර්ෂයේ දී සියලුම ලියාපදිංචි බදු ගෙවන්නන් විසින් සමාජ ආරක්ෂණ දායකත්ව බදු (SSCL) වාර්තා ගොනු කිරීම**

| මාසය | නියමිත දිනට ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කරන ලද බදු වාර්තා සංඛ්‍යාව | ගොනු කිරීමට අපේක්ෂිත බදු වාර්තා සංඛ්‍යාව | නියමිත දිනට ගොනු කිරීමේ අනුකූලතාව % ලෙස | නියමිත දින සිට මසක් ඇතුළත ගොනු කිරීමේ අනුකූලතාව % ලෙස |
|---|---|---|---|---|---|
| ජනවාරි | 4,231 | 7,461 | 12,814 | 33% | 58% |
| අප්‍රේල් | 3,775 | 7,332 | 13,389 | 28% | 55% |
| ජූලි | 4,632 | 8,333 | 14,509 | 32% | 57% |
| ඔක්තෝබර් | 4,893 | 9,019 | 15,440 | 32% | 58% |
| **එකතුව** | **17,531** | **32,145** | **56,152** | **31%** | **57%** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 2.11 බලාත්මක කිරීම

2025 වර්ෂයේදී, දෙපාර්තමේන්තුව විගණන, විමර්ශන සහ නීතිමය ක්‍රියාමාර්ග සංකලනයක් හරහා එහි බදු බලාත්මක කිරීම ශක්තිමත් කළේය. ස්මාර්ට් දත්ත විශ්ලේෂණය භාවිත කිරීම මගින්, බුද්ධි අංශය විසින් ඉහළ ආදායම් උපයන්නන් අතර සහ මූල්‍ය අංශය තුළ බදු මග හැරීම් සාර්ථකව හඳුනා ගන්නා ලදී.

තොරතුරු ඉල්ලීම් සකස් කිරීම සහ මූල්‍ය අපරාධ විමර්ශනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සහ නීතිය ක්‍රියාත්මක කරන ආයතන ඇතුළු අභ්‍යන්තර හා බාහිර ආයතන සමඟ දෙපාර්තමේන්තුව සමීපව කටයුතු කරන ලදී. මෙම වැයම වෙනුවෙන් වැඩිදුර සහාය වීම සඳහා, සාර්ථක බදු එකතු කිරීමට හේතු වන තොරතුරු ලබාදෙන මහජනතාවට ත්‍යාග පිරිනමන රහසිගත වාර්තාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වේ.

### 2.11.1 විගණන

වාර්තාගත කාල පරිච්ඡේදය තුළ බදු විගණන 6,893ක් ආරම්භ කරමින්ද බදු විගණන 6,350ක් අවසන් කරමින්ද 2025 වර්ෂයේදී, දෙපාර්තමේන්තුව එහි බලාත්මක කිරීමේ හැකියාවන් ප්‍රශස්ත කරගන්නා ලදී. ව්‍යාපාර ක්‍රියාකාරකම් සහ ප්‍රමාණයන්හි සමතුලිත නියෝජනය සහතික කිරීම සඳහා මෙම ක්‍රියාමාර්ග සමස්ත බදු ගෙවන ප්‍රජාව ආවරණය කරමින් සිදු කරන ලදී. විගණනය මත පදනම් වූ ආදායම සහ වර්ගීකරණ කාර්ය සාධනය පිළිබඳ විශ්ලේෂණයක් 2.29 සහ 2.30 වගුවේ දැක්වේ.

**2.29 වගුව : විගණන පිළිබඳ විස්තර**

| විස්තරය | ආදායම් බද්ද | එකතු කළ අගය මත බද්ද | සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | උ.වි.ගෙ./ අ.පු.ආ.බ. | වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|
| වර්ෂය තුළ තක්සේරු කළ මුළු අතිරේක බදු ප්‍රමාණය (රු. මිලියන) | 38,972.10 | 12,587.41 | 4,484.93 | 662.15 | 26,336.48 | **83,043.07** |
| වර්ෂය තුළ රැස් කළ මුළු අතිරේක බදු ප්‍රමාණය (රු. මිලියන) | 28,956.97 | 6,640.21 | 2,521.26 | 693.06 | 26,169.54 | **64,981.04** |
| වර්ෂය තුළ ආරම්භ කළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව | 6,893 | | | | | |
| වර්ෂය තුළ නිම කළ විගණන පරීක්ෂණ සංඛ්‍යාව | 6,350 | | | | | |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**2.30 වගුව : සංස්ථාපිත සහ වෙනත් අංශ මගින් රැස් කරන ලද අතිරේක බදු වර්ගීකරණය**

| විස්තරය | තක්සේරු කළ හා එකඟ වූ අතිරේක ආදායම/ පිරිවැටුම (රු. මිලියන) | තක්සේරු කර එකඟ වූ අතිරේක බදු (රු. මිලියන) | | | | එකතු කළ අතිරේක බදු (රු. මිලියන) |
|---|---|---|---|---|---|---|
| | | සංස්ථාපිත- විශාල බදු අංශය | සංස්ථාපිත - වෙනත් | වෙනත් අංශ | එකතුව | |
| ආදායම් බද්ද | 240,572.55 | 24,392.19 | 7,549.46 | 7,030.45 | 38,972.10 | 28,956.97 |
| එකතු කළ අගය මත බද්ද | 73,873.39 | 3,267.03 | 3,901.23 | 5,419.14 | 12,587.41 | 6,640.21 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 358,650.09 | 1,249.10 | 878.55 | 2,357.28 | 4,484.93 | 2,521.26 |
| උ.වි.ගෙ./ අ.පු.ආ.බ. | 5,685.87 | 592.18 | 69.85 | 0.12 | 662.15 | 693.06 |
| අනෙකුත් | 38,639.69 | 24,882.84 | 1,187.18 | 266.46 | 26,336.48 | 26,169.54 |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**2.11.2 විමර්ශන**

2025 වර්ෂය තුළ සිදු කරන ලද විමර්ශන පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු 2.31 වගුවේ දැක්වේ.

**2.31 වගුව : විමර්ශන පිළිබඳ විස්තර**

| විස්තරය | බදු අපරාධ විමර්ශන සංඛ්‍යාව | වෙනත් විමර්ශන සංඛ්‍යාව | මුළු විමර්ශන සංඛ්‍යාව |
|---|---|---|---|
| 2025.01.01 දිනට විභාග වන විමර්ශන සංඛ්‍යාව* | 3 | 43 | 46 |
| වර්ෂය තුළ ආරම්භ කරන ලද විමර්ශන සංඛ්‍යාව | 16 | 249 | 265 |
| වර්ෂය තුළ අවසන් කරන ලද විමර්ශන සංඛ්‍යාව | 3 | 158 | 161 |
| 2025.12.31 දිනට විභාග වන විමර්ශන සංඛ්‍යාව | 16 | 134 | 150 |

* 2025.01.01 දිනට නිවැරදි අගය වාර්තා කරන ලදී.

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**2.11.3 බදු අභියාචනා කොමිෂන් සභාව (TAC) හමුවේ විභාග වන බදු අභියාචනා**

2025 වර්ෂය තුළ පැහැර හරින ලද බදු එකතු කිරීම සඳහා බදු අභියාචනා කොමිෂන් සභාව වෙත ගොනු කරන ලද අභියාචනා සංඛ්‍යාව 2.32 වගුවේ දැක්වේ.

**2.32 වගුව : පැහැර හරින ලද බදු රැස් කර ගැනීම සඳහා බදු අභියාචනා කොමිෂන් සභාවේ (TAC) ගොනු කර ඇති අභියාචනා**

| විනිශ්චය සභාවේ නම | 2025.01.01 දිනට විභාග වන අභියාචනා සංඛ්‍යාව | වර්ෂය තුළ ගොනු කරන ලද අභියාචනා සංඛ්‍යාව | වර්ෂය තුළ නිකුත් කරන ලද තීරණ සංඛ්‍යාව | 2025.12.31 දිනට විභාග වන අභියාචනා සංඛ්‍යාව |
|---|---|---|---|---|
| බදු අභියාචනා කොමිෂන් සභාව | 499 | 478 | 508 | 469 |

*මූලාශ්‍රය: බදු අභියාචනා කොමිෂන් සභාව*

### 2.11.4 අධිකරණ කටයුතු

රාජ්‍ය ආදායම ආරක්ෂා කර ගැනීම සඳහා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පැහැර හරින බදු ගෙවන්නන්ට එරෙහිව දැඩි නීතිමය පියවර ගනු ලැබේ. ස්වේච්ඡා අනුකූලතාව අසාර්ථක වූ විට, හිඟ බදු වගකීම් අනිවාර්යයෙන් එකතු කිරීම සඳහා අධිකරණ කටයුතු ප්‍රමුඛ මෙවලමක් ලෙස පවතී. 2025 දී ආරම්භ කරන ලද අයකර ගැනීම් සම්බන්ධ අධිකරණ නඩුවල ප්‍රමාණය සහ තත්ත්වය 2.33 වගුවේ විස්තර කර ඇත.

**2.33 වගුව : ගෙවීම් පැහැර හැර ඇති බදු එකතු කිරීම සඳහා ගොනු කර ඇති නඩු**

| උසාවියේ නම | 2025.01.01 දිනට විභාග වන නඩු සංඛ්‍යාව*** | වර්ෂය තුළ ගොනු කරන ලද නඩු සංඛ්‍යාව | වර්ෂය තුළ අවසන් කරන ලද නඩු සංඛ්‍යාව | 2025.12.31 දිනට විභාග වන නඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| මහේස්ත්‍රාත් අධිකරණය* | 348 | 951 | 245 | 1,054 |
| දිසා අධිකරණය* | 169 | 0 | 42 | 127 |
| මහාධිකරණය** | 31 | 19 | 13 | 37 |
| අභියාචනාධිකරණය** | 630 | 259 | 23 | 866 |
| ශ්‍රේෂ්ඨාධිකරණය** | 140 | 8 | 9 | 139 |
| **එකතුව** | **1,318** | **1,237** | **332** | **2,223** |

* මහේස්ත්‍රාත් අධිකරණ නඩු සහ දිසා අධිකරණ නඩු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ගොනු කරනු ලැබේ.

** මහාධිකරණ නඩු, අභියාචනාධිකරණ නඩු සහ ශ්‍රේෂ්ඨාධිකරණ නඩු දෙපාර්ශවය විසින්ම ගොනු කරනු ලැබේ. (දේශීය ආදායම් දෙපාර්තමේන්තුව හෝ බදු ගෙවන්නා)

*** 2025.01.01 දිනට නිවැරදි අගය වාර්තා කරන ලදී.

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 2.11.5 බදු ගෙවීම මගහැරීම අවම කිරීම සඳහා ගත් පියවර

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 101 වන වගන්තියට සහ 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 72 වන වගන්තියට අනුව, පුද්ගලයන්ට රහසිගත මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ හෝ භෞතික මාර්ග හරහා බදු ගෙවීම මගහැරීම වාර්තා කළ හැකිය. ආදායම් එකතු කිරීමට තුඩු දෙන සාර්ථක හෙළිදරව් කිරීම්, තොරතුරු සපයන්නා වෙත එකතු කරන ලද ආදායමෙන් 15%ක් දක්වා ත්‍යාගයක් පිරිනැමීම සඳහා සුදුසුකම් ලබාදේ.

බදු ගෙවීම මගහැරීම හඳුනාගනිමින් ද සියලුම බදු ගෙවන්නන් ඔවුන්ගේ සාධාරණ කොටසට දායක වන බව සහතික කරමින් ද බුද්ධි අංශය විසින් 2025 වර්ෂයේදී ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කළේය. ස්මාර්ට් දත්ත විශ්ලේෂණය භාවිත කරමින් , බුද්ධි අංශය විසින් බදු බැඳියාව පවතින බදු මගහැරීමේ අවස්ථා 46ක් සාර්ථකව හඳුනා ගැනින. සංකීර්ණ බැංකු සහ මූල්‍ය ගනුදෙනුවලදී බදු මගහැරිය හැකි විශේෂිත අවස්ථා 2ක් අනාවරණය කරගනිමින් මූල්‍ය අංශය සමීපව අධීක්ෂණය කළේය.

මෙම වසරේ ප්‍රධාන වශයෙන් අවධානය යොමු වූයේ ඉහළ ධනවත් පුද්ගලයන් (HWI) කොටස කෙරෙහි ය. රටේ ඉහළම ආදායම් උපයන්නන් නිසි ලෙස බදු ක්‍රමයට ඇතුළත් කර ගැනීම සහතික කරමින්, බුද්ධි අංශය විසින් බදු බැඳියාව පවතින බදු ගෙවන්නන් ලෙස සුදුසුකම් ලබන පුද්ගලයින් 45 දෙනෙකු හඳුනා ගන්නා ලදී. ඊට අමතරව, සැලකිය යුතු ජාතික සිදුවීම් අතර ක්ෂණික බදු අධීක්ෂණයක් ලබා දෙමින්, රට පුරා සිදුවන විශේෂ සිදුවීම් 16කට ප්‍රතිචාර දැක්වීමෙන් දෙපාර්තමේන්තුව විශාල නම්‍යශීලී බවක් පෙන්නුම් කළේය.

අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම ද ඉහළ ප්‍රමුඛතාවයෙන් යුතු කාර්යයක් විය. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව (CIABOC) විසින් යොමු කරන ලද සිදුවීම් 124ක් සඳහා සවිස්තරාත්මක පිළිතුරු බුද්ධි අංශය විසින් සපයන ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකුව (CBSL) සමඟ හවුල්කාරිත්වයෙන් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කරන ලද විශේෂිත සිදුවීම් 25 ක් සම්බන්ධයෙන් කටයුතු කරන ලදී.

අමාත්‍යවරයාගෙන්, කොමසාරිස් ජනරාල්වරයාගෙන්, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් (CID), මූල්‍ය අපරාධ විමර්ශන කොට්ඨාශයෙන් (FCID) සහ විවිධ පෞද්ගලික පෙත්සම්වලින් ලැබුණු තොරතුරු ඉල්ලීම් 189කට පිළිතුරු වර්ෂය තුළදී ලබාදෙන ලදී.

# 02 පරිච්ඡේදය

## IV කොටස - ආයතනික කාර්යසාධනය

### 2.12 හැඳින්වීම

නවීකරණය, විනිවිදභාවය සහ වැඩිදියුණු කළ සේවාවන් සැපයීම සඳහා වූ උපායමාර්ගික වෙනස්කම් රැසකින් සමන්විත වූ 2025 මූල්‍ය වර්ෂය දේශීය ආදායම් දෙපාර්මේන්තුව තුළ පරිවර්තනීය අවධියක් සනිටුහන් කළ වසරක් විය. ඒ අනුව දෙපාර්තමේන්තුව විසින්, පිළිගත් ජාත්‍යන්තර පිළිවෙත් සහ මූල්‍ය ඒකාබද්ධ කිරීම සඳහා වූ දැඩි කැපවීම යටතේ බදු පදනම පුළුල් කිරීම සහ ස්වේච්ඡා අනුකූලතාව වැඩිදියුණු කිරීම අරමුණු කොටගත් ප්‍රතිසංස්කරණ මාලාවක් ක්‍රියාවට නංවනු ලැබිණි.

බදු ගෙවන්නන්ගෙන් සැලකිය යුතු පිරිසක් විධිමත් බදුකරණයට ඇතුළත් කරගැනීම සඳහා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරමින් "බදු ශක්ති" නම් තේමාව යටතේ දියත් කරනු ලැබූ ජාතික බදු සතිය එහිදී වඩාත් කැපී පෙනුනු ක්‍රියාවලියක් විය. බදු ගෙවන්නන් සඳහා වූ සේවා මධ්‍යස්ථාන පුළුල් කිරීමේ ක්‍රියාවලිය සමඟින් එක්වූ ඉහත ප්‍රයත්නය තුළින්, බදු ගෙවන්නන් කේන්ද්‍ර කරගත් පරිපාලනයක් නිර්මාණය කිරීමටත් ඔවුන් සඳහා සේවා ප්‍රවේශතාවය ඉහළ නැංවීමත් සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි කැපවීම මනාව පිළිබිඹු විය.

ඊට සමගාමීවම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව එහි අභ්‍යන්තර පාලනය සහ තාක්ෂණික ධාරිතාව ද ඉහළ නංවා ගැනීම සඳහා පියවර ගනු ලැබීය. ඒ යටතේ, අභ්‍යන්තර කටයුතු අංශය (IAU) සහ අපනයන ආපසු ගෙවීමේ සත්‍යාපන සහ සැකසුම් අංශය වැනි විශේෂිත අංශ ස්ථාපිත කිරීම තුළින් ආයතනික අඛණ්ඩතාව සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කරගනු ලැබූ අතර, දේශසීමා රහිත බදු පරීක්ෂකවරුන්ගේ (TIWB) වැඩසටහන වැනි ජාත්‍යන්තර සහයෝගීතාවයන් තුළින් මිල පැවරුම්කරණය සහ බදු පැහැර හැරීම ඇතුළු සංකීර්ණ බදු ගැටලු විසඳීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවෙහි විශේෂඥතාව තවදුරටත් වැඩිදියුණු කරගන්නා ලදී.

දෙපාර්තමේන්තුව තුළ පවතින යටිතල පහසුකම් සීමාවන් මෙන්ම දරුණු "දිට්වා" කාලගුණික ව්‍යසනය හේතුවෙන් පැන නගිනු ලැබූ අභියෝග හමුවේ වුවද, දෙපාර්තමේන්තුව සතු කැපී පෙනෙන ඔරොත්තු දීමේ හැකියාව 2025 මූල්‍ය වර්ෂය තුළදී ද මනාව පැහැදිලි විය. වාර්ෂික ආදායම් ඉලක්ක ඉක්මවා යමින්, ශ්‍රී ලංකාවේ දිගුකාලීන ආර්ථික ස්ථාවරත්වය සඳහා ශක්තිමත් පදනමක් සපයමින් රැස්කර ගනු ලැබූ රුපියල් බිලියන 3,222ක වාර්තාගත ආදායම ඊට කදිම නිදසුනකි.

ඉහත සඳහන් කළ ක්ෂේත්‍රවලට අදාළව අත්කරගනු ලැබූ ප්‍රගතිය පිළිබඳ දළ විශ්ලේෂණයක් මෙම පරිච්ඡේදයෙහි එක් එක් කොටස් තුළ දක්වා ඇත.

#### 2.12.1 සංචාරක වැට් බදු ආපසු ගෙවීමේ ක්‍රමවේදය (TVRS) යළි ක්‍රියාත්මක කිරීම

සංචාරක ගමනාන්තයක් ලෙස ශ්‍රී ලංකාවෙහි ආකර්ෂණීයත්වය ප්‍රවර්ධනය කිරීම සහ සංචාරකයන්ගේ තෘප්තිය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2025 වර්ෂයේ සිට සංචාරක වැට් බදු මුදල් ආපසු ගෙවීමේ යෝජනා ක්‍රමය නැවතත් සාර්ථකව ක්‍රියාත්මක කොට ඇත. මෙම යෝජනා ක්‍රමය මඟින් ඒ සඳහා සුදුසුකම් ලත් විදේශීය සංචාරකයින් විසින් දේශීයව මිලදී ගන්නා සුදුසුකම් ලත් භාණ්ඩ සඳහා ගෙවනු ලැබූ එකතු කළ අගය මත බදු මුදල් (VAT) ආපසු ලබා ගැනීමට අවස්ථාව සැලසේ. එමගින්, සංචාරක පහසුකම් සැපයීම පිළිබඳ හොඳම ජාත්‍යන්තර පිළිවෙත් සහිත රටක් බවට පත්වීමට ශ්‍රී ලංකාවට හැකියාව ලැබෙන අතර, දකුණු ආසියාව තුළ මැණික් හා ස්වර්ණාභරණ මිලදී ගැනීම සඳහා පවතින ප්‍රධාන වෙළෙඳපොළක් ලෙස අප සතු ස්ථානය වඩා තහවුරු කරගැනීමට හැකිවේ. ඒ අනුව මෙම යෝජනා ක්‍රමය යටතේ ශ්‍රී ලංකාවේ දිගුකාලීන සංස්කෘතික හා ආර්ථික වැදගත්කමක් ඇති අංශයක් වන දේශීයව සකසන ලද මැණික් හා ස්වර්ණාභරණ මිලදී ගැනීම සඳහා සංචාරකයන් දිරිමත් කිරීම තුළින් මෙරට මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සහ පාරිසරික සංචාරක අංශය කෙරෙහි ඉතා සුභවාදී බලපෑමක් සිදුවන බව සඳහන් කළ හැකිය.

ඉහත වැඩපිළිවෙළ නැවත ක්‍රියාත්මක කිරීමෙන් පසුව, නම් කරන පිටවීමේ ස්ථාන තුළ (exit points) සංචාරක වැට් බදු මුදල් ආපසු ගෙවීමේ කවුළු විවෘත කරනු ලැබීය. දෙපාර්තමේන්තුව සතු සීමිත සම්පත් මධ්‍යයේ වුවද, මුදල් ආපසු ගෙවීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව සහ විනිවිදභාවයෙන් යුතුව සිදු කරනු බවට සහතික වෙමින් මෙම සේවාවන් සැපයීම සඳහා නිලධාරීන් දැඩි කැපවීමකින් කටයුතු කළහ.

කෙසේ වෙතත්, මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේදී කාර්යාල ඉඩකඩ සීමිත වීම, තොරතුරු තාක්ෂණික පහසුකම් ප්‍රමාණවත් නොවීම සහ සැපයුම් සේවාවන් සීමාසහිත වැනි අභියෝග රැසකට මුහුණ දීමට නිලධාරීන්ට සිදුවිය. මෙම ගැටලු හේතුවෙන් විශේෂයෙන් සංචාරක පැමිණීම් බහුල කාලයේදී, ඉටුකළ යුතු දෛනික රාජකාරි ප්‍රමාණය සහ එහි සංකීර්ණත්වය අධික විය.

ඉහත සඳහන් අභියෝග මධ්‍යයේ වුවද, දෙපාර්තමේන්තුව විසින් සංචාරක වැට් බදු මුදල් ආපසු ගෙවීමේ කටයුතු සාර්ථකව සිදුකොට ඇති අතර ඒ සඳහා නිලධාරීන්ගේ කැපවීම සහ වෘත්තීයභාවය සැලකිය යුතු ලෙස දායක වී ලබා දී ඇති බව සඳහන් කළ යුතුය. මෙම වැඩපිළිවෙළ සම්බන්ධයෙන් 2025 දී ලැබූ අත්දැකීම්වලට අනුව එහි දිගුකාලීන තිරසාරභාවය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා පහසුකම් වැඩිදියුණු කිරීම, ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් පැවතීම සහ තාක්ෂණික සහායයන්හි අභිවෘද්ධිය අත්‍යවශ්‍ය සාධක වන බව පෙනී යයි.

### 2.12.2 අපනයන ආශ්‍රිත බදු මුදල් ආපසු ගෙවීම සඳහා "අපනයන ආපසු ගෙවීමේ සැකසුම් අංශය" ස්ථාපිත කිරීම

දෙපාර්තමේන්තුවෙහි බදු පරිපාලන රාමුව තවදුරටත් ශක්තිමත් කරගනිමින් 2025 වර්ෂයේදී, අපනයන ආපසු ගෙවීමේ සැකසුම් අංශය ස්ථාපිත කරන ලදී. ශක්තිමත් අභ්‍යන්තර පාලනයන් පවත්වාගනිමින්, සුදුසුකම් සහිත අපනයනකරුවන් සහ ව්‍යාපෘති විසින් ඉදිරිපත් කරනු ලබන බදු මුදල් ආපසු ලබාගැනීම පිළිබඳ හිමිකම් සම්බන්ධයෙන් කාර්යක්ෂමව, විනිවිදභාවයෙන් යුතුව ක්‍රියාත්මක වීම සඳහා මෙම අංශය ස්ථාපිත කරන ලදී.

බදු ගෙවන්නන් විසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු නිවැරදි බවට තහවුරු කරගැනීම සහ පැහැර හරින ලද බදු නැවත අයකර ගැනීමට අදාළ අනෙකුත් අංශ සමඟ සම්බන්ධ වෙමින්, පවතින නීති රෙගුලාසි සහ ස්ථාපිත ක්‍රියා පටිපාටිවලට අනුකූලව වැට් බදු මුදල් අපසු ගෙවීමේ වගකීම මෙම අංශය වෙත පැවරී ඇත. ප්‍රමිතිගත රාජකාරී පියවර අනුගමනය කිරීම, අංශ අතර සම්බන්ධීකරණය ඉහළ නංවාගැනීම සහ කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය තුළින්, අපනයන ආපසු ගෙවීමේ අංශය ආශ්‍රිත සේවාවන්හි ප්‍රමාදයන් අවම කරගනිමින් කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා මෙම අංශය දායක විය.

අපනයන ආපසු ගෙවීමේ සැකසුම් අංශය ස්ථාපිත කිරීම සහ වැඩි දියුණු කිරීම තුළින් යහපාලනය ඇති කිරීම, කාර්යක්ෂම ආදායම් පරිපාලනය සහ සාධාරණ හා තරඟකාරී අපනයන පරිසරයක් නිර්මාණය කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව දක්වනු ලැබූ කැපවීම මනාව පිළිබිඹු වේ.

### 2.12.3 2025 වර්ෂයෙහි බදු අනුකූලතාවය සහ ආදායම් පරිපාලනය සම්බන්ධයෙන් අවදානම් කළමණාකරණය කිරීමේ අංශයෙහි කාර්යභාරය

සංකීර්ණ ගෝලීය ආර්ථික පරිසරයක් තුළ, ජාතික බදු පරිපාලනයේ සුපිළිපන්නභාවය සහ කාර්යක්ෂමතාව පවත්වා ගැනීම සඳහා අවදානම් කළමනාකරණය විසින් වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි. එහි ශ්‍රී ලාංකේය සන්දර්භය තුළ, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මෙම වගකීම අවදානම් කළමනාකරණ අංශය වෙත (RMU) පවරා ඇති අතර, අවදානම් කළමනාකරණය පිළිබඳව වඩාත් පිළිගත් ජාත්‍යන්තර භාවිතයන් සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) මාර්ගෝපදේශවලට අනුකූල වෙමින් බදු ආශ්‍රිත අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම සහ අවම කිරීම පිළිබඳ මූලික කාර්යභාරයයන් මෙම අංශය විසින් ඉටු කරනු ලබයි. ඒ අනුව, අවදානම් කළමනාකරණ මාර්ගෝපදේශය මත පදනම්ව, අවදානම් කළමනාකරණ අංශය විසින් අනුකූලතා, මෙහෙයුම් සහ මානව සම්පත් යන පැතිකඩ පිළිබඳව මූලික අවදානම් ලේඛන තුනක් පවත්වාගෙන යනු ලබන අතර, මහජන විශ්වාසය පවත්වා ගනිමින් අවදානම් අවම කිරීමේ පූර්ව ක්‍රියාකාරී උපාය මාර්ග දියත් කිරීමට ද තිරසාර ආදායම් රැස් කිරීමටද එය ඉවහල් වේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකු නිර්දේශ යටතේ සකසා ඇති දේශීය ආදායම් දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) සපුරාලීම සඳහා, අවදානම් කළමනාකරණ අංශය විසින් අභ්‍යන්තර හා බාහිර දත්ත මූලාශ්‍ර භාවිතා කරමින් අවදානම් පාදක (Risk Based) කරගත් දත්ත මූලික විගණන තේරීම් ක්‍රියාවලීන් (data-driven audit selection processes) ක්‍රියාත්මක කොට ඇත. බදු වාර්තා ඉදිරිපත් කිරීම සහ ගෙවීම් පිළිබඳ අනුකූලතාව ඉහළ නංවාගැනීම සඳහා අවදානම් ශ්‍රේණිගත විගණන ගොනු (Risk rated audit cases) විශාල බදු ගෙවන්නන්ගේ අංශ (LTO) සහ විශාල බදු ගෙවන්නන්ගේ නොවන අංශ (Non LTO) වෙත යොමු කරනු ලැබේ. 2025 ඔක්තෝබර් 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි සරල කරන ලද එකතු කළ අගය මත බද්ද (SVAT) අවලංගු කිරීමෙන් පසුව, බදු ගෙවන්නන්ගේ අවදානම් ශ්‍රේණිගත කිරීම (rating), යෝග්‍යතාවය තහවුරු කරගැනීම (eligibility verification) සහ පූර්ව ආපසු ගෙවීමේ ක්ෂේත්‍ර චාරිකා (pre refund field visits) යන පියවර මත පදනම්ව ව්‍යවස්ථාපිත දින 45ක කාල රාමුවක් තුළ මුදල් ආපසු ගෙවනු ලබන බව සහතික කරමින්, අවදානම් මත පදනම් වූ වැට් බදු ආපසු ගෙවීමේ ක්‍රමවේදය පරිපාලනය කිරීමේදී මෙම අංශය විසින් ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

ඊට අමතරව, අවදානම් කළමනාකරණ අංශය විසින් වැට් බදු සහ මිල පැවරුම් අනුකූලතාව ඉහළ නංවාගැනීම උදෙසා උපායමාර්ගික ප්‍රයත්නයක් කිහිපයකට මුල පුරා ඇත. සරල කරන ලද එකතු කළ අගය මත බදු (SVAT) සඳහා ලියාපදිංචි වූවන් එකතු කළ අගය මත බදු (VAT) ක්‍රමය වෙත මාරුවීම තුළින් පැන නගින අවදානම් සහ වැට් බදු ක්‍රමය තුළ දක්නට ලැබෙන පුළුල් අවදානම් ඉලක්ක කරගත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි සහාය හිමිවූ සැලසුම් දෙකක් සහිත වැට් බදු අනුකූලතා වැඩිදියුණු කිරීමේ වැඩසටහන (VCIP) හඳුන්වාදීම ඊට ඇතුළත් වේ. තිරසාර පදනමක් මත වැට් බදු අනුකූලතාව ශක්තිමත් කිරීමේ අරමුණින් මෙම සැලසුම් 2027 වසර දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට නියමිතය. එමෙන්ම, අවදානම් තක්සේරු කිරීම, විගණන ක්‍රියාවලීන්, මධ්‍යගත දත්ත කළමනාකරණය තුළින් අනුකූලතා අධීක්ෂණය, අවදානම් දර්ශක සහ ලකුණු ලබා දීමේ ආකෘති සඳහා ඉවහල් විය හැකි මිල පැවරුම පිළිබඳ පුළුල් දත්ත සමුදායක් සකස් කිරීම ද මෙම අංශය විසින් ආරම්භ කරනු ලැබීය.

### 2.12.4 දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර කටයුතු ඒකකයක් (Internal Affairs Unit - IAU) ස්ථාපිත කිරීම

2025 අප්‍රේල් 21 වන දින පිහිටුවනු ලැබූ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර කටයුතු ඒකකය (IAU) ජාතික බදු පරිපාලනය තුළ ආයතනික සුපිළිපන්නබව, වගවීම සහ යහපාලනය උදෙසා තැබූ සුවිශේෂී පියවරක් ලෙස හැඳින්විය හැකිය. විෂමාචාර සහ දූෂණ, නීති, රෙගුලාසි සහ චර්යාධර්ම සංග්‍රහය උල්ලංඝනය, අනාවරණය කිරීම සහ ප්‍රතිචාර දැක්වීම සම්බන්ධයෙන් වගකිව යුතු ස්වාධීන අභ්‍යන්තර අධීක්ෂණ යාන්ත්‍රණයක් ලෙස ක්‍රියාත්මක වෙමින් මෙම ඒකකය බදු ක්‍රමය කෙරෙහි මහජන විශ්වාසය වැඩිදියුණු කරයි.

අභ්‍යන්තර සහ බාහිර වශයෙන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට එරෙහිව යොමුකරනු ලබන පැමිණිලි සහ චෝදනා ඇගයීම සහ විමර්ශනය මෙම ඒකකය වෙත පැවරී ඇති කාර්යභාරයයි. ඒ අනුව විමර්ශන ක්‍රියාවලීන් අපක්ෂපාතීව, රහසිගතව සහ වෘත්තීයමය ස්වභාවයකින් සිදු කරනු ලබන බවට සහතික කරනු ලබන අතර, විනය හෝ නීතිමය ක්‍රියාමාර්ග ගැනීම අවශ්‍ය වූ විට අදාළ බලධාරීන් වෙත යොමු කරනු ලැබේ. ඊට සමගාමීව, 2025 වසරේදී දෙපාර්තමේන්තුව තුළ පවත්වන ලද කාර්ය මණ්ඩල දැනුම්වත් කිරීමේ සැසි තුළින් සදාචාරාත්මක හැසිරීම් ප්‍රවර්ධනය කිරීම සහ වගවීමේ යාන්ත්‍රණයන් පිළිබඳව නිලධාරීන්ගේ දැනුම්වත්භාවය තවදුරටත් වර්ධනය කරන ලදී.

මෙම අංශය පිහිටුවීම මගින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි සංවර්ධන හවුල්කරුවන්ගේ නිර්දේශ සහ පිළිගත් ජාත්‍යන්තර භාවිතයන්ට සමගාමීවීමේ අවශ්‍යතාවය දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ කොට ඇති අතර, අඛණ්ඩ ධාරිතා වර්ධනය, පැහැදිලි මෙහෙයුම් ක්‍රියා පටිපාටි සහ අධීක්ෂණ ආයතන සමඟ සඵලදායී සම්බන්ධීකරණයක් පවත්වාගැනීම තුළින්, විනිවිද පෙනෙන, කාර්යක්ෂම සහ තිරසාර ආදායම් පරිපාලනයක් උදෙසා සහාය වෙමින්, දෙපාර්තමේන්තුව තුළ සුපිළිපන්නබව සහ වගකීම පිළිබඳ පරිසරයක් නිර්මාණය කිරීමෙහි ලා මෙම ඒකකය ඉදිරියේ දී සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

### 2.12.5 ඉහළ වත්කම් සහිත පුද්ගලයින් පිළිබඳ අංශයෙහි 2025 වර්ෂයේ කාර්ය සාධනය

2025 වසර තුළ දී, බදු අනුකූලතාව සවිබල ගැන්වීම සහ රාජ්‍ය ආදායම සුරක්ෂිත කිරීම යටතේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ඉහළ වත්කම් සහිත පුද්ගලයන් පිළිබඳ අංශය (HWIU) විසින් සුවිශේෂී උපායමාර්ගික කාර්යභාරයක් ඉටු කරනු ලැබීය. සැලකිය යුතු මූල්‍ය ධාරිතාව සහ බහු ආශ්‍රිත ආයතන කෙරෙහි පවත්වාගනු ලබන පාලනය හේතුවෙන්, මෙම අංශය විසින් ආයෝජන, රැකියා උත්පාදනය සහ ශ්‍රී ලංකාවේ සමස්ත සාර්ව ආර්ථික ස්ථාවරත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ලබයි. ඒ අනුව, මූල්‍ය පද්ධති තුළ සාධාරණත්වය ආරක්ෂා කරගැනීම සහ අංශයෙහි බදු අනුකූලතාවය පහත දැක්වෙන මූලිකාංග මගින් පාලනය විය:

- ලියාපදිංචිය: ඉහළ වත්කම් සහිත පුද්ගලයින් සියලු දෙනාම අදාළ බදු සඳහා ලියාපදිංචි වී ඇති බව තහවුරු කරගැනීම
- බදු වාර්තා නියමිත වේලාවට ගොනු කිරීම: පරිපාලන කාර්යක්ෂමතාවය පවත්වාගැනීම සඳහා නියම කරන ලද කාලසීමාවන් නිරීක්ෂණය කිරීම
- නිවැරදිව වාර්තා සකස්කිරීම: ආදායම සහ වත්කම් තහවුරු කරගැනීම සඳහා අවදානම් පාදක ක්‍රමවේද භාවිත කිරීම
- කඩිනම් ගෙවීම: රාජ්‍ය ද්‍රවශීලතාවයට සහාය වීම සඳහා බදු බැඳියාවන් පියවීම සහතික කිරීම

සැලකිය යුතු බාහිර අභියෝග මධ්‍යයේ වුවද, විශේෂයෙන්ම 2025 නොවැම්බර් අග දී ඇතිවූ "දිට්වා" කාලගුණික ව්‍යසනය හමුවේ මාසයකට වැඩි කාලයක් පුරාවට මෙරට ආර්ථික ක්‍රියාකාරකම් සහ පරිපාලන මෙහෙයුම්වලට බාධා වුවද ඉහළ වත්කම් සහිත පුද්ගලයින් පිළිබඳ අංශය වෙත පවරා ඇති ගොනු 100ට අදාළ බදු වාර්තා ගොනුකිරීමේ අනුකූලතාවය 100% ප්‍රතිශතයක් සටහන් කරන ලදී. අහිතකර තත්ත්වයන් යටතේ වුවද දෙපාර්තමේන්තුවේ මෙහෙයුම්වල ඔරොත්තු දීමේ

හැකියාව සහ ව්‍යුහගත අනුකූලතා කළමනාකරණයේ ඵලදායීතාවය ඉහත කී බදු වාර්තා ගොනුකිරීමේ අනුකූලතාවය තුළින් පිළිබිඹු වේ. පසුගිය වසර සඳහා වාර්තාගත බදු ආදායමක් රැස්කරගැනීම සඳහා මෙම අංශයෙහි කාර්යසාධනය සහ ඊට අදාළ 1,250ට වැඩි ආයතනවල බදු අනුකූලතාවය පවත්වාගැනීම යන සාධක සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති අතර, රටේ මූල්‍ය ඒකාබද්ධතාවය හා සබැඳි පුළුල් අභිමතාර්ථ අතර ඊට අතිශය වැදගත් ස්ථානයක් හිමි වේ.

බදු බලාත්මක කිරීම් තවදුරටත් සවිබලගැන්වීම සඳහා, අංශය විසින් විගණන තේරීම සඳහා පුළුල් අවදානම් නිර්ණායක රාමුවක් සහ හොඳම ජාත්‍යන්තර භාවිතයන් හා සමගාමී සවිස්තරාත්මක විගණන අත්පොතක් සකස් කරන ලදී. ජාත්‍යන්තර සංවර්ධන හවුල්කරුවන්ගේ සහාය ඇතිව, නිලධාරීන් සඳහා අනුකූලතා කළමනාකරණය, ආක්‍රමණශීලී බදු සැලසුම් හඳුනා ගැනීම සහ විදේශීය වත්කම් ආනාවරණය කරගැනීම සඳහා නවීන ක්‍රමවේද පිළිබඳ විශේෂ පුහුණුවක් ලබා දුනි.

ඒ අනුව, වසර තුළ විගණනය සඳහා ඉහළ අවදානම් ගොනු හතරක් තෝරාගන්නා ලදි. මෙම විගණනයක් වර්තමානයේ දී ක්‍රියාත්මක වෙමින් පවතින අතර, ඒ යටතේ සංකීර්ණ ආදායම්, අක් වෙරළ වත්කම් ව්‍යුහ සහ සම්බන්ධිත පාර්ශ්ව ආයෝජන සම්බන්ධයෙන් විස්තරාත්මක පරීක්ෂාවන් සිදුවේ. මීට සමගාමීව දළ දේශීය නිෂ්පාදිතය සඳහා සුවිශේෂී දායකත්වයක් ලබාදෙන්නන් සහ වෙළෙඳපොළ ප්‍රමුඛයන් ඉලක්ක කරගනිමින් ඉහළ වත්කම් සහිත පුද්ගලයන් හඳුනාගැනීම සඳහා මෙම අංශය අඛණ්ඩව කටයුතු කරයි. තිරසාර ලෙස ආදායම් බළ මුළු ගැන්වීම සහ ශ්‍රී ලංකාවේ බදු පරිපාලනයේ දිගුකාලීන කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා මෙම අංශයේ කාර්යභාරය ඉහත ප්‍රයත්නයන් මගින් වඩා ශක්තිමත් කරනු ලබයි.

### 2.12.6 ධාරිතා වර්ධනය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය තුළින් බදු අපරාධ විමර්ශනය සවිබලගැන්වීම

බදු අනුකූලතාව වැඩි දියුණු කිරීම සහ රාජ්‍ය ආදායම සුරක්ෂිත කරගැනීම සඳහා උපායමාර්ගික ප්‍රමුඛතාවක් ලෙස බදු අපරාධ විමර්ශන අංශය (TCIU) ශක්තිමත් කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් හඳුනාගෙන ඇත. මෙම වාර්තාවට අදාළ කාල සීමාව තුළ, බරපතල බදු වැරදි හඳුනා ගැනීම, විමර්ශනය කිරීම සහ නඩු පැවරීම සම්බන්ධයෙන් මෙම අංශයෙහි ධාරිතාව වැඩිදියුණු කිරීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ආයතනික හා මෙහෙයුම් ප්‍රතිසංස්කරණ කිහිපයක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී, මහා පරිමාණ බදු පැහැර හැරීම්, සංකීර්ණ සංස්ථාපිත විධිවිධාන සහ රජය වෙත අයවිය යුතු සැලකිය යුතු මට්ටමක බදු ආදායමක් සහිත බදු අපරාධ වැනි ඉහළ අවදානම් ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරනු ලැබූ අතර, ඒ සඳහා යාවත්කාලීන කරන ලද ක්‍රියා පටිපාටි සහ නීතිමය ප්‍රමිතීන්ට අනුකූලව සකස් කරන ලද නිල ලේඛන/ ගිවිසුම් උපයෝගී කරගන්නා ලදී.

එමෙන්ම, එක්සත් රාජධානියේ HM Revenue & Customs(HMRC) ආයතනයෙහි සහයෝගීත්වයෙන් පවත්වනු ලැබූ Tax Inspectors Without Borders (TIWB) නම් වැඩසටහන ධාරිතා වර්ධනය පිළිබඳ සුවිශේෂී පියවරක් ලෙස හඳුන්වාදිය හැකි අතර මෙම වැඩසටහන 2027 වර්ෂය දක්වා අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇතැයි අපේක්ෂා කෙරේ. ප්‍රායෝගික සහ සිදුවීම් පාදක සහාය ලබා දීම තුළින්, දේශීය සහ දේශ සීමාවන් අතර බදු අපරාධ සම්බන්ධයෙන් HMRC ආයතනයෙහි නිලධාරීන් දේශීය ආදායම් නිලධාරීන් සමග සෘජුවම කටයුතු කරනු ලබන අතර එමගින්, විමර්ශන ශිල්පීය ක්‍රම, මිල පැවරුම්කරණය, විගණන ක්‍රමවේද, නිරීක්ෂණ සහ සාක්ෂි පාදක භාවිතයන් පිළිබඳ ප්‍රවීණතාවය වැඩිදියුණු කරගැනීමට දේශීය ආදායම් නිලධාරීන්ට හැකියාව ලැබේ. එමෙන්ම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි අංශ අතර දැනුම හුවමාරුකරගැනීම තුළින්, අංශ අතර සහයෝගීතාවය හා ආයතනික දැනුම තවදුරටත් වර්ධනය කරගැනීමට හැකි වේ.

ඊට සමගාමීව, වඩාත් සංකීර්ණ බදු අපරාධ විසඳීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව අන්තර් ආයතන සහ ජාත්‍යන්තර සහයෝගීතාව වර්ධනය කොටගෙන ඇත. එනම්, ජාත්‍යන්තර මට්ටමින් සලකා බැලූ විට, විදේශීය බදු බලධාරීන් සමග තොරතුරු හුවමාරුව තුළින් අන්තර් දේශසීමා බදු අපරාධ විමර්ශනය සඳහා සහයෝගය හිමි වන බවද දේශීය වශයෙන් ගත් කළ, ඒකාබද්ධ විමර්ශන සහ විධිමත් ගිවිසුම් තුළින් නීතිය ක්‍රියාත්මක කිරීමේ සහ නියාමනය කිරීමේ ආයතන සමග සහයෝගීතාවය වර්ධනය වන බව ද පැවසිය හැකිය. ඩිජිටල්කරණය සහ සංකීර්ණ ගෝලීය පරිසරයන් හා සබැඳි අනවරත අභියෝග මධ්‍යයේ වුවද, බදු ක්‍රමය කෙරෙහි මහජන විශ්වාසය ආරක්ෂා කරගැනීම සඳහා බදු අපරාධ විමර්ශන අංශය සෑම අංශයකින්ම සමත් වන බව සහතික කිරීම සඳහා පුහුණුව, තාක්ෂණය, විශ්ලේෂණ සහ සහයෝගීතාවය වැනි අංශ සම්බන්ධයෙන් අඛණ්ඩව ආයෝජනය කිරීමට දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි.

### 2.12.7 රාජ්‍ය සේවාවන් සඳහා ප්‍රවේශය වැඩිදියුණු කරමින් බදු ගෙවන්නන් සඳහා නව සේවා මධ්‍යස්ථාන ආරම්භ කිරීම

2025 වර්ෂයේ දී, කඩුවෙල, අවිස්සාවේල්ල සහ මොරටුව යන ප්‍රදේශ තුළ බදු ගෙවන්නන් සඳහා නව සේවා මධ්‍යස්ථාන (Taxpayer Service Centers

- TSC) තාවකාලිකව ආරම්භ කිරීම තුළින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව බදු ගෙවන්නන් සඳහා තම සේවා සැපයුම් තවදුරටත් ව්‍යාප්ත කරන ලදී. ශීඝ්‍රයෙන් සංවර්ධනය වන තදාසන්න ප්‍රදේශ සහ අර්ධ නාගරික ප්‍රදේශවල පදිංචි බදු ගෙවන්නන් උදෙසා ආදායම් සේවා වෙත ප්‍රවේශය ඉහළ නැංවීමේ අරමුණින් යුතුව මෙම මධ්‍යස්ථාන විශේෂයෙන් ස්ථාපිත කරනු ලැබූ අතර, බදු ගෙවන්නන් හට කාලීන සහ නිවැරදි මග පෙන්වීමක් ලබා දෙනු ලබන බවට සහතික වෙමින් නව බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම, බදු වාර්තා සකස්කිරීම ආශ්‍රිත සහාය, ගෙවීම් පහසු කිරීමේ සේවාවන් සහ උපදේශන සහාය ඇතුළු පුළුල් පරාසයක සේවාවන් මෙම මධ්‍යස්ථාන තුළින් සපයනු ලැබේ. පාරිභෝගික කේන්ද්‍රීය පරිපාලනය සහ ඉහළ සේවා ප්‍රවේශය තුළින් ස්වේච්ඡා අනුකූලතාව වර්ධනය කරගැනීම සඳහා වූ දෙපාර්තමේන්තුවේ පුළුල් උපාය මාර්ගයට සමගාමීව මෙම ක්‍රියාවලිය සිදු කරන ලදී.

මෙම මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම තුළින් ප්‍රධාන කාර්යාලය තුළ තදබදය අවම කරගනිමින් බදු ගෙවන්නන්ගේ තෘප්තිය සහ සමස්ත මෙහෙයුම් කාර්යක්ෂමතාවය ඉහළ නංවා ගැනීමට හැකි විය. මෙලෙස, සේවාවන් මහජනතාව වෙත වඩා සමීප කිරීම තුළින් දෙපාර්තමේන්තුව තනි පුද්ගලයින්, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ බදු ක්‍රමයට ඇතුළු වන නව බදු ගෙවන්නන් සමඟ සම්බන්ධතාවය වැඩිදියුණු කරගෙන ඇත. ඒ අනුව, ජාතික ආර්ථිකයෙහි ස්ථාවරත්වය සහ වර්ධනය සඳහා සහාය වීමේදී නවීකරණය, කලාපීය සේවා සමානාත්මතාවය සහ ආදායම් පරිපාලනය වැඩිදියුණු කිරීම පිළිබඳව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි කැපවීම මෙම සේවා යටිතල පහසුකම් පුළුල් කිරීම තුළින් පිළිබිඹු වේ.

### 2.12.8 ජාතික බදු සතිය 2025 -"බදු ශක්ති" තුළින් ජාතිය සවිබල ගැන්වීම

2025 මූල්‍ය වර්ෂය තුළ ඓතිහාසික පියවරක් ලෙස, ජූනි 2 සිට ජූනි 8 දක්වා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ජාතික බදු සතිය ක්‍රියාත්මක කරන ලදී. ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මහතාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලද මෙම ප්‍රයත්නය තුළින් බදුකරණය අනිවාර්ය වගකීමක් නොව බෙදාගත් ජාතික වගකීමක් ලෙස නැවත අර්ථ දැක්වීමට අදහස් කරනු ලැබූ අතර, එම සංකල්පයට මූලිකාංග තුනක් ඇතුළත් විය. එනම්, සංකීර්ණ ක්‍රියාවලීන් පැහැදිලිව වටහා ගැනීම සඳහා බදු සාක්ෂරතාවය ඉහළ නැංවීම, අනිවාර්ය බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංකය (TIN) ලියාපදිංචිය පහසු කිරීම තුළින් බදු පදනම පුළුල් කිරීම සහ විනිවිදභාවය වැඩි කිරීම තුළින් ස්වේච්ඡා අනුකූලතාව ඉහළ නංවාලීමයි.

මෙම ඉලක්ක සපුරා ගැනීම සඳහා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් මහජනතාව වෙත ළඟා වන පරිද බදු උපදේශන සැසි (tax clinics), සම්මන්ත්‍රණ සහ ඩිජිටල් වැඩසටහන්වලින් සැදුම්ලත් වැඩසටහනක් රටපුරා දියත් කරනු ලැබූ අතර එහි ප්‍රතිඵල වාර්තාගත විය; එනම්, වර්ෂ අවසාන වන විට මිලියන 12කට අධික පුද්ගලයින් බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංක (TIN) ලබාගෙන තිබූ අතර එමගින් මෙරට ආර්ථිකයේ සැලකිය යුතු කොටසක් විධිමත්ව හඳුනාගැනීමට හැකි විය. බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංක (TIN) ලබාගැනීම සඳහා වූ ඉහළ සහභාගීත්වය වසර සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි ආදායම් ඉලක්කය වූ රුපියල් බිලියන 3,093 ඉක්මවා යෑම සඳහා ප්‍රබල උත්ප්‍රේරකයක් වූ අතර පෙර නොවූ විරූ පරිදි 2025 වසර තුළදී රුපියල් බිලියන 3,222 බදු ආදායමක් රැස් කරගැනීමට හැකි විය. බදු ගෙවීම සඳහා සාම්ප්‍රදායික ලෙස බලකිරීමට වඩා ඒ පිළිබඳව ප්‍රායෝගික දැනුම්වත්භාවයක් නිර්මාණය කිරීම උදෙසා ප්‍රමුඛතාවය ලබා දෙමින්, 2025 වසරෙහි "ජාතික බදු සතිය" තුළින් මෙරට බදුකරණය සඳහා නව්‍ය පදනමක් සකස් කරනු ලැබීය.

### 2.12.9 ශ්‍රී ලංකාවේ මූල්‍ය අධීක්ෂණය සවිබල ගැන්වීම: මිල පැවරුම් වැඩසටහන

දේශසීමා රහිත බදු පරීක්ෂකවරුන්ගේ (TIWB) මිල පැවරුම්කරණ වැඩසටහන, ශ්‍රී ලංකාවේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ තාක්ෂණික ධාරිතාව සැලකිය යුතු ලෙස වැඩිදියුණු කර ඇත. දේශසීමා රහිත බදු පරීක්ෂකවරුන්ගේ ලේකම් කාර්යාලය විසින් සම්බන්ධීකරණය කොට එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනෙහි (UNDP) සමඟ සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක කරන ලද මාස 18ක මෙම වැඩසටහන 2024 පෙබරවාරි සිට ක්‍රියාත්මක විය. ඒ අනුව, මෙම වැඩසටහන යටතේ ඩිජිටල් මාධ්‍ය ආශ්‍රිත තාක්ෂණික සහාය භාවිත කරමින් විශේෂඥයින් හතර දෙනෙකුගේ සේවාවන් ලබාගන්නා ලදී. මෙම වැඩසටහන මෙහෙයවනු ලැබුවේ මොරොක්කෝ බදු පරිපාලනයේ උසස් මිලකරණ ගිවිසුම් (Advanced Pricing Agreements) ඒකකයේ ප්‍රධානී, විශේෂඥ ඉල්හාම් කෆ්සාඕයි මහත්මිය විසිනි. එහිදී, අවදානම් තක්සේරුව, විගණන උපාය මාර්ගය, අන්‍යෝන්‍ය ගිවිසුම් ක්‍රියා පටිපාටි (MAP) සහ තොරතුරු හුවමාරුව වැනි තීරණාත්මක ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය.

මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබූ කාල සීමාව තුළ ව්‍යුහගත මිල පැවරුම් අවදානම් තක්සේරු රාමුවක් (Risk Assessment Framework) සහ අවදානම් තක්සේරුව පිළිබඳ අත්පොතක් (Risk Assessment Manual) සකස් කිරීම වැනි සුවිශේෂී කාර්යයන් කිහිපයක් ඉටු කරගැනීමට හැකි විය.

එමෙන්ම, මෙම වැඩසටහන තුළින් න්‍යායාත්මක පුහුණුවට අමතරව, මිල පැවරුම්කරණ විගණන 09ක් සඳහා ප්‍රායෝගික සහාය ලබා දුන් අතර, වැඩසටහන අවසානයේදී මිල පැවරුම් තාක්ෂණික විගණන උපාය මාර්ග අත්පොතක් සහ උසස් මිලකරණ ගිවිසුම් පිළිබඳ නිල මාර්ගෝපදේශ (APA Guidelines) ප්‍රකාශයට පත් කරනු ලැබීය.

ප්‍රතිපත්ති සහ එහි භාවිතය අතර හිඩැස පියවා ගනිමින්, ශ්‍රී ලංකාවේ ක්ෂණික විගණන හැකියාවන් තවදුරටත් සවිබල ගැන්වූ අතර, ජාත්‍යන්තර බදු ප්‍රමිතීන් දිගුකාලීනව පරිපාලනය කිරීම සඳහා ශක්තිමත්, විනිවිද පෙනෙන පදනමක් ද මෙම වැඩසටහන හරහා ස්ථාපිත කර ඇත.

**2.12.10 උසස් මිලකරණ ගිවිසුම් සඳහා විධිමත් රාමුව සහ මාර්ගෝපදේශ**

ප්‍රකාශයට පත් කරනු ලැබූ උසස් මිලකරණ ගිවිසුම් පිළිබඳ මාර්ගෝපදේශ (APA) තුළින් දේශසීමා ගනුදෙනු සම්බන්ධ බදුකරණය පිළිබඳ නිශ්චිතභාවයක් ලබා දීම සඳහා සහයෝගී, විභව ක්‍රියාවලියක් තුළින් නිර්මාණය වූ පුළුල් රාමුවක් ඉදිරිපත් කොට ඇත.

බදු ගෙවන්නා සහ බදු පරිපාලනය අතර විධිමත්, ස්වේච්ඡා ගිවිසුමක් ලෙස උසස් මිලකරණ ගිවිසුම් පිළිබඳ මාර්ගෝපදේශ (APA) ක්‍රියාත්මක වේ. එමගින් කාල සීමාවක් තුළ සැලසුම් කිරීමට භාවිත කරන අනාගත ආර්ථික සිදුවීම් පිළිබඳ ක්‍රමවේද, සංසන්දනාත්මක දත්ත සහ තීරණාත්මක උපකල්පන වැනි නිශ්චිත නිර්ණායක හෝ ආසන්නතම මිල පූර්වයෙන් තීරණය කරනු ලබයි. සවිස්තරාත්මක ක්‍රියා පටිපාටික පියවර සහ පැහැදිලි ලියකියවිලි අවශ්‍යතා ඉදිරිපත් කරමින් මෙම මාර්ගෝපදේශ තුළින් මිල පැවරුම්කරණය පසුගාමී විගණන අවදානමක සිට ක්‍රියාශීලී, විනිවිද පෙනෙන විධිවිධානයක් දක්වා වැඩිදියුණු කරනු ලබයි.

ගිවිසුම් සඳහා අනුමැතිය හිමිවීමෙන් පසු, සමස්ත ගිවිසුම් කාලයට අදාළ සියලුම පාර්ශ්වයන් සඳහා නීත්‍යානුකූලව බැඳීමක් හිමිවන අතර, ගිවිසුම මගින් ආවරණය වන ජාත්‍යන්තර ගනුදෙනු සඳහා බදුකරණය ආශ්‍රිත ගැටලු පිළිබඳ විසඳුම් ලබා දීම ද සහතික කරනු ලබයි.

ද්විත්ව බදුකරණ අවදානම අවම කිරීම සහ බදු පිළිබඳ දිගුකාලීන නඩු කටයුතුවල පරිපාලනමය බර අඩු කිරීම අරමුණු කරගත් සාම්ප්‍රදායික ආරවුල් විසඳීමේ යාන්ත්‍රණයන් සඳහා ව්‍යතිරේකයක් ලෙස මෙම මාර්ගෝපදේශ ක්‍රියා කරයි. එපමණක් නොව, ප්‍රායෝගික අවබෝධය ඉහළ නැංවීම සහ ස්ථාවර මූල්‍ය උපකල්පන පවත්වා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම තුළින්, මෙම උසස් මිලකරණ ගිවිසුම් රාමුව හරහා ජාතික ආර්ථිකය තුළ ක්‍රියාත්මක වන බහුජාතික ව්‍යවසායන් සඳහා වඩාත් ආරක්ෂිත, සාධාරණ පරිසරයක් නිර්මාණය කරනු ලබයි.



**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**



# 03

පරිච්ඡේදය

## වසරේ මූල්‍ය කාර්ය සාධනය

# 03 පරිච්ඡේදය

## වසරේ මූල්‍ය කාර්ය සාධනය

### 3.1 මූල්‍ය කාර්ය සාධනය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු. | ආදායම් ලැබීම් | සටහන | තත්‍ය 2025 රු. | තත්‍ය 2024 රු. | |
|---|---|---|---|---|---|
| 1,120,000,000,000 | ආදායම් බදු | 1 | 1,139,373,084,157 | 1,026,198,562,675 | |
| 1,972,948,460,000 | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | 2,059,679,100,138 | 1,573,728,498,851 | ඒසීඒ-1 |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| 500,000,000 | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | 5,100,000,000 | |
| 3,093,448,460,000 | මුළු ආදායම් ලැබීම් (අ) | | 3,199,052,184,295 | 2,605,027,061,526 | |
| | ආදායම් නොවන ලැබීම් | | - | - | |
| | භාණ්ඩාගාර අග්‍රිම | | 54,759,264,951 | 25,284,518,360 | ඒසීඒ-3 |
| | තැන්පතු | | 23,715,532,289 | 16,110,454,778 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගිණුම් | | 137,154,619 | 124,165,545 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| | මුළු ආදායම් නොවන ලැබීම් (ආ) | | **78,611,951,859** | 41,519,138,683 | |
| | මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ) | | **3,277,664,136,154** | 2,646,546,200,209 | |
| | භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ) | | **518,618,000** | 16,204,693,100 | |
| | ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ) | | **3,277,145,518,154** | 2,630,341,507,110 | |
| | අඩු කළා : වියදම් | | | | |
| | පුනරාවර්තන වියදම් | | | | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3,881,250,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | **5** | 3,812,174,862 | 3,305,277,251 | |
| 2,380,700,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | **6** | 1,703,539,879 | 1,565,749,109 | ඒසී-ඒ-2(ii) |
| 36,150,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | **7** | 29,074,204 | 29,531,590 | |
| - | පොලී ගෙවීම් | **8** | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | **9** | - | - | |
| 6,298,100,000 | මුළු පුනරාවර්තන වියදම් (ඊ) | | 5,544,788,945 | 4,900,557,950 | |
| | මූලධන වියදම් | | | | |
| 280,000,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | **10** | 21,344,332 | 17,272,509 | |
| 5,819,000,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | **11** | 3,410,045,700 | 3,089,150,103 | ඒසී-ඒ-2(ii) |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | **12** | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | **13** | - | - | |
| 40,000,000 | හැකියා වර්ධනය | **14** | 10,371,435 | 11,966,007 | |
| - | වෙනත් මූලධන වියදම් | **15** | - | - | |
| **6,139,000,000** | මුළු මූලධන වියදම් (උ) | | **3,441,761,467** | 3,118,388,619 | |
| | තැන්පතු ගෙවීම් | | 23,623,658,046 | 15,901,866,432 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 128,446,045 | 105,067,448 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඌ) | | **23,752,104,091** | **16,006,933,880** | |
| | මුළු වියදම් එ = (ඊ+උ+ඌ) | | 32,738,654,503 | 24,025,880,450 | |
| | දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ) | | **3,244,406,863,651** | **2,606,315,626,660** | |
| | අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය | | 3,210,525,417,180 | 2,606,315,626,660 | ඒසීඒ-7 |
| | දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය | | 33,881,446,471 | - | ඒසීඒ-3 |
| | | | **3,244,406,863,651** | **2,606,315,626,660** | |

## 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

**ඒසීඒ-පී**

**2025 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| රු. | සටහන | තත්‍ය 2025 රු. | 2024 රු. |
|---|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 21,202,542,141 | 17,591,355,721 |
| | | | |
| **මූල්‍ය වත්කම්** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 275,100,174 | 283,808,747 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 33,881,446,471 | - |
| | | | |
| **මුළු වත්කම්** | | **55,359,088,786** | **17,875,164,467** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධය** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම් | | (718,213,952) | (617,631,136) |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 21,202,542,141 | 17,591,355,721 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | - | |
| | | | |
| **ජංගම වගකීම්** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 993,314,126 | 901,439,883 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 33,881,446,471 | - |
| **මුළු වගකීම්** | | **55,359,088,786** | **17,875,164,467** |

පිටු අංක 1 සිට 45 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 46 සිට 85 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.............................
ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
ලේකම්/ ප්‍රධාන ගණන් දීමේ නිලධාරි
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
දිනය :

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,
ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ - 01

.............................
රුක්දේවි පී. එච්. ප්‍රනාන්දු
කොමසාරිස් ජනරාල්/ගණන් දීමේ නිලධාරි
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
දිනය : 2026/02/24

රුක්දේවි පී.එච්. ප්‍රනාන්දු
දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
සර් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත
කොළඹ 02.

.............................
ඩබ්. එම්. ආර්. සී. කුමාරි
ප්‍රධාන මූල්‍ය නිලධාරි
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
දිනය : 2026/02/24

ඩබ්.එම්.ආර්.සී. කුමාරි
ප්‍රධාන මූල්‍ය නිලධාරි
දේශීය ආදායම් දෙපාර්තමේන්තුව
කොළඹ - 02.

## 3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

**ඒසීඒ-සී**

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සත්‍ය | |
|---|---|---|
| | **2025** රු. | සංශෝධිත **2024** රු. |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | 2,245,163,787,998 | 2,004,071,615,234 |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 166,255,470 | 127,878,960 |
| අග්‍රිම ලැබීම් | 54,759,264,951 | 25,284,518,360 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 156,038,269 | 134,235,307 |
| තැන්පතු ලැබීම් | 22,880,217,819 | 15,431,122,191 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **2,323,125,564,508** | **2,045,049,370,052** |
| අඩුකළා : මුදල් වැය කිරීම් | | |
| බදු ආපසු ගෙවීම් එකතුව | 2,255,978,768,509 | 2,004,825,354,032 |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 5,503,841,084 | 4,860,327,960 |
| සහනාධාර සහ මාරුකිරීම් | 29,074,204 | 29,531,590 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 29,525,601 | 13,341,921 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 518,618,000 | 16,204,693,100 |
| අත්තිකාරම් ගෙවීම් | 127,809,275 | 104,097,911 |
| තැන්පතු ගෙවීම් | 23,623,658,046 | 15,901,090,963 |
| වෙනත් මූලධන වියදම් | 22,777,619 | 21,782,472 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **2,285,834,072,337** | **2,041,960,219,949** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **37,291,492,171** | **3,089,150,103** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | - | - |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |

| | | |
|---|---|---|
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | 3,410,045,700 | 3,089,150,103 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **3,410,045,700** | **3,089,150,103** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඇ)-(ඉ)** | **(3,410,045,700)** | **(3,089,150,103)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **33,881,446,471** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | **-** | **-** |
| විදේශීය ණය ගැනීම් | **-** | **-** |
| ප්‍රදානයන් ලැබීම් | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | **-** | **-** |
| විදේශීය ණය ආපසු ගෙවීම් | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **0** | **0** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **33,881,446,471** | **0** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **0** | **0** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **33,881,446,471** | **0** |

## 3.4 මූල්‍ය ප්‍රකාශන සටහන්

ඇමුණුම (i)

පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය
(මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු)
අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නමː දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

වියදම් ශීර්ෂ අංකය : 246
වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන

**(i) වර්ෂය තුළ අලාභ අයකර ගැනීම/කපාහැරීම/අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය**

| | | අගය | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|---|
| අඩු | රු. | 25,000.00 | නැත | |
| වැඩි | රු. | 25,000.01 | | |

එකතුව ____________

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1 | නැත | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

එකතුව ____________

**(ii)** **තවදුරටත් අයකර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය**

| අගය | | | සිද්ධි සංඛ්‍යාව | මුළු එකතුව (රු) |
|---|---|---|---|---|
| | | | නැත | |
| අඩු | රු. | 25,000.00 | | |
| වැඩි | රු. | 25,000.01 | | |

| අලාභයේ ස්වභාවය අනුව සිද්ධි වර්ගීකරණය | සිද්ධි සංඛ්‍යාව | අගය (රු) |
|---|---|---|
| 1 | නැත | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| එකතුව | | |

**(ii)** අනුව කාල විශ්ලේෂණය

| | | |
|---|---|---|
| වසර 5 ට අඩු | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |
| වසර 10 ට වැඩි | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |
| Over 10 years | සිද්ධි සංඛ්‍යාව | |
| | ගණන | රු |

වැය විෂය 1701 යටතේ වර්ෂය තුළ ගිණුම්ගත කරන ලද හෝ ඉදිරි වර්ෂවලදී ගිණුම්ගත කිරීමට අපේක්ෂිත මු.රෙ. 106 යටතේ වන හානි හා මු.රෙ 113 යටතේ වන අත්හැරීම් පිළිබඳ විස්තර ඇතුළත් කළ යුතු ය.

ඇමුණුම (ii)

පොත්වලින් කපාහැරීම පිළිබඳ ප්‍රකාශනය

අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**වියදම් ශීර්ෂ අංකය : 246**
**වැඩසටහන් අංකය හා නාමය : 01 මෙහෙයුම් වැඩසටහන**

1. **වර්ෂය තුළ සිදුවූ මූ.රෙ.109 යටතේ වන පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය**

| | සිද්ධි සංඛ්‍යාව | වටිනාකම (රු) |
|---|---|---|
| රු. 25,000.00 අඩු | 1 | 22,350 |
| රු. 25,000.01 වැඩි | 7 | 520,026 |
| | 8 | 542,376 |

## 2 වර්ෂය තුළ මූ.රෙ. 109 යටතේ වන පොතෙන් කපා හැරීම් හා අයකර ගැනීම් පිළිබඳ ප්‍රකාශනය

| අනු අංකය | අලාභයේ ස්වභාවය | ආරම්භක කපා නොහල ශේෂය රු. | අලාභයේ වටිනාකම රු. | අයකර ගැනීම් රු. | පොතෙන් කපා හල අගය රු. | කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය රු. | පොතෙන් කපා හැරිම සඳහා වු අනුමැතියේ යොමු අංකය |
|---|---|---|---|---|---|---|---|
| **2022 වර්ෂයේ සිදු වූ අලාභ** | | | | | | | |
| 1 | CAC-9951 | 15,000 | 15,000 | 15,000 | - | - | රක්ෂණාවරණය යටතේ අලුත්වැඩියාව අවසන් කර 2025.01.20 දින මුළු අයකර ගැනීම් මගින් අලාභය යථාවත් වී ඇති බැවින් රජයට කිසිදු අලාභයක් සිදුව නැත. ඒ සඳහා පොතෙන් කපා හැරීමක් සිදු කිරීමට අවශ්‍ය නොවේ. |
| 2 | CAC-9946 | 4,346,250 | 4,346,250 | - | - | 4,346,250 | රක්ෂණාවරණය යටතේ අලුත්වැඩියාව සඳහා යොමුකිරීමට අවසන් පරීක්ෂණ මණ්ඩලයට යොමු කර වාර්තාව ලැබී ඇත. රථය අලුත්වැඩියාව අවසන් කර වෙනසක් පවතී නම් රියදුරුගෙන් අයකර ගන්නා ලෙස සඳහන් කර ඇත. අමතර කොටස් ඇණවුම් කර ඇති අතර අලුත්වැඩියාව මේ වන තෙක් අවසන් කර නොමැත. |
| **එකතුව** | | **4,361,250** | **4,361,250** | **15,000** | - | **4,346,250** | |
| **2024 වර්ෂයේ සිදු වූ අලාභ** | | | | | | | |
| 1 | JO-8480 | - | 196,900 | 163,500 | - | 33,400 | රක්ෂණාවරණය මගින් පූර්ණ අලුත්වැඩියාව සිදුකර රු 163,500/- ක් ලබා දී ඇත. අවසන් පරීක්ෂණ මණ්ඩලයට යොමු කර ඇත. අවසන් පරීක්ෂණ වාර්තාව ලැබී නොමැත. IR/PAM/09/02/01/2024 |
| 2 | CBI-0492 | - | 1,739,526 | 1,499,027 | - | 240,499 | රක්ෂණාවරණය මගින් පූර්ණ අලුත්වැඩියාව සිදුකර රු 1,474,174.45 ක් ලබා දී ඇත. ඉතිරි රු 240,499.29 මුදල පොතෙන් කපා හැරීම සඳහා 2025.05.09 දින කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය ලැබී ඇත. මුදල් අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. IR/PAM/02/03/2024 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 3 | NB-7198 | - | 100,200 | 92,600 | - | 7,600 | රක්ෂණාවරණය මගින් පූර්ණ අලුත්වැඩියාව සිදුකර රු 92,600/- ක් ලබා දී ඇත. අවසන් පරීක්ෂණ මණ්ඩලය වෙත යොමු කර ඇත. IR/PAM/ 09/02/04/2024 |
| 4 | CBI-1638 | - | 164,600 | 117,452 | - | 47,148 | රක්ෂණාවරණය මගින් පූර්ණ අලුත්වැඩියාව සිදුකර රු117,451.80 ක් ලබා දී ඇත. අවසන් පරීක්ෂණ මණ්ඩලය සඳහා 2025.12.17 දින අනුමැතිය ලැබී ඇත. IR/PAM/09/02/09/2024 |
| 5 | CAC-9958 | - | 44,000 | 32,270 | - | 11,730 | රක්ෂණාවරණය මගින් පූර්ණ අලුත්වැඩියාවසිදුකර රු 32,270/- ක් ලබා දී ඇත. අවසන් පරීක්ෂණ මණ්ඩලයට යොමු කිරීම සඳහා කටයුතු සිදු කෙරෙමින් ඇත. |
මෙලෙස, අතත්‍ය ක්‍රමලේඛනය වෙත මාරුවීම, දුරස්ථ පාර්ශ්වයන් සඳහා ප්‍රවේශ්‍යතාව වැඩි දියුණු වීම සඳහා පමණක් නොව, පරිපාලන පිරිවැය සැලකිය යුතු ලෙස අඩු කිරීමට ද දායක වී ඇත. දෙපාර්තමේන්තුවෙහි සාම්ප්‍රදායික ක්‍රියාකාරකම් ඩිජිටල් නවෝත්පාදනයන් සමඟ සමතුලිත කිරීම තුළින්, බදු ගෙවන්නන් දැනුම්වත් කිරීම සඳහා පිරිවැය ඵලදායී ප්‍රවේශයක් සහතික කරනු ලබන අතර වාරයේදීම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ මහජනතාව අතර සම්බන්ධතාවය වඩා ශක්තිමත් කර ඇත.

#### 4.2.3 බදු ගොනු විවෘත කිරීම

නව බදු ගෙවන්නන් ලියාපදිංචිය, තිරසාර හා සාධාරණ මූල්‍ය පරිසරයක් සහතික කිරීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගයේ මූලික අංගයකි. මෙලෙස බදු පදනම පුළුල් කිරීම යනු තවත් එක් පරිපාලනමය කාර්යයක් පමණක් නොව, දැනටමත් ලියාපදිංචි වී ඇති බදු ගෙවන්නන් සඳහා අසමාන ලෙස බදු බර පැවරීමකින් තොරව රජයේ ආදායම වැඩි කිරීම සඳහා තීරණාත්මක පියවරකි.

2025 වර්ෂයේදී, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව නව ආදායම් බදු ගෙවන්නන් 209,462ක් ලියාපදිංචි කොට ඇත. දත්ත සපයා ගැනීම, තෙවන පාර්ශ්වීය තොරතුරු ඒකාබද්ධ කිරීම සහ ක්‍රියාශීලී අනුකූලතා අධීක්ෂණය පිළිබඳ දෙපාර්තමේන්තුවේ දැඩි කැපවීම මෙයින් පිළිබිඹු වේ. මෙලෙස බදු ජාලය නිරන්තරයෙන් පුළුල් කිරීම තුළින් මූල්‍ය වගකීම වර්ධනය වන ආර්ථිකය තුළ වඩාත් පුළුල් ලෙස බෙදා හරිනු ලබන බව සහතික කරමින් රාජ්‍ය සේවා සහ යටිතල පහසුකම් සඳහා අරමුදල් සැපයීමේ රජයේ ධාරිතාව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ඉහළ නංවනු ලබයි.

මූලික කාර්ය සාධන දර්ශකවලට අනුව කාර්ය සාධන ප්‍රතිඵලවල ප්‍රතිශතමය අගයයන්, 4.1 වගුවේ දක්වා ඇත.

**4.1 වගුව: 2025 වසර සඳහා නිශ්චිතව දක්වනු ලැබූ කාර්ය සාධන දර්ශක**

| නිශ්චිතව දක්වනු ලැබූ කාර්ය සාධන දර්ශක | අපේක්ෂිත ප්‍රතිඵලයෙහි ප්‍රතිශතයක් (%) ලෙස සත්‍ය ප්‍රතිඵලය | | | |
|---|---|---|---|---|
| | **>100%** | **100%-90%** | **75%-89%** | **50%-74%** |
| ආදායම් රැස් කිරීම | 104% | | | |
| දැනුම්වත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | 263% | | | |
| බදු ගොනු විවෘත කිරීම | 127% | | | |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*



# 05

පරිච්ඡේදය

# තිරසර සංවර්ධන අරමුණු

# 05 පරිච්ඡේදය

## තිරසර සංවර්ධන අරමුණු

### 5.1 හැඳින්වීම

වර්ෂ 2015 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් හඳුන්වා දුන් තිරසර සංවර්ධන අරමුණු (SDGs) මගින් සැමට වඩාත් යහපත් හා වඩාත් තිරසර අනාගතයක් උදා කර ගැනීමේ පුළුල් සැලැස්මක් ලබා දී ඇත. අරමුණු 17ක් සහ ඉලක්ක 169ක් දක්වා විහිදුන තිරසර සංවර්ධන අරමුණු මගින් දරිද්‍රතාව, අසමානතාව, පරිසර හායනය සහ දේශගුණික විපර්යාස යන අන්තර් සම්බන්ධිත අභියෝග සඳහා පිළියම් යොදනු ලැබේ. මෙම තිරසර සංවර්ධන අරමුණු, ආර්ථික වර්ධනය, සමාජ අන්තර්කරණය සහ පරිසර තිරසරභාවය සංකලනය කරන සංවර්ධනය පිළිබඳ පුළුල් අවබෝධයක් පිළිඹිබු කරමින් සහස්‍ර සංවර්ධන අරමුණුවල (MDGs) අනුප්‍රාප්තිකයා ලෙස නිර්මාණය විය. තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ කොටසක් ලෙස එක්සත් ජාතීන්ගේ සියලුම සාමාජික රාජ්‍යයන් විසින් පිළිගන්නා ලද තිරසර සංවර්ධන අරමුණුවලින් (SDGs) නියෝජනය වන්නේ දරිද්‍රතාව තුරන් කර සෞඛ්‍යාරක්ෂිත ලොවක් තුළ සැමට සාධාරණ සමෘද්ධිමත්භාවයක් ළඟා කර ගැනීමට දක්වන ගෝලීය කැපවීමය.

තිරසර සංවර්ධන අරමුණු (SDGs) සාක්ෂාත් කර ගැනීමේ දී, විශේෂයෙන්ම සංවර්ධනය වෙමින් පවතින රටවල, බදු පරිපාලනය තීරණාත්මක සාධකයක් වේ. අත්‍යවශ්‍ය මහජන සේවාවන් සහ සංවර්ධන කාර්යයන් සඳහා රජයන්ට මුදල් යෙදවිය හැකි වන පරිදි දේශීය සම්පත් රැස් කර ගැනීම සඳහා ශක්තිමත් මෙන්ම කාර්යක්ෂම බදු ක්‍රමයක් පැවතීම ඉතාමත් ම වැදගත් වේ. තව ද බදු බර සාධාරණව බෙදී යාම තහවුරු කර අන්තර්කරණ ආර්ථික වර්ධනය ඉහළ නැංවීම මගින් ආදායම් ලැබීමේ අසමානතාව අඩු කිරීම පිණිස ඵලදායී බදු ක්‍රමයක් දායක වේ.

2017 අංක 19 දරන තිරසර සංවර්ධන අරමුණු පනත, දේශයේ සංවර්ධන මාවත එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රය සමග අනුගත කිරීම පිණිස පනවන ලද වැදගත් නෛතික සම්පාදනයකි.

### 5.2 තිරසර සංවර්ධන අභිමතාර්ථ පදනම් කර ගත් දේශීය ආදායම් දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම්

වර්ෂය සඳහා ඉලක්කගත තිරසර සංවර්ධන අභිමතාර්ථ 5.1 වන වගුවේ දක්වා ඇත.

**5.1 වගුව: තිරසර සංවර්ධන අභිමතාර්ථ පදනම් කර ගත් දේශීය ආදායම් දෙපාර්තමේන්තු ක්‍රියාකාරකම්**

| අරමුණ/ අභිමතාර්ථ | ඉලක්කය | අරමුණ සාක්ෂාත් කර ගැනීමේ දර්ශක | මේ දක්වා අරමුණු සාක්ෂාත් කර ගැනීමේ ප්‍රගතිය (%) | | |
|---|---|---|---|---|---|
| | | | 0-49 | 50-74 | 75-100 |
| **ති.සං.අ. 01: සියලු ආකාරයේ දිළිඳු බව, සියලු තැන්හි ම දුරු කිරීම** | සියලුම මානයන්හි දරිද්‍රතාවය අවසන් කිරීම පිණිස වැඩසටහන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ මූලාශ්‍රවලින් සැලකිය යුතු ලෙස සම්පත් එක් රැස් කිරීම සහතික කිරීම | දිළිඳුකම අවම කිරීමේ වැඩසටහන් සඳහා සෘජුවම රජය විසින් වෙන් කරන ලද දේශීය වශයෙන් ජනනය කරන ලද සම්පත්වල අනුපාතය | | | |
| | | අත්‍යවශ්‍ය සේවා (අධ්‍යාපනය, සෞඛ්‍ය සහ සමාජ ආරක්ෂණය) සඳහා රජයේ මුළු වියදම්වල අනුපාතය | | | |

| | | | |
|---|---|---|---|
| **ති.සං.අ. 03: නිරෝගී බව සහ යහපැවැත්ම** | මත්ද්‍රව්‍ය අනිසි ලෙස භාවිත කිරීම සහ හානිකර මත්පැන් භාවිතය වැළැක්වීම සහ ප්‍රතිකාර කිරීම ශක්තිමත් කිරීම මෙන්ම යෝග්‍ය පරිදි සියලුම රටවල දුම්කොළ පාලනය පිළිබඳ ලෝක සෞඛ්‍ය සංවිධානයේ සම්මුතිය ක්‍රියාත්මක කිරීම ශක්තිමත් කිරීම | දුම්කොළ සහ මද්‍යසාර සඳහා ඉහළ බදු | |
| **ති.සං.අ. 05: ස්ත්‍රී පුරුෂ සමාජභාවීය සමානාත්මතාව සාක්ෂාත් කරමින් සියලු කාන්තාවන් හා ගැහැණු ළමුන් සවිබල ගැන්වීම** | ස්වාභාවික නීතිවලට අනුකූලව කාන්තාවන්ට ඉඩම් සහ අනෙකුත් දේපළ, මූල්‍ය සේවා, උරුමය සහ ස්වාභාවික සම්පත් පිළිබඳ අයිතිය සහ පාලනය සඳහා ප්‍රවේශය ලබා දීම මෙන්ම ආර්ථික සම්පත් සඳහා සමාන අයිතිවාසිකම් ලබා දීම සඳහා ප්‍රතිසංස්කරණ සිදු කිරීම | දේශීය ආදායම් පනතේ 52 වගන්තියේ දක්වා ඇති පරිදි බදු අය කළ හැකි ආදායම ගණනය කිරීමේදී ලබා දුන් අඩු කළ හැකි සුදුසුකම් ලත් ගෙවීමක් | |
| **ති.සං.අ. 07: දරාගත හැකි වූ, විශ්වසනීය වූ, තිරසාර හා නූතන බලශක්තිය සඳහා ප්‍රවේශය සැමට තහවුරු කිරීම** | 2030 වන විට දැරිය හැකි මිලකට, විශ්වසනීය සහ නවීන බලශක්ති සේවාවන් සඳහා විශ්වීය ප්‍රවේශය සහතික කිරීම | පිරිසිදු බලශක්ති ආයෝජන දිරිගැන්වීම සඳහා ලබා දී ඇති බදු සහන | |
| **ති.සං.අ. 10: රටවල් තුළ හා රටවල් අතර ඇති අසමානතාව අවම කිරීම** | ලෝක වෙළෙඳ සංවිධානයේ ගිවිසුම්වලට අනුකූලව සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්, විශේෂයෙන් ම අවම සංවර්ධිත ආර්ථිකයන්, සඳහා විශේෂ මෙන්ම නා නා වෙනස්කම් සහිත විශේෂ සැලකීමේ මූලධර්මය ක්‍රියාත්මක කිරීම | උතුරු පළාතේ භාවිත වන ක්ෂය කළ හැකි වත්කම් සඳහා 200% ක වැඩි කළ ප්‍රාග්ධන දීමනා ලබා දීම | |
| **ති.සං.අ. 16: තිරසාර සංවර්ධනය සඳහා සාමකාමී සහ සියලු දෙනා ඇතුළත් වූ සමාජයක් ප්‍රවර්ධනය කිරීම, සියලු දෙනාට ම යුක්තිය සඳහා ප්‍රවේශයක් සැලසීම සහ ඵලදායී, වගකීම-ක් සහිත හා පූර්ණ ආයතන සෑම මට්ටම-කම ඇති කිරීම** | සෑම මට්ටමකදීම ඵලදායී, උත්තරදායී සහ විනිවිද පෙනෙන ආයතන ඇති කිරීම | නීතියේ ආධිපත්‍යය ස්ථාපිත කිරීම සහතික කිරීම සඳහා බදු පරිපාලනයේ සියලුම කාර්යයන් ස්වයංක්‍රීය කිරීම | |
| | | බදු පැහැර හරින්නන් සොයා දැන ගැනීමට සහ බදු පැහැර හරින්නන් එසේ කිරීම වැළැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම පිණිස තුන්වන පාර්ශ්වයක දත්ත හුවමාරු කර ගැනීම සහ දත්ත විශ්ලේෂණ භාවිත කිරීම | |

| | | | |
|---|---|---|---|
| **ති.සං.අ. 17: තිරසාර සංවර්ධනය සඳහා වූ ගෝලීය සහයෝගීතාව ක්‍රියාත්මක කළ හැකි විධික්‍රම හා නව ජීවයක් දීමේ මාර්ග ශක්තිමත් කිරීම** | බදු සහ අනෙකුත් ආදායම් එකතු කිරීම සඳහා වන දේශීය හැකියාව වැඩි දියුණු කිරීම සඳහා දේශීය සම්පත් එක් රැස් කර යෙදවීම ශක්තිමත් කිරීම | මුළු රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් ලෙස | |
| | | දේශීය බදු මගින් අරමුදල් සපයන දේශීය අයවැයේ අනුපාතය | |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*



# 06

පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

# 06 පරිච්ඡේදය

## මානව සම්පත් පැතිකඩ

## 6.1 විශ්ලේෂණය

ප්‍රමාණවත් කාර්ය මණ්ඩල මට්ටම, විධිමත් පුහුණුව සහ පළපුරුදු පිරිස ආයතනය තුළ රඳවාගැනීම යන අංගවලින් සමන්විත මානව සම්පත කාර්යක්ෂම හා ඵලදායී බදු පරිපාලන පද්ධතියක මූලික අංගයකි. උසස් තත්ත්වයේ රාජ්‍ය සේවාවන් සැපයීම සහතික කිරීම සඳහා එය අත්‍යවශ්‍ය වේ.

කෙසේ වෙතත්, 2025 දෙසැම්බර් 31 වන විට, කාර්ය මණ්ඩලයෙහි හිඟය හේතුවෙන් දෙපාර්තමේන්තුව එහි වාර්ෂික කාර්ය සාධන ඉලක්ක සපුරා ගැනීමේ හැකියාවට බාධා විය හැකි මට්ටමෙහි අභියෝගයන්ට මුහුණ දී ඇත. ආයතනික ව්‍යුහයෙහි විවිධ මට්ටම් තුළ පවතින කාර්ය මණ්ඩල හිඟය සම්බන්ධයෙන් සිදුකරන ලද පුළුල් විශ්ලේෂණයකට අනුව මෙම තත්ත්වය දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් ධාරිතාව අඩපණ කළ හැකි මට්ටමක පවතින බව අනාවරණය විය. දේශීය ආදායම් සේවය තුළ, අනුමත සේවක සංඛ්‍යාව තනතුරු 1,229කින් සමන්විත වුවත්, මෙයින් පුරප්පාඩු 216ක් තවමත් පුරවා නොමැති අතර එය ආසන්න වශයෙන් 18%ක පුරප්පාඩු අනුපාතයක් නියෝජනය කරයි. මෙම ඌනතාව ඒකාබද්ධ සේවා කාර්ය මණ්ඩල කාණ්ඩය තුළින් ද පිළිබිඹු වන අතර, ඒකාබද්ධ සේවාවන්හි අනුමත තනතුරු 1,609න් 193ක් පුරප්පාඩු වී ඇති අතර එය 12% ක පුරප්පාඩු අනුපාතයකට සමාන වේ. දෛනික පරිපාලන ක්‍රියාවලීන් බාධාවකින් තොරව සිදුකිරීම සඳහා අවශ්‍ය සහායක කාර්යයන් ඉටුකරගැනීමේදී මෙම තත්ත්වය අහිතකර ලෙස බලපානු ලබයි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) අංශය තුළ පවතින 21%ක පුරප්පාඩු අනුපාතය හේතුවෙන් දෙපාර්තමේන්තුවේ නවීකරණ ධාරිතාව විශේෂයෙන් සීමා වී තිබේ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කාර්ය මණ්ඩලය සඳහා තනතුරු 170ක් අනුමතව පැවතිය ද ඉන් තනතුරු 35ක පුරප්පාඩු පවතින අතර, බදු රැස් කිරීම සඳහා තාක්ෂණික මෙවලම් ඵලදායී ලෙස භාවිත කිරීම සීමා වීමට මෙම තත්ත්වය හේතු වී ඇත. දිගුකලක් පුරප්පාඩුව පැවති සිවිල් ඉංජිනේරු තනතුර මෙම වසර තුළදී පිරවීමත් සමඟ, යටිතල පහසුකම් නඩත්තුව සහ ප්‍රසම්පාදන මෙහෙයුම් කටයුතුවල ස්ථාවර බවක් දක්නට ලැබිණි.

එමෙන්ම, වෘත්තීය සංවර්ධන අවස්ථා සීමිත වීම මානව සම්පත් සංවර්ධනය පිළිබඳව ප්‍රධාන අභියෝගයකි. ගතික බදු ප්‍රතිපත්ති, තාක්ෂණික නවෝත්පාදන සහ බදුකරණය පිළිබඳ හොඳම අන්තර්ජාතික පිළිවෙත් පිළිබඳව දැනුම්වත්භාවය ලබාගැනීම සඳහා කාර්ය මණ්ඩලය උදෙසා අඛණ්ඩ පුහුණුවක් සැපයීම අත්‍යවශ්‍ය වේ. එවැනි පුහුණු අවස්ථාවන් සීමිත වීම හේතුවෙන් සංකීර්ණ බදු ගැටලු කළමනාකරණය කිරීම සහ අදාළ පාර්ශ්වයන් සඳහා උසස් තත්ත්වයේ සේවාවක් ලබා දීමට කාර්ය මණ්ඩලයට ඇති හැකියාව සැලකිය යුතු ලෙස පහළ යා හැකිය. ඒ අනුව, දෙපාර්තමේන්තුව මෙම මානව සම්පත් සංවර්ධනය පිළිබඳ සීමාකාරී තත්ත්වයන් සඳහා විසඳුම් සපයාගැනීම සඳහා ප්‍රමුඛතාව දීම සහ පුළුල් පුහුණු වැඩසටහන් සඳහා ආයෝජනය කිරීම අත්‍යවශ්‍ය වේ. එය වත්මන් මෙහෙයුම් පවත්වා ගැනීම සඳහා පමණක් නොව, දෙපාර්තමේන්තුවේ දිගුකාලීන උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සහ ජාතික බදු ක්‍රමයේ ශක්තිමත් පරිපාලනය සහතික කිරීම සඳහා ද ඉතා වැදගත් වේ.

## 6.2 කාර්ය මණ්ඩල කළමනාකරණය

### 6.2.1 මුළු සේවක සංඛ්‍යාව

2025 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි අනුමත සේවක සංඛ්‍යාව, තනතුරු දරණ සංඛ්‍යාව සහ පුරප්පාඩු සංඛ්‍යාව පහත වගුවෙහි දැක්වේ.

6.1 වගුව : 2025 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | තනතුරු දරණ සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ***දේශීය ආදායම් සේවය*** | ***1,229*** | ***1,013*** | ***216*** |
| කොමසාරිස් ජනරාල් | 1 | 1 | 0 |
| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 9 | 9 | 0 |
| ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 22 | 22 | 0 |
| කොමසාරිස් | 90 | 90 | 0 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | 1,107 | 232 | 216 |
| නියෝජ්‍ය කොමසාරිස් | | 457 | |
| සහකාර කොමසාරිස් | | 202 | |
| ***වෙනත් සේවා*** | ***1,639*** | ***1,440*** | ***199*** |
| දීප ව්‍යාප්ත සේවය | 10 | 9 | 1 |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | 1 | 0 | 1 |
| අධ්‍යක්ෂ (පරිපාලන) | 1 | 1 | 0 |
| ප්‍රධාන ගණකාධිකාරී | 1 | 1 | 0 |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක | 1 | 1 | 0 |
| ගණකාධිකාරී | 5 | 5 | 0 |
| ඉංජිනේරු | 1 | 1 | 0 |
| **ඒකාබද්ධ සේවය** | ***1,609*** | ***1,416*** | ***193*** |
| අධ්‍යක්ෂ (තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ) | 2 | 2 | 0 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ) | 16 | 10 | 6 |
| පරිපාලන නිලධාරී | 3 | 3 | 0 |
| භාෂා පරිවර්තක | 9 | 8 | 1 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 47 | 21 | 26 |
| සංවර්ධන නිලධාරී | 7 | 7 | 0 |
| පුස්තකාලයාධිපති | 1 | 1 | 0 |
| සහකාර පුස්තකාලයාධිපති | 1 | 1 | 0 |
| කළමනාකරණ සේවා නිලධාරි | 925 | 876 | 49 |
| තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර | 105 | 102 | 3 |
| රියැදුරු | 96 | 75 | 21 |
| කාර්යාල සේවක සේවය | 397 | 310 | 87 |
| **දෙපාර්තමේන්තුගත සේවා** | ***20*** | ***15*** | ***5*** |
| තාක්ෂණික නිලධාරි (සිවිල්/ විදුලි) | 2 | 2 | 0 |
| ප්‍රවාහන නිලධාරී | 1 | 1 | 0 |
| පිළිගැනීමේ නිලධාරී | 4 | 4 | 0 |
| පර්යේෂණ සහකාර | 10 | 8 | 2 |
| ගොඩනැගිලි පරීක්ෂක | 1 | 0 | 1 |
| වඩු කාර්මික | 1 | 0 | 1 |
| සංචාරක බංගලා භාරකරු | 1 | 0 | 1 |
| **එකතුව** | **2,868** | **2,453** | **415** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

#### 6.2.2 පරිපාලන අභියෝග

2025 මූල්‍ය වර්ෂය තුළදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සැලකිය යුතු පරිපාලන අභියෝගවලට මුහුණ දී ඇත. ප්‍රධාන තනතුරු සඳහා පුද්ගලයින් පත් කිරීම සම්බන්ධයෙන් දක්නට ලැබෙන දිගුකාලීන ප්‍රමාදයන් හේතුවෙන් නායකත්වය පිළිබඳ අස්ථාවරත්වයන් සහිත කාලපරිච්ඡේදයක් උදා වී ඇති අතර, උපායමාර්ගික තීරණ ගැනීම සහ සමස්ත දෙපාර්තමේන්තු කාර්යක්ෂමතාව යන දෙඅංශය සඳහා ම අහිතකර ලෙස බලපාන ගැටලු එමගින් නිර්මාණය වී ඇත. මානව සම්පත් කළමනාකරණය සම්බන්ධයෙන් සුවිශේෂී අවධානයක් යොමු විය යුතු ක්ෂේත්‍රයක් වන ජ්‍යෙෂ්ඨ මට්ටම්වල පත්වීම් විධිමත් කිරීම සඳහා දීර්ඝ කාලයක් පුරා අසමත් වීම හේතුවෙන් පරිපාලන ක්‍රියාවලීන්ට දැඩි ලෙස බාධා එල්ල වී තිබේ. 2025 වර්ෂය අවසානය වන විට, දෙපාර්තමේන්තුවෙහි ක්‍රියාකාරීත්වයෙහි අඛණ්ඩතාව සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කරන ලද පියවරක් වශයෙන් සැලකිය යුතු නිලධාරීන් සංඛ්‍යාවක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ (PSC) විධිමත් අනුමැතිය අපේක්ෂාවෙන් වැඩ බලන තනතුරුවල සේවය කළහ. කෙසේ වෙතත්, මෙම නිලධාරීන් ඔවුන්ගේ අදාළ ජ්‍යෙෂ්ඨ භූමිකාවන්හි සම්පූර්ණ වගකීම ඉටු කළද, ජ්‍යෙෂ්ඨ මට්ටම්වල තනතුරු සඳහා ලබා දී ඇති පුළුල් ප්‍රතිලාභ සහ දීමනා පරාසයන්ට ඔවුන් ඇතුළත් වී නොමැති වී අතර, එමගින් හිමිකම් සහ පිළිගැනීම සම්බන්ධයෙන් පැහැදිලි විෂමතාවන් නිර්මාණය වී ඇත.

ඉටු කරනු ලබන සේවයට සරිලන වේතනයකින් තොරව මෙම වැඩ බලන පත්වීම් මත දිගුකාලීනව රඳා පැවැත්ම කාර්ය මණ්ඩලයේ චිත්ත ධෛර්යයට මෙන්ම දෙපාර්තමේන්තුවෙහි සංවිධානාත්මක අභිප්‍රේරණයට අහිතකර බලපෑමක් ඇති කර තිබේ. ජ්‍යෙෂ්ඨ මට්ටම්වල නිලධාරීන් පූර්ණ කාලීන පදනමක් මත උසස් තනතුරුවල වගකීම් කළමනාකරණය කර ඇතත්, එවැනි පත්වීම් නියාමනය කරනු ලබන චක්‍රලේඛ අර්ථ නිරූපණය කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ අපැහැදිලිතා හේතුවෙන් ඔවුන්ට ඒ සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිලාභ ලබා හිමි වී නොමැත. ඒ අනුව, ජ්‍යෙෂ්ඨ මට්ටම්වල තනතුරු සඳහා නිලධාරීන් නිල වශයෙන් පත් කිරීම ප්‍රමාද වීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කළමනාකාරිත්වය දුර්වල වීමටත් ශක්තිමත් අනාගත නායකයින් පිරිසක් නිර්මාණය කිරීම සම්බන්ධයෙන් බාධාවන් ඇතිවීමටත් හේතුවිය හැකි බවත් සඳහන් කළ හැකිය.

ඒ අනුව, දෙපාර්තමේන්තුවේ අනාගත ඵලදායී ක්‍රියාකාරිත්වය සඳහා ජ්‍යෙෂ්ඨ මට්ටම්වල පුරප්පාඩු කාලෝචිත හා විනිවිදභාවයෙන් යුතුව පිරවීම අත්‍යවශ්‍ය වන බව හඳුනාගත යුතුය. මන්ද, ජ්‍යෙෂ්ඨ මට්ටම්වල මෙම පත්වීම් කඩිනමින් ලබා දීම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි මෙහෙයුම් ක්‍රියාවලිය හා සබැඳි බාධා අවම කිරීම සහ රාජ්‍ය ආදායම රැස්කිරීම සඳහා දෙපාර්තමේන්තුව සතු කාර්යභාරය වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීමට සඳහා අත්‍යවශ්‍ය සාධකයක් වන බැවිනි. එමෙන්ම, වැඩ බැලීමේ පත්වීම් විධිමත් කිරීම සහ සුදුසු දීමනා සාධාරණ ලෙස ලබා දීම ද ප්‍රමුඛතාවයක් ලෙස සැලකිය යුතුය. එවැනි පියවර, සේවක චිත්ත ධෛර්යය සහ අභිප්‍රේරණය වැඩි දියුණු කිරීම සඳහා මෙන්ම, නූතන බදු පරිපාලනයේ සංකීර්ණ අභියෝගවලට මුහුණ දීම සඳහා අවශ්‍ය පළපුරුදු පිරිස් ආයතනය තුළ රඳවා ගැනීම සහතික කිරීම සඳහා ඉතා වැදගත් වේ.

**6.2 වගුව: 2025.12.31 දිනට කාර්ය මණ්ඩල තොරතුරු සාරාංශය**

| සේවා මට්ටම | 2025.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය | 2025.12.31 දිනට සේවයේ නිරත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 1,257 | 1,034 | 223 |
| තෘතීය මට්ටම | 60 | 33 | 27 |
| ද්විතීය මට්ටම | 1,055 | 1,001 | 54 |
| ප්‍රාථමික මට්ටම | 496 | 385 | 111 |
| **එකතුව** | **2,868** | **2,453** | **415** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

#### 6.2.3 පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගත් පියවර

##### 6.2.3.1 ජ්‍යෙෂ්ඨ මට්ටම

සැලකිය යුතු පුරප්පාඩු සංඛ්‍යාවක් පැවතියද දෙපාර්තමේන්තුවෙහි මෙහෙයුම් අඛණ්ඩව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා, නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්, ජ්‍යෙෂ්ඨ කොමසාරිස් සහ කොමසාරිස් යන තනතුරුවල කාර්යයන් ඉටු කිරීම සඳහා නිලධාරීන් කිහිප දෙනෙකු වැඩ බලන පදනමින් පත් කර ඇති අතර, දෙපාර්තමේන්තුව මෙම තනතුරු

සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විධිමත් අනුමැතිය අපේක්ෂාවෙන් සිටී. එමෙන්ම ආරම්භක මට්ටමේ තනතුරු සඳහා බඳවා ගැනීමේදී, 2025 වර්ෂයේදී දෙවතාවකදී සහකාර කොමසාරිස්වරුන් බඳවා ගෙන ඇත. ඒ අනුව, 2022 මාර්තු 27 වන දින පවත්වන ලද විවෘත තරඟ විභාගයෙන් පසුව සිදුකළ මූලික බඳවා ගැනීමේ ක්‍රියාවලියෙන් පසු ද පැවති පුරප්පාඩු පිරවීම සඳහා කුසලතා ලැයිස්තුව අනුව තවත් හය දෙනෙකු 2025 පෙබරවාරි 10 වන දින සහකාර කොමසාරිස්වරුන් ලෙස පත් කොට ඇත. 2025 ජූලි 19 වන දින පැවති තරඟ විභාගයේ ප්‍රතිඵල සහ නොවැම්බර් මාසයේ පැවති සම්මුඛ පරීක්ෂණ මත පදනම්ව 2025 දෙසැම්බර් 15 වන දින සහකාර කොමසාරිස්වරුන් 92 දෙනෙකු බඳවා ගනු ලැබීය.

දෙපාර්තමේන්තුවෙහි මානව සම්පත් ධාරිතාව තවදුරටත් ඉහළ නංවාගැනීමට ද, බදු පරිපාලනයේ හා සබැඳි පුළුල් අවශ්‍යතා සපුරාලීම ද සඳහා, දේශීය ආදායම් සේවයේ III ශ්‍රේණිය සඳහා තවත් බඳවා ගැනීම් 200ක් සඳහා අනුමැතිය ඉල්ලා ඇත. තවද, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ සහකාර තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ තනතුරු සඳහා පවතින පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයට විධිමත් ලෙස දැනුම් දීම තුළින් එකී විශේෂිත අංශවල පුරප්පාඩු පිරවීම සඳහා දෙපාර්තමේන්තුව විසඳුම් අපේක්ෂා කරයි. සාමාන්‍ය පරිපාලනය සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ බඳවා ගැනීම් යන දෙඅංශයම සඳහා ප්‍රමාණවත් පරිදි බඳවා ගැනීම සිදු කිරීම සඳහා දෙපාර්තමේන්තුව විසින් දරනු ලබන මෙම ප්‍රයත්නයන් තුළින් තම ශ්‍රම බලකාය ස්ථාවර කරගනිමින් ස්වකීය අභ්‍යන්තර විශේෂඥතාව වැඩිදියුණු කිරීම සඳහා දෙපාර්තමේන්තුව සතු කැපවීම හොඳින් පිළිබිඹු වේ.

#### 6.2.3.2 තෘතීය මට්ටම

විශේෂිත පරිපාලන හා තාක්ෂණික කාර්යයන් බාධා රහිතව ඉටු කරනු ලබන සහතික කිරීම සඳහා, භාෂා පරිවර්තකයින් සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ (ICT) නිලධාරීන් සඳහා පවතින පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත විධිමත්ව දැනුම් දී ඇත. දෙපාර්තමේන්තුවේ වත්මන් යටිතල පහසුකම් තුළ භාෂාමය හා තාක්ෂණික විශේෂඥතාව සඳහා ඇති තීරණාත්මක අවශ්‍යතාව සපුරාලමින්, මෙම අත්‍යවශ්‍ය භූමිකාවන් සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම එහි අරමුණයි.

#### 6.2.3.3 ද්විතීයික මට්ටම

මෙහෙයුම් විනිවිදභාවය පවත්වා ගැනීම සහ බඳවා ගැනීම් කඩිනමින් සිදු කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර සහ කළමනාකරණ සේවා නිලධාරීන් සඳහා පවතින පුරප්පාඩු පිළිබඳව රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වෙත විධිමත් මාසික යාවත්කාලීන කිරීම් යොමු කරනු ලැබේ. මෙමගින්, දෙපාර්තමේන්තුවෙහි කාර්ය මණ්ඩල අවශ්‍යතා පිළිබඳව අදාළ ආයතනය සම්පූර්ණයෙන්ම දැනුවත් කර ඇති බවට සහතික වන අතර, අත්‍යවශ්‍ය ආශ්‍රිත සේවාවන් සහ තාක්ෂණික තනතුරුවල පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් මනා සම්බන්ධීකරණයක් සහිත ප්‍රවේශයක් නිර්මාණය වේ.

#### 6.2.3.4 ප්‍රාථමික මට්ටම

රියදුරු සහ කාර්යාල සේවක සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සමඟ මේ වන විට අඛණ්ඩ සම්බන්ධීකරණයක් පවත්වාගෙන යනු ලබන අතර දෙපාර්තමේන්තුවේ අත්‍යවශ්‍ය සහයක කාර්යයන් සහ සැපයුම් සේවාවන් ස්ථාවර කිරීම සඳහා මෙම සේවාවන් අත්‍යවශ්‍ය වන අතර, සියලු අංශ හරහා සේවා කාර්යක්ෂමව සැපයීමට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ක්‍රියාත්මක වන බව සහතික කරයි.

### 6.2.4 2025 වර්ෂය තුළ උසස්වීම්

දේශීය ආදායම් නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්වරියක ලෙස සේවය කළ ආර්.පී.එච්. ප්‍රනාන්දු මහත්මිය, 2025 මාර්තු 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් ධුරයට පත් කිරීමට කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලදී. වසර තුළ, ජ්‍යෙෂ්ඨ කොමසාරිස්වරුන් 4 දෙනෙකු නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් ධුරයට ද, කොමසාරිස්වරුන් 7 දෙනෙකු ජ්‍යෙෂ්ඨ කොමසාරිස් ධුරයට ද, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරුන් 19 දෙනෙකු කොමසාරිස් ධුරයට ද උසස් කරන ලදී. කොමසාරිස් හෝ ඊට ඉහළ තනතුරු වලට උසස් කරන ලද නිලධාරීන්ගේ විස්තර ඇමුණුම 09 හි දක්වා ඇත.

### 6.2.5 2025 වර්ෂය තුළ විශ්‍රාම ගැනීම්

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2025 වර්ෂයෙහි කාර්ය සාධනය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දුන් පහත සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වසර තුළ දේශීය ආදායම් සේවයෙන් විශ්‍රාම ලබා ඇත.

**6.3 වගුව: 2025 වර්ෂය තුළ විශ්‍රාම ගැනීම්**

| | නම | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ සේවා කාලය | | තනතුර |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| 1 | ඩබ්.ජ්.එස්. චන්ද්‍රසේකර මිය | 1993.01.01 | 2025.02.28 | කොමසාරිස් ජනරාල් |
| 2 | බී.කේ.එස්. ශාන්ත මයා | 1993.10.18 | 2025.10.15 | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| 3 | යූ.ඩී.එන්. ජයවීර මයා | 1998.11.16 | 2025.06.27 | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| 4 | එල්.කේ. රත්නායක මයා | 1993.10.18 | 2025.12.18 | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| 5 | ආර්.ජ්.එස්. රාජපක්ෂ මෙනෙවිය | 1993.08.02 | 2025.01.28 | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් |
| 6 | එම්.එන්. පුෂ්පලතා මිය | 1994.03.01 | 2025.11.19 | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් |
| 7 | අයි.වී. ජයරත්න මයා | 2001.11.15 | 2025.07.29 | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

වර්ෂය තුළ විශ්‍රාමයාම් සංඛ්‍යාව 6.4 වගුවෙහි දැක්වේ.

**6.4 වගුව: 2025 වර්ෂය තුළ විශ්‍රාමයාම් සංඛ්‍යාව**

| තනතුර | විශ්‍රාමික සංඛ්‍යාව |
|---|---|
| කොමසාරිස් ජනරාල් | 01 |
| නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | 02 |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | 01 |
| ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | 04 |
| කොමසාරිස් | 12 |
| අධ්‍යක්ෂ (පාලන) | 01 |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | 16 |
| නියෝජ්‍ය කොමසාරිස් | 06 |
| සහකාර කොමසාරිස් | 02 |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 |
| තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහකාර | 01 |
| කළමනාකරණ සේවා නිලධාරි | 15 |
| කාර්යාල කාර්ය සහායක සේවය | 05 |
| රියදුරු | 12 |
| **එකතුව** | **79** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

කොමසාරිස්වරුන්, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරුන්, නියෝජ්‍ය කොමසාරිස්වරුන් හා සහකාර කොමසාරිස්වරුන්ගේ විශ්‍රාමයාම් පිළිබඳ විස්තර ඇමුණුම 10 හි දක්වා ඇත.

### 6.2.6 වයස් කාණ්ඩය අනුව කාර්ය මණ්ඩල වර්ගීකරණය

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ වයස පාදක වර්ගීකරණය 6.5 වගුව හා 6.1 සහ 6.2 සටහන් තුළින් දැක්වේ.

### 6.5 වගුව: වයස් කාණ්ඩය අනුව කාර්ය මණ්ඩල වර්ගීකරණය

| වයස් කාණ්ඩය (අවුරුදු) | දේශීය ආදායම් සේවයෙහි නිලධාරීන් සංඛ්‍යාව | වෙනත් සේවාවන්ට අයත් නිලධාරීන් සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| 30ට අඩු | 55 | 115 | 170 |
| 31-40 | 121 | 379 | 500 |
| 41-50 | 497 | 499 | 996 |
| 51-60 | 340 | 447 | 787 |
| **එකතුව** | **1,013** | **1,440** | **2,453** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 6.1 සටහන: වයස් කාණ්ඩය අනුව දේශීය ආදායම් සේවයේ සේවකයින් පිළිබඳ විශ්ලේෂණය




*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 6.2 සටහන: වයස් කාණ්ඩය අනුව වෙනත් සේවාවන්ට අයත් සේවකයින් පිළිබඳ විශ්ලේෂණය




*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**6.2.7 2025 වර්ෂය අවසානය වන විට කාර්ය මණ්ඩලයේ සේවා කාලය අනුව ව්‍යාප්තිය**

වසර අවසානය වන විට කාර්ය මණ්ඩලයේ සේවා කාලය ව්‍යාප්තිය 6.6 වගුවේ දැක්වේ.

**6.6 වගුව: 2025 වර්ෂය අවසානය වන විට කාර්ය මණ්ඩලයේ සේවා කාලයෙහි ව්‍යාප්තිය**

| සේවා කාලය | දේශීය ආදායම් සේවයෙහි නිලධාරීන් සංඛ්‍යාව | වෙනත් සේවාවන්ට අයත් නිලධාරීන් සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| වසර 5ට අඩු | 151 | 30 | 181 |
| වසර 5 - 9 | 26 | 205 | 231 |
| වසර 10 - 19 | 644 | 531 | 1,175 |
| වසර 20 - 30 | 184 | 492 | 676 |
| වසර 30ට අඩු | 8 | 182 | 190 |
| **එකතුව** | **1,013** | **1,440** | **2,453** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

දේශීය ආදායම් සේවයේ සේවකයින්ගේ සේවා කාලය අනුව සේවක වර්ගීකරණය 6.3 රූප සටහනෙහි දැක්වේ.

**6.3 සටහන: සේවා කාලය අනුව දේශීය ආදායම් සේවයේ සේවකයින්ගේ ව්‍යාප්තිය**




*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

**6.2.8 2025 වර්ෂය අවසානය වන විට ස්ත්‍රී පුරුෂ භාවය අනුව කාර්ය මණ්ඩලයෙහි ව්‍යාප්තිය**

2025 වර්ෂය අවසානය වන විට ස්ත්‍රී පුරුෂභාවය අනුව කාර්ය මණ්ඩලයෙහි ව්‍යාප්තිය 6.7 වගුව සහ 6.4 සටහනෙන් දක්වා ඇත.

6.7 වගුව: 2025 වර්ෂය අවසානය වන විට ස්ත්‍රී පුරුෂ භාවය අනුව කාර්ය මණ්ඩලයෙහි ව්‍යාප්තිය

| ස්ත්‍රී පුරුෂ භාවය | දේශීය ආදායම් සේවයේ නිලධාරීන් සංඛ්‍යාව | වෙනත් සේවාවන්හි නිලධාරීන් සංඛ්‍යාව | එකතුව |
|---|---|---|---|
| පුරුෂ | 478 | 499 | **977** |
| ස්ත්‍රී | 535 | 941 | **1,476** |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

6.4 සටහන: ස්ත්‍රී පුරුෂ භාවය අනුව කාර්ය මණ්ඩලයෙහි ව්‍යාප්තිය




*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

## 6.3 මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

ජාතික සහ ජාත්‍යන්තර පුහුණු අවස්ථා උපයෝගී කර ගනිමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තම බදු නිලධාරීන්ගේ තාක්ෂණික නිපුණතා වැඩි දියුණු කරයි. ජපානය, ඉන්දියාව සහ චීනය වැනි හවුල්කාර රටවල් මෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව (ADB), ජපාන ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වැනි ගෝලීය ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම තුළින්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තම භාවිතයන් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට සහ හොඳම ගෝලීය භාවිතයන්ට අනුකූලව පවතින බව සහතික කරයි. නවීන බදු පරිපාලනය සඳහා අවශ්‍ය දැනුම සහ කුසලතා වැඩි දියුණු කිරීම සඳහා මෙම වැඩසටහන් විශේෂයෙන් නිර්මාණය කර ඇත.

කෙටි කාලීන පුහුණු වැඩසටහන්වලට අමතරව, දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් සඳහා විධිමත් පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබාදීම කෙරෙහි දැඩි අවධානයක් යොමු කරයි. ඊට කදිම උදාහරණයක් වන්නේ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනය (PIM) සමග සහයෝගයෙන් පිරිනමනු ලබන බදුකරණය පිළිබඳ ශාස්ත්‍රපති (MBAT) උපාධියයි. දකුණු ආසියානු කලාපය තුළ අද්විතීය වැඩසටහනක් ලෙස, මෙම උපාධි පාඨමාලාව බදු නිලධාරීන්ගේ වෘත්තීය අවශ්‍යතා සඳහා ගැලපෙන ලෙස නිර්මාණය කර ඇති අතර, නිලධාරීන්ගේ දෛනික රාජකාරී භූමිකාවන් සඳහා අවශ්‍ය උසස් න්‍යායාත්මක දැනුම සහ එහි ප්‍රායෝගික භාවිතය අතර පරතරය පියවමින් ක්‍රියාත්මක වේ.

එමෙන්ම, දෙපාර්තමේන්තුව විසින් දේශීය හා අභ්‍යන්තර පුහුණු පිළිබඳ ශක්තිමත් රාමුවක් පවත්වාගෙන යනු ලැබේ. ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ (SLIDA) විශේෂිත හා සාමාන්‍ය

සැසිවලට සහභාගී වීම සඳහා දෙපාර්තමේන්තුව සේවකයින්ට අනුග්‍රහය දක්වන අතර, මානව සම්පත් සංවර්ධන ඒකකය ස්වාධීනව පුළුල් පරාසයක පුහුණු වැඩසටහන් සංවිධානය කරයි. දේශීය ආදායම් සේවා ව්‍යවස්ථාවෙන් නියම කර ඇති විභාග සහ වෘත්තීය සන්ධිස්ථාන සඳහා කාර්ය මණ්ඩලය සූදානම් කිරීම සඳහා මෙම උපායමාර්ගික වැඩපිළිවෙළ නිර්මාණය කර ඇත. මෙම පුළුල් ප්‍රවේශය තුළින්, තම ශ්‍රම බලකාය වත්මන් අභියෝග සඳහා හොඳින් සන්නද්ධ වීම පමණක් නොව, තිරසාර වෘත්තීය ප්‍රගතිය සඳහා ද සම්පූර්ණයෙන්ම සුදුසුකම් ලබා ඇති බවට දෙපාර්තමේන්තුව සහතික වනු ලබයි.

### 6.3.1 2025 වර්ෂය තුළ පවත්වනු ලැබූ දේශීය හා විදේශීය මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

2025 වර්ෂය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් අනුග්‍රහය දක්වන ලද දේශීය මානව සම්පත් සංවර්ධන වැඩසටහන් පිළිබඳ විස්තර 6.8 වගුවේ දක්වා ඇත.

**6.8 වගුව: දේශීය මානව සම්පත් සංවර්ධන වැඩසටහන්**

| අනු | වැඩසටහනෙහි නම | සහභාගී වූ සංඛ්‍යාව | ආයෝජනය (රු.) | අරමුදල් පිරිනැමීම |
|---|---|---|---|---|
| 1 | ශාස්ත්‍රපති උපාධිය (ජන සන්නිවේදනය) - කැලණිය විශ්වවිද්‍යාලය | 5 | 950,000/- | දේ.ආ.දෙ. |
| 3 | ශාස්ත්‍රපති උපාධිය (ආර්ථික විද්‍යාව) - කැලණිය විශ්වවිද්‍යාලය | 3 | 360,000/- | දේ.ආ.දෙ. |
| 4 | ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - රුහුණ විශ්වවිද්‍යාලය | 1 | 192,500/- | දේ.ආ.දෙ. |
| 5 | රාජ්‍ය පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය - ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය | 1 | 184,000/- | දේ.ආ.දෙ. |
| 6 | ශාස්ත්‍රපති උපාධිය (ආර්ථික විද්‍යාව) - රුහුණ විශ්වවිද්‍යාලය | 1 | 98,300/- | දේ.ආ.දෙ. |
| 7 | ආර්ථික සංවර්ධනය සඳහා ඩිජිටල් පරිවර්තනය පිළිබඳ ජාත්‍යන්තර සමුළුව | 1 | 10,000/- | දේ.ආ.දෙ. |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

2025 දී, දෙපාර්තමේන්තුව විදේශීය මානව සම්පත් සංවර්ධන වැඩසටහන් 24ක් සඳහා පහසුකම් සපයන ලද අතර, ඒ සඳහා නිලධාරීන් 42ක් සහභාගී විය. මේ පිළිබඳ සවිස්තර තොරතුරු ඇමුණුම 11හි ඇත. සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් 2025 වර්ෂයේදී පවත්වන ලද පුහුණු වැඩසටහන්වල සාරාංශය ඇමුණුම 12හි දැක්වේ.

### 6.3.2 2025 වර්ෂය තුළ දේශීය ආදායම් සේවා නිලධාරීන් සඳහා පවත්වන ලද පුහුණු පන්ති, අනෙකුත් සම්මන්ත්‍රණ, වැඩමුළු, දැනුවත් කිරීමේ වැඩසටහන්, පුහුණු වැඩසටහන් සහ විභාග

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධන අංශය විසින් සහකාර සහ නියෝජ්‍ය කොමසාරිස්වරුන් සඳහා විශේෂිත පුහුණුව සහ විභාග නිරන්තරයෙන් පවත්වනු ලබයි. බදුකරණය සහ ගිණුම්කරණය කෙරෙහි මූලික අවධානයක් යොමු කරමින් වෘත්තීය දැනුම සහ විශ්ලේෂණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා මෙම වැඩසටහන් උපායමාර්ගිකව නිර්මාණය කර ඇත. අත්‍යවශ්‍ය විෂය ක්ෂේත්‍ර ආවරණය කිරීම තුළින්, නිලධාරීන්ගේ නිල රාජකාරි ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය නිපුණතා ලබා ගනිමින් ශ්‍රේණි තහවුරු කිරීම සහ උසස් කිරීමේ සුදුසුකම් ඇතුළු තීරණාත්මක සේවා අවශ්‍යතා සපුරාලන බවට මෙම මෙම වැඩසටහන් තුළින් සහතික කරනු ලැබේ. වර්ෂය තුළ පවත්වන ලද පුහුණු සැසි, විශේෂිත වැඩමුළු, සම්මන්ත්‍රණ සහ විභාග පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු පහත දැක්වේ.

1. 2024 පෙබරවාරි 18 වන දින II ශ්‍රේණියට උසස් කරන ලද දේශීය ආදායම් සේවයේ නිලධාරීන් සඳහා වන 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා පුනරීක්ෂණ සැසි පැවැත්වීම.
2. 2025 ජුනි 19 සහ 21 යන දිනවල II ශ්‍රේණියට උසස් කරන ලද දේශීය ආදායම් සේවයේ නිලධාරීන් සඳහා වන 2 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා සම්මන්ත්‍රණ සහ දේශන සංවිධානය කිරීම.
3. 2024 ජනවාරි 16 සහ 2025 පෙබරවාරි 10 යන

දිනවල III ශ්‍රේණියට පත් කරන ලද දේශීය ආදායම් සේවයේ නිලධාරීන් සඳහා වන 1 වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා සම්මන්ත්‍රණ සහ දේශන සංවිධානය කිරීම.

4. වැඩ කාර්යසාධනය වැඩිදියුණු කිරීම අරමුණු කරගත් බදු පරිපාලනය, බදු සංශෝධන, රේගු ක්‍රියා පටිපාටි, සැපයුම් දාම කළමනාකරණය සහ අභිප්‍රේරණ වැඩසටහන් පිළිබඳ දැනුම වැඩි දියුණු කිරීම සඳහා පූර්ව තීරණය කරන ලද මාතෘකා පිළිබඳ සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කිරීම සහ පැවැත්වීම (දේශීය ආදායම් සේවයේ නිලධාරියෙකු සඳහා පැය 12 බැගින්)
5. දේශීය ආදායම් සේවයේ නිලධාරීන් නිලධාරීන්ගේ දෛනික රාජකාරිවල කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් ඉල්ලා සිටින මාතෘකා පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් නම් කරන ලද නිලධාරීන් විසින් සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම.

පහත සඳහන් වැඩසටහන් ඊට ඇතුළත් විය :

- 2018, 2024 සහ 2025 දී බඳවා ගත් දේශීය ආදායම් සේවයේ නිලධාරීන් සඳහා බදු පැහැර හැරීම, බදු අපරාධ විමර්ශනය සහ දණ්ඩන පිළිබඳ විශේෂ දැනුම්වත් කිරීමේ වැඩසටහන
- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2024 (භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා) පිළිබඳ විශේෂ දැනුම්වත් කිරීමේ වැඩසටහනක්

### 6.3.3 2025 වර්ෂයේදී රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සඳහා පවත්වන ලද පුහුණු පාඨමාලා

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 ට අනුකූලව, සියලුම රාජ්‍ය නිලධාරීන් රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම අවශ්‍ය වේ. මේ සඳහා, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් වසර පුරා දේශීය ආදායම් දෙපාර්තමේන්තු නිලධාරීන් සඳහා විශේෂිත ප්‍රවීණතා පාඨමාලා පවත්වන ලදී. මෙම වැඩසටහන් පිළිබඳ විස්තර පහත දක්වා ඇත.

**6.9 වගුව : 2025 වර්ෂයේදී රාජ්‍ය භාෂා ප්‍රවීණතාව සඳහා පවත්වන ලද පුහුණු පාඨමාලා**

| පාඨමාලාව | පාඨමාලා කාලය | සහභාගීවූවන් ගණන |
|---|---|---|
| දෙමළ භාෂාව | පැය 200 | 52 |

*මූලාශ්‍රය: දේශීය ආදායම් දෙපාර්තමේන්තුව*

### 6.3.4 දේශීය ආදායම් සේවාවට අයත් නොවන නිලධාරීන් සඳහා 2025 වර්ෂයේදී පවත්වන ලද අනෙකුත් සම්මන්ත්‍රණ, වැඩමුළු, දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පුහුණු වැඩසටහන්

2025 වර්ෂයේදී දේශීය ආදායම් සේවයට අයත් නොවන සේවකයන් සඳහා පහත සඳහන් සම්මන්ත්‍රණ, වැඩමුළු සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

1. අලුතින් බඳවා ගත් කළමනාකරණ සේවා නිලධාරීන් (MSOs) සඳහා නම්නීකරණ වැඩසටහනක් පවත්වන ලදී.
2. දේශීය ආදායම් සේවයේ නිලධාරීන් හැර අනෙකුත් නිලධාරීන් සඳහා දෛනික කටයුතුවලදී කාර්යක්ෂම හා වැඩිදියුණු කළ සේවා සැපයීම සහතික කිරීම සඳහා අදාළ විෂයයන් සහ ක්‍රියා පටිපාටි පිළිබඳ සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වන ලදී. (එක් නිලධාරියෙකු සඳහා පැය 12 බැගින්) පහත වැඩසටහන් ඊට ඇතුළත් විය:
   - දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරනු ලබන බදු වර්ග, විනය ක්‍රියා පටිපාටි සහ අභිප්‍රේරණ වැඩසටහන් පිළිබඳ හැඳින්වීමක්
   - බදු ගෙවන්නා හඳුනාගැනීමේ අංකය (TIN) ලබා ගැනීම, පුද්ගලික හඳුනාගැනීම අංකය (PIN) ලබා ගැනීම, බදු වර්ග සහ බදු පැතිකඩ වෙනස් කිරීම, විද්‍යුත් වාර්තා ගොනු කිරීම සහ බදු මුදල් ආපසු ගෙවීම ඉල්ලා සිටීම ඇතුළු ප්‍රායෝගික පුහුණුවක් හරහා බදු සම්බන්ධ කරුණු කළමනාකරණය කිරීම සඳහා මාර්ගගත වේදිකා භාවිතා කිරීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන්
   - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර කටයුතු ඒකකය ස්ථාපිත කිරීමේ අරමුණ පිළිබඳ දැනුවත් කිරීමේ සැසි, වගවීමේ මානසිකත්වයක් ප්‍රවර්ධනය කිරීම, ක්‍රියාමාර්ග සඳහා වගකීම අවධාරණය කිරීම සහ අල්ලස් හා දූෂණයේ ප්‍රතිවිපාක පිළිබඳව නිලධාරීන් දැනුම්වත් කිරීම
   - ප්‍රසම්පාදන මාර්ගෝපදේශ - 2024 (භාණ්ඩ, වැඩ සහ උපදේශන නොවන සේවා) පිළිබඳ විශේෂ දැනුම්වත් කිරීමේ වැඩසටහනක්



# 07

පරිච්ඡේදය

# අනුකූලතා වාර්තාව

# 07 පරිච්ඡේදය

## අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ වන අවශ්‍යතාවය | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ නොවේ) | අනුකූලතාවය නොදැක්වීම පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක් | අනාගතයේදී අනුකූල නොවීම වැළැක්වීම සඳහා යෝජිත නිරවද්‍ය කිරීමේ ක්‍රියාවන් |
|---|---|---|---|---|
| **1** | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර ඇත.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශය | අනුකූල වේ | | |
| 1.2 | රජයේ නිලධාරින්ගේ ගිණුම සඳහා වන අත්තිකාරම් | අනුකූල වේ | | |
| 1.3 | වෙළඳ සහ නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | | අදාළ නොවේ | |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | | අදාළ නොවේ | |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | | අදාළ නොවේ | |
| 1.6 | වෙනත් | අනුකූල වේ | | |
| **2** | **පොත් සහ රෙජිස්ටර් නඩත්තු කිරීම (මු.රෙ. 445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛන 267/2018 ප්‍රකාරව ස්ථාවර වත්කම් රෙජිස්ටරය නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම | අනුකූල වේ | | |
| 2.2 | පෞද්ගලික පඩිනඩි රෙජිස්ටරය/පෞද්ගලික පඩිනඩි කාඩ්පත් නිසි පරිදි නඩත්තු කර යාවත්කාලීන කිරීම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම | අනුකූල වේ | | |
| 2.5 | සියලු මාසික ගිණුම් සාරාංශ (CIGAS) සකස් කර නියමිත දිනට භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් සහ මුදල් ඇණවුම් රෙජිස්ටරය නිසි පරිදි නඩත්තු කර යාවත්කාලීන කිරීම | අනුකූල වේ | | |
| 2.7 | බඩු ලේඛන පොත් රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම | අනුකූල වේ | | |
| 2.8 | තොග රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම | අනුකූල වේ | | |

| | | | |
|---|---|---|---|
| 2.9 | අලාභ රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම | අනුකූල වේ | |
| 2.10 | බැඳීම් රෙජිස්ටරය නඩත්තු කර යාවත්කාලීන කිරීම | අනුකූල වේ | |
| 2.11 | උප පත්‍රිකා පොත් රෙජිස්ටරය (GA-N20) නඩත්තු කර යාවත්කාලීන කිරීම | අනුකූල වේ | |
| **3** | **මුදල් පාලනය සම්බන්ධ කාර්යයන් පවරා දීම (මු.රෙ. 135)** | | |
| 3.1 | ආයතනය තුළ මූල්‍ය අධිකාර බලය පවරා දීම | අනුකූල වේ | |
| 3.2 | මූල්‍ය අධිකාර බලය පවරා දීම පිළිබඳව ආයතනය තුළ සන්නිවේදනය කිරීම | අනුකූල වේ | |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා යන පරිදි මූල්‍ය අධිකාර බලය පවරා දීම | අනුකූල වේ | |
| 3.4 | අංක 171/2004 දරන 2014.05.11 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය ප්‍රකාරව, රජයේ පඩි සැකසීමේ මෘදුකාංග පැකේජය යොදා ගැනීමේදී ගණකාධිකාරිවරු විසින් මෙම අධිකාරි බලය පිළිපැදීම | අනුකූල වේ | |
| **4** | **වාර්ෂික සැලසුම් සැකසීම** | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලසුම සැකසීම | අනුකූල වේ | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලසුම සැකසීම | අනුකූල වේ | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලසුම සැකසීම | අනුකූල වේ | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකසා ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහයන්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත නියමිත වෙලාවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | |
| **5** | **විගණන විමසුම්** | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කර ඇති සියලු විගණන විමසුම් සඳහා විශේෂිත කාල සීමාවක් තුළ පිළිතුරු සැපයීම | අනුකූල වේ | |
| **6** | **අභ්‍යන්තර විගණන** | | |
| 6.1 | මුදල් රෙගුලාසි 134(2) DMA /1-2019 ප්‍රකාරව විගණකාධිපතිවරයාගේ උපදේශනයන් ලබා ගැනීමෙන් අනතුරුව වර්ෂය ආරම්භයේදී අභ්‍යන්තර විගණන සැලසුම සැකසීම | අනුකූල වේ | |
| 6.2 | සියලුම අභ්‍යන්තර විගණන වාර්තා සඳහා මසක් ඇතුළත පිළිතුරු ලබා දීම | අනුකූල වේ | |

| | | |
|---|---|---|
| 6.3 | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(4) උපවගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම | අනුකූල වේ |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටුව** | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 ප්‍රකාරව වර්ෂය තුළ විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් අවම වශයෙන් 04ක් වත් පැවැත්වීම | අනුකූල වේ |
| **8** | **වත්කම් කළමනාකරණය** | |
| 8.1 | අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන ඡේදය ප්‍රකාරව මිලදී ගන්නා ලද සහ අපහරණය කරන ලද වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත භාර දීම | අනුකූල වේ |
| 8.2 | ඉහත කී චක්‍රලේඛයේ 13 වන ඡේදය ප්‍රකාරව චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම සඳහා සුදුසු සම්බන්ධීකරණ නිලධාරියෙකු පත් කිරීම | අනුකූල වේ |
| 8.3 | අංක 05/2016 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පවත්වා අදාළ වාර්තා විගණකාධිපතිවරයා වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ |
| 8.4 | චක්‍රලේඛයේ විශේෂයෙන් දක්වා ඇති පරිදි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල හරහා අතිරික්ත හෝ අඩුපාඩු නිරාවරණය කර ගැනීම සහ කාලසීමාව තුළ ඒ හා සම්බන්ධ අනෙකුත් නිර්දේශ, ක්‍රියාකාරකම් | අනුකූල වේ |
| 8.5 | මු.රෙ. 772 ප්‍රකාරව, පාවිච්චියට නුසුදුසු භාණ්ඩ ව්‍යපහරණය කිරීම | අනුකූල වේ |
| **9** | **වාහන කළමනාකරණය** | |
| 9.1 | දෛනික ධාවන සටහන සහ සංචිත වාහන පිළිබඳ සාරාංශ සකස් කර විගණකාධිපතිවරයා වෙත නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ |
| 9.2 | පාවිච්චියට නුසුදුසු බව නිර්දේශ කිරීමෙන් පසු මාස හයකට අඩු කාල සීමාවක් තුළ පාවිච්චියට නුසුදුසු වාහන ව්‍යපහරණය කිරීම | අනුකූල වේ |
| 9.3 | වාහන ලොග් පොත් නඩත්තු කිරීම සහ යාවත්කාලීන කිරීම | අනුකූල වේ |

| | | | |
|---|---|---|---|
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109 සහ 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | |
| 9.5 | අංක 30/2016 දරන 2016.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ විධිවිධානයන් ප්‍රකාරව වාහන වල තෙල් පරිභෝජනය නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් පසු කල් බදු වාහන ලොග් පොත්වල අත්‍යන්ත හිමිකාරීත්වය පැවරීම | අනුකූල වේ | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳීම් ප්‍රකාශ සකස් කර, සහතික කර විගණනය සඳහා සූදානම් කරවීම | අනුකූල වේ | |
| 10.2 | සලකන ලද වර්ෂය යටතේ හෝ පෙර වර්ෂවල පැවති නිෂ්ක්‍රිය ගිණුම් නිරවුල් කිරීම | | අදාළ නොවේ |
| 10.3 | ගැලපුම් සිදු කළ යුතු සහ මාසයක් තුළ එකී ශේෂ නිරවුල් කළ යුතු, බැංකු සැසඳීම් ප්‍රකාශයන් හරහා නිරාවරණය කරගත් ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි අනුව කටයුතු කිරීම | අනුකූල වේ | |
| **11** | **ප්‍රතිපාදන ප්‍රයෝජනයට ගැනීම** | | |
| 11.1 | වෙන්කර ඇති ප්‍රතිපාදන සීමාව නොඉක්මවා වියදම් කිරීම | අනුකූල වේ | |
| 11.2 | මු.රෙ. 94(1) ප්‍රකාරව වර්ෂය අවසානයේ ඉතුරු ප්‍රතිපාදන නොඉක්මවන බැරකම් | අනුකූල වේ | |
| **12** | **රාජ්‍ය නිලධාරීන්ගේ ගිණුමට අත්තිකාරම්** | | |
| 12.1 | සීමාවට අනුකූල වීම | අනුකූල වේ | |
| 12.2 | හිඟ ණය සම්බන්ධයෙන් කාල විශ්ලේෂණයක් සිදු කිරීම | අනුකූල වේ | |
| 12.3 | එක් වසරකට වැඩි හිඟ ණය ශේෂ නිරවුල් කිරීම | අනුකූල වේ | |
| **13** | **පොදු තැන්පතු ගිණුම** | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු ව්‍යපහරණය සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | |
| 13.2 | පොදු තැන්පතුව සහ පාලන රෙජිස්ටරය යාවත්කාලීන කර නඩත්තු කර ඇත. | අනුකූල වේ | |
| **14** | **අග්‍රිම ගිණුම** | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයෙහි මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම | අනුකූල වේ | |

| | | | |
|---|---|---|---|
| 14.2 | කාර්යය සම්පූර්ණ කිරීමේ සිට මාසයක් ඇතුළත මු.රෙ. 371 ප්‍රකාරව තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම | අනුකූල වේ | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවීමේදී තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම | අනුකූල වේ | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය භාණ්ඩාගාර පොත් සමග මාසිකව සැසඳීම | අනුකූල වේ | |
| **15** | **ආදායම් ගිණුම** | | |
| 15.1 | රෙගුලාසි ප්‍රකාරව ආදායම් මගින් ආපසු ගෙවීම | අනුකූල වේ | |
| 15.2 | එකතු කළ ආදායම තැන්පතු ගිණුමට බැර නොකරමින්, ඍජුවම ආදායම් ගිණුමට බැර කිරීම | අනුකූල වේ | |
| 15.3 | මු.රෙ. 176 ප්‍රකාරව ආපසු ලැබෙන හිඟ ආදායම් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩලය ඇතුළත කාර්ය මණ්ඩලයට පඩි ගෙවීම | අනුකූල වේ | |
| 16.2 | සෑම කාර්ය මණ්ඩල සාමාජිකයෙකුටම ලිඛිත රාජකාරි ලැයිස්තුවක් ලබා දීම | අනුකූල වේ | |
| 16.3 | සෑම වාර්තාවක්ම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඔවුන්ගේ අංක 04/2017 දරන 2017.09.20 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව භාර දීම | අනුකූල වේ | |
| **17** | **මහජනතාව වෙත තොරතුරු ලබා දීම** | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම් පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කිරීම සහ නිසි තොරතුරු රෙජිස්ටරයක් නඩත්තු කිරීම හා යාවත්කාලීන කිරීම | අනුකූල වේ | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු වෙබ් අඩවි හෝ විකල්ප ක්‍රියා මාර්ග මගින් මහජනතාව වෙත ලබා දීම සහ මෙම වෙබ් අඩවි හෝ විකල්ප ක්‍රියා මාර්ග මගින් රාජ්‍ය අධිකාරියට එදිරිව මහජනයාට පැමිණිලි ඉදිරිපත් කිරීමට/ ගුණාත්මකභාවය ඇගයීමට ඉඩ ප්‍රස්තාව ලබා දීම | අනුකූල වේ | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන සහ 10 වන වගන්තිය ප්‍රකාරව අර්ධ වාර්ෂික හෝ වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම | අනුකූල වේ | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | |

| | | |
|---|---|---|
| 18.1 | රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 05/2008 සහ 05/2018(1) ප්‍රකාරව ආයතනය විසින් පුරවැසි ප්‍රඥප්තියක්/ පුරවැසි සේවාලාභියාගේ ප්‍රඥප්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම | අනුකූල වේ |
| 18.2 | චක්‍රලේඛයේ 2.3 ඡේදය ප්‍රකාරව පුරවැසි ප්‍රඥප්තිය/ පුරවැසි සේවාලාභියාගේ ප්‍රඥප්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමෝපායක් සකස් කිරීම | අනුකූල වේ |
| **19** | **මානව සම්පත් සැලසුම සැකසීම** | |
| 19.1 | 2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 02 වන ඇමුණුමේ ආකෘතිය ප්‍රකාරව මානව සම්පත් සැලසුමක් සකස් කිරීම | අනුකූල වේ |
| 19.2 | ඉහත කී මානව සම්පත් සැලසුම මගින් කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකුම අවම ලෙස වසරට පැය 12ට නොඅඩු පුහුණු අවස්ථාවන් සඳහා යොමු කිරීම | අනුකූල වේ |
| 19.3 | ඉහත කී චක්‍රලේඛයේ ඇමුණුම 01හි ආකෘතිය පදනම් කර ගනිමින් සමස්ත කාර්ය මණ්ඩලයට වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් සඳහා අත්සන් කිරීම | අනුකූල වේ |
| 19.4 | ඉහත කී චක්‍රලේඛයේ ඡේද අංක 6.5 ප්‍රකාරව ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත්කිරීම සහ මානව සම්පත් සංවර්ධන සැලසුම, ධාරිතා ඉහළ නැංවීමේ වැඩසටහන් සංවිධාන කිරීම හා නිපුණතා සංවර්ධන වැඩසටහන් පවත්වාගෙන යාමේ වගකීම පැවරීම | අනුකූල වේ |
| **20** | **විගණන ඡේද සඳහා ප්‍රතිචාර දැක්වීම** | |
| 20.1 | පෙර වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේදයන්හි පෙන්වා දී ඇති අඩුලුහුඬුකම් නිවැරදි කිරීම | අනුකූල වේ |

ඇමුණුම 01

**වර්ෂය තුළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පරිපාලනය කරන ලද බදු**

| බදු වර්ගය | ප්‍රධාන පනත සහ සංශෝධන | සහතික කළ දිනය |
|---|---|---|
| ආදායම් බද්ද | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත | 2017.10.24 |
| | 2021 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | 2021.05.13 |
| | 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | 2022.12.19 |
| | 2023 අංක 4 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | 2023.05.08 |
| | 2023 අංක 14 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | 08.09.2023 |
| | 2025 අංක 2 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | 20.03.2025 |
| එකතු කළ අගය මත බද්ද (මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද ඇතුළත්ව) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත | 26.07.2002 |
| | 2003 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2003.02.27 |
| | 2004 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2004.11.18 |
| | 2005 අංක 6 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2005.03.30 |
| | 2006 අංක 8 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2006.03.31 |
| | 2007 අංක 14 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2007.04.12 |
| | 2008 අංක 15 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2008.02.29 |
| | 2009 අංක 15 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2009.03.31 |
| | 2011 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2011.03.31 |
| | 2012 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2012.03.30 |
| | 2013 අංක 17 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2013.04.24 |
| | 2014 අංක 7 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2014.04.24 |
| | 2015 අංක 11 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2015.10.30 |
| | 2016 අංක 20 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2016.11.01 |
| | 2018 අංක 25 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2018.08.16 |
| | 2019 අංක 19 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2019.10.31 |
| | 2021 අංක 9 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2021.05.13 |
| | 2022 අංක 13 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2022.03.31 |
| | 2022 අංක 44 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2022.12.14 |
| | 2023 අංක 32 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2023.12.13 |
| | 2024 අංක 16 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2024.03.20 |
| | 2025 අංක 4 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත | 2025.04.11 |
| ඔට්ටු හා සූදු බද්ද | 1988 අංක 40 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු පනත | 1988.11.24 |
| | 2001 අංක 7 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 2001.04.11 |
| | 2002 අංක 11 දරන මුදල් පනත | 2002.07.08 |
| | 2003 අංක 23 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 2003.07.30 |
| | 2005 අංක 9 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 2005.03.31 |
| | 2006 අංක 14 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 2006.03.31 |
| | 2013 අංක 19 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 2013.04.24 |
| | 2015 අංක 14 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 2015.10.30 |
| | 2023 අංක 11 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 2023.08.21 |
| | 2025 අංක 25 දරන ඔට්ටු ඇල්ලීම හා සූදු බදු (සංශෝධන) පනත | 2025.12.17 |

| | | |
|---|---|---|
| මුද්දර ගාස්තු | 1982 අංක 43 දරන මුද්දර බදු පනත | 1982.12.14 |
| | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත | 2006.03.31 |
| | 2008 අංක 10 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත | 2008.02.29 |
| | 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනත | 2011.03.31 |
| | 2022 අංක 6 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) පනත | 2022.02.17 |
| කොටස් ගනුදෙනු බද්ද | 2005 අංක 5 දරන මුදල් පනත | 2005.03.30 |
| | 2007 අංක 13 දරන මුදල් (සංශෝධන) පනත | 2007.04.11 |
| | 2008 අංක 8 දරන මුදල් (සංශෝධන) පනත | 2008.02.29 |
| | 2009 අංක 18 දරන මුදල් (සංශෝධන) පනත | 2009.03.31 |
| විගමන බද්ද | 2015 අංක 10 දරන මුදල් පනත | 2015.10.30 |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | 2021 අංක 18 දරන මුදල් පනත | 2021.09.15 |
| අධිභාර බද්ද | 2022 අංක 14 දරන අධිභාර බදු පනත | 2022.04.08 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත | 2022.09.20 |
| | 2023 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත | 2023.09.08 |
| | 2024 අංක 15 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත | 2024.03.20 |
| | 2025 අංක 24 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත | 2025.12.17 |

## අවලංගු කර හෝ අහෝසි කර ඇති නමුත් 2024 වර්ෂයේදී ආදායම් රැස් කිරීම සිදු කරන ලද බදු

| බදු වර්ගය | ප්‍රධාන පනත සහ සංශෝධන | අවලංගු කළ හෝ අහෝසි කළ දිනය |
|---|---|---|
| ආදායම් බද්ද | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත | 2018.04.01 |
| ජාතික ආරක්ෂක බද්ද | 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත | 2002.08.01 |
| පිරිවැටුම් බද්ද (උතුරු පළාත) | 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත | 2011.01.01 |
| ආර්ථික සේවා ගාස්තු | 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනත | 2020.01.01 |
| | 2007 අංක 15 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2008 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2009 අංක 16 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2011 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2012 අංක 11 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2013 අංක 6 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2014 අංක 9 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2015 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2017 අංක 7 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2018 අංක 33 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| | 2020 අංක 4 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධන) පනත | |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | 2019.12.01 |
| | 2009 අංක 32 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2011 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2012 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2013 අංක 11 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |

| | | |
|---|---|---|
| | 2014 අංක 10 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2015 අංක 12 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2016 අංක 22 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2017 අංක 13 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2018 අංක 20 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2019 අංක 20 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| | 2020 අංක 3 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත | |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 2018 අංක 35 දරන මුදල් පනත | 2022.01.01 |

## 2025 දෙසැම්බර් 31 දිනට අනුමත පුණ්‍යායතන

| | පුණ්‍යායතනයේ නම | ගැසට් පත්‍රයේ අංකය | ගැසට් පත්‍රයේ දිනය |
|---|---|---|---|
| 1 | සීමාසහිත හින්දු කාන්තා සමිතිය කොළඹ | 10693 | 1954.07.16 |
| 2 | ශ්‍රී ලංකා පිළිකා සංගමය | | |
| 3 | මුහන්දිරම් ඩී එෆ් පෙරේරා අබයසිරිවර්ධන වැඩිහිටි නිවාසය | | |
| 4 | කොළඹ අසරණ සරණ සමිතිය | D.S.221/50, No. 84/3/11 (ET/DO) | 1951.12.11 |
| 5 | FRIDSRO ළමා නිවාසය | 143 | 1981.05.29 |
| 6 | සිස්ටර්ස් ඔෆ් චැරිටි ඔෆ් ජීසස් ඇන්ඩ් මේරි | 833 | 1994.08.19 |
| 7 | රෝහණ (අන්ධ, බිහිරි) විශේෂ පාසල සහ නේවාසිකාගාරය | LDB 7/13 | 1972.10.04 |
| 8 | චාල්ස් සහ රොස්ලින් ප්‍රනාන්දු භාරය | Act No. 28 of 1979 | |
| 9 | අමරසීල වැඩිහිටි නිවාසය | 618 | 1990.07.06 |
| 10 | හංවැල්ල සමාජ සේවා සමිතිය, සැඳෑ සරණ වැඩිහිටි නිවාසය | 425 | 1986.10.24 |
| 11 | සීමාසහිත මාතර ආරෝග්‍ය සේවා සමිතිය | 14797 | 1968.04.11 |
| 12 | සීමාසහිත මතුගම සමාජ සේවා සමිතිය | 1063/16 | 1999.01.21 |
| 13 | පිළියන්දල තරුණ බෞද්ධ සංගමය | 28 | 1979.03.16 |
| 14 | සහනෝදා වැඩිහිටි නිවාසය | 31 (7) a IR Act | 2001.04.04 |
| 15 | මහා මහින්ද ධර්මදූත විශේෂ අරමුදල | 965/15/150(SB/EP) | 1964.03.28 |
| 16 | සුදය භාරය | 07/624 | 1993.07.30 |
| 17 | ශ්‍රවණාබාධිතයින් සඳහා ශාන්ත ජෝශප් අධ්‍යාපනික පදනම | 1554 | 2008.06.13 |
| 18 | සරණ නිකේතනය | 1395 | 2005.05.27 |
| 19 | කොළඹ තරුණ බෞද්ධ සංගමය | Chapter 399 Ordinance 11 | 1927.09.29 |
| 20 | සවිය සංවර්ධන පදනම | 90/0476-26 | 1995.12.04 |
| 21 | ඉස්ලාමීය මුවර්ස් සංස්කෘතික නිවාසය | 10490 | 1953.01.23 |
| 22 | සීමාසහිත ශ්‍රී ලංකාධර සමිතිය | 10596 | 1953.10.09 |
| 23 | තරුණ බෞද්ධ සංගමය මහරගම | 1299 | 2003.07.25 |
| 24 | කනදරාව තපෝවන විහාර ගොඩනැගිලි අරමුදල | | |
| 25 | උදය ළමා නිවාසය | 1313 | 2003.10.31 |
| 26 | දෙව් සුව සේවාව | 185 | 1975.10.10 |
| 27 | කළුතර බෝධි භාරය | 368 | 1985.09.20 |
| 28 | සීමාසහිත සර්වෝදය සුවසෙත සේවා සමිතිය | 462 | 1987.07.09 |
| 29 | මාතර බෞද්ධ කාන්තා සමිතිය | 10947 | 1956.07.06 |
| 30 | ශ්‍රී පරමානන්ද ළමා සහ වැඩිහිටි නිවාසය | 14930 | 1970.10.30 |
| 31 | ප්‍රදීපාලෝක බෞද්ධ බාලිකා නිවාසය | 1842 | 1965.12.31 |
| 32 | ජගද්දලා සමාජ සුබසාධන ආයතනය | 1660 | 2010.06.24 |
| 33 | ශ්‍රී ලංකා කාර්මික ආයතනය සහ දියගල බෝයිස් ටවුන් | 14860 | 1969.06.27 |
| 34 | ශ්‍රී පුණ්‍යවර්ධන සමිතිය | 13998 | 1964.03.28 |
| 35 | ශ්‍රී ලංකා යුධ හමුදා සේවා වනිතා ඒකකයේ බ්‍රේව් හාට්ස් අරමුදල | 1698 | 2011.03.18 |

| | | | |
|---|---|---|---|
| 36 | ශාන්ත මරියා සහ ශාන්ත ජෝන් දේවස්ථානයේ ප්‍රජා සංවර්ධන සහ සමාජ සේවා ව්‍යාපෘතිය | 3-435 – Gazete No. 186 | |
| 37 | පිහිඹියහේන වැඩිහිටි නිවාසය | 1584 | 2009.01.09 |
| 38 | සීමාසහිත ශ්‍රී සුචරිතධර උපාසිකා සමිතිය | 10947 | |
| 39 | සීමාසහිත මල්ලිකා නිවාස සමිතිය (සමාජය) | 10889 | 1956.02.03 |
| 40 | ශාන්ත මාග්‍රට් නිවාසය | 10468 | 1952.11.07 |
| 41 | සරණ කාන්තා වැඩිහිටි නිවාසය | IRD Act No. 34(2)(a) of No. 10 of 2006 | 2008.02.27 |
| 42 | දොන් බොස්කෝ පිරිමි ළමා නිවාසය | 1192 | 2001.07.06 |
| 43 | ලිට්ල් සිස්ටර්ස් ඔෆ් ද පුවර් | IRD Act No 28 of 1979(02-573) | 1994.02.24 |
| 44 | ෆෙන්ඩ්ස් මාක් ශ්‍රී | 462 | 1987.07.09 |
| 45 | ශිල්ප ළමා භාරය | 513 | 1988.07.01 |
| 46 | ශාන්ති නිවාසය | 1667 | 2010.08.13 |
| 47 | සීමාසහිත ගම්සිරි උදා සමිතිය | 246 | 1976.12.31 |
| 48 | ගල්කිස්ස බෞද්ධ සමිතිය - ශ්‍රී සෙනරත් ගුණවර්ධන ළමා සංවර්ධන මධ්‍යස්ථානය | 14892 | 1970.01.27 |
| 49 | SOS ළමා ගම්මාන ශ්‍රී ලංකාව | 496 | 1988.03.04 |
| 50 | මහනුවර බෞද්ධ කාන්තා සමිතිය ජයවික්‍රම ළමා නිවාස | | |
| 51 | හින්දු අධ්‍යාපන මණ්ඩලය | 10857 | 1955.11.04 |
| 52 | මුස්ලිම් කාන්තා අරාබි විද්‍යාල කළමනාකරණ සංගමය | 13998 | 1964.03.28 |
| 53 | විල්රන්ස් කෝනර් ළමා නිවාසය | 38 of 2000 | 2003.06.27 |
| 54 | සියනෑ කෝරළයේ නැගෙනහිර සමාජ සේවා සංගමය - ඔබේසේකර වැඩිහිටි නිවාස | 1337 | 2004.04.16 |
| 55 | සමස්ත ලංකා බෞද්ධ මහා සම්මේලනය | 10812 | 1955.07.01 |
| 56 | ලංකා මෙතෝදිස්ත භාර සංගමය | 237/20 | 1983.03.25 |
| 57 | ද ඔබ්ලේට්ස් ඔෆ් මේරි ඉමාකුලටා ප්‍රොවින්ස් ඔෆ් ශ්‍රී ලංකා | 305 of 84.07.06 | 1984.06.13 |
| 58 | මහනුවර අසරණ සරණ සමිතිය | | 1963 |
| 59 | සීමාසහිත සෙංකලගල බිහිරි සහ අන්ධ සමිතිය | | 1969.01.31 |
| 60 | ලංකා මහාබෝධි සංගමය | 777 | 1999.06.18 |
| 61 | දොන් බොස්කෝ භාරය | 1541 | 2008.03.14 |
| 62 | ප්‍රීතිපුර ළදරු නිවාසය | 7/1638 | 2010.01.22 |
| 63 | සීමාසහිත අනුරාධපුර බිහිරි සහ අන්ධ පාසල් සමිතිය | 387 | 1986.01.31 |
| 64 | ඒන්ජල් පදනම | | |
| 65 | ජෝර්ජ් රජු පස්වන රිදී ජුබිලි අනුස්මරණ සංගමය | 10332 | 1951.12.21 |
| 66 | ඉෂා අතුල් ඉස්ලාම් ළමා නිවාසය | 43/83 | 1984.08.23 |
| 67 | රාමක්‍රිෂ්ණා සාරදා මෙහෙවර | 3-669/3 | 1973.03.16 |
| 68 | ලංකා මුවර්ස් කාන්තා සමිතිය | 305 | 1978.02.17 |
| 69 | පානදුර ළමා සුබසාධන සහ සමාජ සේවා ලීගය (මොරටුව බාලිකා නිවාසය) | 10490 | 1953.01.23 |
| 70 | කළුතර බෞද්ධ සමිතිය | | |
| 71 | හෙල්ප්ඒජ් ශ්‍රී ලංකා | 497 | 1988.03.11 |
| 72 | රෝහල් සේවා සභාව | 458 | 1987.06.12 |

| | | | |
|---|---|---|---|
| 73 | බිහිරි හා අන්ධ අය සඳහා වූ ලංකා පාසල | 10,411 | 1952.06.06 |
| 74 | විශේෂ අධ්‍යාපන සේවා සංගමය | 411 | 1986.07.18 |
| 75 | මොරටුව සමාජ සේවා සංගමය (වැඩිහිටි නිවාසය) | 1982/39 | 2016.09.02 |
| 76 | ලංකා ළමා කමිටුව සඳහා අභියාචනය | 10782 | |
| 77 | එතනමඩල සහන වැඩිහිටි නිවාසය | 2127/14 | 2019.06.12 |
| 78 | ආබාධිත දරුවන් සඳහා ලෝටස් හිල් නිවාසය | 2046/10 | 2017.11.21 |
| 79 | කැනඩාපුර ළමා නිවාසය | 2094/8 | 2018.10.23 |
| 80 | පිළිකාසරණ සංගමය - ශ්‍රී ලංකාව | 2142/81 | 2019.09.27 |
| 81 | ආබාධිත පුද්ගලයින් සඳහා මධ්‍යස්ථානය | 2144/23 | 2018.10.09 |
| 82 | නෝමන් වීරසූරිය අනුස්මරණ නිවහන | 2267/60 | 2022.02.18 |
| 83 | සමස්ත ලංකා වකුගඩු රෝගීන්ගේ සංගමය | 2288/08 | 2022.07.12 |
| 84 | සිලෝන් ෆෙලෝෂිප් ඔෆ් සර්විස් - ප්‍රීතිපුර නිවාසය | 2288/09 | 2022.07.12 |
| 85 | ළමුන් සඳහා ජේන්ටර් නිවාසය | 2307/51 | 2022.11.25 |
| 86 | පීටර් වීරසේකර පදනම | 2329/18 | 2023.04.24 |
| 87 | ශ්‍රී සත්‍ය සායි කරුණා නිලයම් පදනම | 2387/40 | 2024.06.06 |
| 88 | බිංගිරිය සමාජ සේවා සංගමයට අයත් ජේ. එල්. සිරිසේන අනුස්මරණ වැඩිහිටි නිවාසය | 2443/22 | 2025.07.01 |
| 89 | ඉන්දිරා පිළිකා භාරය | 2449/52 | 2025.08.15 |

## 2025 දෙසැම්බර් 31 දිනට ද්විත්ව බදු වැළැක්වීමේ ගිවිසුම්

| | රට | ගිවිසුම අත්සන් කළ දිනය | ගැසට් පත්‍රය | | ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වීම (තක්සේරු වර්ෂය අනුව) |
|---|---|---|---|---|---|
| | | | අංකය | දිනය | |
| 1 | ඕස්ට්‍රේලියාව | 1989.12.18 | 657/2 | 1991.04.08 | 1992/1993 |
| 2 | බහරේනය | 2011.06.24 | 1847/51 | 2014.01.31 | 2015/2016 |
| 3 | බංගලාදේශය | 1986.07.24 | 448/13 | 1987.04.07 | 1989/1990 |
| 4 | බෙලරුස් | 2013.08.26 | 1837/13 | 2013.11.20 | 2015/2016 |
| 5 | බෙල්ජියම | 1983.02.03 | 292/6 | 1984.04.09 | 1984/1985 |
| 6 | කැනඩාව | 1982.06.23 | 253/8 | 1983.07.13 | 1986/1987 |
| 7 | චීනය | 2003.08.11 | 1374/20 | 2005.01.06 | 2006/2007 |
| 8 | චෙක් ජනරජය (සංශෝධිත) | 2023.02.23 | 2356/15 | 2023.11.01 | 2025/2026 |
| 9 | ඩෙන්මාර්කය (සංශෝධිත) | 1981.12.22 | 228/15 | 1983.01.20 | 1980/1981 |
| 10 | පින්ලන්තය | 2016.10.06 | 2027/1 | 2017.07.10 | 2019/2020 |
| 11 | ප්‍රංශය | 1981.09.17 | 210/17 | 1982.09.17 | 1982/1983 |
| 12 | ජර්මනිය | 1979.09.13 | 113 | 1980.10.31 | 1982/1983 |
| 13 | හොංකොං (සීමිත) | 2004.03.26 | 1374/21 | 2005.01.06 | 2005/2006 |
| 14 | ඉන්දියාව (සංශෝධිත) | 2013.01.22 | 1828/9 | 2013.09.17 | 2014/2015 |
| 15 | ඉන්දුනීසියාව | 1993.02.03 | 798/10 | 1993.10.21 | 1995/1996 |
| 16 | ඉරානය | 2000.07.25 | 1187/16 | 2001.06.06 | 2002/2003 |
| 17 | ඉතාලිය | 1984.03.28 | 322/4 | 1984.11.05 | 1978/1979 |
| 18 | ජපානය | 1967.12.12 | 14803/5 | 1968.05.29 | 1969/1970 |
| 19 | ජෝර්දානය (සීමිත) | 2002.08.21 | 1274/9 | 2003.02.06 | 1990/1991 |
| 20 | කොරියාව | 1984.05.28 | 342/11 | 1985.03.29 | 1980/1981 |
| 21 | කුවේටය | 2002.02.05 | 1245/19 | 2002.07.18 | 2002/2003 |
| 22 | ලක්සම්බර්ග් | 31.01.2013 | 1838/9 | 2013.11.26 | 2015/2016 |
| 23 | මැලේසියාව (සංශෝධිත) | 1997.09.16 | 1028/21 | 1998.05.22 | 1999/2000 |
| 24 | මොරිෂස් | 1996.03.12 | 958/10 | 1997.01.15 | 1998/1999 |
| 25 | නේපාලය | 1999.07.06 | 1116/6 | 2000.01.26 | 2001/2002 |
| 26 | නෙදර්ලන්තය | 1982.11.17 | 281/13 | 1984.01.26 | 1979/1980 |
| 27 | නෝර්වේ (සංශෝධිත) | 1986.12.12 | 464/4 | 1987.07.27 | 1989/1990 |
| 28 | ඕමානය | 2018.08.12 | 2154/50 | 2019.12.20 | 2020/2021 |
| 29 | පකිස්ථානය | 1981.10.05 | 210/17 | 1982.09.17 | 1983/1984 |
| 30 | පලස්තීනය | 2012.04.16 | 1838/8 | 2013.11.26 | 2015/2016 |
| 31 | පිලිපීනය | 2000.12.11 | 1237/7 | 2002.05.21 | 2019/2020 |
| 32 | පෝලන්තය | 2020.10.06 | 2027/2 | 2017.07.10 | 2020/2021 |
| 33 | කටාර් | 2004.11.07 | 1422/10 | 2005.12.05 | 2008/2009 |
| 34 | රොමේනියාව | 1984.10.19 | 371/9 | 1985.10.15 | 1986/1987 |
| 35 | රුසියාව | 1999.03.02 | 1101/22 | 1999.10.15 | 2003/2004 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 36 | සෞදි අරාබිය (සීමිත) | 1996.12.16 | 1101/23 | 1999.10.15 | 1983/1984 |
| 37 | සීෂෙල්ස් | 2011.09.23 | 1837/14 | 2013.11.20 | 2015/2016 |
| 38 | සිංගප්පූරුව | 2014.04.03 | 1993/11 | 2016.11.16 | 2018/2019 |
| 39 | ස්වීඩනය | 1983.02.23 | 297/28 | 1984.05.18 | 1985/1986 |
| 40 | ස්විට්සර්ලන්තය | 1983.01.11 | 292/6 | 1984.04.09 | 1981/1982 |
| 41 | තායිලන්තය | 1988.12.14 | 571/16 | 1989.08.18 | 1990/1991 |
| 42 | තුර්කිය | 2022.01.18 | 2289/27 | 2022.07.20 | 2024/2025 |
| 43 | එ.අ. එමීර් රාජ්‍යය (සීමිත)<br>එ.අ. එමීර් රාජ්‍යය (පූර්ණ) | 1992.07.07<br>2003.09.24 | 824/13<br>1346/1 | 1994.06.23<br>2004.06.21 | 1979/1980<br>2004/2005 |
| 44 | එක්සත් රාජධානිය | 1979.06.21 | 60/23 | 1979.11.02 | 1977/1978 |
| 45 | ඇ.එ. ජනපදය<br>ඇ.එ. ජනපදය (සංධානය) | 1985.03.14<br>2002.09.20 | 398/4<br>1298/8 | 1986.04.22<br>2003.07.21 | 2004/2005 |
| 46 | වියට්නාමය | 2005.10.26 | 1455/9 | 2006.07.24 | 2007/2008 |
| **බහුපාර්ශ්වීය ගිවිසුම්** | | | | | |
| 1 | සාර්ක් බහුපාර්ශ්වීය ගිවිසුම | 2005.10.13 | 1447/3 | 2006.05.29 | 2011/2012 |

ඇමුණුම 05

## පෙර වසර සමඟ ආදායම සංසන්දනය කිරීම

| බදු වර්ගය | 2021 | | 2022 | | 2023 | | 2024 | | 2025 | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රැස් කිරීම (රු. මිලියන) | % | රැස් කිරීම (රු. මිලියන) | % | රැස් කිරීම (රු. මිලියන) | % | රැස් කිරීම (රු. මිලියන) | % | රැස් කිරීම (රු. මිලියන) | % |
| ආදායම් බද්ද | 300,545.59 | 47.49 | 524,533.80 | 49.57 | 908,417.65 | 49.31 | 1,024,098.43 | 39.09 | 1,131,326.09 | 35.12 |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 667.88 | 0.11 | 5,315.39 | 0.50 | 2,679.20 | 0.15 | 1,853.67 | 0.07 | 8,020.68 | 0.25 |
| එකතු කළ අගය මත බද්ද | 308,213.04 | 48.70 | 463,071.66 | 43.77 | 694,460.23 | 37.70 | 1,309,679.83 | 49.99 | 1,746,874.45 | 54.22 |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 599.13 | 0.09 | 585.05 | 0.06 | 328.08 | 0.02 | 201.30 | 0.01 | 528.74 | 0.02 |
| ආර්ථික සේවා ගාස්තු | 728.11 | 0.12 | 201.75 | 0.02 | 246.68 | 0.01 | 245.07 | 0.01 | 24.83 | 0.001 |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 7.57 | 0.001 | 81.80 | 0.01 | 31.37 | 0.002 | 52.18 | 0.002 | 19.67 | 0.001 |
| ඔට්ටු හා සූදු බද්ද | 1,939.35 | 0.31 | 5,244.76 | 0.50 | 6,921.82 | 0.38 | 9,814.82 | 0.37 | 10,241.92 | 0.32 |
| කොටස් ගනුදෙනු බද්ද | 6,964.48 | 1.10 | 4,215.86 | 0.40 | 2,477.74 | 0.13 | 3,130.91 | 0.12 | 7,455.36 | 0.23 |
| විගමන බද්ද | 17.03 | 0.003 | 10.73 | 0.001 | 14.35 | 0.0008 | 33.98 | 0.001 | 67.04 | 0.002 |
| මුද්දර ගාස්තු | 12,949.84 | 2.05 | 12,719.61 | 1.20 | 10,009.41 | 0.54 | 14,976.10 | 0.57 | 22,452.96 | 0.70 |
| පිරිවැටුම් බද්ද | 18.74 | 0.003 | 7.47 | 0.0007 | 3.89 | 0.0002 | 9.02 | 0.0003 | 10.47 | 0.0003 |
| ජාතික ආරක්ෂක බද්ද | 0.32 | 0.00005 | 11.31 | 0.001 | 0.88 | 0.00005 | 1.16 | 0.00004 | 0.67 | 0.00002 |
| ප්‍රේෂණ ගාස්තු | 5.21 | 0.0008 | - | - | - | - | 0.62 | 0.00002 | 1.89 | 0.0001 |
| ස්වේච්ඡාවෙන් හෙළිදරව් කිරීම මත බද්ද | 174.62 | 0.03 | 3,969.89 | 0.38 | 11.78 | 0.0006 | 1.39 | 0.00005 | 1.49 | 0.00005 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | - | - | 36,111.03 | 3.41 | 216,180.55 | 11.73 | 250,868.72 | 9.57 | 294,519.51 | 9.14 |
| කැසිනෝ බලපත්‍ර ගාස්තු | - | - | 2,000.00 | 0.19 | 500.00 | 0.03 | 5,100.00 | 0.19 | - | - |
| ඉදිකිරීම් කර්මාන්ත ඇප අරමුදල් බද්ද | 0.42 | 0.00007 | - | - | - | - | - | - | - | - |
| භාණ්ඩ හා සේවා බද්ද | 0.24 | 0.00004 | - | - | 0.24 | 0.00001 | 0.000028 | 0 | - | - |
| **මුළු ආදායම් රැස් කිරීම** | **632,830.59** | **100%** | **1,058,080.10** | **100%** | **1,842,283.85** | **100%** | **2,620,067.22** | **100%** | **3,221,545.77** | **100%** |

ඇමුණුම 06

## 2025 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු බදු පිළිබඳ විශ්ලේෂණය

| බදු වර්ගය | දළ මුදල් ප්‍රමාණය (රුපියල් '000) | | | විවාදයට ලක්වූ මුදල (අත්හිටවූ මුදල) (රුපියල් '000) | | | එකතු කළ යුතු මුදල (රුපියල් '000) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| ජාතිය ගොඩනැගීමේ බද්ද | 13,283,608 | 7,808,075 | - | 13,230,676 | 7,782,004 | - | 52,932 | දණ්ඩන 26,072 | - |
| ආර්ථික සේවා ගාස්තු | 20,131,469 | 2,419,865 | - | 16,463,022 | 2,419,865 | - | 3,668,447 | - | - |
| උ.වි.ගෙ. | 19,768,043 | 2,120,668 | 2,080,691 | 7,081,104 | 1,276,948 | 1,536,790 | 12,686,938 | 843,720 | 543,901 |
| 200 දණ්ඩන | - | 4,183 | - | - | 4,183 | - | - | - | - |
| එ.අ.බ. | 235,213,412 | 228,094,809 | - | 148,244,072 | 152,477,701 | - | 86,969,340 | 75,617,109 | - |
| පිරිවැටුම් බද්ද | 277,471 | 139,119 | - | 277,471 | 139,119 | - | - | - | - |
| මුද්දර බද්ද | 19,622,096 | 6,430,007 | - | 19,622,096 | 6,430,007 | - | - | - | - |
| ඔට්ටු හා සූදු බද්ද | 3,045,243 | 1,337,497 | - | 2,632,598 | 1,297,010 | - | 412,645 | 40,487 | - |
| ආදායම් බද්ද මත අධිභාරය | 80,912 | 49,395 | - | 76,083 | 46,963 | - | 4,829 | 2,432 | - |
| උ.වි.ගෙ. - අධිභාරය | 12,466 | 9,397 | - | 12,466 | 9,397 | - | - | - | - |
| ජාතික ආරක්ෂක බද්ද | 12,925 | 3,523 | - | 12,925 | 3,523 | - | - | - | - |
| 172 දණ්ඩන | - | 208 | - | - | 208 | - | - | - | - |
| පොලිය මත රඳවා ගැනීමේ බද්ද | 1,508,060 | 671,810 | - | 1,488,451 | 658,935 | - | 19,609 | 12,875 | - |
| හර බද්ද | 2,215,581 | - | - | 2,215,581 | - | - | - | - | - |
| එ.අ.බ. - මූල්‍ය සේවා | 60,712,381 | 46,494,731 | - | 58,843,384 | 44,965,511 | - | 1,868,997 | 1,529,220 | - |
| ජාතිය ගොඩනැගීමේ බද්ද - මූල්‍ය සේවා | 2,431,126 | 1,213,923 | - | 2,430,694 | 1,213,707 | - | 432 | 216 | - |
| ණය ආපසු ගෙවීමේ බද්ද | 1,088,139 | 1,447 | 576,145 | 1,088,139 | 1,447 | 576,145 | - | - | - |
| රඳවා ගැනීමේ බද්ද | 48,574,187 | 1,331,977 | 8,740,946 | 35,328,283 | 1,196,632 | 7,639,748 | 13,245,904 | 135,345 | 1,101,198 |
| සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද | 28,988,852 | 19,335,509 | - | 18,208,485 | 12,779,397 | - | 10,780,367 | 6,556,112 | - |
| ප්‍රාග්ධන ලාභ බද්ද | 13,058,799 | 44 | 9,321 | 6,308,758 | 34 | 9,043 | 6,750,041 | 10 | 278 |
| ආරක්ෂක බද්ද | 38,538 | 10,801 | - | 38,538 | 10,801 | - | - | - | - |
| **එකතුව** | **1,395,290,059** | **435,835,951** | **333,271,006** | **1,069,660,702** | **331,691,453** | **277,715,666** | **325,629,356** | **104,144,498** | **55,555,341** |

## ප්‍රවර්ධන හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර

| අනුක්‍රමික අංකය | ක්ෂේත්‍රය/ විෂය | ආයතනය/ ඉලක්කගත කණ්ඩායම | සහභාගි වූ පුද්ගලයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| 1 | බදු ප්‍රතිපත්ති වෙනස්වීම් | පේරාදෙණිය විශ්වවිද්‍යාලය | 90 |
| 2 | | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 200 |
| 3 | | හේමාස් හෝල්ඩින්ස් පීඑල්සී | 30 |
| 4 | | ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලය | 75 |
| 5 | | වාහන ආනයනකරුවන්ගේ සංගමය | 100 |
| 6 | | උපදේශන හා ප්‍රවර්ධන අංශය - මාර්ගගත වැඩසටහන (සරල කරන ලද එකතු කළ අගය මත බදු ක්‍රමය අහෝසි කිරීම හා එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ නව ක්‍රමවේදය) | 475 |
| 7 | විද්‍යුත් ගොනු කිරීම | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 25 |
| 8 | | ශ්‍රී ලංකා නාවික හමුදාව (වැටුප් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව) | 40 |
| 9 | | හේමාස් හෝල්ඩින්ස් පීඑල්සී | 25 |
| 10 | | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව | 40 |
| 11 | | උපදේශන හා ප්‍රවර්ධන අංශය - මාර්ගගත වැඩසටහන (ර.ගැ.බ./ අ.ආ.බ. 2425) | 340 |
| 12 | | උපදේශන හා ප්‍රවර්ධන අංශය - මාර්ගගත වැඩසටහන (උ.වි.ගෙ./අ.පු.ආ.බ 2425) | 320 |
| 13 | | උපදේශන හා ප්‍රවර්ධන අංශය - මාර්ගගත වැඩසටහන (එ.අ.බ. වාර්තා ගොනු කිරීමේ කාලීන වෙනස්විම් හා උපලේඛන ගොනු කිරීම) | 1,198 |
| 14 | | උපදේශන හා ප්‍රවර්ධන අංශය - මාර්ගගත වැඩසටහන (එ.අ.බ. වාර්තා ගොනු කිරීමේ කාලීන වෙනස්වීම් හා උපලේඛන ගොනු කිරීම) | 279 |
| 15 | | යාපනය විශ්ව විද්‍යාලය - ශිෂ්‍යයන්ගේ ක්ෂේත්‍ර චාරිකාව | 80 |
| 16 | | අග්‍රාමාත්‍ය කාර්යාලය | 70 |
| 17 | | කර්මාන්ත සංවර්ධන මණ්ඩලය 2025.09.18 දින පැවැත්වූ ප්‍රදර්ශනය | 12 |
| 18 | | කර්මාන්ත සංවර්ධන මණ්ඩලය 2025.09.19 දින පැවැත්වූ ප්‍රදර්ශනය | 15 |
| 19 | | කර්මාන්ත සංවර්ධන මණ්ඩලය 2025.09.20 දින පැවැත්වූ ප්‍රදර්ශනය | 28 |
| 20 | | කර්මාන්ත සංවර්ධන මණ්ඩලය 2025.09.21 දින පැවැත්වූ ප්‍රදර්ශනය | 23 |
| 21 | | ට්‍රාන්ස් ටේනින් ඇකඩමි | 30 |
| 22 | | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 62 |
| 23 | | පවුල් සෞඛ්‍ය කාර්යාංශය | 150 |
| 24 | | මානව සම්පත් සංවර්ධන කේන්ද්‍රය - කොළඹ විශ්වවිද්‍යාලය | 150 |
| 25 | | ජනාධිපති ලේකම් කාර්යාලය | 60 |
| 26 | | ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 90 |

| | | | |
|---|---|---|---|
| 27 | විද්‍යුත් ගොනු කිරීම | ශ්‍රී ලංකා මහ බැංකුව | 250 |
| 28 | | මොරටුව විශ්වවිද්‍යාලය | 150 |
| 29 | | ජාතික පුස්තකාල සහ ප්‍රලේඛන සේවා මණ්ඩලය | 50 |
| 30 | | ලංකා බැංකුව | 75 |
| 31 | | පවර් හවුස් ලිමිටඩ් (ටීවී දෙරණ) | 80 |
| 32 | | ශ්‍රී ලංකා වරාය අධිකාරිය | 6,850 |
| 33 | | ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය | 600 |
| 34 | | ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලය | 200 |
| 35 | පෞද්ගලික තොරතුරු යාවත්කාලීන කිරීම හා මාර්ගගත සේවා | හේමාස් හෝල්ඩින්ස් පීඑල්සී | 30 |
| 36 | | ආගමන විගමන දෙපාර්තමේන්තුව | 70 |
| 37 | | හැටන් නැෂනල් බැංකුව | 5,750 |
| 38 | | ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය | 90 |
| 39 | | කොළඹ ජාත්‍යන්තර බහාලුම් පර්යන්තය | 100 |
| 40 | | කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය | 20 |
| 41 | | කෑගල්ල දිස්ත්‍රික්කය - මාර්ගගත | 25 |
| 42 | | වීදි සමීක්ෂණය - කොටුව හා පිටකොටුව | 225 |
| 43 | | වීදි සමීක්ෂණය - කොටුව හා පිටකොටුව | 60 |
| 44 | | සංචාරක වැට් බදු ආපසු ගෙවීමේ ක්‍රමවේදය යටතේ ලියාපදිංචි බදු ගෙවන්නන් | 60 |
| 45 | බදු ප්‍රතිපත්ති වෙනස්වීම්/ මාර්ගගත ගොනු කිරීම් | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - කොළඹ නගර කාර්යාලය | 830 |
| 46 | | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - ගාල්ල ප්‍රාදේශීය කාර්යාලය | 250 |
| 47 | | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - මහනුවර ප්‍රාදේශීය කාර්යාලය | 600 |
| 48 | | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - මීගමුව ප්‍රාදේශීය කාර්යාලය | 200 |
| 49 | | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - රත්නපුර ප්‍රාදේශීය කාර්යාලය | 257 |
| 50 | | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය | 350 |
| 51 | | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - ගම්පහ බටහිර ප්‍රාදේශීය කාර්යාලය | 175 |
| 52 | | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - ගම්පහ නැගෙනහිර ප්‍රාදේශීය කාර්යාලය | 225 |
| 53 | | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - කුරුණෑගල ප්‍රාදේශීය කාර්යාලය | 458 |
| 54 | | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - මාතර ප්‍රාදේශීය කාර්යාලය | 301 |
| 55 | | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - කළුතර ප්‍රාදේශීය කාර්යාලය | 300 |
| 56 | | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය | 100 |

| | | | |
|---|---|---|---|
| 57 | මාර්ගගත ගොනු කිරීම/ වාර්තා අනුකූලතාව/ බදු ප්‍රතිපත්ති වෙනස්වීම් | වෘත්තීයවේදීන්/ ව්‍යාපාරිකයන්/ සේවා නියුක්තිකයන් - අනුරාධපුර | 1,500 |
| 58 | ශ්‍රී ලංකාවේ බදු නීතිවල කාලීන වෙනස්වීම් හා බදු ආශ්‍රිත ගැටලු | බදු ගෙවන්නන් හා විෂය පිළිබඳ කැමැත්තක් දක්වන සියලු පාර්ශ්වයන් - දඹුල්ල | 1,662 |
| 59 | මාර්ගගත ගොනු කිරීම් | දිස්ත්‍රික් මහ රෝහල - ගම්පහ | 320 |
| 60 | | ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය | 196 |
| 61 | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - ගම්පහ | 517 |
| 62 | | උතුරු කොළඹ ශික්ෂණ රෝහල - රාගම | 855 |
| 63 | | මධ්‍යම පළාත් වාණිජ හා කර්මාන්ත මණ්ඩලයේ සාමාජිකයන් | 55 |
| 64 | | වෙළෙඳ සංගමය - බණ්ඩාරවෙල, වැලිමඩ, බදුල්ල, මහියංගනය | 843 |
| 65 | | ජාතික සමූපකාර සංවර්ධන ආයතනය - පොල්ගොල්ල | 120 |
| 66 | | පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය - මධ්‍යම පළාත | 38 |
| 67 | | මූලික රෝහල - කරවනැල්ල | 85 |
| 68 | | ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය | 177 |
| 69 | | බදු ගෙවන්නන් - මීගමුව | 805 |
| 70 | | කුඩා ව්‍යාපාර ව්‍යවසායකයින් (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - රත්නපුර) | 260 |
| 71 | | බදු උපදේශකයන් හා විගණකවරුන් - රත්නපුර | 55 |
| 72 | | ශික්ෂණ රෝහල - රත්නපුර | 225 |
| 73 | මාර්ගගත ගොනු කිරීම් | බදු ගෙවන්නන් සහ මහජනතාව - මඩකලපුව | 455 |
| 74 | | කර්මාන්ත සංවර්ධන මණ්ඩලය - මඩකලපුව | 96 |
| 75 | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - අම්පාර | 110 |
| 76 | | ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලය | 120 |
| 77 | | වෙළෙඳ සංගමය - කාත්තන්කුඩි | 180 |
| 78 | | බොඩිලයින් ප්‍රයිවට් ලිමිටඩ් | 100 |
| 79 | | Eu Retec Pvt Ltd | 250 |
| 80 | | ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය | 50 |
| 81 | | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 852 |
| 82 | | බ්‍රවුන්ස් ඇන්ඩ් කම්පැනි පීඑල්සී | 44 |
| 83 | | බන්ධනාගාර මූලස්ථානය | 60 |
| 84 | | තැපැල් දෙපාර්තමේන්තුව | 88 |
| 85 | | ආරක්ෂක සේවා මූලස්ථානය (බටහිර) - පනාගොඩ | 998 |
| 86 | | ශ්‍රී ලංකා ඇඟළුම් අපනයනකරුවන්ගේ සංගමය | 341 |
| 87 | | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 184 |
| 88 | | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 272 |

| | | | |
|---|---|---|---|
| 89 | එකතු කළ අගය මත බද්ද | ඛනිජ තෙල් අලෙවිකරුවන් - යාපනය | 200 |
| 90 | | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - කෑගල්ල ප්‍රාදේශීය කාර්යාලය | 265 |
| 91 | | එ.අ.බ. සඳහා ලියාපදිංචි බදු ගෙවන්නන් - බදුල්ල ප්‍රාදේශීය කාර්යාලය | 122 |
| 92 | | ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - හොරණ | 104 |
| 93 | පුද්ගල ආදායම් බද්ද | සුරාබදු දෙපාර්තමේන්තුව - යාපනය | 54 |
| 94 | | යාපනය විශ්වවිද්‍යාලය | 152 |
| 95 | පුද්ගල ආදායම් බද්ද සහ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද | උතුරු පළාතේ ගණකාධිකාරීවරුන් සහ ආයතන ප්‍රධානීන් | 187 |
| 96 | | ව්‍යාපාරිකයන් - මුලතිවු | 112 |
| 97 | අත්තිකාරම් පුද්ගල ආදායම් බදු සහ එකතු කළ අගය මත බදු විද්‍යුත් ගොනු කිරීම | රාජ්‍ය නිලධාරීන් - පේරාදෙණිය | 42 |
| 98 | ශ්‍රී ලංකාවේ බදු නීතියේ කාලීන වෙනස්වීම් | ග්‍රාම නිලධාරීන්, ක්ෂේත්‍ර නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් | 24 |
| 99 | රඳවා ගැනීමේ බද්ද/ අත්තිකාරම් ආදායම් බද්ද | සණස සමිති සහ සමුපකාර ග්‍රාමීය බැංකු නිලධාරීන් - මහනුවර | 133 |
| 100 | | ජ්‍යෙෂ්ඨ පුරවැසියන් - කළුතර දිස්ත්‍රික්කය | 500 |
| 101 | බදු නීතිය සහ බදු අනුකූලතාව | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව - වයඹ පළාත | 171 |
| 102 | අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද හා එකතු කළ අගය මත බද්ද පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් | දඹදෙණිය විවිධ සේවා සමූපකාර සමිතිය | 207 |
| 103 | | කුලියාපිටිය විවිධ සේවා සමූපකාර සමිතිය | 197 |
| 104 | අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද හා බදු ප්‍රතිපත්ති වෙනස්වීම් | MAS ෆැබ්රික් පාර්ක් | 187 |
| 105 | | දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කුරුණෑගල | 152 |
| 106 | බදු ප්‍රතිපත්ති වෙනස්වීම් සම්බන්ධ දැනුම්වත් කිරීමේ වැඩසටහන් | කර්මාන්ත සේවා කාර්යාංශය - කුරුණෑගල | 91 |
| 107 | බදු ප්‍රතිපත්ති වෙනස්වීම් සහ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ක්‍රියාවලිය සම්බන්ධ දැනුම්වත් කිරීමේ වැඩසටහන් | බදු ගෙවන්නන් - කුරුණෑගල | 519 |
| 108 | එකතු කළ අගය මත බදු හා සමාජ ආරක්ෂණ දායකත්ව බදු සම්බන්ධ බදු වාර්තාව මාර්ගගත ගොනු කිරීම | බදු ගෙවන්නන්, ගණකාධිකාරීවරුන් සහ විගණකවරුන් - මාතර | 951 |

| | | | |
|---|---|---|---|
| 109 | පුද්ගල ආදායම් බදු වාර්තාව මාර්ගගත ගොනු කිරීම | රාජ්‍ය නිලධාරීන්, බදු ගෙවන්නන්, මහජනතාව - මාතර | 583 |
| 110 | බදු ප්‍රතිපත්ති වෙනස්වීම් | මහජනතාව - මාතර | 250 |
| 111 | ආදායම් බදු බැඳියාව | සේවා නියුක්තිකයන් හා ව්‍යාපාරිකයන් - මීගමුව | 575 |
| 112 | බදු ප්‍රතිපත්ති වෙනස්වීම් සම්බන්ධ දැනුම්වත් කිරීමේ වැඩසටහන | ගණකාධිකාරීවරුන් සහ බදු උපදේශකයින් - නුවරඑළිය | 22 |
| 113 | | ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරියේ කාර්ය මණ්ඩලය හා ශිෂ්‍යයන් - නුවරඑළිය | 366 |
| 114 | | තාක්ෂණ විද්‍යාලයේ කාර්යය මණ්ඩලය හා ශිෂ්‍යයන් - නුවරඑළිය | 207 |
| 115 | බදු ප්‍රතිපත්ති වෙනස්වීම් සම්බන්ධ දැනුම්වත් කිරීමේ වැඩසටහන සහ බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංක නිකුත් කිරීම සම්බන්ධ වැඩසටහන | ව්‍යාපාර හා ප්‍රජාව, රාජ්‍ය නිලධාරීන්, සමූපකාර අංශ කාර්යය මණ්ඩලය සහ මහජනතාව (ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - අඹගමුව කෝරළේ) | 144 |
| 116 | | රාජ්‍ය නිලධාරීන් සහ ගුරුවරුන් (කලාප අධ්‍යාපන කාර්යාලය - හැටන්) | 78 |
| 117 | අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද සම්බන්ධ දැනුම්වත් කිරීමේ වැඩසටහන | රාජ්‍ය නිලධාරීන් සහ සමූපකාර අංශ කාර්යය මණ්ඩලය (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - නුවරඑළිය) | 105 |
| 118 | විද්‍යුත් ගොනු කිරීම් සහ එකතු කළ අගය මත බද්ද | මැණික් ව්‍යාපාරිකයන් සහ මැණික් අපනයනකරුවන් (මැණික් කුළුණ - රත්නපුර) | 270 |
| 119 | විද්‍යුත් ගොනු කිරීම සහ රඳවා ගැනීම් බද්ද | රාජ්‍ය හා විදුලි බලමණ්ඩල සේවානියුක්තිකයන් - රත්නපුර | 265 |
| 120 | | සමූපකාර සමිති හා සමූපකාර ග්‍රාමීය බැංකු සේවානියුක්තිකයින් | 355 |
| 121 | බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම හා මාර්ගගත ගොනු කිරීම් | ව්‍යාපාරිකයන් - බලන්ගොඩ | 475 |
| 122 | එකතු කළ අගය මත බද්ද සහ සරල කරන ලද එකතු කළ අගය මත බද්ද | තේ කර්මාන්තශාලා හිමිකරුවන් සහ කළමණාකාරීත්වය - රත්නපුර | 125 |
| 123 | අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද සහ මාර්ගගත ගොනු කිරීම | මූලික රෝහල - වතුපිටිවල | 69 |
| 124 | | ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද ශික්ෂණ රෝහල - යක්කල | 91 |
| 125 | | ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව - සපුගස්කන්ද පර්යන්තය | 171 |
| 126 | එකතු කළ අගය මත බද්ද සහ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද මාර්ගගත ගොනු කිරීම | වෙළෙඳ සංගමය - කිරිබත්ගොඩ | 520 |
| 127 | | වෙළෙඳ සංගමය - කඩවත | 843 |

| | | | |
|---|---|---|---|
| 128 | බදු ගොනු විවෘත කිරීම හා මාර්ගගත ගොනු කිරීම | අනුලා විද්‍යාලය - නුගේගොඩ | 193 |
| 129 | | වෙළෙඳ ප්‍රජාව (දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මොරටුව) | 300 |
| 130 | | වෙළෙඳ ප්‍රජාව (නාලන්දාරාම විහාරය ශ්‍රවණාගාරය) | 84 |
| 131 | | වෙළෙඳ ප්‍රජාව (සණස ශ්‍රවණාගාරය - කොටිකාවත්ත) | 215 |
| 132 | | දකුණු කොළඹ ශික්ෂණ රෝහල - කළුබෝවිල | 215 |
| 133 | ජාතික සංවර්ධනය සඳහා බදු දායකත්වයේ වැදගත්කම - බදු අනුකූලතාවය, බදු පදනම පුළුල් කිරීම සහ ආදායම් බදු වාර්තා මාර්ගගත ගොනු කිරීම | Godagama Reach හෝටලය - ගොඩගම | 194 |
| 134 | | ආයෝජන මණ්ඩල ශ්‍රවණාගාරය - අවිස්සාවේල්ල | 64 |
| 135 | | The River Edge හෝටලය - කඩුවෙල | 208 |
| 136 | | කැස්බෑව නගර සභාව | 72 |
| 137 | | මහරගම නගර සභාව | 115 |
| 138 | | NSBM හරිත සරසවිය | 63 |
| 139 | බදු ගෙවන්නන් හඳුනාගැනීමේ අංක ලියාපදිංචි කිරීම, බදු ලියාපදිංචි කිරීම සහ පුද්ගල ආදායම් බද්ද මාර්ගගත ගොනු කිරීම | රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය | 345 |
| 140 | | Inivos Consulting (Pvt) Ltd | 144 |
| 141 | | ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව | 160 |
| 142 | | රජයේ රස පරීක්ෂණ දෙපාර්තමේන්තුව | 270 |
| 143 | | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | 420 |
| | | **සහභාගී වූ මුළු සංඛ්‍යාව** | **47,597** |

ඇමුණුම 08

# ජාතික විගණන කාර්යාලය
# தேசிய கணக்காய்வு அலுவலகம்
# NATIONAL AUDIT OFFICE

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | විඑක්ස්/අයිආර්ඩී/එෆ්ඒ/25/01 | ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2026 මැයි [illegible] දින |

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්,

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

**ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කල මතය

ශීර්ෂය 246 - දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව පසුව නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ , මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාව සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල

2

සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී.

මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම්

#### (අ) නොසැසඳීම

(I) සාමූහික නොවන ආදායම් බදු යටතේ වන අංක 10.04.02.99 දරන අනෙකුත් ආදායම් සංකේතය, ආදායම් සංකේතයක් මෙන්ම පාලන ගිණුමක් ලෙස ද ක්‍රියා කරයි. මෙම ආදායම් සංකේතය භාණ්ඩාගාරයේ තොරතුරු අනුව, යථෝක්ත පාලන ගිණුම සඳහා රු.මිලියන 84,769 ක් බැර වී තිබුණ ද දෙපාර්තමේන්තුව විසින් ආදායම් වර්ගීකරණයේදී පාලන ගිණුමේ ගිණුම් ගත කර ඇති ආදායම රු. මිලියන 84,909 ක් ලෙස හඳුනා ගැනීම හේතුවෙන් රු.මිලියන 140 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

(II) දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව 10.04.02.99 දරන අනෙකුත් ආදායම් සංකේතය යටතේ ශේෂය රු. මිලියන 85,090 ක් වන නමුත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශණ වල ACA 1 හි ආදායම් රැස්කිරීම් යටතේ 10.04.02.99 දරන අනෙකුත් ආදායම් පාලන ගිණුමේ ශේෂය රු. මිලියන 84,769 ක් වීම නිසා රු. මිලියන 321 ක නොසැසඳීමක් නිරීක්ෂණය වේ.

(III) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අනුව ආදායම් සංකේතවල 2025 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු.මිලියන 1,418,628 වූ නමුත් 2024 දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශයේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂය රු. මිලියන 1,140,491 විය. ඒ අනුව රු. මිලියන 278,137 ක වෙනස්කම් නිරීක්ෂණය වූයෙන් මූල්‍ය ප්‍රකාශන තුළින් හිඟ ආදායම් ශේෂ නිවැරදිව වාර්තා කර නොමැති අතර හිඟ බදු වාර්තාවන්හි දෝෂ පවතින බව විගණනයේ දී තවදුරටත් නිරීක්ෂණය විය.

(IV) 2025 දෙසැම්බර් 31 දිනට RAMIS පරිගණක පද්ධතිය තුළ TIN අංක 10088xxxx යටතේ රු.මිලියන 3,758 ක නිරවුල් නොවූ අවිනිශ්චිත ශේෂයක් පැවතීම හේතුවෙන් 2025 දෙසැම්බර් 31 දිනට හිඟ බදු ශේෂය එම ප්‍රමාණයෙන් අධි ගණනය වී ඇති බවත්, එම නිරවුල් නොවූ ශේෂයන් තුළ 2015 සිට එනම් ආසන්න වසර 10 කට වැඩි කාලයක් පුරා නිරවුල් නොවී පවතින ශේෂයන් ද ඇතුළත් බව නිරීක්ෂණය කෙරේ. 2025 වසර තුළදී අලුතින් එකතු වී ඇති වටිනාකම වන රු. 858,975,314 න් වර්ෂය තුළදී රු. 506,751,293 ක් පමණක් නිරවුල් කර තිබුණි. සමස්ථ ශේෂයෙන් ආසන්නව සියයට 52 ක සැලකිය යුතු ප්‍රතිශතයක් එනම් රු.මිලියන 1,976 ක අගයක් සාංගමික ආදායම්

බදු ( CIT) මඟින් නියෝජනය වන අතර සියයට 55 ක් එනම් රු, මිලියන 2,068 ක් ම 2020 හා 2021 යන වසරවලට අදාළ ශේෂයන් බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

(V) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 157 වගන්ති ප්‍රකාරව ඌන ගෙවීම මත පොලී අයකරගැනීම සම්බන්ධව 2018/2019 බදු වර්ෂයේ සාංගමික ආදායම් බද්දට අදාළව තෝරාගත් බදුකරුවන් 17 කින් යුත් නියදියට අනුව 2025 දෙසැම්බර් 31 දිනට ලබා දී ඇති RAMIS හිඟ බදු වාර්තාවෙහි තවදුරටත් ගෙවිය යුතු බදු වටිනාකම් ලෙස රු.මිලියන 1,058 ක් වාර්තා වී තිබුණද ඊට අදාළව RAMIS පද්ධතියේ TPF මොඩියුලයෙහි වාර්තා වී තිබුණේ රු.මිලියන 1,154 ක අගයකි. තවද 2025 දෙසැම්බර් 31 දිනට ලබා දී RAMIS හිඟ බදු වාර්තාවේ බදුකරුවන්ට අදාළව උක්ත හිඟ හිටි ආදායම් බදු මත පොලී හා දණ්ඩන ගණනය වී නොමැති බව නිරීක්ෂණය විය.

## (ආ) ආදායම් අඩුවෙන් දැක්වීම

විගණකාධිපති වෙත 2026 මාර්තු 19 දිනැතිව ලබා දුන් (අංක IATF/INFO/2026/A-13/27 දරන) 2026 දෙසැම්බර් 31 දිනට හිඟ බදු ලේඛනය (RAMIS හා Non RAMIS) ඇසුරෙන් සිදු කළ පරීක්ෂාවට අනුව උක්ත මධ්‍ය පරිමාණ සංස්ථාපිත සේවා 03 (MCO Service 03) අංශයට අදාළ නියැදියෙහි අතිරේක තක්සේරු නිකුත් කිරීම් 100හි ඇතුළත් හිඟ බදු වගකීමක් සහිත අතිරේක තක්සේරු වාර්තා 97න් අතිරේක තක්සේරු වාර්තා 59 කට අදාළ කිසිදු බදු වගකීමක් යථෝක්ත හිඟ බදු වාර්තාවේ අන්තර්ගත නොවුණු අතර මධ්‍ය පරිමාණ සංස්ථාපිත නිශ්පාදන 01 (MCO Manufacturing 01) අංශයට අදාළ නියැදියෙහි අතිරේක තක්සේරු නිකුත් කිරීම් 100හි ඇතුළත් හිඟ බදු වගකීමක් සහිත අතිරේක තක්සේරු වාර්තා 62 න් අතිරේක තක්සේරු වාර්තා 47 කට අදාළ කිසිඳු බදු වගකීමක් යථෝක්ත හිඟ බදු වාර්තාවේ අන්තර්ගත නොවුණි. මෙම අංශ 2 ට අදාළ දඩ හා පොලී ඇතුළත් මුළු බදු වටිනාකම රු.943,487,684 ක් වූ අතර එම වටිනාකමෙන් දෙපාර්තමේන්තුවේ හිඟ බදු වාර්තාව ඌන ගණනය වී ඇති බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

## (ඇ) මාසික ආදායම් වාර්තා කිරීම්වල නිවැරදිතාව

රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 01/2015 හි 4 හා 4 (ඇ) වගන්තිය අනුව එක් එක් ආදායම් විෂයයන් යටතට එළඹෙන මාසයේ පළමු සතිය තුළ නිවැරදි ආදායම වර්ගීකරණය හඳුනා ගැනීම කළ යුතු බවට මගපෙන්වීම් කර තිබුණද, ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ ආදායම් සංකේත යටතේ එකිනෙක මාසවල රැස්කරගත් ආදායම් එම මාසය තුළ හඳුනානොගෙන වෙනත් මාසයක ආදායම් සමඟ සමුච්චිත වී ශේෂය වාර්තා වීම හේතුවෙන් එක් එක් මාස වල සත්‍ය ආදායම් රැස්කිරීම පිළිබඳව නිවැරදි තොරතුරු වාර්තා නොවන බව නිරීක්ෂණය විය.

5

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

(අ) වසර 43 කට ආසන්න කාලයක් කුරුණෑගල දේශීය ආදායම් ප්‍රාදේශීය කාර්යාලය පිහිටා ඇති ඉඩමට එහි ඔප්පුව මෙතෙක් ලබාගෙන නොතිබීම මත මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම සම්බන්ධයෙන් 2018 දෙසැම්බර් 31 දින කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය විසින් නිකුත් කර ඇති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018 හා ඊට අදාළ මාර්ගෝපදේශය අනුව, තක්සේරු වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2007 සැප්තැම්බර් 12 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශයට අදාළ අංක අමප/07/1625/342/021 හා 2007 සැප්තැම්බර් 27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොළඹ 12, ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් ඉඩමකින් පර්චස් 100 කින් යුත් බිම් කොටසක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පැවරීමට අදාළව කිසිදු ගිවිසුමකට එළඹීමෙන් තොරව සහ ගෙවීමට පෙර හෝ වත්කම පවරා ගැනීමට තීරණය කිරීමට පෙර හෝ දේපළෙහි යෝග්‍යතාව, අයිතිය නිරවුල් බව පිළිබඳ නිසි සොයා බැලීමකින් තොරව රුපියල් මිලියන 50 ක අත්තිකාරම් මුදලක් ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට ගෙවා තිබුණු අතර මෙම ගනුදෙනුව සම්බන්ධයෙන් ගිණුම් මඟින් හෙළිදරව් කිරීම් සිදුව නොතිබුණි. 2007 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා වර්ෂ 17 ක් ගත වී ඇතත් මෙම මුදල අය කර ගැනීමට 2026 මැයි 15 දින දක්වා අපොහොසත්ව තිබුණි.

(ඇ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් විගණනයට ලබා දුන් 2026 මාර්තු 31 දිනැති, අංක IATF/INFO/2026/C-08/15 දරන වාහන වාර්තාව අනුව 2025 දෙසැම්බර් 31 දිනට වාහනවල මුළු පිරිවැය රු. මිලියන 348 ක් වූ අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ (SA 82 වාර්තාව අනුව) වාහනවල මුළු පිරිවැය රු. මිලියන 247 ක් වීමෙන් 2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුව සතු වාහනවල පිරිවැය වටිනාකමෙහි රු. මිලියන 101 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් මූල්‍ය වර්ෂයේ සිදු කළ භාණ්ඩ සමීක්ෂණයන්ට අදාළ කමිටු නිර්දේශවල සඳහන් අංශ 04 කට අදාළ භාණ්ඩ අයිතම 2026 මැයි 15 දින වන විටද CIGASහී ඇතුළත් වී නොතිබුණි.

### 1.6.3 අග්‍රිම ශේෂය

මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ අග්‍රිම ගිණුම පිළිබඳ ප්‍රකාශනයේ (ඒසීඒ- 3) 2025 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 33,881ක ශේෂය නොපියවීමට හේතු දක්වා නොතිබුණි.

### 1.6.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

(අ) දේශිය ආදායම් දෙපාර්තමේන්තුව විසින් සිංගප්පූරුවේ NCS ආයතනය සමඟ එළඹී ඇති ගිවිසුම්වල පිටපත් විගණකාධිපති වෙත ලබාදී නොමැති බැවින් RAMIS පද්ධතියට අදාළ මුදල් ගෙවීම් අදාළ ගිවිසුම් ප්‍රකාරව සිදුවී ඇතිද යන්න විගණනයේදී තහවුරු කළ නොහැකි වී තිබුණි.

(ආ) RAMIS පද්ධතියෙන් පරිබාහිරව පවත්වා ගෙන යන වාර්තා මොඩියුලය වන elixir පද්ධතියේ සංවර්ධන කටයුතු සම්පූර්ණ කර නොමැතිවීම හා විගණන කාර්යමණ්ඩලය සඳහා ප්‍රවේශය මෙතෙක් ලබා නොදීම හේතුවෙන් විගණන කාර්යමණ්ඩලයට වාර්තා ස්වාධීනව ජනනය කිරීම සීමා වී ඇති අතර දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව ලබාදෙන වාර්තා මත පමණක් විගණන පරීක්ෂණ සිදු කිරීමට සිදු වීමෙන් විෂයපථය සීමා වී ඇත.

### 2 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.1.1.(i) | භාණ්ඩාගාර තොරතුරු හා දෙපාර්තමේන්තු පොත් අතර පවතින වෙනස්කම් නිවැරදිව හඳුනාගෙන ගැලපිය යුතුය. | 1.6.1(අ)(i) |
| 1.6.1.1.(ii) | දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව හා ACA 1 හි ආදායම් රැස් කිරීම් යටතේ අනෙකුත් ආදායම් පාලන ගිණුමේ නොසැසඳීම් නිවැරදිව හඳුනාගෙන ගැලපිය යුතුය. | 1.6.1(අ)(ii) |
| 1.6.1.1.(iii) | මූල්‍ය ප්‍රකාශන තුළ හිඟ ආදායම් ශේෂ නිවැරදිව වාර්තා කළ යුතු වීම | 1.6.1(අ)(iii) |
| 1.6.1.1.(vi) | අවිනිශ්චිත ගිණුමේ ශේෂය නිවැරදිව හඳුනාගෙන අවශ්‍ය ගැලපීම් කර නිරවුල් කළ යුතුය. | 1.6.1(අ)(iv) |

7

| | | |
|---|---|---|
| 1.6.1.2 | මාසික ආදායම් නිවැරදිව වාර්තා කළ යුතුය. | 1.6.1(ඇ) |
| 1.6.2.1, | චක්‍රලේඛ ප්‍රකාරව දෙපාර්තමේන්තු සතු සියලු වත්කම් | 1.6.2(අ) |
| 1.6.2.2, | තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. | 1.6.2(ආ) |
| 1.6.2.6 | | 1.6.2(ඇ) |
| 1.6.3.1,1.6.3.2 | විගණනය සඳහා සාක්ෂි සැපයිය යුතු වීම | 1.6.4(අ) (ආ) |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 අග්‍රිම කළමනාකරණය

භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් අග්‍රිම නිකුත් කිරීම ITMIS පද්ධතිය වෙත ඇතුළත් කරන ලද වවුචර්වල වටිනාකම මත තීරණය වුවද සලකා බලනු ලබන වර්ෂය තුළ පද්ධතිය වෙත ඇතුළත් කළ වවුචර් වටිනාකම ඉක්මවා රු.මිලියන 1,931ක අග්‍රිම ප්‍රමාණයක් වැඩියෙන් ඉල්ලුම් කර තිබුණි.

### 3.2 ආදායම් කළමනාකරණය

3.2.1 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අනුව ණය ආපසු ගෙවීම් බද්ද 10.03.07.11 ආදායම් ශීර්ෂය යටතේ හා 10.02.08.00 හර බදු ආදායම් ශීර්ෂය යටතේ පිළිවෙලින් රු.මිලියන 1,666 ක් හා රු.මිලියන 2,216 ක ශේෂයක් ද 2019 වර්ෂයේ සිට අයකරගෙන නොමැති බව නිරීක්ෂණය විය.

3.2.2 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා හිඟ ආදායම් පිළිබඳ ප්‍රකාශය අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම් සංකේතාංක 10 ක් සඳහා රු.මිලියන 977,478 ක හිග බදු ශේෂවල වැඩිවීමක් 2025 දෙසැම්බර් 31 දිනට, විගණනයට නිරීක්ෂණය විය.

3.2.3 මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128(2)(ඇ) ජේදය ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අර්ධ වාර්ෂික හිඟ බදු වාර්තා පිළිවෙලින් ජූලි 31 හා ඊළඟ මුදල් වර්ෂයේ ජනවාරි 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වේ. 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා 2026 පෙබරවාරි 23 දිනැතිව ඉදිරිපත් කළ Legacy හිඟ බදු ආදායම් පිළිබඳ වාර්තාව හා RAMIS හිඟ බදු ආදායම් පිළිබඳ වාර්තාව මඟින් ලබා දුන් තොරතුරු පරීක්ෂාවේ දී නිරීක්ෂණය වූ කරුණු පහත වේ.

(අ) RAMIS හා Legacy පරිගණක පද්ධතිවලට අදාළව 2025 දෙසැම්බර් 31 දින පැවැති මුළු හිඟ බදු, දඩ හා පොලී ආදායම, අයකිරීම් තාවකාලිකව අත්හිටවූ බදු, දඩ හා පොලී සහ අයකළ හැකි බදු, දඩ හා පොලී පිළිබඳ විස්තර පහත පරිදි වේ.

8

| පද්ධතිය | මුළු හිඟ බදු, දඩ හා පොලී රු.මිලියන | අය කිරීම තාවකාලිකව අත්හිටවීම් රු.මිලියන | අය කළ හැකි ආදායම රු.මිලියන | මුළු හිඟ ආදායමේ ප්‍රතිශතයක් ලෙස (%) | |
|---|---|---|---|---|---|
| | | | | අය කිරීම් තාවකාලිකව අත්හිටවීම් | අය කළ හැකි ආදායම |
| RAMIS | 1,990,454 | 1,534,336 | 456,118 | 77 | 23 |
| Legacy | 173,943 | 144,732 | 29,211 | 83 | 17 |
| **එකතුව** | **2,164,397** | **1,679,068** | **485,329** | **78** | **22** |

(I) දෙපාර්තමේන්තුව විසින් රැස්කරගත යුතු සමස්ථ හිඟ බදු, දඩ හා පොලී ආදායමෙන් අයකර ගැනීමට පවතින හැකියාව මත අය කළ හැකි හා අය කිරීම් තාවකාලිකව අත්හිටවූ ලෙස වර්ග කර තිබුණු අතර ඒ අනුව, සමස්ථ හිඟ බදු, දඩ හා පොලී ආදායමෙන් සියයට 78 කට වැඩි වටිනාකමක් තාවකාලිකව අත් හිටවූ බදු, දඩ හා පොලී ලෙස හඳුනාගෙන තිබුණි.

(ආ) 2014 අංක 14 පනතින් සංශෝධිත 2010 අංක 16 දරන පැහැර හරින ලද බදු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ 2009 දෙසැම්බර් 31 දිනට ගෙවීම් පැහැර හරින ලද බදු අය කර ගැනීම සඳහා නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් වරයෙකු යටතේ දෙපාර්තමේන්තුව තුළ වෙනම ඒකකයක් (DTRU) ස්ථාපිත කර අදාළ හිඟ බදු අය කර ගැනීමට අදාළ විශේෂ විධිවිධාන පනවා තිබුණි. කෙසේ නමුත්, 2024 ජනවාරි 01 දින සිට DTRU අංශය පෙර සිට පැවති Legacy අංශය යටතේ ඒකාබද්ධ කර හිඟ බදු (RAMIS කාල පරිච්ඡේදයට පෙර ) අය කිරීම් අංශය ලෙස නව අංශයක් කොමසාරිස්වරියක් යටතේ පිහිටුවා තිබිණි. DTRU අංශයට 2015 දෙසැම්බර් 31 දින රු.මිලියන 48,813 ක් හිඟ බදු හා දඩ ලෙස මාරු කර ඇති අතර 2025 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 17,905 ක් දක්වා එනම්, රු.මිලියන 30,908 ක හිඟ බදු හා දඩ මුදල් පමණක් නිරවුල් කර ඇති බව නිරීක්ෂණය විය.

3.2.4 සමාලෝචිත වර්ෂයේ දෙපාර්තමේන්තුව විසින් ආදායම් වර්ගීකරණයේදී පහත ආදායම් සංකේත ඔස්සේ ගිණුම්ගත කර ඇති ආදායම හා දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුමේ එම ආදායම් සංකේතවල සඳහන් ආදායම අතර පහත වෙනස්කම් පවතින බව නිරීක්ෂණය විය.

| ආදායම් ශීර්ෂය | ආදායම් වර්ගීකරණ වාර්තාව අනුව ශේෂය රු. | දෙපාර්තමේන්තු ශේෂ පිරික්සුම අනුව ශුද්ධ ශේෂය රු. | වෙනස රු. |
|---|---|---|---|
| 10.02.03.01 | 723,392 | 22,328 | 745,720 |
| 10.02.01.01 | 198,519,764,638 | 198,219,764,638 | 300,000,000 |

### 3.2.5 ආදායම් ඇස්තමේන්තුකරණය

(අ) 2025 වර්ෂයට අදාළ වූ මූලික ආදායම් ඇස්තමේන්තුව රු.මිලියන 3,060,220 ක් වූ අතර එය සංශෝධිත ඇස්තමේන්තුව මගින් රු.මිලියන 3,093,448 ක් දක්වා ඉහළ දමා තිබිණි. එමෙන්ම එදිනට සත්‍ය වශයෙන් රැස්කරගත් ආදායම රු.මිලියන 3,199,052 ක් වූ අතර අතිරික්ත ආදායම් ඉපයීම සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස සියයට 3.4 ක් විය .

(ආ) ප්‍රේෂණ ගාස්තු සම්බන්ධයෙන් මූලික ඇස්තමේන්තුව මගින් කිසිදු ආදායමක් ඇස්තමේන්තුගත නොකළ නමුත් සංශෝධිත ඇස්තමේන්තුව මගින් එය රු. 460,000 දක්වා ඉහළ දමා තිබූ අතර ඊට අදාළව සත්‍ය ආදායම් රැස්කිරීමේදී සංශෝධිත ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා රු. 1,430,973 ක් එනම් සියයට 311 ක ප්‍රමාණාත්මක විචලනයක් පෙන්නුම් කෙරිණි. තවද ඒසීඒ 1 (iii) හෙවත් සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ සත්‍ය ආදායම අතර විචලතා පැහැදිලි කිරීම සඳහා අදාළ වූ ආකෘතියෙහි මෙම සියයට 311 ක ප්‍රමාණාත්මක විචලනය සඳහා නිශ්චිත හේතු දැක්වීමක් සිදුකර නොතිබුණි.

(ඇ) 2025 වසර සඳහා සිදු කළ මූලික ආදායම් ඇස්තමේන්තුව තුළ හා සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව තුළ සෘජු බදු ආදායම හා වක්‍ර බදු ආදායම අතර අනුපාතය පිළිවෙලින් සියයට 38:62 ක් හා 36:64 ක් විය. ඒ අනුව සෘජු හා වක්‍ර බදුවල යෝග්‍ය මිශ්‍රණය වන 60: 40 යන අනුපාතය ලභා කර ගැනීම දෙපාර්තමේන්තුවට තවදුරටත් අභියෝගයක් වී ඇති බව විගණනයට නිරීක්ෂණය වේ.

(ඈ) 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හී ඇතුළත් ඒසීඒ 1 (ii) හෙවත් මූලික ආදායම් ඇස්තමේන්තුව සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර විචලතා පැහැදිලි කිරීම සඳහා අදාළ වූ ආකෘතියෙහි සමස්ත විචලනයන් සඳහා වෙන් වෙන් වශයෙන් නිවැරදි හේතු දක්වා නොතිබුණි.

### 3.3 වියදම් කළමනාකරණය

3.3.1 පුනරාවර්තන වැය විෂයයන් 16ක් සඳහා රු.මිලියන 1,802ක ශුද්ධ ප්‍රතිපාදන සලසා ගෙන තිබුණද රු.මිලියන 1,178ක් උපයෝජනය කිරීම සහ බැරකම් සඳහා රු.මිලියන 136ක ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු රු.මිලියන 488ක ඉතිරියක් වූ අතර එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 96 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් විය.

3.3.2 මූලධන වැය විෂයයන් 6 ක් සඳහා රු.මිලියන 6,016 ක ශුද්ධ ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර ඉන් රු.මිලියන 3,397ක් පමණක් උපයෝජනය කිරීම නිසා බැරකම් සඳහා රු.මිලියන 260 ක ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු රු.මිලියන 2,360ක ඉතිරියක් නිරීක්ෂණය වූ අතර එය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 32 සිට සියයට 99.5ක් දක්වා පරාසයක ප්‍රමාණයක් විය. තවද වැය විෂයය 2001(033) හා 2001(034)) සඳහා පිළිවෙලින් රු. 150,000,000ක හා රු. 100,000,000 ක ප්‍රතිපාදනයන් සලසා ගෙන තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විට එම ඉදිකිරීම් කටයුතු/ නවීකරණ කටයුතු සඳහා දෙපාර්තමේන්තුව වෙත ඉංජිනේරුවරයකුගේ සේවය ලබා ගැනීමට නොහැකිවීම මත එම ප්‍රතිපාදනවලින් සියයට 99ක් හා සියයට 91ක ප්‍රතිශතයක් උපයෝජයනය නොවී පැවතුණු අතර ,මෙම මූලධන වැය විෂයයන් සඳහා පසුගිය වර්ෂයේදී ද ඉහත හේතුව මත ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

3.3.3 මු.රෙ. 94 - බැරකම්වලට බැඳීම ප්‍රකාරව, වෙනත් ආකාරයකට විධිවිධාන සලසා ඇති අවස්ථාවලදී හැර වාර්ෂික ඇස්තමේන්තුවල ඒ සඳහා මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා කිසිම දෙපාර්තමේන්තුවක් විසින් වැඩක් හෝ සේවාවක් හෝ සැපයුමක් සඳහා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳි සිටිය යුතු වුවත්, ප්‍රතිපාදනයන් උපයෝජනය වී ඇති ආකාරය පරීක්ෂා කිරීමේදී 1409 (140) විවිධ සේවා වියදම් වැය විෂයයට අදාළව රු.1,401,375 ක ඉතිරිවීම් ඉක්ම වූ බැරකම් තිබූ බව නිරීක්ෂණය විය.

3.3.4 මූලධන අත්පත් කර ගැනීම යටතේ 2102 ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ වැය විෂයය යටතේ වූ රු. 563,000,000ක මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන්, 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැය විෂයය සඳහා රු. 113,000,000ක මුදලක් මු.රෙ 66 යටතේ මාරු කිරීමෙන් පසුව ද උක්ත වැය ශීර්ෂය යටතේ ප්‍රසම්පාදන සඳහා වෙන් කළ වියදමින් අදාළ ප්‍රසම්පාදන සිදු නොකිරීම මත රු. 425,199,916ක ඉතිරියක් නිරීක්ෂණය වූ අතර 2103 යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ වැය විෂයය සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පූර්ව වර්ෂයේදී වියදම් අවශතාව හඳුනාගෙන මූලික වියදම් ඇස්තමේන්තුවක් සිදු කර නොතිබුණු බව විගණනයේදී නිරීක්ෂණය විය.

3.4 බැරකම් හා බැදීම්වලට එළඹීම

3.4.1 නව CIGAS වෙබ් යෙදුම මගින් ජනනය කරන ලද සමුච්චිත බැදීම් හා බැරකම් වාර්තාව අනුව 2025 දෙසැම්බර් 31 දිනට බැදීම් හා බැරකම් ප්‍රමාණය රු. 515,907,110 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ බැරකම් ශේෂය රු.1,819,857කින් අඩුවෙන් දක්වා තිබුණි.

3.4.2 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් සමුච්චිත බැදීම් හා බැරකම් වාර්තාව අනුව 2025 දෙසැම්බර් 31 දිනට වූ බැරකම් ලෙස දක්වා ඇති වටිනාකම්වලට හා මු.රෙ.94(2) සහ (3) ප්‍රකාරව බැරකම්වලට එළඹෙන ලද බැදීම් ප්‍රකාශනය තුළ ඇතුළත්ව නොමැති අමතර බැදීම් හා බැරකම් රු. 1,137,384ක වටිනාකමක් 2026 ජනවාරි හා පෙබරවාරි වවුචරපත් පරීක්ෂාවේදි නිරීක්ෂණය විය.

3.4.3 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයේ සඳහන් ශේෂයන්වලින් 2026 අප්‍රේල් 30 දින වන විටත් නොපියවූ බැදීම් හා බැරකම් ප්‍රමාණය රු. 379,189,402 වූ අතර එය ප්‍රතිශතයක් ලෙස සියයට 66ක් බව නිරීක්ෂණය විය.

3.5 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3.5.1 දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීතාව පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණද, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

3.5.2 විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාල සීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී නොතිබුණි.

## 3.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| 3.6.1 | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදය 13.1 වගන්තිය හා 2019 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2019 න් සංශෝධිත ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 13.2 උපවගන්තිය | සෑම මූලික විමර්ශනයක්ම නොපමාව නිම කිරීමට අදාළ සෑම පාර්ශවයක්ම නිරන්තරයෙන්ම වග බලා ගත යුතු වුවද 2024 සැප්තැම්බර් 21 දින පැවති ජනාධිපතිවරණයේ මැතිවරණ නීති උල්ලංඝනය කිරීම සම්බන්ධ සිදුවීම් 02 කට අදාළ මූලික විමර්ශන කටයුතු අදාළ සිදුවීම සිදු වී වර්ෂයක කාල සීමාවක් ඉක්මවා තිබුණ ද 2026 මැයි 15 දින දක්වා අවසන් වී නොතිබුණි. |
| 3.6.2 | 2019 සැප්තැම්බර් 30 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2019 න් සංශෝධිත ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 22:1:1 උප වගන්තිය | යම් නිලධරයකු විසින් සිදු කරන ලද විෂමාචාරයක් සම්බන්ධයෙන් නිකුත් කරන ලද චෝදනා පත්‍රයකට අදාළව පවත්වනු ලබන විධිමත් විනය පරීක්ෂණය එම පරීක්ෂණය ආරම්භ කර මාස හයක් ඇතුළත නිම කළ යුතුය. ඒ සඳහා අමතර කාලයක් අවශ්‍ය වේ නම් පරීක්ෂණ නිලධාරී විසින් ප්‍රමාණවත් පිළිගත හැකි හේතු ඉදිරිපත් කරමින් විනය බලධාරියාගේ අනුමැතිය ලබාගත යුතුය. එසේ වුවද සහකාර කොමසාරිස්වරයකු විසින් 2022 වර්ෂයේදී සිදු කළ විෂමාචාරයකට අදාළව මූලික විමර්ශනය පවත්වා 2022 දෙසැම්බර් මස 09 වන දින මූලික විමර්ශන වාර්තාව නිකුත් කර තිබුණු අතර , චෝදනා පත්‍රය 2023 මාර්තු මස 10 වන දින මූලික කෙටුම්පත් කිරීම සිදු කර තිබුණි. මේ සම්බන්ධව චෝදනා පත්‍රය නැවත සංශෝධනය කර ඉදිරිපත් කරන ලෙස රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් දන්වා වර්ෂ 03 කට ආසන්න කාලයක් ගත වී ඇතත් මේ වන විටත් ඉදිරි කටයුතු සිදු වී නොතිබුණි. |

| | | |
|---|---|---|
| 3.6.3 | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.4 වගන්තිය | ලබා ගත් ණය සම්පූර්ණයෙන් අය කර ගැනීමට පෙර නිලධාරියෙකු මිය ගිය හොත් , ඔහුගෙන් රජයට අය විය යුතුව තිබෙන සියලුම මුදල් ,ඔහුගේ උරුමක්කාරයින්ට ගෙවීමට නියමිත ඕනෑම මුදලකින් අඩු කර ගන්නා ලෙස විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්ගෙන් වහාම ඉල්ලා සිටිය යුතු බව දක්වා ඇතත් මිය ගිය නිලධාරීන් 05 දෙනෙකු වෙතින් අය කර ගත යුතු පිළිවෙලින් වසර 10 - 20 අතර හා වසර 01- 03 අතර වූ රු. 983,078ක ණය ශේෂ 2025 දෙසැම්බර් 31 දිනට ද නිරවුල් වී නොතිබුණි. |
| 3.6.4 | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.2.2 , 4.2.4, 4.2.5, 4.5, 4.6, සහ 6.3 වගන්තිය | විශ්‍රාම ගිය නිලධාරීන් දෙදෙනෙකු වෙතින් අය කර ගත යුතු වසර 05 - 10 අතර වූ 146,380ක ණය ශේෂයක් හා වසර 03 - 05 අතර වූ 139,813ක ණය ශේෂයක් මෙතෙක් නිරවුල් වී නොතිබුණි. |
| 3.6.5 | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 සහ 4.6 වගන්තිය | තනතුර හැර ගිය නිලධාරීන්ගේ අදාළ ණය ශේෂ කඩිනමින් නිරවුල් කළ යුතු වුවත් තනතුර හැර ගිය නිලධාරීන් 11දෙනෙකු වෙතින් අය කර ගත යුතු වර්ෂ 01 සිට 20 දක්වා කාල පරාසයක පවතින රු. 1,900,277 ක ණය ශේෂය සමඟ 2024 ජූලි 21 තනතුර හැර ගිය නිලධාරියෙකුගෙන් රු.132,676ක ණය ශේෂය ද නිරවුල් වී නොතිබුණි.තවද 2025 වර්ෂයේ තනතුර හැර ගිය නිලධාරීන්ගේ රු.352,494 ක ණය ශේෂ නිරවුල් නොවී පැවති අතර එය මාස 09 සිට 10 දක්වා කාල පරාසයක පැවත තිබුණි. |
| 3.6.6 | 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30/2016 හි 03 වගන්තිය | ඉන්ධන දහන පරීක්ෂාව සිදු කිරීමට සුදුසු වැඩ පිළිවෙලක් දෙපාර්තමේන්තුව සතුව නොතිබීම හේතුවෙන් දෙපාර්තමේන්තු වාහන ඇණියේ භාවිතයේ පවතින වාහන 38 කට අදාළව ඉන්ධන කාර්යක්ෂමතාව පිළිබඳ මිනුම් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි. |
| 3.6.7 | 2017 නොවැම්බර් මස 07 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 22/99 (xxxiii) | කණ්ඩායම් ප්‍රවාහනයක ගමන් ස්ථාන දෙක අතර උපරිම දුර ප්‍රමාණය කිලෝමීටර් 50 නොඉක්මවිය යුතු වුවද විගණනයට ලක්වූ දෙපාර්තමේන්තු කණ්ඩායම් ප්‍රවාහන සේවා වාහන 04 ක උපරිම දුර ප්‍රමාණය වූ 50km ඉක්මවා ධාවනය වී තිබුණි. |

## 3.7 අවිධිමත් ගනුදෙනු

### 3.7.1 ආදායම් බදු වංචා කිරීම පිළිබඳ ලද මහජන නියෝජනයක් සම්බන්ධ පරික්ෂාව

(අ) 2025 පෙබරවාරි 12 දිනැතිව විගණනය වෙත ඉදිරිපත් කරන ලද මහජන නියෝජනය මඟින් බදුකරුවකු විසින් රජයට අයවිය යුතු බදු මුදල් වංචා කරමින් ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යන බවට තොරතුරු හෙළිදරව් කර ඇති අතර ඔහු පුද්ගල ආදායම් බදු (IIT) සඳහා 2018 මැයි මස 14 වන දින ලියාපදිංචි කර ඇති නමුත් 2022 සැප්තැම්බර් මස 06 වන දින නැවත පුද්ගල ආදායම් බදු (IIT) සඳහා ලියාපදිංචිය අක්‍රීය කර තිබුණි. ඒ අනුව පුද්ගල ආදායම් බදු (IIT) සඳහා මෙම බදුකරුවාගේ ලියාපදිංචිය අක්‍රීය කිරීමට යොදා ගත් පදනම විගණනයට ඉදිරිපත් නොවීය.

(ආ) 1718 බදු කාල පරිච්ඡේදයට අදාළව රු. 1,498,416 ක බදු වටිනාකමට නිකුත් කළ දැනුවත් කිරීමේ ලිපිය පමණක් පද්ධතියට උඩුගත කර තිබූ අතර ඊට අදාළ පැහැර හරින ලද බදු තක්සේරු වාර්තාව විගණිත දිනට පද්ධතියට උඩුගත කර නොතිබුණි. තවද බදුකරුගේ ගිණුමට බැර වී ඇති රු. 1,498,416 ක බදු වගකීමට හා රු. 749,908 ක් වූ දඩ මුදලට අදාළව කිසිඳු බදු අයකර ගැනීමක් පද්ධතිය තුළින් නිරීක්ෂණය නොවීය. එමෙන්ම තක්සේරු නිකුත් කළ ද අභියාචනා ඉදිරිපත් කිරීමේ කාලය පවතින බැවින් හිඟ බදු අයකිරීමේ ක්‍රියාමාර්ග ගෙන නොමැත. 2026 දෙසැම්බර් 31 දිනට අදාළව RAMIS හිඟ බදු වාර්තාවෙහි 1718 යන බදු කාල පරිච්ඡේදයට අදාළව TIN අංක 10134xxxx යටතේ රු. 1,498,416 ක බදු වටිනාකම පමණක් ඇතුළත් වී ඇති බව හෙළිදරව් විය.

## 3.8 තත්ත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම හා පියවීම

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 12 දෙනෙකු විසින් ලබා ගෙන ඇති රු.832,020ක් වූ තත්ත්කාර්ය අතුරු අග්‍රිම වටිනාකමින් අපේක්ෂිත වියදම වඩාත් නිවැරදිව ඇස්තමේන්තු නොකිරීම හේතුවෙන් රු.489,089 ක අතිරික්තය නැවත මුදලින් පියවා ඇති අතර එම මුදල සියයට 34 සිට 75 දක්වා පරාසයක පැවතුණි. තවද මු.රෙ.371 (4) වගන්තිය ප්‍රකාරව නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ලබා ගත නොහැකි බව දන්වා ඇතත් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 04 දෙනෙකු විසින් ලබා ගෙන ඇති රු.144,697ක අත්තිකාරම් මුදල සම්පූර්ණ වශයෙන් නැවත පියවා තිබූ අතර බදු සතියට සමගාමීව රු.431,800 ක් වූ තත්ත්කාර්ය අතුරු අග්‍රිම ලබා ගෙන ඇති නිලධාරීන් 05දෙනෙකු විසින් එම කාර්යය නිම කර දින 10ක් තුළ එම අතුරු අග්‍රිමය නැවත පියවා නොතිබුණි.

3.9 **බැංකු ගිණුම් මෙහෙයවීම**

2025 දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව නිකුත් කළ නමුත් ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ මාස 06කට වඩා කාල පමාවක් සහිත රු. 318,582 ක වටිනාකමින් යුතු චෙක්පත් 16 ක් විගණිත දිනය වූ 2026 පෙබරවාරි 28 දිනට ද ගෙවීම් සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

4 **මෙහෙයුම් සමාලෝචනය**

4.1. **කාර්යසාධනය**

4.1.1 **අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

(අ) **ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් සැපයුම්කරුවන්ට ගෙවන ලද එකතු කළ අගය මත බදු (VAT) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීම**

ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් සක්‍රීය සැපයුම්කරුවන් 75 දෙනෙකුට අදාළව 2023 ජනවාරි සිට 2025 ජුනි දක්වා කාල පරිච්ඡේදය තුළ ගෙවන ලද එකතු කළ අගය මත බදු ඇතුළත් ඉන්වොයිස් 777 අතරින් සැපයුම්කරුවන් 36ක් යටතේ වන VAT ඇතුළත් මුළු වටිනාකම රු. 574,780,447ක් වූ ඉන්වොයිසි 254ක් RAMIS පද්ධතියේ එක් එක් සැපයුම්කරුවන් විසින් අදාළ කාල පරිච්ඡේදයන් යටතේ (ඉදිරි බදු කාල පරිච්ඡේද 02 ක් ඇතුළත්ව) උඩුගත කර තිබූ VAT නිමවුම් උපලේඛනවල (VAT-Schedule 01- Output Tax) ඇතුළත් වී නොතිබුණි.එම ඉන්වොයිස් පිළිබඳ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් තොරතුරු විමසා සිටිය ද, සැපයුම්කරුවන් 28ට අදාළ ඉන්වොයිස් පිළිබඳ තොරතුරු මෙතෙක් ලැබී නොමැති අතර එහි VAT ඇතුළත් මුළු වටිනාකම රු. 400,366,741 වේ. තවද, RAMIS පද්ධතියේ VAT නිමවුම් උපලේඛන (VAT-Schedule 01-Output Tax) යටතේ VAT ඉන්වොයිස් අංක ඇතුළත් වුවත්, විගණනයට ලද තොරතුරුවලට අනුව පද්ධතියට උඩුගත කර ඇති දත්ත හා සැසඳීමේ දී ගෙවූ VAT බදු ලෙස RAMIS පද්ධතියෙහි දක්වා ඇති ඉන්වොයිසි 10 ක් සඳහා වූ වටිනාකම රු. 788,933ක් අඩුවෙන් දක්වා ඇති අවස්ථා නිරීක්ෂණය විය.

(ආ) **විශාල බදු අංශය-ආපසු ගෙවීම් (LTO Refund) එකතු කළ අගය මත බදු ආපසු ගෙවීම්**

විශාල බදු අංශය- ආපසු ගෙවීම්(LTO Refund) විසින් රු.මිලියන 5ට වඩා වැඩි බදු ආපසු ගෙවීම් පිළිබඳ තීරණය කිරීම සඳහා වූ කමිටුව වෙත යොමු කර බදු ගෙවන්නන් සඳහා එකතු කළ අගය මත බදු (VAT) Journal මඟින් ආපසු ගෙවීම් හිලව් කිරීම සිදු කිරීම සඳහා එම කමිටුව විසින් 2024 වර්ෂයේ එකඟතාව ලබා දී ඇති TIN අංක 11430xxxx දරන බදුකරුගේ 1832 දරන බදු කාල සීමාවට අදාළ රු.8,078,599ක වටිනාකම 2021 තක්සේරු වර්ෂයේ රු. 4,605,264ක ආදායම් බදු වෙනුවෙන් හා 2324 තක්සේරු වර්ෂයේ

16

රු.3,473,335ක ආදායම් බදු වෙනුවෙන් හිලව් කර ඇති බව වාර්තා කළ තිබුණ ද එම බදු කරුගේ එකතු කළ අගය මත බදු (VAT) ලෙජරයේ Journal මඟින් ආපසු ගෙවීම් හිලව් කිරීම සිදු කර ඇති මුළු වටිනාකම ලෙස පෙන්නුම් වනුයේ රු.6,523,085ක් බැවින් Journal මඟින් ආපසු ගෙවීම් හිලව් කිරීම සිදු කිරීම සඳහා කමිටුව විසින් අනුමතිය ලබා දී ඇති වටිනාකම හා ලෙජරයේ පිටපත් කර ඇති වටිනාකම අතර රු.1,555,514ක වෙනසක් පෙන්නුම් වන බව නිරීක්ෂණය කෙරේ.

(I) විශාල බදු අංශය-ආපසු ගෙවීම්හී එකතු කළ අගය මත බදු (VAT) ආපසු ගෙවීම් සිදු කිරීමට අදාළව WI_Receive_Refund_Form සහ WI_Process_Credit_Voucher යනුවෙන් ප්‍රධාන වැඩ අයිතම දෙකක් පවතින අතර එම අංශයේ 2024 වර්ෂයේ දෙවන අර්ධයට අදාළ කාර්යසාධන වාර්තාවෙහි Achievement යටතේ සඳහන් කර ඇති වැඩ අයිතම ප්‍රමාණයන් සහ එම අංශය විසින් විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව සම්පූර්ණ කර ඇති වැඩ අයිතම ප්‍රමාණයන් අතර WI_Receive_Refund_Form වැඩ අයිතම 780ක හා WI_Process_Credit_Voucher වැඩ අයිතම 133ක පරස්පරතාවක් පවතින බව නිරීක්ෂණය කෙරේ.

(II) විශාල බදු අංශය- ආපසු ගෙවීම්හී එකතු කළ අගය මත බද්දට (VAT) අදාළව 2024 වර්ෂයේදී නිම කිරීමට නියමිත (Revise End Time) WI_Receive_Refund_Form යන වැඩ අයිතම 219 ක ප්‍රමාණයක් සහ WI_Process_Credit_Voucher යන වැඩ අයිතම 32 ක ප්‍රමාණයක් RAMIS පද්ධතියේ 2026 මැයි 15 දින වන විට තවදුරටත් විවෘතව (සම්පූර්ණ කර නොමැති) පවතින බව විගණනයට නිරීක්ෂණය විය.

(III) බදු ගෙවන්නන් විසින් අයදුම්කරනු ලබන බදු ආපසු ගෙවීම් (Refund) මුදලින් කාලීනව නොලැබීමෙන් හෝ Journal මඟින් ආපසු ගෙවීම් හිලව් කිරීම කඩිනමින් සිදු නොවීමෙන් ඔවුන් තුළ බදු පරිපාලනය සම්බන්ධයෙන් පවත්නා මහජන මතයට ඍණාත්මක බලපෑමක් සිදු විය හැකි අතරම බදු ආපසු ගෙවීම් නියමිත පරිදි සිදු කිරීම බදු ගෙවන්නන් දිරිගැන්වීමේ ක්‍රමවේදයක් ද වන බැවින් සිදුවන ප්‍රමාද වීම් හැකිතාක් අවම කරගනිමින් නියමිත පරිදි බදු ආපසු ගෙවීම් සිදු කිරීම සඳහා RAMIS පද්ධතියේ පවතින ගැටළු විසඳීමට කළමනාකරණයේ අවධානය තවදුරටත් යොමු විය යුතු බව නිරීක්ෂණය වේ.

(ඇ) ශ්‍රී ලංකා එනර්ජීස් එච් ආර් (පුද්ගලික) සමාගමේ බදු අනුකූලතාව

(I) 2012 වර්ෂයේදී පිහිටුවන ලද ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට අනුබද්ධිත ආයතනයක් වන ශ්‍රී ලංකා එනර්ජීස් එච් ආර් (පුද්ගලික) සමාගම TIN අංක 17408xxxx යටතේ බදු සඳහා ලියාපදිංචි වී ඇති අතර එම සමාගම 2015 ඔක්තෝබර් 01 දින සිට එකතු කළ අගය මත බදු (VAT) සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබුණ

17

ද මේ වන විට එකතු කළ අගය මත බදු සඳහා අක්‍රීය බදුකරුවෙක් ලෙස RAMIS පද්ධතිය තුළින් නිරීක්ෂණය වේ. එසේම මෙම බදුකරු එකතුකල අගය මත බදු සඳහා අක්‍රීය බදුකරුවකු බවට පත්වී ඇත්තේ 2019 දෙසැම්බර් 31 දිනැතිව වුවද 1930 හා 1940 බදු කාල පරිච්ඡේදයට අදාළ එකතු කළ අගය මත බදු වාර්තාවන්ගේ දෘඩ පිටපත් RAMIS පද්ධතිය තුළ උඩු ගත කර නොතිබුණි.

(II) රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි විය යුතු සීමාව එනම් යම් තැනැත්තෙකුගේ තොග සහ සිල්ලර වෙළඳාම ද ඇතුළුව එහෙත් මූල්‍ය සේවා සැපයීම හැර බදු අයකළ හැකි භාණ්ඩ හෝ සේවා සැපයුම්වල වටිනාකම 2022 සැප්තැම්බර් 30 දිනෙන් පසුව වර්ෂයකට මිලියන 300 සිට මිලියන 80 දක්වා අඩු කර ඇති අතර උක්ත සඳහන් සමාගමේ වාර්ෂික පිරිවැටුම 2023 වර්ෂයෙන් පසුව එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි විය යුතු සීමාව ද ඉක්මවා තිබියදී එම සමාගම එකතු කළ අගය මත බදු සඳහා අක්‍රීය බදුකරුවෙකු ලෙස RAMIS පද්ධතිය තුළින් පෙන්නුම් කර තිබුණි.

(III) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතට 2024 ජනවාරි 23 දිනැතිව නිකුත් කළ සංශෝධන පනත් කෙටුම්පත අනුව 2024 ජනවාරි 01 දින හෝ එදිනෙන් පසුව සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට යටත් පිරිවැටුම කාර්තුවකට මිලියන 15 හෝ අනුයාත කාර්තු 04ක කාල සීමාවකට මිලියන 60 දක්වා අඩු කර ඇත. එසේ වුව ද උක්ත සඳහන් සමාගම සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සඳහා ලියාපදිංචි විය යුතු සීමාව ඉක්මවා තිබුණ ද 2026 අප්‍රේල් 29 දින වන විටත් එම බද්ද සඳහා ලියාපදිංචි වී නොමැති බව නිරීක්ෂණය කෙරේ.

**(ඇ) ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්ගලික) සමාගමේ බදු අනුකූලතාව**

(I) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි 126 වන වගන්තිය ප්‍රකාරව මෙම පනත යටතේ බදු ගෙවීමට යටත් වන සෑම තැනැත්තෙකු විසින්ම කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතවම නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකට අනුව එසේ නියමිත තොරතුරු ඇතුළත් කර බදු වාර්තාවක් ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික මාධ්‍ය මඟින් නියමිත කාලය තුළ සහකාර කොමසාරිස්වරයා වෙත සැපයිය යුතුය. එසේ වුව ද TIN අංක 11476xxxx යටතේ බදු සඳහා ලියාපදිංචි වී ඇති ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලයට අනුබද්ධිත ආයතනයක් වන ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්ගලික) සමාගම විසින් 2017/18 තක්සේරු වර්ෂයට අදාළව 2026 අප්‍රේල් 29 දින වන විටත් ආදායම් බදු (CIT) වර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(II) තවද ශ්‍රී ලංකා එනර්ජිස් (පුද්ගලික) සමාගම 2011 ජනවාරි 13 වන දින සිට උපයන විට /අත්තිකාරම් ආදායම් බදු (PAYE/APIT) සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබුණ ද 1516 බදු කාලපරිච්ඡේදයෙන් පසුව 2026 මැයි 15 දක්වා වන බදු කාල පරිච්ඡේදයන්ට අදාළව උපයන විට /අත්තිකාරම් ආදායම් බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇති බවට RAMIS පද්ධතිය තුළින් සිදු කළ පරීක්ෂාවේදී විගණනයට සාක්ෂි ඉදිරිපත් නොවිය.

(III) උක්ත TIN අංක දරන සමාගම සඳහා 2020/21 තක්සේරු වර්ෂයට අදාළව රු. 10,341,817 ක හිඟ බදු පැවතිය ද 2026 මැයි 15 වන දිනය දක්වා පොලී හා,දණ්ඩන වාර්තා වී නොමැති අතර 2024 හා 2025 වර්ෂ සඳහා පමණක් දල වශයෙන් රු.මිලියන 04ක පමණ වටිනාකමක් පොලිය ලෙස සහ දණ්ඩන ලෙස අය කර ගත යුතුව පවතින බව විගණනයේදී නිරීක්ෂණය කෙරේ.

**(ඉ) අභ්‍යන්තර කටයුතු ඒකකය (Internal Affairs Unit – IAU) පිහිටුවීම**

ජනාධිපති ලේකම්ගේ අංක PS/SB/Circular/2/2025 හා 2025 පෙබරවාරි 18 දිනැති චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර කටයුතු ඒකකය (Internal Affairs Unit – IAU) පිහිටුවීම පිළිබඳ පරීක්ෂාවට ලක් කෙරුණි. එහිදී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ දූෂණ සහ සදාචාර විරෝධී හැසිරීම් සම්බන්ධ පැමිණිලි භාර ගැනීම සඳහා ක්‍රමවේදයක් ස්ථාපිත කිරීම පමණක් ප්‍රමාණවත් නොවන අතර එම භාර ගනු ලබන පැමිණිලි කළමනාකරණය කිරීම සඳහා ආරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරීමට, 2026 මාර්තු 23 දින වන විටත් අභ්‍යන්තර කටයුතු ඒකකය විසින් කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය.

**(ඊ) විශාල බදු අංශය - විමර්ශන (LTO Investigation) අංශයේ කාර්යසාධන විගණන පරීක්ෂාව**

දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පිහිටුවා තිබූ විශාල බදු විමර්ශන අංශය(LTO Investigation) මේ වන විට බදු අපරාධ විමර්ශන අංශය (TCIU) ලෙස ප්‍රතිව්‍යුහගත කර ඇති අතර එවකට විශාල බදු විමර්ශන අංශය විසින් බදු ගෙවීම් පැහැර හැරීම් සම්බන්ධයෙන් එම අංශය වෙත ලැබෙන තොරතුරු මත පදනම්ව විමර්ශන කටයුතු සිදු කරමින් අදාළ පාර්ශවයන්ගෙන් පැහැර හරින ලද බදු අය කර ගැනීමට කටයුතු කර ඇත. ඒ අනුව විශාල බදු විමර්ශන අංශයේ 2024 දෙවන අර්ධ වර්ෂයට (2024 ජුලි 01 දින සිට 2024 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට) අදාළව සිදු කළ කාර්යසාධන විගණනයට අනුව එම අංශය විසින් තක්සේරු දැන්වීම් නිකුත් කර විගණනයන් අවසන් කරන ලද විමර්ශනයන්ට අදාළව පනවා ඇති අතිරේක බදු වටිනාකමෙන් රු. 433,116,720 ක පමණ ප්‍රමාණයක්,

2026 මැයි 15 දින වන විටත් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැති බව RAMIS පද්ධතිය තුළින් සිදු කළ පරීක්ෂාවේදී තවදුරටත් නිරීක්ෂණය විය.

**(උ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - මහනුවර ප්‍රාදේශීය කාර්යාලය සම්බන්ධ කාර්යසාධන පරීක්ෂාව**

(I) දේශීය ආදායම් දෙපාර්තමේන්තු මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේ 2009 වර්ෂයේ සිට රු. 56,997,838ක් වටිනා චෙක්පත් 137ක් අගරු වී ඇති අතර ඒ තුළ Legacy කාල පරිච්ඡේදයට අයත් වන වටිනාකම රු. 36,166,260ක් වූ අගරු චෙක්පත් 69ක් හා RAMIS කාල පරිච්ඡේදයට අයත් වන වටිනාකම රු. 20,831,578ක් වූ අගරු චෙක්පත් 68ක් අන්තර්ගත වන අතර Legacy හා RAMIS කාල පරිච්ඡේද දෙකටම අයත් වටිනාකම රු. 54,480,399ක් වූ වැඩිම චෙක්පත් ප්‍රමාණයක් වන චෙක්පත් 110ක් VAT බදු වර්ගය සඳහා අගරු වී ඇති බව තවදුරටත් නිරීක්ෂණය වූ අතර මේ දක්වා එම වටිනාකම අයකර ගැනීමට නොහැකි වී ඇති බව ද නිරීක්ෂණය විය.

(II) 2009 වර්ෂයේ සිට 2024 වර්ෂය දක්වා Legacy හා RAMIS පද්ධතිවලට අදාළව එක් එක් වර්ෂයන්හිදී අගරු වී ඇති VAT බදු සඳහා වන චෙක්පත් විස්තර අනුව වර්ෂ 05 ඉක්මවා ඇතත් තවදුරටත් අය කර ගැනීමට නොහැකි වූ (2020 වර්ෂයට පෙර අගරු වූ චෙක්පත්) වටිනාකම රු. 45,667,067 ක් වන චෙක්පත් 95ක් පවතින බව නිරීක්ෂණය විය.

(III) එම ප්‍රාදේශීය කාර්යාලයෙහි කටයුතු කරන දේශීය ආදායම් සේවයේ නියුතු නිලධාරීන් 22 යටතේ වැඩ අයිතම නාම 112කට අදාළව 2025 ඔක්තෝබර් 29 දිනට RAMIS පද්ධතියෙන් ලබා ගත් දත්තයන්ට අනුව එක් එක් බදු වර්ගයන්ට අදාළව 2017 වර්ෂයේ සිට තවදුරටත් සම්පූර්ණ නොකළ විවෘත වැඩ අයිතම (Open Work Items) 36,972ක ප්‍රමාණයක් පවතින බව නිරීක්ෂණය විය.

**(ඌ) ජාතික විගණන කාර්යාලය විසින් විගණනය කරනු ලබන අරමුදල් මත ගෙවිය යුතු බදු බැදියාව**

(I) විවිධ ආයතන යටතේ සංස්ථාපනය කර ඇති අරමුදල් 60 කට අදාළ නියැදි පරීක්ෂාවට අනුව අරමුදල් 18ක් පමණක් බදු සඳහා ලියාපදිංචි වී ඇති බව නිරීක්ෂණය වූව ද ඒ අතරින් ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය, ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය හා බේරුම් කරන ඇපකර අරමුදල යන අරමුදල් 03ක එම අරමුදලට අදාළව බදු ගෙවීම සඳහා අරමුදල පාලනය වන ආයතනය සතු TIN අංකයම භාවිතා කරන බව ද RAMIS පද්ධතිය මඟින් සිදු කළ

පරීක්ෂාවේදී විගණනයට නිරීක්ෂණය වූ අතර වෙන් වූ ඒකකයක් ලෙස සලකා බදු සඳහා ලියාපදිංචි වීමේ අවශ්‍යතාව නොසලකා හැර ඇති බව නිරීක්ෂණය විය.

(II) නියැදියෙහි ඇතුළත් අරමුදල් 60 අතරින් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි හෝ එම අරමුදල් පිහිට වූ පනත්හි හෝ බදු ගෙවීමෙන් නිදහස් කිරීම පිළිබඳව විධිවිධාන දක්වා ඇති බවට විගණනයට සාක්ෂි නොවූ , බදු සඳහා ලියාපදිංචි වී නොමැති අරමුදල් 38 ක් විසින් 2024 වර්ෂයේදී උපයා ගෙන තිබූ රු.මිලියන 46,208 ක වාර්ෂික ආදායමෙන් උද්ගත වන බදු බැදියාව මත වන බදු ආදායම රජයට අහිමි වී ඇති බව විගණනයේදී නිරීක්ෂණය විය.තවද එවැනි අරමුදල්හි බදු බැදියාව නිවැරදිව හඳුනාගෙන කාලීනව එම ආදායම රජයට අය කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් අදාළ ක්‍රියාමාර්ග ගත යුතු මෙන්ම එම අරමුදල් තවදුරටත් හඳුනාගැනීම සඳහා ඵලදායී උපායමාර්ගයන් ක්‍රියාත්මක කළ යුතු බව වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ.

**(එ) කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළෙහි (BIA) පිටවීමේ පර්යන්තයේ ස්ථාපිත කර ඇති සංචාරක එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ (TVRS) කවුන්ටරය**

2025 ජූලි මස ආරම්භ කර ඇති මෙම TVRS ක්‍රමවේදය මඟින් සැපයුම්කරුවන් විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත VAT බදු මුදල් ගෙවීමට පෙර අදාළ VAT බදු මුදලින් සියයට 80ක මුදලක් සංචාරකයන් වෙත නැවත ලබා දීම සිදු කළ යුතු බැවින්, මෙම ක්‍රමවේදය යටතේ ලියාපදිංචි වී ඇති සැපයුම්කරුවන්ගේ VAT බදු වාර්තා ලබා දීම සියයට 100 ක අනුකූලතාවක් පැවතීම, මෙම ක්‍රමවේදයේ සාර්ථකත්වයට අවශ්‍ය බැවින්, රජය බදු ආපසු ගෙවීමේ හා බදු එකතු කර ගැනීමේ කාල පමාවක් හේතුවෙන් සිදු විය හැකි අලාභ අවම කර ගැනීම සඳහා සැපයුම්කරුවන් මනා අධීක්ෂණයට ලක් විය යුතු අතර, ඔවුන් සඳහා මාර්ගෝපදේශයක් නිකුත් කිරීම මඟින් බදු අනුකූලතාව ඉහළ නැංවීමට කටයුතු කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ සිදුකෙරේ.

(I) TVRS ක්‍රමවේදය යටතේ සංචාරකයන් වෙත නිකුත් කරන ලද 2025 අගෝස්තු හා සැප්තැම්බර් මාසවලට අදාළ වවුචර්පත්වලින්, වටිනාකම රු. 1,545,590ක් වූ වවුචර්පත් 48ක් සංචාරක වැට් බදු ආපසු ගෙවීමේ ගිණුම වන අංක 704xxxx දරන ලංකා බැංකු ගිණුම හරහා ගෙවීමට ඉදිරිපත් වී නොමැති අතර, එසේ වුවත් ඊට අදාළ චෙක්පත් පිළිපත් (Counter Foil) හා TVRS පද්ධතියෙහි වවුචර්පත් ගෙවීම් ලබාගෙන නොමැති බැවින් අවලංගු කර පද්ධතිය යාවත්කාලීන කිරීමක් සිදු නොවන බවත්, TVRS කවුන්ටරයෙන් දෛනිකව නිකුත් කළ චෙක්පත් සමඟ විදේශිකයින් මඟින් සත්‍ය වශයෙන්ම බැංකු කවුන්ටරයෙන් ලබා ගත් චෙක්පත් ප්‍රමාණය සංසන්දනය කරමින් දෛනික වාර්තාවක් පිළියෙළ නොකරන බවත් විගණනයට නිරීක්ෂණය විය.

21

(II) වවුචර්පත් සැකසීමේ දී ඇති වන දෝෂ හා බැංකුවෙන් ගෙවීමට ඉදිරිපත් නොවූ වවුචර්පත් වටිනාකම්, අදාළ TVRS 35 පත්‍රිකා සැකසීමේදී නිවැරදි/ඉවත් නොකිරීම හේතුවෙන්, වවුචර්පත් 11කට අදාළ සංචාරක වැට් බදු ආපසු ගෙවීම සඳහා TVRS 35 පත්‍රිකාවන්හි සඳහන් කර ඇති වටිනාකම් රු.1,417,987ක් වැඩියෙන් ප්‍රතිපූර්ණය කර ඇති බව විගණිත දිනය වූ 2026 මැයි 15 දිනට නිරීක්ෂණය විය.

**(ඒ) 2018/19 සිට 2021/22 තක්සේරු වර්ෂයන්හි සංස්ථාපිත ආදායම් බදු (CIT) සඳහා විකල්ප ක්‍රමවේදය ඔස්සේ නිකුත් කර ඇති අතිරේක තක්සේරු වාර්තා දත්ත RAMIS පද්ධතියට ඇතුළත් කිරීම - මධ්‍ය පරිමාණ සංස්ථාපිත අංශය සේවා 03 (MCO Service 03) සහ මධ්‍ය පරිමාණ සංස්ථාපිත අංශය නිෂ්පාදන 01 (MCO Manufacturing 01)**

විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2018/19 සිට 2021/22 තක්සේරු වර්ෂ සඳහා ITAS විකල්ප ක්‍රමවේදය ඔස්සේ නිකුත්කර ඇති අතිරේක තක්සේරු වාර්තා ප්‍රමාණය 17,184ක් වන අතර හා ඊට අදාළ දඩ හා පොලී ඇතුළත් මතභේදකාරී මුළු බදු මුදල රු.මිලියන 343,012 ක් බව නිරීක්ෂණය විය. ඒ තුළ අන්තර්ගත සංස්ථාපිත ආදායම් බදු (CIT) සඳහා නිකුත් කර ඇති අතිරේක තක්සේරු වාර්තා ප්‍රමාණය 9,626 ක් වන අතර ඊට අදාළ දඩ හා පොලී ඇතුළත් මතභේදකාරී මුළු බදු මුදල රු. මිලියන 330,496 ක් විය. අංක DCG/ICT/ADM/2025/01 යටතේ 2025 මැයි 27 දිනැතිව ITAS විකල්ප ක්‍රමවේදය ඔස්සේ නිකුත් කරන ලද 2019/20, 2020/21 හා 2021/22 තක්සේරු වර්ෂයන්හි CIT අතිරේක තක්සේරු වාර්තා RAMIS පද්ධතියට ඇතුළත් කිරීමේ මාර්ගෝපදේශ නිකුත් කර තිබූ අතර උක්ත අභ්‍යන්තර චක්‍රලේඛය ඔස්සේ ඊට අදාළ විස්තර RAMIS පද්ධතියට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් නිලධාරීන් දැනුවත් කර තිබුණි. විගණිත දිනය වූ 2026 මැයි 15 දින විට ඊට අදාළව RAMIS පද්ධතියෙහි සියලු මොඩියුල සංවර්ධනය කර ඇතත්, එම අතිරේක තක්සේරු වාර්තා RAMIS පද්ධතියට ඇතුළත් කිරීමේ ප්‍රමාදයක් තවදුරටත් පවතින බව නියැදි පරීක්ෂාවට අනුව විගණනයට නිරීක්ෂණය වේ. විස්තර පහත දැක්වේ.

(I) 2024 ජුලි 19 දිනට ශාඛාවන්හි පවතින බදු ලිපිගොනු (File Allocation) තොරතුරු සංසන්දනය කිරීමෙන්, මධ්‍ය පරිමාණ සංස්ථාපිත සේවා 03 (MCO Service 03) අංශයට අදාළව CIT සඳහා දඩ හා පොලී ඇතුළත් ගෙවිය යුතු මුළු බදු වටිනාකම රු. මිලියන 4,144ක් වූ අතිරේක තක්සේරු වාර්තා 600 ක් නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය. ඉන් අතිරේක තක්සේරු දැන්වීම් 100 ක නියැදියක් පරීක්ෂාවට ලක් කෙරුණු අතර ඒ අතරින් 61 ක්ම 2026 ජනවාරි 20 දින තෙක් එහි අතිරේක බදු වගකීම RAMIS පද්ධතියට ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර ඊට අදාළව දඩ හා පොලී ඇතුළත් ගෙවිය යුතු මුළු හිඟ බදු වටිනාකම රු. 663,071,715ක් විය. එසේම එම අතිරේක තක්සේරු දැන්වීම් 61න් ඉහළම වටිනාකමක් සහිත අතිරේක තක්සේරු

දැන්වීම් 34ක් Suspended ලෙස RAMIS පද්ධතියෙහි Assessment Tabහි Assessment Status යටතේ නිරීක්ෂණය වන අතර, ඊට අදාළව දඩ හා පොලී ඇතුළත් ගෙවිය යුතු මුළු හිඟ බදු වටිනාකම රු. 217,170,650ක් විය.

(ඖ) 2024 ජුලි 19 දිනට ශාඛාවන්හි පවතින බදු ලිපිගොනු (File Allocation) තොරතුරු සංසන්දනය කිරීමෙන්, මධ්‍ය පරිමාණ සංස්ථාපිත නිශ්පාදන 01 (MCO Manufacturing 01) අංශයට අදාළව CIT හා PIT සඳහා දඩ හා පොලී ඇතුළත් ගෙවිය යුතු මුළු බදු වටිනාකම රු.මිලියන 3,621 ක් වූ අතිරේක තක්සේරු වාර්තා 369ක් නිකුත් කර තිබුණි. ආදායම් බදු සඳහා නිකුත් කර ඇති තක්සේරු දැන්වීම් 369 න් 2019/20, 2020/21 හා 2021/22 යන තක්සේරු වර්ෂයන්ට අදාළව CIT සඳහා විකල්ප ක්‍රමවේදය ඔස්සේ නිකුත් කර ඇති අතිරේක තක්සේරු දැන්වීම් 100ක නියැදියක් පරීක්ෂාවට ලක් කෙරුණු අතර එම නියැදි පරීක්ෂාවේ දී නියැදියෙහි අන්තර්ගත විකල්ප ක්‍රමවේදය මඟින් නිකුත් කර ඇති අතිරේක තක්සේරු දැන්වීම් 100න් 85ක් ම විගණිත දිනය වූ 2025 දෙසැම්බර් 23 තෙක් RAMIS පද්ධතියට ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය වූ අතර ඊට අදාළ දඩ හා පොලී ඇතුළත් ගෙවිය යුතු මුළු බදු වටිනාකම රු. 299,427,476ක් විය.

(ක) **2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 157 වගන්ති ප්‍රකාරව ඌන ගෙවීම මත පොලී අයකර ගැනීම**

හිඟ බදු ප්‍රමාණය මත ගෙවිය යුතු පොලී ගණනය කර අයකර ගැනීම සඳහා RAMIS පද්ධතියේ අදාළ වන ප්‍රධාන මොඩියුලයන් වන TPF සහ Collection මොඩියුලයන් සම්බන්ධයෙන් සිදුකළ විගණන පරීක්ෂාවන්ට අනුව විගණිත දිනට වාර්තා කර ඇති පරිදි TPF මොඩියුලයෙහි සංවර්ධන තත්ත්වය සියයට 95ක මට්ටමක පැවතිණි.

(ඛ) **ප්‍රාග්ධන ලාභ මත බදු අයකරගැනීම සම්බන්ධ නියැදි පරීක්ෂාව ( කොළඹ, ගම්පහ, කළුතර )**

(I) 2024 වර්ෂය සඳහා ඇස්තමේන්තු බද්ද රු. මිලියන 5,000ක් වූ අතර ඉන් 2024 වර්ෂයේදී රැස්කළ බදු මුදල සියයට 37ක ප්‍රතිශතයක් වීමෙන් 2025 වර්ෂය සඳහා ප්‍රාග්ධන ලාභ බද්ද ලෙස ඇස්තමේන්තු කර ඇත්තේ රු. මිලියන 2,000ක් පමණක් බව නිරීක්ෂණය විය.

(II) වත්කම් උපලබ්ධි කිරීමෙන් ලද ලාභය මත ගෙවිය යුතු ප්‍රාග්ධන ලාභ බදු අයකරගැනීම සම්බන්ධව සිදු කරනු ලබන පරීක්ෂාවේදී ඉඩම් ගනුදෙනු 160 කින් සමන්විත නියැදියට අදාළ පරීක්ෂාවේදී දීමනාකරුවන් 34කට අදාළව ඉඩම් ගනුදෙනු උක්ත කාලච්ඡේදයට සිදු වුවත් එම දීමනාකරුවන් වෙනුවෙන් RAMIS පද්ධතියෙහි බදුකරු ලියාපදිංචියවත් සිදු නොවූ අවස්ථා නිරීක්ෂණය වූ අතර ඒ සඳහා නියමිත ප්‍රාග්ධන ලාභ බදු ගෙවා ඇතිද යන්න පිළිබඳ තොරතුරු RAMIS පද්ධතිය ඇසුරින්

විගණනයට පරීක්ෂා කළ නොහැකි විය. තවද ඉඩම් ගනුදෙනුහි නිරත වූ නියැදියේ ඇතුළත් දීමනාකරුවන් 146 දෙනෙකු ප්‍රාග්ධන ලාභ බද්ද සඳහා ලියාපදිංචි වී නොතිබුණි. එමෙන්ම සමස්ත වටිනාකම රු.363,487,408 ක් වූ දීමනාකරුවන් 56 දෙනෙකු සඳහා RAMIS පද්ධතිය තුළ TIN අංක ජනනය වී ඇති නමුත් එම දීමනාකරුවන් කිසිදු බදු වර්ගයක් සඳහා ලියාපදිංචි වී නොමැති බව ද විගණිත දිනට නිරීක්ෂණය විය.

(III) 2023/2024 බදු වර්ෂයට අදාළව සමස්ත වටිනාකම රු. 288,840,000 ක් වූ ඉඩම් ගනුදෙනු සිදු කළ ලැබුම්කරුවන් 38 දෙනෙකු පුද්ගල ආදායම් බදු සඳහා ලියාපදිංචි වී තිබුණි. ඒ අතරින් ගනුදෙනු 25 ක් සිදු කළ ලැබුම්කරුවන් අදාළ බදු වර්ෂයන් සඳහා ආදායම් වාර්තා ගොනුකර නොමැති අතර ලැබුම්කරුවන් 06 දෙනෙකු 2023/2024 බදු වර්ෂයට පෙර බදු වර්ෂ සඳහා පමණක් ආදායම් වාර්තා ගොනුකර තිබිණි. තවත් ලැබුම්කරුවන් 06 දෙනෙකු 2023/2024 බදු වර්ෂය සඳහා ආදායම් වාර්තා ගොනුකර තිබූ අතර එයින් ලැබුම්කරුවන් 03 දෙනෙකු 2024 වර්ෂයේ ජනවාරි හා පෙබරවාරි යන මාසයන් තුළ අත්පත්කරගත් වත්කම් පිළිබඳව එම වාර්තා තුළ හෙළිදරව් කර නොතිබිණි. 23/24 බදු වර්ෂය සඳහා ආදායම් වාර්තා ගොනුකර ඇති ලැබුම්කරුවකු වත්කම් අත්පත්කරගැනීම් යටතේ මිලදී ගත් දිනය හා වත්කමෙහි වටිනාකම යන තොරතුරු නොමැතිව ඉඩම් දෙකක් පිළිබඳව හෙළිදරව් කර තිබුණි.

**(ක) සීනි කිලෝ එකක් සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බද්ද 2020 ඔක්තෝබර් 14 සිට 2021 පෙබරවාරි 28 දක්වා කාල පරිච්ඡේදය තුළ රු. 50 සිට ශත 25 දක්වා අඩු කිරීමෙන් ආනයනකරුවන් සීනි ආනයනයෙන් ලද ලාභය මත බදු ගෙවීම**

(I) සීනි කිලෝ එකක් සඳහා පනවා තිබුණු විශේෂ භාණ්ඩ බද්ද 2020 ඔක්තෝබර් 14 සිට 2021 පෙබරවාරි 28 දක්වා කාල පරිච්ඡේදය තුළ රු. 50 සිට ශත 25 දක්වා අඩු කිරීම මත රජයට සිදුවූ අලාභය සම්බන්ධයෙන් වූ පරීක්ෂාව සඳහා පත්වූ විශේෂ කමිටුවේ වාර්තාව අනුව ආනයනකරුවන් 10 දෙනෙකුට අදාළව සමස්ථ වශයෙන් රු.896,858,125 ක වටිනාකමකින් යුත් තක්සේරු නිකුත් කර තිබුණි.

(II) දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් ලබා දෙන ලද වර්තමාන ප්‍රගතිය පිළිබඳ තොරතුරු අනුව සමස්ථ වශයෙන් නිකුත් කළ අතිරේක තක්සේරු වටිනාකමින් රු.332,067,546 ක වටිනාකමක් අභියාචනා විසඳීමේදී සිදු කළ අඩුකිරීම් ලෙස සංශෝධනය කර ඇති නමුත් එම සංශෝධනයන්ට අදාළ තක්සේරු තාක්ෂණික ගැටළුවක් හේතුවෙන් RAMIS පද්ධතියේ උඩුගත කර නොමැත. තවද 2026 මාර්තු 31 දිනට ගෙවීම් ලෙස රු. 432,416,353ක් දක්වා ඇති නමුත් මීට අදාළව පද්ධතිය මගින් කළ පරීක්ෂාවේදී අතිරේක තක්සේරු සඳහා සිදු කළ ගෙවීම් ලෙස

රු.111,469,843 ක් පමණක් අනාවරණය වීමෙන් වර්තමාන ප්‍රගතිය යටතේ දෙපාර්තමේන්තුව ලබා දුන් තොරතුරු හා පද්ධතිගත තොරතුරු අතර පරස්පරතාවයක් වැඩිදුරටත් නිරීක්ෂණය විය.

(ග) **2024 සහ 2025 වාර්ෂික දෙපාර්තමේන්තු කාර්යසාධන වාර්තා සම්බන්ධ පරීක්ෂාව**

(I) 2023 හා 2024 යන මූල්‍ය වර්ෂයන් තුළ නව බදු ගොනු විවෘත කිරීමට සාපේක්ෂව අදාළ බදු වාර්තා ගොනු කිරීමේ අනුකූලතාවය සෘජු බදු සම්බන්ධයෙන් අඩු කාර්ය සාධනයක් වාර්තා කර තිබුණි. ඒ අනුව 1,730,233 ක් වූ නව බදු ගොනු සංඛ්‍යාවට සාපේක්ෂව බදු වාර්තා ගොනු කිරීමේ අනුකූලතාවය එම වර්ෂයන්හී එක් එක් බදු වර්ගයන්ට අදාළව සියයට 30 ටත් වඩා අඩු ප්‍රතිශතයක් වී තිබුණි. තවද තිරසාර ආර්ථික වර්ධනයක් අත්කර ගැනීම සඳහා අවම වශයෙන් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස බදු ආදායම් අනුපාතය සියයට 15 ක් විය යුතු බවට දෙපාර්තමේන්තුව හඳුනාගෙන තිබුණද, 2024 වර්ෂයට අදාළව එම අගය තවදුරටත් සියයට 12.39 ක් වැනි ඉලක්කගත අනුපාතයට වඩා පහළ අනුපාතයකින් පැවතිණ.

(II) 2025 සැප්තැම්බර් 09 වන දින පළ කරන ලද ලෝක බැංකු වාර්තාවෙහි "ශ්‍රී ලංකාව - රාජ්‍ය මූල්‍ය සමාලෝචනය: සමබර මූල්‍ය ගැලපීමක් කරා " යන ශීර්ෂය යටතේ දෙපාර්තමේන්තු දත්ත මධ්‍යස්ථානයේ තීරණාත්මක යටිතල පහසුකම් බොහොමයක ඵලදායී ජීව කාලය 2027 වන විට අවසන් වීමට නියමිත බව දක්වා තිබුණ ද 2025 වාර්ෂික කාර්යසාධන වාර්තාවෙහි දෙපාර්තමේන්තුවෙහි දීර්ඝ කාලීන අරමුණක් ලෙස ඩිජිටල්කරණය වූ බදු පරිපාලනයක් කරා සංක්‍රමණය වීම යන්න සඳහන් කර තිබීමෙන් එම අරමුණ ලඟාකර ගැනීමට දෙපාර්තමේන්තුව තවදුරටත් කාලීනව කටයුතු කිරීමේ අවශ්‍යතාව නිරීක්ෂණය විය.

(ඝ) **දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2017 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා බදුකරුවන් විසින් ගොනු කර ඇති බදු අභියාචනා/පරිපාලන සමාලෝචනයන් සඳහා කළ ඉල්ලීම් සහ විමසීම්**

(I) 2017 වර්ෂයේ සිට 2025 ජූලි දක්වා RAMIS පද්ධතිය මඟින් පරිපාලනය වන බදු වර්ගයන්ට අදාළව පමණක් රු. මිලියන 261,728 ක් වටිනා මතභේදකාරී බදු මුදලකට අදාළව බදු අභියාචනා (Appeal) 5,651ක් ද, රු.මිලියන 118,829 ක් වටිනා මතභේදකාරී බදු මුදලකට අදාළව විමසීම් (Query) 14,191ක් ද, රු.මිලියන 4,548 ක් වටිනා මතභේදකාරී බදු මුදලකට අදාළව බදු අභියාචනා හෝ විමසීම් ලෙස හඳුනා නොගත් අයිතම 1,160ක් ද වශයෙන් මුළු බදු අභියාචනා හා විමසීම් 21,002ක් ඉහත

කාල සීමාව තුල ලැබී තිබුණු අතර ඊට අදාළ මුළු මතභේදකාරී බදු මුදල රු.මිලියන 385,100 ක් බව විගණනයට නිරීක්ෂණය විය.

(II) යථෝක්ත බදු අභියාචනා හා විමසීම් අතරින් සමාලෝචිත වසර අවසන් වනවිටත් නොවිසඳුණු බදු අභියාචනා/පරිපාලන සමාලෝචනයන් සඳහා කළ ඉල්ලීම් සහ විමසීම් 6,516ක් වූ අතර ඊට අදාළ මතභේදකාරී බදු මුදල් වටිනාකම රු.මිලියන 142,042 ක් විය. යථෝක්ත නොවිසඳුණු බදු අභියාචනා/ පරිපාලන සමාලෝචනයන් සඳහා කළ ඉල්ලීම් සහ විමසීම් 6,516හි කාල විශ්ලේෂණය අනුව (ලද දිනය අනුව) 2018 වර්ෂයේ සිට තවදුරටත් අභියාචනා රෙජිස්ටරය තුළ අභියාචනා/ පරිපාලන සමාලෝචනයන් සඳහා කළ ඉල්ලීම් (Appeal) 1,182ක් විවෘතව පවතින බවත්, ඊට අදාළ මතභේදකාරී බදු මුදල් වටිනාකම රු. මිලියන 58,029 ක් බවත් නිරීක්ෂණය විය. තවද විමසීම් (Query) 4,332ක් 2017 වර්ෂයේ සිට තවදුරටත් අභියාචනා රෙජිස්ටරය තුළ විවෘතව පවතින අතර ඊට අදාළ මතභේදකාරී බදු මුදල් වටිනාකම රු. මිලියන 79,635 ක් විය. එසේම යථෝක්ත නොවිසඳුණු බදු අභියාචනා/ පරිපාලන සමාලෝචනයන් සඳහා කළ ඉල්ලීම් සහ විමසීම් 6,516 අතරින් 2023/24 වර්ෂයන්ට අදාළව එසේ Query ලෙස හෝ Appeal ලෙස හෝ හඳුනාගෙන නොමැති වටිනාකම රු. මිලියන 4,378 ක් වූ බදු අභියාචනා ඉල්ලීම් 1,002ක් නිරීක්ෂණය වූ අතර මේ දක්වා එම බදු අභියාචනා විසඳීමට ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය විය.

(III) 2023 අංක 4 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනත මඟින් සංශෝධනය කරන ලද මුල් පනතේ 139 වන වගන්තියේ 5 (ඇ) උප වගන්තිය අනුව මෙම (සංශෝධන) පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින හෝ ඉන් පසුව කරනු ලබන සමාලෝචනය සඳහා වූ ඉල්ලීමක් සම්බන්ධයෙන් වන විට හා ඒ ඉල්ලීම සම්බන්ධයෙන් බදු අභියාචනා කොමිෂන් සභාවට අභියාචනාවක් ඉදිරිපත් කර නොමැති විට, කොමසාරිස් ජනරාල්වරයා විසින්, එම ඉල්ලීම ලැබුණු දින සිට වසර 02ක කාල සීමාවක් ඇතුළත තම තීරණය ලබා දීමට අපොහොසත් වුවහොත්, නිකුත් කරන ලද අතිරේක කත්සේරු මඟින් අයකර ගැනීමට බලාපොරොත්තු වන අතිරේක බදු මුදල් අය කර ගැනීමට නොහැකි වන අතර, බදුකරු විසින් සිදු කර ඇති ඉල්ලීමට ඉඩ දීම සිදු වන බැවින්, එම සියලු අතිරේක තක්සේරු කාල කඩඉම් වන බවද විගණනයට නිරීක්ෂණය විය. එසේ වුව ද දේශීය ආදායම් දෙපාර්තමේන්තුව යටතේ පවතින 2017 වර්ෂයේ සිට 2025 වර්ෂය දක්වා වන සියලු පරිපාලන සමාලෝචනය සඳහා වන ඉල්ලීම්, විමසීම් හා හඳුනානොගත් අයිතම යටතේ නොවිසඳුණු වැඩ අයිතම 6,516න්, මුළු වටිනාකම රු.මිලියන 5,230 ක් වූ වැඩ අයිතම 59ක් වසර 02කට වඩා වැඩි කාලයක සිට පැවති අතර ඉහත දක්වා ඇති පරිදි අයවියයුතු බදු ආදායම නොලැබීමේ අවදානමක් පවතින බව නිරීක්ෂණය විය.

**(ජ) TIN අංක 12400xxxx අදාළව RAMIS පද්ධතියේ එකතු කළ අගය මත බදු ගෙවීම**

(I) TIN අංක 12400xxxx දරන බදු ගෙවන්නාට අදාලව RAMIS පද්ධතිය පරීක්ෂා කිරීමේ දී එම බදු ගෙවන්නා දැනටමත් ක්‍රියාකාරීව තිබුණද 2019 සැප්තැම්බර් 02 දිනෙන් පසුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට කිසිදු එකතු කළ අගය මත බදු ගෙවීමක් හෝ එකතු කළ අගය මත බදු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. ගෙවීම් වවුචර් නියැදියට අනුව 2023 වර්ෂයේ එකතු කළ අගය මත බදු ගෙවීම් රු. 10,252,372 ක් සඳහා RAMIS පද්ධතිය තුළ අදාළ බදු ගෙවන්නාගේ නමින් එකතු කළ අගය මත බදු වාර්තා ගොනු කර නොතිබූ අතර RAMIS පද්ධතිය තුළ මෙම බදු ගෙවන්නාට අදාලව නිම නොවූ වැඩ අයිතම 25 ක් පවතින බව ද නිරීක්ෂණය විය.

(II) මුදල් රෙගුලාසි 128 (2) (ඇ) ප්‍රකාරව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් විගණකාධිපතිවරයා වෙත ලබා දුන් 2025 දෙසැම්බර් 31 දිනට හිඟ බදු වාර්තාව අනුව උක්ත බදු ගෙවන්නා සම්බන්ධයෙන් 1730 හා 1920 බදු කාලච්ඡේදවලට අදාළව පිළිවෙලින් රු.5,000 හා රු.2,434,086 ක එකතු කළ අගය මත හිඟ බදු ශේෂ පැවතුණි.

**(ට) TIN අංක 10352xxxx දරන්නාට අදාළ ආදායම් බදු ගෙවීම් පරීක්ෂා කිරීම**

2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 186 හා 189 වගන්තිය අනුව TIN අංක 10352xxxx දරන තැනැත්තා 2022/2023 තක්සේරු වර්ෂය සඳහා පැහැර හැර ඇති පුද්ගල ආදායම් බද්ද(දඩ හා පොලී සමඟ) රු.130,664,749 ක්ද එම තැනැත්තා අධ්‍යක්ෂිකාවක් ලෙස කටයුතු කරන TIN අංක 10334xxxx දරන සමාගම 2022/2023 තක්සේරු වර්ෂය සඳහා පැහැර හැර ඇති සමාගම් ආදායම් බද්ද(දඩ හා පොලී සමඟ) රු.95,816,856 ක් වන බව නිරීක්ෂණය වූ අතර එම මුළු බදු මුදල් දඩ හා පොලිය වන රු.226,481,605 ක මුදල අය කර ගැනීම සම්බන්ධ කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු අංක 28577/09/24 යටතේ නඩුවක් විභාග වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

**(ඩ) TIN අංක 40905xxxx අදාළව HDFC බැංකුවේ මුද්දර බදු ගෙවීම**

2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන ) පනතේ අංක 03 වගන්තිය ප්‍රකාරව ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයන් මඟින් අමාත්‍යවරයා නිශ්චය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව මුද්දර ගාස්තුවක් සෑම විශේෂිත සාධන පත්‍රයක් මතම අය කරනු ලැබිය යුතුය. ඒ අනුව මෙම බදු ගෙවන්නාගේ 2015 සිට 2025 ජුනි 30 දක්වා මුද්දර බදු ගෙවීම් පිළිබඳව RAMIS පද්ධතිය ඇසුරින් සිදු කළ පරීක්ෂාවේදී 2015 වර්ෂයේ සිටම මුද්දර බදු ගෙවීම් සිදු කර ඇත්තේ කල් බදු සඳහා පමණක් බවත්, 2015 වර්ෂයේ සිට 2020 වර්ෂයේ

27

දෙවන කාර්තුව දක්වා කාලපරිච්ඡේදයට අයත් වැටුප් ලදුපත්, ලදුපත් හා නිදහස්කිරීම්, පොරොන්දු නෝට්ටු මත HDFC බැංකුව විසින් නොගෙවූ මුද්දර ගාස්තු බදු වටිනාකම රු.4,602,991 ක් බවත් 2020 වර්ෂයේ තුන්වන කාර්තුවේ සිට 2025 ජූනි 30 දක්වා නොගෙවූ මුද්දර බදු වටිනාකම රු. 3,225,113 ක් බවත් තවද ගනුදෙනුකරුවන්ගේ රු.25,000ට වැඩි ඉතුරුම් තැන්පතු හරහා ණය පියවීමේ දී රු. 25,000 ට වැඩි මුද්දර බදුවලට යටත් මුදල් ලැබීම් අයිතම ගණන 63,125 ක් සඳහා ගෙවිය යුතු මුද්දර බදු වගකීම රු.1,578,125 (63,125*25) ක් බවත් නිරීක්ෂණය වූ අතර 2015 වර්ෂයේ ඔක්තෝම්බර් 01 දින සිට 2025 වර්ෂයේ ජූනි 30 දක්වා අදාළ බදු ගෙවන්නාගේ ගෙවිය යුතු මුළු මුද්දර බදු වගකීම රු.9,406,229 ක් වේ. ඒ අනුව ගෙවා නොමැති මුද්දර බදු මුදල් සම්බන්ධයෙන් 2006 අංක 12 දරන මුද්දර බදු පනතේ වගන්ති අංක 11 යටතේ දේශීය ආදායම් පනතේ වගන්ති ප්‍රකාරව තක්සේරු දැන්වීම් නිකුත් කිරීමටත්, නොගෙවා ඇති බදු සම්බන්ධ දඩ පැනවීමටත් ක්‍රියා කල යුතුව ඇති බව ද තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

(ත) **TIN අංක 40905xxxx දරන පෞද්ගලික රෝහල**

(I) අංක TAX/A(REV)/INFO/01/2025/42 දරන තොරතුරු කැඳවීමේ ලිපියට ලද පිළිතුරු අනුව උක්ත TIN අංකය යටතේ පෞද්ගලික රෝහලක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙහි භාරයක් (Trust) ලෙස ලියාපදිංචි වී ඇති අතර 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි 57 වගන්තිය යටතේ භාර මත බදු අය කරනු ලැබීමට යටත් විය යුතු බව සඳහන් වේ.එසේ වුවත් RAMIS පද්ධතියට අනුව 2021 වර්ෂයෙන් පසුව 2022,2023,2024 යන වර්ෂයන් සඳහා ආදායම් බදු ගෙවා නොමැති අතර 2025 වර්ෂයේ දී ප්‍රාග්ධන ලාභ බදු සඳහා පමණක් ගෙවීමක් බදුකරු විසින් සිදු කර ඇත. එනමුත් ප්‍රාග්ධන ලාභ බදු සඳහා වන බදු වාර්තා 2026 මැයි 15 තෙක් ලබා දී නොතිබුණි.

(II) RAMIS පද්ධතියෙහි Tax Period Profileහි CIT සඳහා 2122 තක්සේරු වර්ෂය දක්වා ද, PAYE/APIT සඳහා 2223 තක්සේරු වර්ෂය දක්වා ද, VAT සඳහා 1940 බදු කාල පරිච්ඡේදය දක්වා හා WHT/AIT සඳහා 1920 තක්සේරු වර්ෂය දක්වා පමණක් තොරතුරු අන්තර්ගත වුවත්, 2019,2020,2021 හා 2022 යන වර්ෂ සඳහා ගෙවිය යුතු බදු මුදල් (Tax Payable) එක් එක් බදු වර්ග යටතේ සඳහන් කර නොතිබුණි.

(III) දෙපාර්තමේන්තුව විසින් 1920, 2021, 2122 තක්සේරු වර්ෂ සඳහා ආදායම් වාර්තාව ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් වන දැන්වීමේ දෙවන සිහිකැඳවීම 2023 දෙසැම්බර් 11 වන දින සිදු කර තිබුණි. තව ද 2223 හා 2324 තක්සේරු වර්ෂ සඳහා ආදායම් වාර්තාව ඉදිරිපත් නොකිරීම සම්බන්ධයෙන් වන දැන්වීම (Failure to Furnish a Return - CIT) පිළිවෙළින් 2024 මැයි 24 හා 2025 ජූනි 21 යන දිනයන්හි

නිකුත් කර තිබුණි. එනමුත් එහි සඳහන් පරිදි ආදායම් වාර්තාව ඉදිරිපත් නොකිරීම මත 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතෙහි 178 වගන්තිය ප්‍රකාරව දණ්ඩන පැනවීමක් හෝ 190 (1) වගන්තිය ප්‍රකාරව නෛතිකමය ක්‍රියාමාර්ගයක් ගැනීම හෝ 133 (1) වගන්තිය ප්‍රකාරව පැහැර හරින ලද තක්සේරුවක් (Default Assessment) නිකුත් කිරීම හෝ වන කාරණාවලින් කිසිදු ක්‍රියාමාර්ගයක් දෙපාර්තමේන්තුව විසින් මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබීම විගණනයට ගැටළු සහගත විය.

(IV) RAMIS පද්ධතියෙහි අන්තර්ගත 1920 තක්සේරු වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන පරික්ෂාවේ දී 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව 2019 අප්‍රේල් 01 දිනට ආරම්භක ශේෂයක් නොපැවතුණ රු. 52,644,175ක් වන සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ශේෂයක් (Amounts Due from Related Parties) හා රු.176,858,705ක් වන සමුච්චිත භාර අරමුදලක් (Accumulated Trust Fund) 2020 මාර්තු 31, එනම් වර්ෂ අග ශේෂයන් ලෙස ගලපා තිබුණි. තවද 2019 අප්‍රේල් 01 දිනට ආරම්භක ශේෂයක් ලෙස පැවතුණ රු. 72,709,857ක් වන සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු ශේෂයක් (Amounts Due to Related Parties) 2020 මාර්තු 31, එනම් වර්ෂ අග ශේෂයෙහි නොවුණි. සම්බන්ධිත පාර්ශවයන් ලෙස Melsta Health (PVT) Ltd හා Distilleries Company PLC යන ආයතන දක්වා ඇති අතර මෙසේ විශාල වටිනාකමකින් යුතු සම්බන්ධිත පාර්ශව ශේෂයන් හා සමුච්චිත භාර අරමුදල් ශේෂයක් අලුතින් ගිණුම්වල අන්තර්ගත වීමත්, ඒ අනුව වර්ෂයෙහි අලාභ දැක්වීමත් ගැටළු සහගත වුවත් දෙපාර්තමේන්තුව ඒ සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමුකර නොතිබුණි.

(V) 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වත්කම් යටතේ Income Tax Receivable ලෙස රු. 603,835ක් දක්වා තිබුණු අතර උක්ත කාලච්ඡේදයට අදාළව එසේ පැවතීම ද විගණනයට ගැටළු සහගත විය.

(VI) උක්ත ආයතනය සම්බන්ධයෙන් RAMIS පද්ධතියෙහි අන්තර්ගත වූ ගිණුම් කාලච්ඡේද 03කට අදාළ (2017/18, 2018/19, 2019/20) මූල්‍ය ප්‍රකාශනයන්හි විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය තුළ පිළිවෙලින් රු. 21,250,219, රු. 10,793,660, රු.39,810,593 බැගින් අලාභ පෙන්වා ඇති අතර පෞද්ගලික රෝහලක් ලෙස පවත්වා ගෙන යනු ලබන ආයතනයක එසේ වාර්ෂිකව අලාභ තත්ත්වයෙන් ඉදිරියට පවත්වා ගෙන යාම ගැටළු සහගත විය.

29

(ද) සන්නිවේදන චන්ද්‍රිකා ව්‍යාපෘතියට සම්බන්ධ සමාගම් පිළිබඳ බදු අනුකූලතා පරීක්ෂාව

2025 අගෝස්තු 06 වන දින පාර්ලිමේන්තුවේ දී සාකච්ඡාවට බඳුන් වූ උක්ත සන්නිවේදන චන්ද්‍රිකා ව්‍යාපෘතිය හා සම්බන්ධ TIN අංක 11482xxxx දරන සමාගම ඇතුළු ඊට අදාළ අනෙකුත් ආයතනයන් 04ක් පිළිබඳව පද්ධතිය ඇසුරෙන් සිදු කළ විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ කරුණු පහත පරිදි වේ.

(I) **TIN අංක 11482xxxx දරන සමාගම**

(i) මෙම ආයතනය 2011 ඔක්තෝබර් 25 දින ආරම්භ කර ඇති අතර, චන්ද්‍රිකා සන්නිවේදන ක්‍රියාකාරකම් (Satellite Telecommunications Activities) මූලික කරගත් ව්‍යාපාර කටයුතු සිදු කිරීමට 2012 මැයි 23 වන දින ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹී ඇති අතර එම සමාගමේ 2024 වර්ෂයේ විගණිත මූල්‍ය ප්‍රකාශන අනුව 2012 අංක 08 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ 17A වගන්තියෙහි සඳහන් ආයෝජන සිදු කරමින් ලාභය වසර 10ක කාලයක් සඳහා ආදායම් බද්දෙන් නිදහස් කර ඇති බවත් නිරීක්ෂණය විය.

(ii) 2006 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන ඇතුළුව) පනතේ උක්ත වගන්තියෙහි උපලේඛනයේ II තීරුවේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව සඳහා බදු නිදහස් ලබා ගැනීමට, උපලේඛනයේ I වන තීරයේ ආයෝජනයට අනුරූපව රු.මිලියන 1500ට වැඩි සහ 2500ට නොවැඩි කාණ්ඩයේ නව ආයෝජන, ස්ථාවර වත්කම්වල සිදු කර තිබිය යුතු අතර එම ස්ථාවර වත්කම් 2011 මාර්තු 31 දිනට පසුව නමුත් 2015 අප්‍රේල් 1 දිනට පෙර අත්පත් කරගෙන තිබිය යුතුය. එසේ වුවත්, උක්ත වගන්තියෙහි සඳහන් බදු නිදහස ලබා ගැනීම සඳහා සිදු කළ යුතු ආයෝජනය, සමාගම විසින් 2013 වර්ෂයේ සිට ම පවත්වා ගෙන ගොස් නොමැති බව නිරීක්ෂණය විය.

(iii) ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය මඟින් පහසුකම් සපයන ආයෝජන කලාපයක ද ව්‍යාපාර කටයුතු කර ගෙන යමින් පවතින උක්ත සමාගම විසින් ආයෝජන මණ්ඩලය යටතේ, බදු නිදහස් බව දක්වා ඇති වුවත්, ඊට අදාළව බද්දෙන් නිදහස් බදු පනත අනුව ගණනය කරන ලද බදු අලාභය (Tax Losses) ඉදිරියට ගෙන යමින් ආයෝජන ආදායමින්, එම අලාභ අඩු කර ගෙන ඇති අතර, 2006 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධන) පනතේ 32 (5) (ආ) වගන්තිය අනුව එසේ බද්දෙන් නිදහස් ආදායමට අදාළ බදු අලාභ ඉදිරියට ගෙන යා නොහැකි බව දැක්වේ. ඒ අනුව ඉදිරියට ගෙන ගොස් ඇති අලාභ මුදල වූ රු. 368,067,927 මෙසේ ඉදිරියට ගෙන ගොස් සමාගමේ බදු අය විය යුතු වෙනත් ලාභ සඳහා හිලව් කළ හැකි ද යන්න විගණනයට ගැටළු සහගත විය.

30

(iv) මෙම සමාගමෙහි 2026 මාර්තු 20 දිනට VAT බදු ආපසු ගෙවිය යුතු වටිනාකම ලෙස රු. 12,574,056 ක් හා බදු ගෙවීම රු. 9,800,790 ක් බව RAMIS පද්ධතිය තුළ සඳහන් වී තිබුණි.

(II) **TIN අංක 17410xxxx දරන සමාගම**

RAMIS පද්ධතිය අනුව 2026 මාර්තු 20 දිනට මුළු බදු වගකීම රු. 27,273,119 ක් හා බදු ගෙවීම රු.30,011,542 ක් විය. එසේ බදු වගකීම ඉක්මවා බදු ගෙවීම් පැවතීමට බදු කාලච්ඡේදයන්හි බදු බැදියාව පද්ධතියෙහි උඩුගත නොවීම හේතුවෙන් බව නිරීක්ෂණය විය.

(III) **TIN අංක 17497xxxx දරන සමාගම**

RAMIS පද්ධතිය අනුව 2026 මාර්තු 20 දිනට මුළු බදු වගකීම රු. 866,748 ක් හා බදු ගෙවීම රු. 376,786 ක් විය.

(IV) **TIN අංක 10273xxxx දරන සමාගම**

RAMIS පද්ධතිය අනුව 2026 මාර්තු 20 දිනට මුළු බදු වගකීම රු. 13,350,679 ක් හා බදු ගෙවීම රු. 30,880,658 ක් විය.

(න) **2025 දෙසැම්බර් 31 දිනට අගරු චෙක්පත් පරීක්ෂාව**

(I) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අය කර ගැනීමට ඇති අගරු චෙක්පත් සංඛ්‍යාව 2,412 ක් වන අතර ඊට අදාළ වටිනාකම රු.මිලියන 1,461 ක් ලෙස විගණනයට, 2026 පෙබරවාරි 25 දිනැති ලිපිය මගින් වාර්තා කර තිබුණි.

(II) වැඩිම චෙක්පත් ප්‍රමාණයක් VAT බදු සඳහා අගරු වී තිබූ අතර, එය චෙක්පත් 1,777ක වටිනාකම රු. 960,900,912ක් බව නිරීක්ෂණය විය. තවද පිළිවෙළින් IIT, CIT හා PAYE බදු සඳහා චෙක්පත් 253ක්, 185ක් හා 88ක් අගරු වී ඇති අතර ඒවායෙහි අගරු වටිනාකම පිළිවෙළින් රු. 46,005,783, රු. 371,241,686 හා රු. 20,023,826 ක් විය.

(III) මෙම අගරු චෙක්පත් සම්බන්ධව 2024 අප්‍රේල් 04 දිනැති අංක 2378/33 අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් චෙක්පත් ඔස්සේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත සිදු කළ හැකි බදු ගෙවීම් සීමා කළ අතර, ඒ අනුව චෙක්පත් මගින් සිදු කළ හැකි VAT, SSCL සහ SD බදු වර්ග පමණක් වුවද, 2025 වර්ෂයෙහි අගරුව ඇති චෙක්පත් 142 තුළ වටිනාකම රු. 296,053,872 වූ චෙක්පත් 14ක් CIT හා PAYE සඳහා ද පවතින බව

නිරීක්ෂණය වූ අතර, ඉහත ගැසට් පත්‍රය මඟින් චෙක්පත් ඔස්සේ ගෙවීම් සිදු කිරීම සීමා කර ඇති අවස්ථාවක වුවද චෙක්පත් අගරු වීම තවදුරටත් පවතින බව නිරීක්ෂණය විය.

(IV) බදුකරුවන් 1,201ක් අතරින් එකම TIN අංකය යටතේ වැඩිම වාර ගණනක් චෙක්පත් අගරු වී ඇති අවස්ථා විගණනයට නිරීක්ෂණය වූ අතර නියැදි පරීක්ෂාවේ දී චෙක්පත් 10ක් හා ඊට වැඩි ප්‍රමාණයක් අගරු වී ඇති බදුකරුවන් 22ක් සිටින අතර TIN අංක 53238xxxx අදාළව VAT බදු සඳහා වටිනාකම රු. 4,672,729ක් වූ චෙක්පත් 23ක් ද, TIN අංක 69047xxxx අදාළව IIT සඳහා වටිනාකම රු. 1,247,778ක් වූ චෙක්පත් 22 ක් ද, TIN අංක 11400xxxx අදාළව VAT බදු සඳහා වටිනාකම රු. 4,785,613ක් වූ චෙක්පත් 21ක් ද අගරු වී තිබුණි.

TIN අංක 17407xxxx, 81214xxxx හා 64306xxxx සඳහා පිළිවෙළින් වටිනාකම රු. 23,704,757 වූ චෙක්පත් 13ක් ද, වටිනාකම රු. 16,000,000 වූ චෙක්පත් 10ක් ද, වටිනාකම රු. 12,352,198 වූ චෙක්පත් 14ක් ද, වැඩිම වටිනාකමක් සහිතව VAT බදුවලට අදාළව අගරුව ඇති බව නිරීක්ෂණය විය.

**(ප) දෙපාර්තමේන්තුව අනුගත වී ඇති තොරතුරු හා සයිබර් ආරක්ෂණ ක්‍රමවේදය සම්බන්ධ පරීක්ෂාව**

(I) 2022 අගෝස්තු 22 දින සිට ක්‍රියාත්මක කළ යුතු තොරතුරු හා සයිබර් ආරක්‍ෂණ ප්‍රතිපත්තියෙහි සඳහන් තොරතුරු ආරක්ෂණ නිලධාරී හා සහකාර තොරතුරු ආරක්ෂණ නිලධාරී යන තනතුරු 2023 අගෝස්තු 08 දින එනම් ආසන්න වශයෙන් වසරකට පමණ පසුව පත් කර තිබුණි. තවද මෙම තනතුරු සඳහා වූ නාමයෝජනා සහිත වාර්තාව 2023 වර්ෂයේ ශ්‍රී ලංකා සර්ට් ආයතනය වෙත ඉදිරිපත් කර ඇති නමුත් මේ වන විට එහි පිටපතක් සොයාගැනීමට නොහැකි බව දක්වා ඇත.දෙපාර්තමේන්තුව සිය අභ්‍යන්තර විගණන නිලධාරී වෙත තොරතුරු හා සයිබර් ආරක්‍ෂණ විගණන වගකීම් පවරා දී නොතිබුණු අතර තොරතුරු ආරක්ෂණ කමිටු හා අවදානම් කළමනාකරණ කමිටු දෙපාර්තමේන්තුව තුළ පිහිටුවා නොතිබුණි. තවද තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහතික වන ආකාරයේ ව්‍යාපෘති තම ක්‍රියාකාරී සැලසුමට ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි.

(II) වටිනාකමක් ඇති තොරතුරු වත්කම් හා තොරතුරු තාක්ෂණික වත්කම් මූලිකව හඳුනා ගැනීමක් සිදුකර තිබුණද එම වත්කම් සම්බන්ධයෙන් ලේඛනගත කිරීමක්, එහි සංවේදීතාව හෝ තීරණාත්මකභාවය මත වර්ගීකරණය කිරීමක්, එම වත්කම්වලට අදාළ හිමිකරුවන් හඳුනාගෙන තිබීම මෙන්ම එම වත්කම් සම්බන්ධයෙන් අවදානම් තක්සේරු කිරීම සිදුකර නොමැති අතර දෙපාර්තමේන්තුව සතු දත්ත ගබඩා කිරීමට පෙර මෙන්ම පරිගණක ජාල හා වෙනත් චැනලයන් හරහා ගමන් කිරීමට පෙර

32

කේතනය කිරීම සඳහා කටයුතු කර නොමැත. තවද පද්ධති ප්‍රවේශය සඳහා පරිශීලක නාමය හා මුරපදය පමණක් භාවිතා කරන අතර බහු සාධක සත්‍යාපන ක්‍රමවේදයක් භාවිතා නොවේ. එමෙන්ම ශ්‍රී ලංකා සර්ට් ආයතනය විසින් සම්මතයක් ලෙස පරිශීලකයන්ගේ සියලුම මුරපද දින 90 කට වරක් වෙනස් කළ යුතුය යනුවෙන් දක්වා ඇති නමුත් දෙපාර්තමේන්තුවට අනුව එය දින 180 ක් වැනි දීර්ඝ කාලසීමාවක් බව නිරීක්ෂණය විය.

(ඛ) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතට අනුව සමාජ ආරක්ෂණ දායකත්ව බද්දට (SSCL) යටත් පිරිවැටුම මත සෑම බදු අය කළ හැකි තැනැත්තෙකුම 2022 ඔක්තෝම්බර් 01 වන දින හෝ එදිනට පසු සෑම කාර්තුවක් සඳහාම සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද ගෙවිය යුතුය. ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් ඉන්ධන පිරවුම් බලපත්‍රලාභීන්ගෙන් අයකරනු ලබන එක් ගාස්තුවක් වන තෙල් පොම්ප කිරීමේ ගාස්තුව (pumping charges) බදු නිදහස් ගාස්තුවක් සේ සලකා කටයුතු කර තිබුණද එම ගාස්තු සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ පළමු උපලේඛනයේ II වන කොටසේ අයිතම 4 යටතේ නිදහස් සේවාවක් ලෙස සැලකිය නොහැකි බව නිරීක්ෂණය වූ අතර ඒ අනුව සමාජ ආරක්ෂක බදු වාර්තාවලට ඇතුලත් නොකරන ලද තෙල් පොම්ප කිරීමේ ගාස්තුව 2022, 2023 හා 2024 වර්ෂවල පිළිවෙලින් රු.115,462,139, රු.420,136,784 හා රු.499,683,324ක් වන බවත් ගෙවිය යුතු සමාජ ආරක්ෂණ දායකත්ව බදු ප්‍රමාණය දළ වශයෙන් රු.25,882,056 ක් බවද එයින් 2240, 2310 කාර්තු සඳහා පමණක් අතිරේක තක්සේරු නිකුත් කර ඇති බවද විගණනයට නිරීක්ෂණය විය.

### 4.1.2 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

**(අ) RAMIS පද්ධතියේ කාර්යය සාධනය පරීක්ෂාව-2025**

(I) RAMIS පද්ධතිය සංවර්ධනය කිරීමේ ගිවිසුම් ලෙස RAMIS 1.0 සඳහා 2014 මැයි 27 දින සිංගප්පූරු ඩොලර් 35,006,646ක් ද, RAMIS 2.0 අදියර A සඳහා සිංගප්පූරු ඩොලර් 1,760,000 (රු.මිලියන 265ක් පමණ) ක් ද, 2.0 අදියර B සඳහා සිංගප්පූරු ඩොලර් 15,534,364 (රු.බිලියන 2.3ක් පමණ) ක් ද ගිවිසුම් ගත වී තිබුණි. 2024 ජනවාරි 31 දක්වා වසර 03කට සිංගප්පූරු ඩොලර් 21,053,371කට (රු.බි. 3.1 ක් පමණ) නඩත්තු සේවා කොන්ත්‍රාත්තුව සිංගප්පූරු සහයෝගිතා ආයතනයේ උප කොන්ත්‍රාත්කරුවකු වෙත ලබා දී තිබුණි. RAMIS පද්ධතිය නඩත්තු කිරීමේ කොන්ත්‍රාත්තුව 2024 පෙබරවාරි සිට 2027 ජනවාරි දක්වා වසර 3කින් දීර්ඝ කිරීම සඳහා සකසන ගිවිසුමේ වටිනාකම සිංගප්පූර් ඩොලර් (SGD) 31,808,289ක් බව ද වාර්තා කර තිබුණි. එම ගිවිසුම 2027 ජනවාරි 31 දිනෙන් අවසන් වන අතර RAMIS පද්ධතිය පවරාගැනීමට අවශ්‍ය මානව සහ භෞතික සම්පත් සංවර්ධනය කර නොමැති

33

වීමෙන් ගිවිසුම් පරිදි RAMIS පද්ධතිය පවරාගැනීමට නොහැකි වන බව නිරීක්ෂණය කෙරේ.

(II) RAMIS පද්ධතිය ක්‍රියාත්මක වීමේදී ඇති වන ගැටළු සඳහා RAMIS පද්ධතියෙහි යම් යම් වෙනස්කම් සිදු කරනු ලබන බවත්, මේ සඳහා සිංගප්පූරු ආයතනයට එම වෙනස්කම් සිදු කිරීමට ගත වන මිනිස් දිනක් සඳහා සිංගප්පූරු ඩොලර් 1,333ක් එනම් දල වශයෙන් රු.291,000ක් වැය වන බවත්, එම මුදල නව ගිවිසුම යටතේ සිංගප්පූරු ඩොලර් 1,400 වන දල වශයෙන් රු.305,200 ලෙස වැඩි කර ඇති අතර ඒ අනුව එම ආයතනයට මොඩියුල සංවර්ධනය කිරීමට ගෙවන ඉහත දක්වා ඇති පිරිවැයට අමතරව, මෙසේ සිදු කළ වෙනස්කම් සඳහා 2025 වර්ෂයේ දී රු.මිලියන 3,268 ක් පමණ ගෙවා තිබුණු බව ද නියැදි විගණන පරීක්ෂාවේ දී නිරීක්ෂණය විය.

(III) RAMIS පද්ධතියට ආයතන 29ක් සම්බන්ධ කිරීම අදියර 4ක් යටතේ සිදු කිරීමටත් එහිදී , දැනටමත් ශ්‍රී ලංකා රේගුව, මහජන බැංකුව, ලංකා බැංකුව, මුදල් අමාත්‍යාංශය, සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව, ලංකා ක්ලියර් පුද්ගලික සමාගම යන ආයතන 06 සම්බන්ධ කර ඇති නමුත්, ආගමන විගමන දෙපාර්තුමේන්තුව, මෝටර්රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තුමේන්තුව හා සුරාබදු දෙපාර්තමේන්තුව යන ආයතන 05 විවිධ ගැටළු පැවතීම හේතුවෙන් මෙතෙක් සම්බන්ධ කර නොමැති බව ද නිරීක්ෂණය විය.

(IV) RAMIS ව්‍යාපෘතිය යටතේ සිංගප්පූරු ආයතනය මගින් ක්‍රියාත්මක වූ ඇමතුම් මධ්‍යස්ථාන සේවාව (Call Center) දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව වෙත පවරාගෙන වර්ෂයකට රු.33,844,000ක වැට් රහිත මුදලක් ගෙවීමට යටත්ව 2021 අප්‍රේල් 01 දින සිට 2023 මැයි 31 දින දක්වා වූ වර්ෂ 02කට වැඩි කාලයක් සඳහා N-able (pvt) Ltd ආයතනය යටතේ පවත්වාගෙන යනු ලැබූ අතර නැවතත් 2023 ජූනි 01 සිට 2025 මාර්තු 31 දින දක්වා වර්ෂ 2 ක කාලයක් වැට් බදු රහිතව රු. 76,700,000 ක මුදලකට අදාළ කොන්ත්‍රාත්තුව දිර්ඝ කිරීමට මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලැබී තිබුණු අතර මෙම ඇමතුම් මධ්‍යස්ථාන සේවාව පවත්වා ගෙන යාම සඳහා දෙපාර්තමේන්තුව සතුව භෞතික හා මානව සම්පත් නොමැති වීම මත මෙම කොන්තාත්තුව තවදුරටත් 2025 නොවැම්බර් 30 දක්වා දීර්ඝ කර ඇති අතර ඒ වෙනුවෙන් 2025 වර්ෂය සඳහා රු. 47,937,500ක අතිරේක වියදම් දරා ඇති බව ද නිරීක්ෂණය විය.තවද 2025 දෙසැම්බර් 01 සිට 2026 නොවැම්බර් 30 දින දක්වා නව කොන්ත්‍රාත් ගිවිසුමකටද දෙපාර්තමේන්තු එළැඹ තිබූ නමුදු මේ දක්වා කාර්යය මණ්ඩල පුහුණුව සම්බන්ධව සාධනීය පියවරක් ගෙන නොතිබුණි.

34

(V) RAMIS ක්‍රියාත්මක කිරීමේ අදියර II යටතේ පද්ධතිගත කිරීමට අපේක්ෂා කරන ලද ඉහළ බදු ප්‍රතිශතයක් රැස් කරන ඔට්ටු හා සූදු බද්දට අදාළ පරිපාලන කටයුතු දිගු කාලයක් ගත වී ඇතත් ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය මඟින් සිදු නොවන බව නිරීක්ෂණය විය.

### 4.1.3 ප්‍රසම්පාදනයන්

(අ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ භාවිතයේ පවතින පරිගණක බොහෝ ප්‍රමාණයක් වර්ෂ 10 ඉක්මවීම හා යොදාගන්නා මෘදුකාංග කල් ඉකුත් වී තිබීම මත යාවත්කාලීන වූ නවීන පරිගණක සම්පාදනය කර ගැනීමේ අවශ්‍යතාවය මත දෙපාර්තමේන්තුව් සඳහා ඩෙස්ක්ටොප් පරිගණක 1000 ක් මිලදී ගැනීමේ ප්‍රසම්පාදනය ක්‍රියාවලිය 2024 වර්ෂයේදී ආරම්භ කර තිබුණද පිරිවිතර සහ ලංසු ලේඛන නිවැරදිව පිළියෙල නොකිරීම හේතුවෙන් මහාපරිමාණ ප්‍රසම්පාදන කමිටු තීරණය මත 2025 වර්ෂය තුල පරිගණක අවශ්‍යතාවය නැවතත් විශ්ලේෂණය කර ලංසු කැඳවා තිබුණි.එහිදී විධිමත් ලංසු ඇගයුම් කමිටු වාර්තා තීරණය අනුව සියළුම ලංසුකරුවන් විසින් ඉදිරිපත් කරන ලද ලංසු ප්‍රතික්ෂේප කර තිබුණද ඊට හේතු වී ඇති කරුණු , විශාල බැහැර වීම් ද, සුළු බැහැරවීම් ද යන්න නිවැරදිව හඳුනාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) 2025 ඔක්තෝබර් 29 දින පැවති ලංසු ඇගයීම් කමිටු වාර්තාව අනුව සියලුම ලංසු ප්‍රතික්ෂේප කර ඩෙස්ක්ටොප් පරිගණක ප්‍රසම්පාදන සඳහා නැවත මිල ගණන් කැඳවීම සුදුසු බව නිර්දේශ කර තිබුණු අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා වසරකට අධික කාලයක් ගත කර නැවතත් මූලික ප්‍රසම්පාදන කටයුතු සඳහා ප්‍රවේශ වීමට සිදුව තිබුණි තවද දෙපාර්තමේන්තුව මූලික ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීම සිදු කරන විට දෙපාර්තමේන්තු සඳහා වූ පරිගණක අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගෙන හා දෙපාර්තමේන්තුව අවශ්‍යතාවයට ගැලපෙන පරිදි පිරිවිතර සකස් කිරීම මූලික අදියරේදීම සිදුකර නොතිබීමෙන් 2025 නොවැම්බර් මස ප්‍රසම්පාදන කමිටුව විසින් යලිත් වරක් පරිගණක අවශ්‍යතාවය සලකා බැලීමට උපදෙස් ලබාදී තිබුණි. තවද, දෙපාර්තමේන්තු කටයුතු බාධාවකින් තොරව සුමටව පවත්වාගෙන යාමටත්, 2025 වර්ෂයේදී නව බඳවා ගැනීම් සිදු කල සහකාර කොමසාරිස්වරුන් සඳහා ද ඔහුන්ගේ කටයුතු කාර්යක්ෂමව සිදු කරගෙන යාම සඳහා අවශ්‍ය වන ධාරිතාවයකින් යුතු ඩෙස්ක්ටොප් පරිගණක යන්ත්‍ර හඳුනාගෙන ඒවා මිලදී ගැනීමට වසර 2 කට ආසන්න කාලයක් ගත වී ඇතත්, මේ වන තෙක් එම ප්‍රසම්පාදනයන් සිදු කිරීමට අපොහොසත් වී තිබුණි.

(ඇ) මිල පැවරුම් විගණනයන් සිදුකිරීම සඳහා සන්සන්දනාත්මකව විශ්ලේෂණය කරන ලද දත්ත පද්ධතියක අවශ්‍යතාව සඳහා Capitaline ඉන්දියානු දත්ත පද්ධතිය 2025 වර්ෂය සඳහා අනුසන් කිරීම සඳහා වූ ප්‍රසම්පාදන කමිටු අනුමැතිය මත දත්ත පද්ධතිය මිලදී ගෙන

තිබුණද පද්ධතිය දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවයට ප්‍රමාණවත් නොවන බව හා එයින් ආවරණය වන්නේ ඉතා සීමිත පරිමාණයක් බවටද එම වාර්තාව මඟින්ම අනාවරණය කර තිබුණි.

(ඈ) ප්‍රධාන කාර්යාල විදුලි ජනන යන්ත්‍ර නඩත්තු ප්‍රසම්පාදනය සඳහා මහා පරිමාණ ප්‍රසම්පාදන කමිටු තීරණය අනුව Trade Promoters (Pvt) Ltd ආයතනය සමඟ පැවති ගිවිසුමට අදාළව 2025 මාර්තු 01 දින සිට මාස 03 ක් දක්වා දීර්ඝ කර ඇති කාලය සඳහා වූ කාර්යසාධන ඇපකරය ලබා දී නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන ක්‍රියාකාරකම් සඳහා සමස්ත ඇස්තමේන්තු ගත වියදම හා 2025 වර්ෂයට එහි භෞතික ප්‍රගතිය සලකා බැලීමේදී 2025 දෙසැම්බර් 31 දිනට ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් අපේක්ෂිත ප්‍රගතිය ලගා කර නොගත් ප්‍රසම්පාදන අයිතමයන් 22ක් හා වියදම් සිදු කර ඇති නමුත් භෞතික ප්‍රගතිය හඳුනා ගෙන නොමැති ප්‍රසම්පාදන අයිතමයන් 08ක් හා වර්ෂය තුලදී කිසිදු වියදමක් සිදු කර නොතිබුණු ප්‍රසම්පාදන අයිතමයන් 30ක් විය.

(ඊ) 2025 වර්ෂයේදී සංශෝධිත ප්‍රසම්පාදන සැලැස්මෙහි දක්වා ඇති ඇස්තමේන්තුගත වියදම ඉක්මවා 2025 දෙසැම්බර් 31 දිනට වියදම් සිදු කර ඇති ප්‍රසම්පාදන අයිතමයන් 22ක් තිබුණු අතර විගණනයට ඉදිරිපත් කර ඇති ප්‍රසම්පාදන ප්‍රගති ලේඛනය අනුව ප්‍රසම්පාදන අයිතම සඳහා දක්වා ඇති වියදම්, දෙපාර්තමේන්තු වැය ශීර්ෂ සඳහා වූ වියදම් වාර්තාව හා සැසඳීමේදී ප්‍රසම්පාදන ප්‍රගති ලේඛනයේ වැය ශීර්ෂ සඳහා දක්වා ඇති වියදම් වටිනාකම්වල රු.182,838,269 ක වෙනසක් පැවතුනි.

(උ) දෙපාර්තමේන්තුවේ CCTV කැමරා පද්ධතිය රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ අධීක්ෂණය යටතේ පෞද්ගලික ආයතනයක් විසින් සම්පූර්ණ කර 2010 මැයි මසදී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට භාර දී තිබුණු අතර ඒ වන විටද අවුරුද්දක වගකීම් කාලය ඉක්ම ගොස් තිබුණි. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් එය දෙපාර්තමේන්තුව වෙත විධිමත්ව භාර දී තිබූ බවට තහවුරු කල හැකි සාක්ෂි ඉදිරිපත් වී නොතිබූ අතර, මේ වන තුරු භාවිතයට ගෙන නොතිබුණු CCTV කැමරා 70 ක්‍රියාකාරී තත්ත්වයේද නොපැවති අතර මේ සඳහා දරන ලද පිරිවැය ලිපිගොනු අනුව රු. 7,985,992 ක් වී තිබුණි.

4.1.4 **වත්කම් කළමනාකරණය**

(අ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල නවීකරණයේදී දෙපාර්තමේන්තුව වෙත සපයා තිබුණු ට්‍රාන්ස්පොමර් යන්ත්‍ර 02 ප්‍රධාන විදුලි පද්ධතියට සම්බන්ධ කර නොතිබීම නිසා එම යන්ත්‍ර 2010 වර්ෂයේ සිටම භාවිතයට ගෙන නොතිබුණු අතර, මේ වන විට වර්ෂ 15 කට ආසන්න කාලයක් නිශ්ක්‍රියව පැවත තිබුණි.

(ආ) මහනුවර ප්‍රාදේශීය කාර්යාලයීය කොමසාරිස් නිල කාමරය තුල සවිකර තිබූ දෙපාර්තමේන්තුවේ RAMIS පද්ධතිය හා සම්බන්ධ ප්‍රධාන RAMIS සර්වරය ( RAMIS Server Rac Unit) නියමිත ජාත්‍යන්තර ප්‍රමිත අනුව නියමිත ඉඩ ප්‍රමාණයන් පවත්වා ගනිමින් ආරක්ෂිතව ස්ථානගත කර නොතිබුණි.

(ඇ) 2018 වර්ෂයේදී මහනුවර ප්‍රාදේශීය කාර්යාලය සඳහා මිලදී ගෙන ඇති CUMMINS වර්ගයේ විදුලි ජනන යන්ත්‍රයේ 2020 වර්ෂයේ සිට වාර සේවා නඩත්තුව සිදුකර නොතිබූ අතර විදුලි ජනන යන්ත්‍රය සඳහා ඉන්ධන අත්තිකාරම ඉල්ලීමේදී විදුලි විසන්ධි වීම සම්බන්ධ වාර්තාවක් විදුලි බල මණ්ඩල ඉංජිනේරු හරහා ලබා ගෙන ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් විදුලි ජනන යන්ත්‍රය නිසි පරිදි උපයෝජනය නොවී පැවතුනි.

(ඈ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ බාහිර ආවරණ තහඩු( Cladding Sheet) සවි කිරීමෙන් පසු 2017 වර්ෂයේ සිට මේ දක්වා එම තහඩු වරින් වර ගැලවී ගොස් තිබුණු අතර, එම අවදානම සම්බන්ධව දෙපාර්තමේන්තුවේ ආරක්ෂක අංශ නිරන්තරයෙන් වාර්තා කර තිබුණි.තවද එම ආවරණ තහඩු විධිමත් පරිදි නඩත්තු නොවීමෙන් මහල් 15 කින් සමන්විත ජනාකීර්ණ ස්ථානයක පැවති දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ ඉහළ මහලක පිටත ආවරණ තහඩු(Cladding Sheet) ගැලවී ගොස් විශාල අනතුරක් සිදුවීමේ අවදානමක් ඉදිරියේදී ද පැවතුනි. තවද සෙලවෙන ආවරණ තහඩු සිර කිරීමට සහ බිමට වැටීමේ අවදානම ඇති ආවරණ තහඩු ආවරණ ගලවා ඉවත් කිරීම සඳහා 2017 වර්ෂයේ සිට මේ දක්වා වරින් වර එකතු වටිනාකම රු. 1,145,658 ක් පෞද්ගලික ආයතනයට ගෙවා තිබුණද 2026 මැයි 15 දිනා වන විටද අවදානමක් පවතින ආවරණ තහඩු ඉවත් කර සහ ගලවා ඉවත් කරන ලද ආවරණ තහඩු සඳහා නැවත සවි කිරීමක් සිදු කිරීමට විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) මහනුවර ප්‍රාදේශීය කාර්යාලයේ ඉහළ මහලේ කොටසක පවත්වාගෙන තිබූ දෙපාර්තමේන්තු ලේඛනාගාරයේ ධාරිතාවය ඉක්මවා පැරණි ලිපිගොනු අසුරා තිබූ අතර තවදුරටත් ලේඛනාගාරය පුළුල් කිරීමේ හැකියාවක් නිරීක්ෂණය නොවූ අතර ලේඛනාගාරයේ පවතින ලේඛන ක්‍රමවත්ව සුචිගත කිරීමක්ද සිදුවී නොතිබුණි.

(ඊ) සමූපකාර තොග වෙළඳ සංස්ථාව වෙතින් දෙපාර්තමේන්තුව වෙත ලැබී තිබුණ ජාවත්ත ප්‍රාදේශීය කාර්යාලය පිහිටි ගොඩනැගිල්ල සම්බන්ධ ප්‍රසම්පාදන, ඉන්වෙන්ට්‍රි භාරදීම හා භාරගැනීම හෝ අයිතිය තහවුරු කිරීමට අදාළ නිශ්චිත ලේඛන නොපැවතුණි.

37

### 4.1.5 පාඩු හා හානි

මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව පාඩුවක් හෝ අලාභයක් සිදු වූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චය වශයෙන් දැන ගැනීමත් එයට වගකිව යුත්තන් නිශ්චය කිරීමත් සඳහා පරීක්ෂණ ආරම්භ කිරීම හා මුදල් රෙගුලාසි 105 අනුව අලාභයට වගකිව යුතු නිලධාරීන්ගෙන් ඒ සඳහා ගෙවිය යුතු උපරිම අගයත් නිශ්චය කර එම මුදල පූර්ණය කරන ලෙස ඔහුන්ට නියම කොට එය අයකර ගැනීමට හෝ එමෙන්ම මුදල් රෙගුලාසි 109 ප්‍රකාරව පොතෙන් අස්කිරීමේ නියෝගය යටතේ කපා හැරීමක් සිදු කිරීමට කටයුතු කර නොමැති රු.4,747,639 ක ශේෂයක් 2025 දෙසැම්බර් මස 31 දිනට පැවතුණි.

### 4.1.6 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම

සමාලෝචිත වර්ෂයේ විගණනයට අදාළව නිකුත් කරන ලද විගණන විමසුම් 06 කට දෙපාර්තමේන්තුව විසින් නියමිත කාලය තුල පිළිතුරු ලබාදී නොතිබුණු අතර යථෝක්ත විමසුම්වලින් රු.මිලියන 324,252 ක වටිනාකමකින් යුතු කරුණු සම්බන්ධයෙන් විමසීම් කර තිබුණි.

### 4.1.7 කළමනාකරණ දුර්වලතා

(අ) 2022-2025 කාලපරිච්ඡේදයට අදාලව විනය චෝදනාවන්ට ලක් වූ දෙපාර්තමේන්තු නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණ පැවැත්වීම සඳහා විවෘත කල මූලික විමර්ශන ගොනු 30 කින් කිසිදු ගොනුවක් සඳහා කාලපරිච්ඡේදය අවසානයේ චෝදනා කෙටුම්පත් කර විධිමත් පරීක්ෂණ පවත්වා අවසන් කර නොතිබුණි.

### 4.1.8 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුයුක්ත කාර්යමණ්ඩලය, තථ්‍ය කාර්යමණ්ඩලය**

(I) 2025 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ 2,868ක් වූ සමස්ථ අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 14 ක් වූ තනතුරු 414 ක් පුරප්පාඩුව පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු සංඛ්‍යාව 222 ක් එනම් අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 18 ක් විය. 2026 මැයි 15 දින වන විට ප්‍රධාන මූල්‍ය නිලධාරි තනතුර පිරවී තිබුණද අනෙකුත් තනතුරු මේ දක්වා පුරප්පාඩුව පැවතුනි. තවද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ නොවන සේවක කාණ්ඩය යටතේ සමස්ථ පුරප්පාඩු සංඛ්‍යාව 192 ක් එනම් සියයට 12 ක් වී තිබුණි.

(II) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් තනතුර සඳහා අනුමත වූ සේවක සංඛ්‍යාව 90ක් වන අතර 2025 දෙසැම්බර් 31 දිනට නිත්‍ය නිලධාරින් 54කින් හා වැඩ බලන නිලධාරින් 36කින් තනතුරු සංඛ්‍යාව සම්පූර්ණ කර ඇති නමුත් දේශීය ආදායම්

සේවයේ නිලධාරින්ගේ පුරප්පාඩු පැවතියද දේශීය ආදායම් සේවයේ I ශ්‍රේණියේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්වරුන් තිදෙනෙකු හා දේශීය ආදායම් සේවයේ II ශ්‍රේණියේ නියෝජ්‍ය කොමසාරිස්වරයෙකු වෙනත් පාර්ශවයන්ට නිදහස් කර තිබූ අතර ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සේවයේ පුරප්පාඩුව පැවති නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ තනතුරු 06 ක් සඳහා නිලධාරින් බඳවා ගැනීමේ ප්‍රමාදය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ(RAMIS) නඩත්තු කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමේදී අහිතකර බලපෑමක් ඇති වී තිබුණි.

(III) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ MN-6 කාණ්ඩයේ නිලධාරින් නොපමාව බඳවා ගැනීමට අනුමැතිය ලබා දී තිබුන ද තොරතුරු තාක්ෂණ නිලධාරි තනතුරු 26 ක බඳවා ගැනීමේ පවතින ප්‍රමාදය දේශීය ආදායම් දෙපාර්මේන්තුවේ ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතියේ කටයුතු සඳහා සෘජුව බලපෑමක් ඇති කර තිබුණි.

(IV) ප්‍රාථමික මට්ටමේ සේවක කාණ්ඩයට අයත් දෙපාර්තමේන්තුගත තනතුරක් වන ගොඩනැගිලි පරීක්ෂක හා සංචාරක බංගලා භාරකරු තනතුරු වර්ෂ ගණනාවක සිට පුරප්පාඩුව පැවතිය ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටද එම තනතුරු සඳහා කිසිදු නිලධාරියෙකු බඳවා ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණු අතර රියදුරු තනතුරු 21ක් හා කාර්යාල කාර්යය සහායක තනතුරු 87ක් පුරප්පාඩුව පැවතීම දෙපාර්තමේන්තුවේ දෛනික කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට දැඩි බලපෑම් ඇතිවී තිබුණි.

(V) රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනය කිරීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 02/2018 හා 02/2018 (1) අනුව සියලු රාජ්‍ය ආයතනයන්හි දීර්ඝ කාලීන මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමේ අවශ්‍යතාවය පෙන්වා දී ඇති නමුදු දෙපාර්තමේන්තුවට අදාලව 2025 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

එස්.රත්නවීර
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

**2025 වර්ෂය තුළ උසස්වීම්**

| | නම | උසස්වීම ලද දිනය | ස්ථිර තනතුර | වර්තමාන තනතුර |
|---|---|---|---|---|
| 1 | එල්.කේ. රත්නායක මයා | 2025.03.24 | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| 2 | ජේ.එම්.එස්.එස්. රත්නවර්ධන මයා | 2025.06.27 | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් |
| 3 | කේ.ජී.පී.කේ. ධර්මවර්ධන මයා | 2025.11.19 | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (වැඩබලන) |
| 4 | එන්.එම්.ඒ.කේ.බී. නාපාන මයා | 2025.12.18 | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් (වැඩබලන) |
| 5 | ඒ.එම්. නෆීල් මයා | 2025.01.28 | කොමසාරිස් | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (වැඩබලන) |
| 6 | ඩබ්.ඒ.ඩී. වලිමිණි මයා | 2025.03.24 | කොමසාරිස් | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (වැඩබලන) |
| 7 | ඒ.කේ. ලොකුබාලසූරිය මයා | 2025.06.27 | කොමසාරිස් | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (වැඩබලන) |
| 8 | ජේ.එන්. රාජපක්ෂ මෙනවිය | 2025.07.29 | කොමසාරිස් | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (වැඩබලන) |
| 9 | එම්.ඒ.වී. ජයසිරි මයා | 2025.10.15 | කොමසාරිස් | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (වැඩබලන) |
| 10 | ඒ.එල්.ඩී. සංජීව මයා | 2025.11.19 | කොමසාරිස් | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (වැඩබලන) |
| 11 | එස්.අයි. අසන්ති මිය | 2025.12.18 | කොමසාරිස් | ජ්‍යෙෂ්ඨ කොමසාරිස් (වැඩබලන) |
| 12 | ඩී.අයි.යූ.කේ. ඩයස් මයා | 2025.01.10 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 13 | එච්.එච්.එම්.එම්.කේ. හේරත් මිය | 2025.01.23 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 14 | පී.එන්. කුමාර මයා | 2025.01.28 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 15 | ජී.වී.අයි.පී. නානායක්කාර මයා | 2025.02.03 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 16 | ඩී.ජී. දිසානායක මයා | 2025.02.06 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 17 | පී. බාල්රාජ් මයා | 2025.02.28 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |

| | | | | |
|---|---|---|---|---|
| 18 | වයි.එස්.බී. කුසුම්සිරි මයා | 2025.05.02 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 19 | ටී.කේ. ජයරත්න මිය | 2025.06.23 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 20 | පී.එච්. ගුණවර්ධන මයා | 2025.07.01 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 21 | ආර්.ඒ.එම්. පෙරේරා මිය | 2025.07.29 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 22 | කේ.ජී.ආර්. ධර්මශ්‍රී මිය | 2025.07.31 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 23 | එස්.කේ.ජේ. ජයවර්ධන මිය | 2025.09.11 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 24 | ජේ.එස්.යූ.වී. ද සිල්වා මයා | 2025.10.15 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 25 | එම්.ටී.එස්. නිලන්ති මිය | 2025.11.19 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 26 | කේ.ජී.ජේ.එන්. දේශප්‍රිය මයා | 2025.12.07 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 27 | සී.ජේ. ගුණරත්න මිය | 2025.12.07 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 28 | එස්.කේ.එන්. සුජානි මිය | 2025.12.18 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 29 | පී.ඩී.එස්.ඩී. ජයනන්ද මයා | 2025.12.20 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |
| 30 | එච්.ටී.ජී.එල්.ආර්. අබේසේකර මයා | 2025.12.28 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොමසාරිස් (වැඩබලන) |

## දේශීය ආදායම් සේවයේ විශ්‍රාම ගත් නිලධාරීන්

| | නම | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුළ සේවා කාලය | | තනතුර |
|---|---|---|---|---|
| | | සිට | දක්වා | |
| 1. | ඩබ්.ජී. විජේදාස මයා | 1998.11.16 | 2025.01.09 | කොමසාරිස් |
| 2. | ටී.එම්.පී.බී. තෙල්වඩන මයා | 1993.10.18 | 2025.01.23 | කොමසාරිස් (වැඩබලන) |
| 3. | එස්.ඒ.ආර්. ප්‍රේමසිරි මයා | 1999.07.01 | 2025.02.06 | කොමසාරිස් |
| 4. | එල්.ඒ.එස්.කේ. පෙරේරා මයා | 1993.08.02 | 2025.05.02 | කොමසාරිස් |
| 5. | එල්.එම්.එස්.පී. වික්‍රමසිංහ මයා | 1993.08.02 | 2025.02.01 | කොමසාරිස් (වැඩබලන) |
| 6. | එස්.පී.කේ. ගුණරත්න මයා | 1998.11.16 | 2025.06.23 | කොමසාරිස් |
| 7. | ජී.පී.ඩබ්. සෙනෙවිරත්න මයා | 1998.11.16 | 2025.07.31 | කොමසාරිස් |
| 8. | කේ.ටී.යූ. පද්මිණී මිය | 1993.08.02 | 2025.09.11 | කොමසාරිස් |
| 9. | ආර්.ඩබ්.ඒ.ජී. රාජපක්ෂ මිය | 1993.10.18 | 2025.12.07 | කොමසාරිස් |
| 10. | බී.එම්.ටී.කේ. බාලසූරිය මිය | 1998.11.16 | 2025.12.07 | කොමසාරිස් (වැඩබලන) |
| 11. | එච්.එස්.කේ. මුණසිංහ මිය | 1994.03.01 | 2025.12.28 | කොමසාරිස් (වැඩබලන) |
| 12. | එච්.ආර්. සනත් මයා | 1999.07.01 | 2025.12.30 | කොමසාරිස් |
| 13. | කේ.ඩී.ජී. තිලකරත්න මයා | 1993.10.18 | 2025.01.12 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 14. | ආර්.එච්.එම්.ඒ. හේමමාලි මිය | 1993.10.18 | 2025.02.08 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 15. | කේ.ඒ.පී.ආර්. ගුණරත්න මිය | 1993.10.18 | 2025.04.07 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 16. | එස්.එච්.පී.සී.එස්. පෙරේරා මිය | 2007.01.01 | 2025.04.09 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 17. | එම්.ජේ.ආර්. මුණසිංහ මයා | 1993.08.02 | 2025.05.07 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 18. | ඩබ්.එම්.එස්.එස්. වලිසුන්දර මයා | 1993.08.02 | 2025.07.12 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 19. | කේ.පී.පී. නිල්මිණී කුමාරි මිය | 1993.08.02 | 2025.07.15 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 20. | පී.කේ.පී. ජයතිලක මයා | 1993.08.02 | 2025.07.20 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 21. | ඩබ්.ඩබ්. සුනේත්‍රා මිය | 1993.10.18 | 2025.08.14 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 22. | ඩබ්.වයි.එම්. නසීම් මයා | 1993.08.02 | 2025.09.13 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 23. | එම්.එම්. කොරේරා මිය | 1993.08.02 | 2025.10.29 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 24. | ජේ.එච්.එම්.ඒ. ජයපත්ම මයා | 1993.08.02 | 2025.11.05 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 25. | එච්.පීකේ.අයි. කල්දේරා මයා | 1993.10.18 | 2025.11.20 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 26. | පී.ඩී.ආර්.ඩී. පෙරමුණ මිය | 1993.08.02 | 2025.11.25 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 27. | ර්.ඒ.ජේ. රූපසිංහ මයා | 2007.11.15 | 2025.12.08 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 28. | ඩබ්.පී.පී. වීරසිංහ මිය | 1993.08.02 | 2025.12.29 | ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් |
| 29. | ර්.ඒ.එන්.ජේ. එදිරිසිංහ මයා | 1998.11.16 | 2025.02.19 | නියෝජ්‍ය කොමසාරිස් |
| 30. | එන්.පී. අටුපොලගේ මයා | 1998.11.16 | 2025.05.21 | නියෝජ්‍ය කොමසාරිස් |
| 31. | එච්.කේ.ජී. ප්‍රියංක ලාල් මයා | 1998.11.16 | 2025.08.27 | නියෝජ්‍ය කොමසාරිස් |
| 32. | කේ.පී.ඒ. වීරසූරිය මයා | 2007.04.03 | 2025.09.22 | නියෝජ්‍ය කොමසාරිස් |
| 33. | ඩී.එස්.ආර්. වික්‍රමාරච්චි මයා | 2007.04.03 | 2025.10.27 | නියෝජ්‍ය කොමසාරිස් |
| 34. | ආර්.පී. දයානන්ද මයා | 1998.11.16 | 2025.12.06 | නියෝජ්‍ය කොමසාරිස් |
| 35. | කේ.එච්.සී. ජයසිරි මිය | 1999.07.01 | 2025.01.01 | සහකාර කොමසාරිස් |
| 36. | එච්.එම්.යූ. ප්‍රේමකුමාර මයා | 2007.07.02 | 2025.06.04 | සහකාර කොමසාරිස් |

ඇමුණුම 11

## 2025 වර්ෂයේ දී පවත්වන ලද විදේශීය මානව සම්පත් සංවර්ධන වැඩසටහන්

| අංකය | වැඩසටහනේ නම | සහභාගිවූ අයගේ නම් සහ තනතුරු | රට | වැඩසටහනේ කාලසීමාව | මුළු ආයෝජනය (එක්සත් ජනපද ඩොලර්) | අරමුදල් සැපයීම | ප්‍රතිඵලය |
|---|---|---|---|---|---|---|---|
| 1 | ITEC Customized course on Taxation | 1. ඩබ්.කේ.එච්. සිරිමාන්න මිය - නියෝජ්‍ය කොමසාරිස්<br><br>2. ඩබ්.ආර්.එන්.එස්. කුමාරි මිය - නියෝජ්‍ය කොමසාරිස් | ඉන්දියාව | 13 ජන.<br>24 ජන. | 325 | ඉන්දියානු රජය | මෙම පාඨමාලාව තුළින් බදු නිලධාරීන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් හට ඉන්දීය බදු ක්‍රමවේදයෙහි කැපී පෙනෙන ලක්ෂණ වන භාණ්ඩ හා සේවා බද්ද (GST) සාර්ථකව ක්‍රියාත්මක කිරීම සහ පුද්ගලයන් රහිත ඇස්තමේන්තුකරණය (faceless assessment) වැනි ඩිජිටල් විද්‍යුත් පාලන පද්ධති කේන්ද්‍රීය කොටගත් බදුකරණය පිළිබඳ පුළුල් අවබෝධයක් ලබා දෙනු ලැබීය.<br><br>ඊට අමතරව මෙම පාඨමාලාව සඳහා සහභාගිවන්නන් හට ජාත්‍යන්තර බදු ගිවිසුම්, මිල පැවරුම්කරණය සහ උසස් විගණන ශිල්පීය ක්‍රම පිළිබඳ ප්‍රායෝගික විශේෂඥතාව ලබා ගත හැකි අතර, එමඟින් ආදායම් පරිපාලනය ප්‍රතිසංස්කරණ සහ ඔවුන්ගේ මව් රටවල බදු ගෙවන්නන්ගේ අනුකූලතාව වැඩි දියුණු කිරීමට ඔවුන්ට හැකියාව ලැබේ. අවසාන වශයෙන්, මෙම පාඨමාලාව තුළින් ඉන්දියාව සමඟ ද්විපාර්ශ්වික ආර්ථික සහයෝගීතාව ශක්තිමත් කරනු ලබන අතරම සංකීර්ණ මූල්‍ය අභියෝගවලට මුහුණ දීමට හැකියාව ඇති ගෝලීය බදු වෘත්තිකයන්ගේ ජාලයක් නිර්මාණ කිරීම සඳහා සහාය පිරිනමනු ලබයි. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2 | 2025 Dialogue on Public Finance & the Sustainable Development Goals | 1.එම්.කේ.පී.ජේ.එස්.එස්. පෙරේරා මයා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස්<br><br>2. එස්.ඩී.සී.මල්කාන්ති මිය - ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ඇමරිකා එක්සත් ජනපදය | 29 ජන.<br>31 ජන. | 150<br><br>උණුසුම් ඇඳුම් දීමනාව පවුම් 75 | එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන | බදු, වියදම් සහ ආයෝජන ප්‍රතිපත්ති ඒකාබද්ධ කිරීම තුළින් සංවර්ධනය වෙමින් පවතින රටවල ඉහළ යන ණය සේවාකරණ පිරිවැය, විශේෂයෙන් දැඩි මූල්‍යකරණ පරතරය පියවීම සම්බන්ධයෙන් මෙම පුහුණු වැඩසටහන යටතේ අවධානය යොමු කරන ලදී. ඒ අනුව ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ ඩිජිටල් පරිවර්තනය සඳහා ප්‍රමුඛත්වය පිරිනමමින් "ප්‍රතිඵල කේන්ද්‍රීය" මූල්‍ය ප්‍රතිපත්ති සඳහා විශේෂ අවධානය යොමු කරනු ලබන සංවර්ධනය සඳහා මූල්‍යකරණය පිළිබඳ සිව්වන ජාත්‍යන්තර සමුළුව (Fourth International Conference on Financing for Development (FfD4), සඳහා නිර්දේශ සකස් කරන ලදී.<br><br>විවිධ විභේදනයන්ට ලක් වූ මූල්‍ය පද්ධතිවලින් බැහැරව පොදු යහපත උදෙසා වූ ඒකාබද්ධ ප්‍රවේශයක් අනුගමනය කිරීම වෙනුවෙන් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP), ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF) සහ ලෝක බැංකුව වැනි ආයතන අතර ගෝලීය හවුල්කාරිත්වයන් මෙම වැඩසටහන මගින් වඩාත් ශක්තිමත් කරනු ලැබීය. |
| 3 | Simplification and Digitization of Tax Systems for the Commonwealth | 1. එම්.එල්.එස්.පී. ගුණතිලක මයා - කොමසාරිස්<br><br>2. ජේ.එස්.පී.ඒ.ඩී. වීරසූරිය මිය - අධ්‍යක්ෂ (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ) | එංගලන්තය | 10 පෙබ.<br>12 පෙබ. | 100<br><br>උණුසුම් ඇඳුම් දීමනාව පවුම් 75 | Wilton Park | දැඩි නෛතික ව්‍යුහයන් පදනම් කරගත් බදු පරිපාලනය භාවිත කරන්නා කේන්ද්‍ර කරගත්, දත්ත පාදක ක්‍රමවේදයක් බවට පත් කිරීම මෙම වැඩසටහනෙහි අරමුණ විය.<br><br>ඒ අනුව, බදු පිළිබඳ නීති රෙගුලාසි සරල කිරීම, කලින් සකස් කරන ලද බදු වාර්තා, අපේක්ෂිත බදු ආදායම අහිමි වීමේ අවදානම් හඳුනාගැනීම සඳහා සාමාන්‍ය විගණනය වෙනුවට කෘත්‍රිම බුද්ධිය යොදාගැනීම තුළින් බදු අනුකූලතාවය ඉහළ නැංවීම හරහා බදුකරණයේ මී මැසි මූලධර්මය අනුගමනය කරමින් බදු ආදායම් රැස් කිරීම සඳහා සියලු පාර්ශ්වයන් එකඟ වීම මෙම වැඩසටහනෙහි මූලික ප්‍රතිඵලයක් විය.<br><br>එය පවත්වාගෙන යෑම සඳහා සාමාජික රටවල් පුරා ඩිජිටල් දැනුම සහ භාවිතය වේගවත් කිරීම සඳහා පොදු රාජ්‍ය මණ්ඩලයීය රාජ්‍ය මට්ටමෙන් ඉගෙනුම් මධ්‍යස්ථානයක් සහ බදු ආශ්‍රිත සිද්ධි අධ්‍යයනයන් පිළිබඳ පොදු මූලාශ්‍රයක් ස්ථාපිත කිරීම සඳහා සහභාගී වූ පාර්ශ්වයන් වැඩිදුරටත් එකඟ විය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 4 | Effective Leadership for Revenue Administration SARTTAC | 1. ඒ.පී.ජේ. චන්ද්‍රනීල් මයා - කොමසාරිස්<br><br>2. එස්. තේවසීලන් මිය - කොමසාරිස්<br><br>3. කේ.ඒ.ඩී.ජී.එම්. කහඳවආරච්චි මිය - කොමසාරිස්<br><br>4. ඒ.පී. ගුණතුංග මයා - කොමසාරිස් | ඉන්දියාව | 17 පෙබ.<br>21 පෙබ. | 150 | දකුණු ආසියානු කලාපීය පුහුණු හා තාක්ෂණික සහාය මධ්‍යස්ථානය | පුද්ගලයන් රහිත ඇස්තමේන්තුකරණය (faceless assessment) වැනි ඩිජිටල් විද්‍යුත් පාලන පද්ධති කේන්ද්‍රීය කරගනිමින් තක්සේරුකරණයෙහි මානව අංගය ඩිජිටල් භාවිතය සමග කළමනාකරණය කරගත හැකි ආකාරය පිළිබඳව අවධානය යොමු කරමින් සාම්ප්‍රදායික, ධූරාවලි කළමනාකරණයේ සිට පරිවර්තනීය නායකත්වය දක්වා උපායමාර්ගික විතැන් වීම මෙම වැඩසටහනෙහි මූලික අරමුණ විය.<br><br>මෙම වැඩසටහන මගින් කලාපීය සහයෝගීතාව ද ශක්තිමත් කරනු ලැබූ අතර, බදු පැහැර හැරීමට එරෙහි වීම සහ දත්ත පාදක තීරණ ගැනීම තුළින් බදු ගෙවන්නන් සඳහා පිරිනමනු ලබන සේවාවන් වැඩිදියුණු කිරීම සම්බන්ධයෙන් අදහස් හුවමාරු කරගැනීමට බදු පරිපාලකයන් හට අවස්ථාවක් ලැබිණි. |
| 5 | South Asia Knowledge Network on Taxation | 1. එල්.කේ. රත්නායක මයා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස්<br><br>2. එන්.එම්.ඒ.කේ.බී. නාපාන මයා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස්<br><br>3. වී.ජී.ආර්. කුමාර මයා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | තායිලන්තය | 24 පෙබ.<br>27 පෙබ. | 75 | ලෝක බැංකුව | මෙම වැඩසටහන තුළින් අපේක්ෂිත මූලික ප්‍රතිඵලය වූයේ වැඩිදියුණු කළ තොරතුරු හුවමාරුව (EOI) හරහා බදු පැහැර හැරීම මැඩපැවැත්වීම සඳහා ගෝලීය බදු ප්‍රමිතීන් අනුගමනය කිරීමයි. දූෂණය අවම කිරීම සහ බදු පදනම පුළුල් කිරීම සඳහා ඉන්දියාවේ "පුද්ගලයන් රහිත ඇස්තමේන්තුකරණය" (faceless assessment) ආකෘතිය සහ කෘත්‍රිම බුද්ධිය යොදාග නු ලබන ආකාරය කෙරෙහි විශේෂයෙන් අවධානය යොමු කරමින්, බදු පරිපාලනය ඩිජිටල්කරණය කිරීම සඳහා කලාපීය මාර්ග සිතියමක් ද සහභාගිවන්නන් විසින් සකස් කරන ලදී. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 6 | Tax Debt Management Workshop for SGATAR and ADB Members | ජේ.ඩී. රණසිංහ මිය - නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | ජපානය | 10 මාර්තු 12 මාර්තු | 125<br><br>උණුසුම් ඇඳුම් දීමනාව පවුම් 75 | ආසියානු සංවර්ධන බැංකුව | වැඩමුළුව තුළින් අපේක්ෂිත මූලික ප්‍රතිඵලය වන්නේ ප්‍රතික්‍රියාශීලී ණය අය කිරීම වෙනුවට දත්ත පාදක ණය කළමනාකරණ උපාය මාර්ගයක් සකස් කිරීමයි. බදු ගෙවන්නන් බදු අවදානමට අනුව කාණ්ඩගත කොට අඩු ණය අවදානම සහිත ණය ගැතියන් සඳහා "මෘදු" ස්වයංක්‍රීය සිහි කැඳවීම් ද, ඉහළ අවදානම් සහිත අවස්ථා කෙරෙහි දැඩි බලාත්මක කිරීම ද ක්‍රියාත්මක කිරීම සඳහා උසස් විශ්ලේෂණය සහ කෘත්‍රිම බුද්ධිය යොදාගැනීම පිළිබඳ මෙම වැඩසටහනට සහභාගී වූවන් දැනුම්වත් කරනු ලැබීය. ඊට අමතරව පහත කරුණු ද වැඩසටහන තුළින් අපේක්ෂිත මූලික ප්‍රතිඵලවලට ඇතුළත් විය:<br><br>ණය අය කිරීමේ ක්‍රියාවලිය ඩිජිටල්කරණය කිරීම : ණය අයකරගැනීමේ පිරිවැය අවම කිරීම සඳහා විද්‍යුත් ගෙවීම් ද්වාර සහ ස්වයංක්‍රීය තුලන පද්ධති ක්‍රියාත්මක කිරීම;<br><br>නීතිමය රාමුව ශක්තිමත් කිරීම: ණය කපා හැරීම්, ගෙවීම් වාරික සැලසුම් සහ දේශසීමා අයකර ගැනීම සඳහා වඩාත් ඵලදායී නීති කෙටුම්පත් සකස් කිරීම පිළිබඳ දැනුම;<br><br>කලාපීය ප්‍රමිතිකරණය: සමස්ත දේශීය සම්පත් බලමුලු ගැන්වීම වැඩිදියුණු කිරීම සඳහා *Tax Administration Diagnostic Assessment Tool (TADAT)* වැනි ජාත්‍යන්තර මෙවලම්වලට සමගාමීව ණය කළමනාකරණ පිළිවෙත් සකස්කිරීම. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 7 | Regional Workshop on International Taxation | 1. ඩී.අයි.යූ.කේ. ඩයස් මයා - කොමසාරිස්<br><br>2. කේ. මේනකා මිය - සහකාර කොමසාරිස් | ඉන්දියාව | 11 මාර්තු<br>13 මාර්තු | 125 | ලෝක බැංකුව | ඩිජිටල් වත්කම්වලට අදාළ බදු පැහැර හැරීම මැඩපැවැත්වීම සඳහා ක්‍රිප්ටෝ-වත්කම් වාර්තාකරණ රාමුව (Crypto-Asset Reporting Framework - CARF) සඳහා උපායමාර්ගික මාර්ග සිතියමක් සැකසීම සහ ස්වයංක්‍රීය තොරතුරු හුවමාරු (Automatic Exchange of Information - AEOI) දත්ත සෘජුවම දේශීය බදු විගණනවලට යොමු කිරීම සඳහා තාක්ෂණික නියාමන ලේඛන සැකසීම මෙම වැඩමුළුව තුළින් අපේක්ෂිත මූලික ප්‍රතිඵල විය. ඊට අමතරව දේශසීමා හරහා අයවිය යුතු බදු සැබෑ ලෙස අයකර ගැනීම සඳහා අන්තර් දේශ සීමා බල ප්‍රදේශවල සහයෝගීතාවය ඇති කිරීම සඳහා සහභාගිවන්නන් විසින් දේශ සීමාවන් අතර අයවිය යුතු බදු අයකරගැනීම සඳහා Cross-Border Assistance in Recovery (CBAR) සඳහා නව මාර්ගෝපදේශ ස්ථාපිත සකස් කරන ලදී. ආසියා-පැසිෆික් කලාපය පුරා ඩිජිටල්කරණය වූ ආර්ථිකයක් තුළ සාධාරණ බදුකරණය පිළිබඳව සහතික කිරීම සඳහා මෙම ද්විත්ව විසඳුම ක්‍රියාත්මක කිරීම පිළිබඳව ද පාර්ශ්වයන් එකඟතාවයකට පැමිණියහ. |
| 8 | Bridging Research to Policy (Australia Awards South Asia & Mongolia) | සී.එස්. රත්නායක මිය - නියෝජ්‍ය කොමසාරිස් | ඕස්ට්‍රලියාව | 15 මාර්තු<br>29 මාර්තු | 50<br><br>උණුසුම් ඇඳුම් දීමනාව පවුම් 75 | ඕස්ට්‍රේලියානු රජය | අපේක්ෂිත මූලික ප්‍රතිඵලය individual Return-to-Work Plans (RWPs) සංවර්ධනය කිරීමයි. එමඟින් සහභාගිවන්නන්ට ඔවුන්ගේ මව් රටවල නිශ්චිත සංවර්ධන අභියෝග සඳහා කොටස්කරුවන්ගේ හඳුනාගැනීම, පර්යේෂණ අර්ථ නිරූපණය සහ ප්‍රතිපත්ති කෙටුම්පත් කිරීමේදී එම නව තාක්ෂණික කුසලතා භාවිතය සඳහා යොමුකරනු ලැබීය. අධ්‍යයන දත්ත සහ පරිපාලන ක්‍රියාවලිය අතර පරතරය පියවීම තුළින්, මෙම වැඩසටහන ඔස්සේ විශේෂයෙන් ඩිජිටල් පරිවර්තනය, කෘෂිකර්මාන්තය සහ රාජ්‍ය අංශයේ ප්‍රතිසංස්කරණ වැනි ප්‍රධාන අංශ තුළ පරිපූර්ණ ආර්ථික වර්ධනයක් සහ වගවීමේ පාලනයක් ඇති කිරීම සඳහා අවශ්‍ය ආයතනික ධාරිතාව ශක්තිමත් කරන ලදී. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 9 | IRBM-IBFD: Digital Assets Course | කේ.ආර්.ආර්.පී. කොස්වත්ත මිය - නියෝජ්‍ය කොමසාරිස් | මැලේසියාව | 21 අප්‍රේල් 25 අප්‍රේල් | 175<br><br>ගුවන් ගමන් ගාස්තුව රු. 117,000/- | මැලේසි යානු බදු ආයතනය | Distributed Ledger Technology (DLT), සඳහා ඉහළ මට්ටමේ විගණන ශිල්පීය ක්‍රම පිළිබඳව බදු නිලධාරීන් පුහුණු කිරීම මෙම වැඩසටහන තුළින් අපේක්ෂිත මූලික ප්‍රතිඵලය විය. විශේෂයෙන් ප්‍රාග්ධන ලාභ සහ බදු අය කළ හැකි ව්‍යාපාර ආදායම අතර වෙනස හඳුනා ගැනීම සඳහා "වෙළඳාමේ ලාංඡන "(badges of trade)" කෙරෙහි අවධානය යොමු කරන ලදී. වැඩසටහන අවසන් වන විට, සහභාගිවන්නන් දේශසීමා හරහා ඩිජිටල් ගනුදෙනු නිරීක්ෂණය කිරීම සඳහා ඒකාබද්ධ වැඩ ප්‍රවාහයක් සකස් කළ අතර, අග්නිදිග ආසියාවේ වර්ධනය වන ඩිජිටල් ආර්ථිකය සඳහා අවශ්‍ය නියාමන නිශ්චිතභාවය ලබා දෙන අතරම මෙම වැඩසටහන තුළින් බදු කාන්දු වීම ඵලදායී ලෙස අවම කළ හැකි බව සහතික කළහ. |
| 10 | Fundamentals of the Global Minimum Tax of Pillar Two – ADB, OECD, KTC and NTS | ජේ.එස්.යූ.වී. ද සිල්වා මයා - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොරියානු ජනරජය | 22 අප්‍රේල් 25 අප්‍රේල් | 150<br><br>උණුසුම් ඇඳුම් දීමනාව පවුම් 75 | ආසියානු සංවර්ධන බැංකුව | වැඩමුළුවේ අපේක්ෂිත මූලික ප්‍රතිඵලය වන්නේ Income Inclusion Rule (IIR) and the Qualified Domestic Minimum Top-up Tax (QDMTT) වෙත යොමුවීම කෙරෙහි අවධානය යොමු කරමින් 15% ගෝලීය අවම බද්ද සඳහා ප්‍රායෝගික ක්‍රියාත්මක කිරීමේ උපාය මාර්ග සංවර්ධනය කිරීමයි. බදු පදනම් ආරක්ෂාව පිළිබඳ අවදානමක් ඇති වීමට ඉඩ නොදී තරඟකාරීත්වය පවත්වාගනු ලබන අකාරය පිළිබඳ අවබෝධයක් සහභාගි වූවන් විසින් ලබා ගත්හ. |
| 11 | Negotiation on Double Tax Avoidance Agreement (DTAA) with Slovak Republic | 1. බී.කේ.එස්. ශාන්ත මයා - නියෝජ්‍ය කොමසාරිස් ජනරාල්<br><br>2. එස්.ඕ.ඒ.සී.ආර්. නිවුන්හැල්ල මිය - ජ්‍යෙෂ්ඨ කොමසාරිස්<br><br>3. අයි.ජේ.ඩබ්. විතානගේ මිය - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | ස්ලෝවැකියා ජනරජය | 28 අප්‍රේල් 30 අප්‍රේල් | 150<br><br>උණුසුම් ඇඳුම් දීමනාව පවුම් 75<br><br>යැපීම් දීමනාව 2,400<br><br>ගුවන් ගමන් ගාස්තුව රු. 536,300/- | ශ්‍රී ලංකා රජය | මෙම වැඩසටහන තුළින් අපේකෂිත ප්‍රධාන ප්‍රතිඵලය වූයේ OECD/G20 BEPS අවම ප්‍රමිතීන් ඇතුළත් කිරීම සඳහා බදු නීති නවීකරණය කිරීමයි, විශේෂයෙන් බදු ආරවුල් කඩිනමින් විසඳීම සහ දේශසීමා බදු අවම කරගැනීම සඳහා රටවල් විසින් සිදු කරනු ලබන විකල්ප ක්‍රියාකාරකම් (treaty shopping) මැඩ පැවැත්වීම සඳහා යාවත්කාලීන කරන ලද අන්‍යෝන්‍ය ගිවිසුම් ක්‍රියාපටිපාටියක් (Mutual Agreement Procedure - (MAP) ඇතුළත් කර ඇත. තවද, විනිවිදභාවය වැඩි දියුණු කිරීම සහ දේශසීමා බදු පැහැර හැරීම මැඩපැවැත්වීම සඳහා තොරතුරු හුවමාරුව (EOI) සඳහා නව විධිවිධාන සමඟ, ලාභාංශ, පොලී සහ රාජ්‍ය භාග සඳහා සාමාන්‍යයෙන් 10% සිට 15% දක්වා පරාසයක තරඟකාරී රඳවා ගැනීමේ බදු සීමාවන් සඳහා සහභාගී වූ දෙරටෙහි පාර්ශ්වයන් එකඟ විය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 12 | Misuse of Technology in Financial Crimes (Specialty Pilot Program) | ජේ.එම්.යූ.එන්.බී. ජයමහ මයා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | ජපානය | 26 මැයි 30 මැයි | 175<br><br>උණුසුම් ඇඳුම් දීමනාව පවුම් 75<br><br>ගුවන් ගමන් ගාස්තුව රු.155,500/- | ශ්‍රී ලංකා රජය | අනන්‍යතාවය පිළිබඳ ව්‍යාජ භාවිතයන්, ක්‍රිප්ටො මුදල් ආශ්‍රිත වංචාවන් සහ මාර්ගගත ක්‍රීඩා වේදිකා තුළ මුදල් විශුද්ධිකරණය වැනි නවතම අභියෝගයන් පිළිබඳ අවබෝධයක් ලබා දීම මෙම වැඩසටහනෙහි මූලික ප්‍රතිඵල අතරට ඇතුළත් විය. සහභාගිවන්නන් block chain විශ්ලේෂණ ක්‍රමවේදය සහ ඩිජිටල් අධිකරණ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ප්‍රායෝගික විශේෂඥතාවයක් ලබා ගත් අතර, එමඟින් අන්තර් දේශසීමාවන් තුළ සංකීර්ණ, තාක්‍ෂණික පහසුකම් භාවිත කරමින් සපයනු ලබන මූල්‍ය මංපෙත් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට හැකි විය. සමස්තයක් ලෙස මෙම වැඩසටහන තුළින් තීරණාත්මක ලෙස, වැඩසටහන මූල්‍ය තාක්ෂණයේ වේගවත් පරිණාමය හා සමගාමීව ගමන් කිරීම සඳහා වූ අනුවර්තන නියාමන රාමුවල අවශ්‍යතාවය සනිටුහන් කළේය. |
| 13 | Seminar on IT Based Taxation Statistics Management for Officials of Developing Countries - China | එස්.එම්.ජී.එන්. පැතුම් තිස්ස මයා - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | චීනය | 02 ජූලි 15 ජූලි | 375 | චීන රජය | චීනයේ Golden Tax Phase IV ව්‍යාපෘතියේ ප්‍රායෝගික භාවිතය කෙරෙහි මෙම වැඩසටහන මගින් අවධානය යොමු කළ අතර, cloud computing වැනි පරිගණක ක්‍රමවේදයන් හරහා ස්වයංක්‍රීය බදු රැස්කිරීම තුළින් මානව දෝෂ අවම කළ හැකි ආකාරය පැහැදිලි කරනු ලැබිය. තත්‍ය කාලීන දත්ත අධීක්ෂණය සඳහා ශක්තිමත් තොරතුරු තාක්ෂණ රාමු ස්ථාපිත කිරීම, ජාතික බදු සංඛ්‍යා ලේඛනවල නිරවද්‍යතාවය වැඩි දියුණු කිරීම සහ බදු පැහැර හැරීමේ අවදානම් හඳුනා ගැනීම සඳහා පුරෝකථන විශ්ලේෂණ භාවිත කිරීම පිළිබඳ අවබෝධයක් සහභාගිවන්නන්ට ලබා දුනි. වැඩසටහන තුළින් අපේක්ෂිත ප්‍රධාන ප්‍රතිඵලයක් වූයේ විනිවිදභාවය සහ දේශීය සම්පත් බළ මුළු ගැන්වීම ඉහළ නංවාලනු ලබන දත්ත පාදක පාලන ආකෘති ක්‍රියාත්මක කිරීම තුළින් සංවර්ධනය වෙමින් පවතින රටවල "ඩිජිටල් අඩුලුහුඩුකම්" අවම කරගත හැකි උපාය මාර්ග සකස් කිරීමයි. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 14 | 45th CATA Annual Heads Meeting and Technical Conference 2025 | එම්.එල්.ජේ.ජී. චන්ද්‍රසිරි මයා - ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | පැපුවා නිව්ගිනියාව | 07 ජූලි 11 ජූලි | යැපීම් දීමනාව 1,092<br><br>150<br><br>ගුවන් ගමන් ගාස්තුව රු 289,000/- | ශ්‍රී ලංකා රජය | මෙම සම්මන්ත්‍රණය තුළින් තාක්ෂණික ප්‍රතිඵල මගින් ඩිජිටල් පරිවර්තනයක් කරා ළඟා වීම අවධාරණය කරනු ලැබූ අතර, ආදායම් එකතු කිරීම සහ බදු ගෙවන්නන්ගේ සේවාවන් වැඩිදියුණු කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය, සහ තත්‍ය කාලීන දත්ත විශ්ලේෂණය ඒකාබද්ධ කරගැනීම පිළිබඳව විමසා බලනු ලැබීය. තිරසාර සංවර්ධනයට සහාය වීම සඳහා දේශීය සම්පත් බළ මුළු ගැන්වීම සහ බදු පරිපාලනය තුළ ස්ත්‍රී පුරුෂ සමානාත්මතා උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම කෙරෙහි ද මෙම සාකච්ඡා කේන්ද්‍රගත විය. බදු පද්ධති ගෝලීය වශයෙන් අනුකූලව ද දේශීය වශයෙන් අදාළව ද පවතින වන බවට සහතික වෙමින් දේශීය නවෝත්පාදනයන්ට ඉඩ සලසන නම්‍යශීලී, අනුවර්තන රෙගුලාසිවලට සහාය පළකරමින් "අනම්‍යශීලී" ජාත්‍යන්තර ප්‍රමිතීන්ගෙන් ඉවත් වීමට සම්මන්ත්‍රණය අවසන් වන විට, සාමාජික රටවල් පොරොන්දු වූහ. |
| 15 | 16th Asia-Pacific Tax Forum - Indonesia | 1. එස්.අයි. අසන්ති මිය - කොමසාරිස්<br><br>2. එන්.සී. විජේවර්ධන මයා - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | ඉන්දුනීසියාව | 16 ජූලි 17 ජූලි | 75 | INDEF සහ MATA | කෘත්‍රිම බුද්ධිය මත පදනම් වූ බදු පරිපාලනය හරහා දේශීය සම්පත් බළ මුළු ගැන්වීම ශක්තිමත් කිරීම, ASEAN නිදහස් වෙළඳ කලාපයට සහාය වීම සඳහා වක්‍ර බදු ප්‍රතිපත්ති සමාන කිරීම සහ කලාපයේ බලශක්ති පරිණාමනය සඳහා අරමුදල් සැපයීම සඳහා "හරිත බදු" පිළිබඳව විමසා බැලීම ප්‍රධාන ප්‍රතිඵල අතරට ඇතුළත් විය. නම්‍යශීලී බදු දිරිගැන්වීම් සහ වැඩිදියුණු කළ ඩිජිටල් අනුකූලතා පද්ධති හරහා නැගී එන ආර්ථිකයන්හි වර්ධනයට හිතකර පරිසරයක් පවත්වා ගැනීම සහතික කරන අතරවාරයේදී, බදු පරතරයන් වසා දැමීම සඳහා කලාපීය සහයෝගීතාවයට ප්‍රමුඛත්වය දෙන ජකර්තා මූල්‍ය මාර්ග සිතියම (Jakarta Fiscal Roadmap) මෙම සමුළුවේදී අවසන් කරන ලදී. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 16 | United Nations Regional Workshop on Transfer Pricing in Asia Pacific | එම්.ආර්. බද්දෙවිතාන මිය - ජ්‍යෝෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | කොරියා ජනරජය | 25 අගෝස්තු<br>29 අගෝස්තු | 75 | එක්සත් ජාතීන්ගේ සංවිධානය | අන්තර් කණ්ඩායම් ගනුදෙනු (Intra-group) සන්දර්භය තුළ "arm's length principle" මූලධර්මය පිළිබඳ විමසා බලමින් සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා වූ මිල පැවරුම්කරණය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රායෝගික අත්පොතෙහි ප්‍රායෝගික භාවිතය කෙරෙහි වැඩමුළුව තුළින් අවධානය යොමු කරනු ලැබීය. ඊට අමතරව සියලුම මහා පරිමාණ බහුජාතික ව්‍යවසායයන් විසින් ඔවුන් ක්‍රියාත්මක වන බදු බල ප්‍රදේශ තුළ ලාභය, ගෙවන ලද බදු, ආදායම සහ ආර්ථික ක්‍රියාකාරකම් පිළිබඳ දත්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතිගත රටින් රටට වාර්තා කිරීම standardized Country-by-Country Reporting (CbCR) තුළින් විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා කලාපීය ගිවිසුමක් සකස් කිරීම සහ බදු අධිකාරීන් සහ බදු ගෙවන්නන් යන දෙපිරිසම වෙත පැවරෙන පරිපාලන බර අවම කිරීම සඳහා අඩු අවදානම් සේවා සඳහා සරල කළ නීති සකස් කිරීම ද මෙම වැඩමුළුව තුළින් අපේක්ෂිත ප්‍රතිඵල අතරට ඇතුළත් විය. තවද, නීති විරෝධී මූල්‍ය ප්‍රවාහයන් සහ ආසියා-පැසිෆික් කලාපය පුරා නීති විරෝධී ලාභ හුවමාරුවීම් මැඩපැවැත්වීම සහ ආරවුල් වැළැක්වීම සඳහා මෙවලමක් ලෙස ද වඩා හොඳින් පුරෝකථනය කළ හැකි ආයෝජන වාතාවරණයක් සහතික කිරීම ද සඳහා උසස් මිලකරණ ගිවිසුම් (APA) භාවිත කිරීම පිළිබඳ වැඩමුළුවට සහභාගී වූ නියෝජිතයින් අවධාරණය කළහ. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 17 | CATA Senior Leadership Program 2025 to 2026 - Phase 1 | එච්.එච්.ටී. ප්‍රියන්ති මිය - ජ්‍යෙෂ්ඨ කොමසාරිස් | උගන්ඩාව | 8 සැප්.<br>18 සැප්. | 350<br><br>යැපීම් දීමනාව 245 | HMRC | වැඩසටහනෙහි මූලික ප්‍රතිඵලය වූයේ විත්තවේගීය බුද්ධිය, අනුවර්තන තීරණ ගැනීම සහ සංවිධානාත්මක ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ මොඩියුල හරහා ඉහළ විභවයක් ඇති ජ්‍යෙෂ්ඨ බදු නිලධාරීන් තාක්ෂණික කළමනාකරණයේ සිට උපායමාර්ගික නායකත්වයට වෙත සාර්ථකව පිවිසීම ය. නායකත්වය පිළිබඳ ගැටලු විසඳීම සඳහා සහභාගිවන්නන් විසින් පුද්ගලික ක්‍රියාකාරී සැලසුම් සකස් කළ අතර ඩිජිටල් බදු පරතරය පියවීම සහ ස්වේච්ඡා අනුකූලතාව වැඩිදියුණු කිරීම වැනි තීරණාත්මක බදු පරිපාලන අභියෝග පිළිබඳ පර්යේෂණ ආරම්භ කිරීම සඳහා එක් එක් රටවල බල ප්‍රදේශීය "ක්‍රියාකාරී ඉගෙනුම්" කණ්ඩායම් ක්‍රියාකාරකම් සිදු කළහ. මෙම වැඩසටහන ආයතනික ප්‍රතිසංස්කරණ මෙහෙයවීමට සහ තම රටවල්වල පරිපාලනය තුළ ඊළඟ පරම්පරාවේ බදු වෘත්තිකයන්ට මග පෙන්වීමට අවශ්‍ය මෘදු කුසලතා ඔවුන් තුළ ඇති කරමින් පොදු රාජ්‍ය මණ්ඩලීය නායකයින් අතර සහයෝගීතා ජාලයක් සාර්ථකව ස්ථාපිත කරනු ලැබීය. |
| 18 | Seminar on Tax Administration and Digitalization for BRI Partner Countries | 1. යූ.වී. විතානාරච්චි මිය - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්<br><br>2. කේ.පී. හන්වැල්ල මයා - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | චීනය | 9 සැප්.<br>22 සැප්. | 375<br><br>උණුසුම් ඇඳුම් දීමනාව පවුම් 75 | චීන රජය | සම්මන්ත්‍රණයේ මූලික ප්‍රතිඵලය වූයේ බදු ගෙවන්නන් ලියාපදිංචි කිරීම, විද්‍යුත් ගොනු කිරීම සහ අවදානම් කළමනාකරණය සඳහා ප්‍රමිතිගත ඩිජිටල් රාමුවක් සපයන Tax Administration Product Portfolio (Version 1.0) අනුමත කිරීමයි. බදු බල ප්‍රදේශ 30කට අධික සංඛ්‍යාවක සහභාගිවන්නන් චීනයේ "සුහුරු බදුකරණය" (Smart Taxation) පද්ධති පිළිබඳ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගත් අතර, විශේෂයෙන් අනුකූලතාවය ස්වයංක්‍රීය කිරීමට සහ බදු පැහැර හැරීම අඩු කිරීමට Big Data සංකල්පය සහ කෘත්‍රිම බුද්ධිය ඒකාබද්ධ කිරීම කෙරෙහි අවධානය යොමු කළහ. Belt and Road Initiative (BRI or B&R) ආයෝජන සඳහා වඩාත් පුරෝකථනය කළ හැකි ව්‍යාපාරික පරිසරයක් පෝෂණය කරමින්, ජාත්‍යන්තර ඩිජිටල් ප්‍රමිතීන්ට අනුකූල වන ශක්තිමත්, කඩදාසි රහිත බදු පරිසර පද්ධති ස්වාධීනව ක්‍රියාත්මක කළ හැකි බව සහතික කරමින්, දේශසීමා දත්ත බෙදාගැනීම සහ මාර්ගගත පුහුණු ප්‍රශස්ත ලෙස භාවිත කිරීම පිළිබඳව අවධානය යොමු කරමින් මෙම වැඩසටහන අවසන් විය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 19 | The 14th IMF – Japan High Level Tax Conference for Asian and Pacific Countries | ජේ.එම්.එස්.එස්. රත්නවර්ධන මයා - නියෝජ්‍ය කොමසාරිස් ජනරාල් | ජපානය | 24 සැප්.<br>25 සැප්. | 100<br><br>උණුසුම් ඇඳුම් දීමනාව පවුම් 75 | ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | රජයේ කාර්යක්ෂමතාව සහ තිරසාර වර්ධනය සහතික කිරීම සඳහා දළ ජාතික නිෂ්පාදිතය සඳහා බදු ආදායමෙහි දායකත්වය අවම වශයෙන් 15%ක් බවට පත්කිරීම සඳහා ඉලක්කයක් තබා ගත යුතු බවට එකඟතාවයකින් යුතුව බදු-දළ දේශීය නිෂ්පාදිත අනුපාත සඳහා "ආදායම් ලක්ෂ්‍යයක්" හඳුනා ගැනීම සමුළුවෙහි මූලික ප්‍රතිඵලයක් විය. ආදායම් කාන්දු වීම පාලනය කිරීම සඳහා බදු දිරිගැන්වීම් වැඩි දියුණු කිරීම සඳහා ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයෙහි (OECD) Pillar Two global minimum tax දේශීය වශයෙන් ක්‍රියාත්මක කිරීම ද, අඩු ආදායම්ලාභී ආසියානු ආර්ථිකයන්හි දේපල බදුවල විභවය සහ බදු පරිපාලනයේ සඳහා කෘත්‍රිම බුද්ධියෙහි භූමිකාව පිළිබඳව ද මෙහි දී අවධාරණයට ලක් විය. ආසියා-පැසිෆික් කලාපය පුරා රාජ්‍ය වියදම්වල කාර්යක්ෂමතාවය පහළ යැම වළක්වාළීම සඳහා සමාන රාජ්‍යයන් අතර අධ්‍යයනයන්ට ප්‍රමුඛත්වය ලබා දෙමින්, මධ්‍ය කාලීන ආදායම් උපාය මාර්ගික (MTRS) රාමුවක් සඳහා වූ බැඳියාවක් සඳහා සහභාගී වන්නන් එකඟ වන ලදී. |
| 20 | IRBM – IBFD: High Net Worth Individual (HNWIs) | අයි.පී.කේ.එස්.එස්. කරුණානායක මයා - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | මැලේසියාව | 13 ඔක්.<br>17 ඔක්. | 175<br><br>ගුවන් ගමන් ගාස්තුව<br>රු 90,600/- | මැලේසියානු බදු ආයතනය | මෙම වැඩසටහනේ ප්‍රධාන ප්‍රතිඵලය වූයේ පෞද්ගලික පදනම්, පවුල් කාර්යාල (family offices) සහ විචල්‍ය ප්‍රාග්ධන සමාගම් (VCCs) කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් දේශ සීමාවන් අතර සංකීර්ණ ධන ව්‍යුහයන් හඳුනා ගැනීම සඳහා තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීමයි. විදේශීය බදු පැහැර හැරීම් සහ ආක්‍රමණශීලී බදු සැලසුම්කරණය හඳුනා ගැනීම සඳහා පොදු වාර්තාකරණ ප්‍රමිතිය (CRS) සහ ස්වයංක්‍රීය තොරතුරු හුවමාරු (AEOI) දත්ත භාවිත කිරීම පිළිබඳ උසස් කුසලතාවන් සහභාගිවන්නන් විසින් වර්ධනය කර ගත්හ. දිගුකාලීන ස්වේච්ඡා අනුකූලතාව සහ වේගයෙන් පරිණාමනය වන ගෝලීය ආර්ථිකයක් තුළ දේශීය බදු පදනම ආරක්ෂා කිරීම සඳහා ඉහළ වත්කම් සහිත පුද්ගලයන් (HNWIs) සඳහා උසස් මට්ටමේ සේවාවක් සමඟ දැඩි බලාත්මක කිරීම ක්‍රියාත්මක කිරීම අරමුණු කරගත් "සාමූහික අනුකූලතා" ආකෘති පිළිබඳ අවධාරණය කරමින් වැඩමුළුව අවසන් විය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 21 | ADB High Level Regional Tax Conference 2025 | 1. එස්.ජී.පී.ඩී. දිසාබණ්ඩාර මිය - කොමසාරිස්<br>2. ජී.ජී.එන්.පී. කුමාරිහාමි මිය - කොමසාරිස්<br>3. පී.ඩී.ආර්.වී. තේනබදු මිය - කොමසාරිස් | පිලිපීනය | 04 නොවැ.<br>06 නොවැ. | 125 | ආසියානු සංවර්ධන බැංකුව | තිරසාර සංවර්ධන ඉලක්ක (SDGs) සඳහා අරමුදල් සැපයීම සහ ඉහළ ණය මට්ටම් හරහා ඉදිරියට ගමන් කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවතින සාමාජික රටවල් සඳහා තීරණාත්මක මිණුම් ලකුණක් ලෙස 15% බදු-දළ දේශීය නිෂ්පාදිත අනුපාතය නැවත තහවුරු කිරීම මෙම පුහුණු වැඩසටහනෙහි මූලික ප්‍රතිඵලයක් විය. දේශසීමා හරහා විද්‍යුත් වාණිජ්‍ය භාවිතයෙන් ආදායම වඩා හොඳින් ග්‍රහණය කර ගැනීම සඳහා ප්‍රගතිශීලී බදු ප්‍රතිපත්තිවල අවශ්‍යතාවය සහ වැට් බදු පද්ධති නවීකරණය කිරීම මෙහිදී ඉස්මතු කරන ලදී. නව ගෝලීය අවම බදු නීති යටතේ ආදායම ආරක්ෂා කරන අතරම තරගකාරීව සිටීමට බදු දිරිගැන්වීම් නැවත සැලසුම් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව සහභාගිවන්නන් එකඟ වූ අතර අනුකූලතා පරතරයන් අවම කිරීම සහ කලාපීය මූල්‍ය ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා කෘත්‍රිම බුද්ධිය සහ විද්‍යුත් ඉන්වොයිස්කරණය තුළින් ඩිජිටල් පරිවර්තනය වේගවත් කිරීම සඳහා ආසියා පැසිෆික් බදු මධ්‍යස්ථානය (Asia Pacific Tax Hub) සඳහා ශක්තිමත් වරණයක් ලබා දීමෙන් වැඩසටහන අවසන් විය. |
| 22 | Taxation on e-Commerce Industry Training Program (ITEC) | 1. ඒ.එස්.වයි. ගුණවර්ධන මිය - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්<br>2. ටී. නිරූපා මිය - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | ඉන්දියාව | 10 නොවැ.<br>21 නොවැ. | 275 | ඉන්දියානු රජය | වැඩසටහනෙහි ප්‍රධාන ප්‍රතිඵලය වූයේ Significant Economic Presence (SEP), "Equalization Levies," සහ දේශසීමා ඩිජිටල් සේවාවන් තුළ GST/VAT බදු එකතු කිරීම වැනි විද්‍යුත් වාණිජ්‍ය ක්‍රියාකාරකම් හැසිරවීම සඳහා තාක්ෂණික හවුල්කාර රටවල බදු නිලධාරීන් තාක්ෂණ විශේෂඥතාවය සහිතව බලගැන්වීමයි. වැඩසටහනට සහභාගිවූවන් ඩිජිටල් වේදිකා විගණනය කිරීම, බදු වළක්වා ගැනීමේදී "අසතුටුදායක රටා" හඳුනා ගැනීම සහ ඉහළ පරිමාණ ගනුදෙනු නිරීක්ෂණය කිරීම සඳහා විශාල දත්ත විශ්ලේෂණ (big data analytics) භාවිත කිරීම පිළිබඳ අභ්‍යාස සැසිවල නිරත විය. නැගී එන ආර්ථිකයන්ට සාධාරණ හා තරගකාරී ඩිජිටල් වෙළඳපොළක් පෝෂණය කරන අතර වාරයේදී බහුජාතික මහා පරිමාණ තාක්ෂණික සමාගම් වෙතින් ඵලදායී ලෙස ආදායම් ලබාගත හැකි බව සහතික කරමින් කලාපීය බදු පරිපාලකයන්ට ඔවුන්ගේ ඩිජිටල් බදු නීති සමග ඒකාබද්ධ කිරීම සඳහා සහයෝගීතා රාමුවක් මෙම වැඩසටහන තුළදී සකස් කරනු ලැබීය. |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 23 | Seminar for Senior Sri Lankan Government Officials of Sri Lanka | 1. එම්.ජී.ඒ.එස්. කුමාර මයා - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්<br><br>2. කේ.කේ.සී.ඩී. කුලතුංග මයා - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස්<br><br>3. එච්.එල්.පී. සෙනෙවිරත්න මයා - ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් | චීනය | 26 නොවැ.<br>09 දෙසැ. | 375<br><br>උණුසුම් ඇඳුම් දීමනාව පවුම් 75 | චීන රජය | මෙම වැඩසටහනේ ප්‍රධාන ප්‍රතිඵලයක් වූයේ ශ්‍රී ලංකාවේ ජාතික සංවර්ධන උපායමාර්ගික වැඩසටහන්, විශේෂයෙන් "ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන", "ඩිජිටල් පරිවර්තනය" සහ "ග්‍රාමීය සංවර්ධනය" ආදී වැඩසටහන් චීනයේ 15 වන පස් අවුරුදු සැලැස්මේ උපායමාර්ගික ඉලක්ක සමඟ සමගාමීව ක්‍රියාත්මක කිරීමයි. දරිද්‍රතාවය පිටුදැකීම, ග්‍රාමීය පුනර්ජීවනය සහ කෘත්‍රිම බුද්ධිය සහ හරිත තාක්ෂණයන් රාජ්‍ය පරිපාලනයට ඒකාබද්ධ කිරීම පිළිබඳ සාකච්ඡාවලට සහභාගී වූවන් සහභාගී වූහ. ශ්‍රී ලංකාවේ මානව සම්පත් ධාරිතාව සහ ආයතනික ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම කෙරෙහි අවධානය යොමු කරමින්, Belt and Road Initiative (BRI), හරහා ද්විපාර්ශ්වික සහයෝගීතාව ඉහළ නැංවීම සඳහා කැපවීමකින් සම්මන්ත්‍රණය අවසන් විය. වැඩසටහන අවසන් වන විට, තිරසාර ආර්ථික ප්‍රතිසාධනය සහ දිගුකාලීන නවීකරණය මෙහෙයවීම අරමුණු කරගනිමින්, "සුහුරු බදුකරණය" (smart taxation) සහ "විශේෂිත ආර්ථික කලාප" කළමනාකරණය පිළිබඳ චීන ආකෘති ශ්‍රී ලාංකික සන්දර්භය සඳහා සක්‍රියව අනුවර්තනය කිරීම සඳහා නිලධාරීන් උපාය මාර්ග සකස් කළහ. |
| 24 | 2025 Plenary Meeting of the Global Forum on Transparency and Exchange of Information for Tax Purposes | ආර්.පී.එච්. ප්‍රනාන්දු මිය - දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් | ඉන්දියාව | 1 දෙසැ.<br>5 දෙසැ. | යැපීම් දීමනාව 1,680<br><br>240<br><br>ගුවන් ගමන් ගාස්තුව රු 194,100/- | ශ්‍රී ලංකා රජය | වැඩසටහනෙහි ප්‍රධාන ප්‍රතිඵලයක් වූයේ ස්වයංක්‍රීය තොරතුරු හුවමාරුව සහ ස්වේච්ඡා අනාවරණය කිරීමේ වැඩසටහන්වල සාර්ථකත්වය හේතුවෙන් ගෝලීය වශයෙන් අතිරේක ආදායමෙන් යුරෝ බිලියන 135කට වඩා වැඩි ප්‍රමාණයක් නැවත අයකරගත හැකි තත්ත්වයට පත්වීමයි. මෙම රැස්වීම තුළදී සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා අක්වෙරළ බදු පැහැර හැරීමට එරෙහිවීම සඳහා අවශ්‍ය තාක්ෂණික යටිතල පහසුකම් ලබා දීම තුළින් "ඩිජිටල් අඩුලුහුඩුකම්" අවම කිරීම අවධාරණය කරනු ලබන නව දිල්ලි ප්‍රකාශනය සකසා අවසන් කළ අතර, ගෝලීය ආර්ථිකය විමධ්‍යගත මූල්‍යකරණය වෙත ගමන්කිරීමේදී, මූල්‍ය ඒකාබද්ධතාවය සහ විනිවිදභාවය පවත්වා ගැනීම සඳහා බදු පරිපාලනය තුළ දත්ත හුවමාරුව පිළිබඳ ඉතා හොඳ මෙවලම් භාවිතයට ගනු ලබන බව එමගින් සහතික කරනු ලබයි. |

## සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් 2025 වර්ෂයේ දී පවත්වන ලද පුහුණු වැඩසටහන්

| සංවර්ධන පාර්ශ්වකරු | වැඩසටහන පැවැත්වීමට පැමිණි කාලසීමාව | මාතෘකාව/ ආවරණය කරන ලද ක්ෂේත්‍රය | පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව |
|---|---|---|---|
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල | 2025 ජනවාරි 2-10 | ඉහළ වටිනාකම් සහිත පුද්ගල (HWI) අංශය ශක්තිමත් කිරීම<br>• ධාරිතා සංවර්ධනය සහ ඉහළ වටිනාකම් සහිත පුද්ගල අනුකූලතා වැඩිදියුණුකිරීමේ සැලැස්ම | 06 |
| | 2025 පෙබරවාරි 10-21 | ඉහළ වටිනාකම් සහිත පුද්ගල අංශය ශක්තිමත් කිරීම<br>• ඉහළ වටිනාකම් සහිත පුද්ගල විගණනය හා සම්බන්ධ සිද්ධි කළමනාකරණ මාර්ගෝපදේශය | |
| | 2025 අප්‍රේල් 1-11 | හිඟ බදු කළමනාකරණය වැඩිදියුණු කිරීම<br>• අනුකූලතා කළමනාකරණය සහ හිඟ බදු කළමනාකරණය | |
| | 2025 මැයි - ජූනි | ඉහළ වටිනාකම් සහිත පුද්ගල අංශය ශක්තිමත් කිරීම<br>• ඉහළ වටිනාකම් සහිත පුද්ගල විගණන අත්පොත සහ විගණනය හා සම්බන්ධ සිද්ධි කළමනාකරණය | |
| | 2025 අගෝස්තු - දෙසැම්බර් | ඉහළ වටිනාකම් සහිත පුද්ගල අංශය ශක්තිමත් කිරීම<br>• පරිපාටික විගණනය හා සම්බන්ධ සිද්ධි කළමනාකරණට සහාය දැක්වීම | |
| | 2025 සැප්තැම්බර් 8-12 | හිඟ බදු කළමනාකරණය වැඩිදියුණු කිරීම (දකුණු ආසියාතික කලාපීය පුහුණු සහ තාක්ෂණික සහයෝගීතා මධ්‍යස්ථානය - SARTTAC)<br>• ගෙවීම් සහ ණය කළමනාකරණ පුහුණුව | |
| HRMC | 2025 මැයි | මානව සම්පත් කාර්යසාධන ඇගයීම සහ දිරිදීමනා<br>• නව බඳවා ගැනීම් සමඟ සේවාස්ථානයට හුරුකිරීම කෙරෙහි අවධානය යොමු කරමින් පුහුණු ඒකකයේ සහාය ලබාදීම; පුහුණුකරු පුහුණු කිරීම; පුහුණුව සමඟ අභ්‍යන්තර සන්නිවේදනයන්ට සහාය දැක්වීම සඳහා සමාජ මාධ්‍ය වේදිකා භාවිත කිරීම | 06 |
| | 2025 ජූනි | බදු අපරාධ විමර්ශනය<br>• TIWB-HMRC<br>බදු අපරාධ විමර්ශනය/ HWI සිද්ධි කළමනාකරණය (ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව ඇතුළුව) | |
| | 2025 සැප්තැම්බර් 15-19 | මිල පැවරුම්<br>• මිල පැවරුම් තාක්ෂණික සහාය<br>බදු අපරාධ විමර්ශනය<br>• HMRC/ සීමාවන්ගෙන් තොරව බදු විමර්ශනය (TIWB) ද්වි වාර්ෂික වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලද අතර බදු විශ්ලේෂණය ආරම්භ කරන ලදී. | |
| | 2025 දෙසැම්බර් 02-06 | බදු අපරාධ විශ්ලේෂණ පුහුණුව | |
| | 2025 | අභ්‍යන්තර සහ බාහිර සන්නිවේදනය සඳහා වීඩියෝ අන්තර්ගතයන් නිර්මාණය කිරීම අරමුණු කරගත් මාධ්‍ය කණ්ඩායම සමඟ සහයෝගීත්ව ක්‍රියාකාරකම්වල නිරතවීම | |

| | | | |
|---|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපද බදු විශ්ලේෂණ කාර්යාලය (US Treasury OTA) | 2025 අගෝස්තු 26 - සැප්තැම්බර් 05 | අභ්‍යන්තර විගණන සහ අභ්‍යන්තර කටයුතු | 01 |
| ආසියානු සංවර්ධන බැංකුව | 2025 ජූනි 2-6 | අනුකූලතා අවදානම් කළමනාකරණය<br>• සංස්ථාපිත ආදායම් බද්ද (CIT) සහ හවුල් ව්‍යාපාර ආදායම් බද්ද (PIT), අනුකූලතා වැඩිදියුණු කිරීමේ සැලැස්ම (CIP) - උසස් මට්ටමේ අනුකූලතා ක්‍රමෝපාය | 02 |
| | 2025 | අනුකූලතා අවදානම් කළමනාකරණය<br>• එකතු කළ අගය මත බද්ද (VAT), සංස්ථාපිත ආදායම් බද්ද (CIT) සහ හවුල් ව්‍යාපාර ආදායම් බද්ද (PIT) යන බදු අන්තර (Tax Gap) විශ්ලේෂණය | |
| ලෝක බැංකුව | 2025 ජූනි - ජූලි | තෙවන පාර්ශ්වීය දත්ත<br>• දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ තෙවන පාර්ශ්වීය දත්ත ඵලදායී ලෙස හුවමාරු කිරීම නිරීක්ෂණය | 05 |
| | 2025 දෙසැම්බර් 8-10 | බදු වියදම් කළමනාකරණ රාමුව සහ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය පිළිබඳ වැඩමුළුව | |
| | 2025 | බදු වියදම් විනිවිදභාවය<br>• මුදල් අමාත්‍යාංශය - බදු වියදම් ප්‍රකාශනය (ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ සහයෝගීත්වයෙන්)<br><br>ඩිජිටල් පරිණාමනය (ස්වයංක්‍රීයකරණය/ ඩිජිටල්කරණය)<br>• තොරතුරු තාක්ෂණ ක්‍රමෝපාය සැලැස්ම ක්‍රියාත්මකකිරීම<br><br>බදුගෙවුම් සේවා වැඩිදියුණු කිරීම<br>• බදුගෙවුම් සේවා වැඩිදියුණු කිරීම | |
| එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) | 2025 ජූනි | බදු අපරාධ විමර්ශනය<br>• TIWB-HMRC<br>බදු අපරාධ විමර්ශනය/ ඉහළ වටිනාකම් සහිත පුද්ගල සිද්ධි කළමනාකරණය (ශ්‍රී ලංකා රේගුව සහ සුරාබදු දෙපාර්තමේන්තුව ඇතුළත්ව) | 03 |
| | 2025 අගෝස්තු | දේශීය ආදායම් දෙපාර්තමේන්තු ආචාර ධර්ම සංග්‍රහය<br>• ආචාර ධර්ම සංග්‍රහ පුහුණු වැඩසටහන (අතුරු නියෝජිතායතන) | |
| | 2025-2026 | දූෂණවලට බදුන්වීමට ඇති හැකියාව අවම කිරීමේ ක්‍රියාමාර්ග<br>• අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සමඟ එක්ව අභ්‍යන්තර කටයුතු කාර්යයන් සඳහා සහාය වීම | |
| | | අදාළ ස්ථානයට ගොස් සේවය ලබාදීම/ සන්නිවේදනය<br>• බදුගෙවන්නා සම්බන්ධවීම/ නිතර අසන ප්‍රශ්න/ ලියාපදිංචිවීම සහ ගොනුකිරීම සඳහා උපකාරීවන වීඩියෝ පට | |
| **පවත්වන ලද මුළු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව** | | | **23** |



දේශීය ආදායම් දෙපාර්තමේන්තුව - ශ්‍රී ලංකාව
உள்நாட்டு இறைவரித் திணைக்களம் - இலங்கை
INLAND REVENUE DEPARTMENT - SRI LANKA

සර්. චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවත, කොළඹ 02
சேர் சிற்றம்பலம் ஏ. கார்டினர் மாவத்தை, கொழும்பு 02
Sir Chittampalam A. Gardiner Mawatha, Colombo 02